198 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 198 - இல. 10
**Volume 198 - No. 10**

2011 අප්‍රේල් 08 වන සිකුරාදා
2011 ஏப்பிரல் 08, வெள்ளிக்கிழமை
**Friday, 08th April, 2011**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී

**විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී

**විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී

**මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී

**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා:**

ජනාධිපතිවරයා සහ අගමැතිවරයා විසින් අමාත්‍ය ධුරයන් දැරීම යෝග්‍ය නොවීම

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE), රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (PAC) සහ උපදේශක කාරක සභාවල සියලුම රැස්වීම්වලට සහභාගි වීමට මාධ්‍යවේදීන්ට අවසර ලබා දීම

පුත්තලම දිස්ත්‍රික්කය තුළ කාර්මික උද්‍යාන පිහිටුවීම

කෑගල්ල දිස්ත්‍රික්කය තුළ කෞතුකාගාරයක් පිහිටුවීම

ශ්‍රී ලංකාවේ ජීවත් වන අඩු පහසුකම් සහිත නිවාස හිමියන්ගේ නිවාස ප්‍රශ්න විසඳීමට ප්‍රායෝගික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

**කල් තැබීමේ යෝජනාව:**
ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලය වෙනුවට නව ක්‍රමවේදයක්

---

# பிரதான உள்ளடக்கம்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**ஊழியர் ஓய்வூதிய நன்மைகள் நிதியம் சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது

**கடல்கடந்த ஊழியர்கள் ஓய்வூதிய நன்மைகள் நிதியம் சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது

**ஓய்வூதியங்கள் (விளைவாந்தன்மையினவான ஏற்பாடுகள்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது

**நிதித்தொழில் சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது

**பிரதேசிய சங்வர்தன வங்கி (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது

**தனி உறுப்பினர் பிரேரணைகள்:**

சனாதிபதியும் பிரதம அமைச்சரும் அமைச்சரவை அமைச்சுப் பதவிகளை வகித்தலின் பொருத்தமின்மை

அரசாங்கப் பொறுப்புமுயற்சிகள் பற்றிய குழு (COPE), அரசாங்கக் கணக்குக் குழு (PAC) மற்றும் ஆலோசனைக் குழுக் கூட்டங்களில் பிரசன்னமாயிருக்க ஊடகவியலாளர்களுக்கு அனுமதியளித்தல்

புத்தளம் மாவட்டத்தில் கைத்தொழிற்பேட்டைகளைத் தாபித்தல்

கேகாலை மாவட்டத்தில் நூதனசாலையொன்றினைத் தாபித்தல்

இலங்கையில் குறைந்த வசதிகளுடன்கூடிய வீடுகளில் வாழ்கின்ற வீட்டுரிமையாளர்களின் வீட்டுப் பிரச்சினையைத் தீர்ப்பதற்கான நடைமுறைச்சாத்தியமான நிகழ்ச்சித்திட்டமொன்றை நடைமுறைப்படுத்துதல்

**ஒத்திவைப்புப் பிரேரணை:**
இலங்கை பத்திரிகைச் சபைக்குப் பதிலாகப் புதிய முறைமையியல்

---

# PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

EMPLOYEES' PENSION BENEFITS FUND BILL:
Read the First time

OVERSEAS EMPLOYEES' PENSION BENEFITS FUND BILL:
Read the First time

PENSIONS (CONSEQUENTIAL PROVISIONS) BILL:
Read the First time

FINANCE BUSINESS BILL:
Read the First time

PRADESHIYA SANWARDANA BANK (AMENDMENT) BILL:
Read the First time

PRIVATE MEMBERS' MOTIONS:

Inappropriateness of Holding Cabinet Porfolios by President and Prime Minister

Granting Permission to Journalists to attend all Meetings held under Committee on Public Enterprises (COPE), Public Accounts Committee (PAC) and Consultative Committees

Establishment of Industrial Estates in Puttalam District

Establishment of a Museum in Kegalle District

Implementing a practical programme to address the housing issues of the owners of houses lacking in facilities living in Sri Lanka

ADJOURNMENT MOTION:
New System in place of Sri Lanka Press Council

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2011 අප්‍රේල් 08 වන සිකුරාදා***
*2011 ஏப்பிறல் 08, வெள்ளிக்கிழமை*
*Friday, 08th April, 2011*

***අ. භා. 1.30ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி.ப. 1.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.30 p.m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර 2008 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ හයවන කාණ්ඩයේ XXII කොටස සහ 2009 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමු කාණ්ඩයේ XI වැනි කොටස, හතරවන කාණ්ඩයේ VII වන කොටස, පස්වන කාණ්ඩයේ VII වැනි කොටස සහ හයවැනි කාණ්ඩයේ VI, VII, VIII, IX, X සහ XI වැනි කොටස් ඉදිරිපත් කරමි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ගරු කථානායකතුමනි, මම 2008 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී ගරු අමාත්‍යතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද? ගරු ඇමතිතුමා පාර්ලිමේන්තුවේ සභාගත කරලා තිබෙන මේ වාර්තාව මීට ඉස්සර පාර්ලිමේන්තුවේ සභාගත කරන්නට තිබුණා. කරුණාකරලා මීන් පසුව 2009ත්, 2010ත් වර්ෂ සඳහා වූ වාර්තා -

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ඔබතුමා කියන කරුණ මම පිළිගන්නවා. මමත් COPE එකේ හිටපු නිසා මම විශේෂයෙන්ම කිව්වා, මේ වාර්තාව ඉදිරිපත් කළ යුතුව තිබුණේ අවුරුදු දෙකකට ඉස්සර වෙලා කියලා. නමුත් මන්ත්‍රීතුමා මම ඔබතුමාට වග කීමෙන් කියනවා, මීට පසුව එහෙම වන්නේ නැහැ, අවශ්‍ය කාලයේදී, අවශ්‍ය වේලාවට ඒ වාර්තා ඉදිරිපත් කරනවායි කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

බොහොම ස්තුතියි.

## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2008 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි:

(i) 2008 වර්ෂය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වාර්ෂික වාර්තාව;

(ii) 2009 වර්ෂය සඳහා කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2009 වර්ෂය සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්; සහ

(iv) 2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Deputy Minister of Ports and Highways)

ගරු කථානායකතුමනි, මම 2007 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් වරාය හා මහාමාර්ග කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අතාවුද සෙනෙවිරත්න මහතා - පැමිණ නැත.
ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා - පැමිණ නැත.

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කොහොලාන වැඩ බලන උපතැපැල් ස්ථානාධිපති ඒ.ඒ. පද්මිණී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කළුතර උතුර, වස්කඩුව, දෙ දියවල, අංක 130 දරන ස්ථානයේ පදිංචි ජේ.ඩී. විජේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ගුණරත්න වීරකෝන් මහතා (නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා)**
(மாண்புமிகு குணரத்ன வீரகோன் - மீள்குடியேற்ற அமைச்சர்)
(The Hon. Gunaratne Weerakoon - Minister of Resettlement)

ගරු කථානායකතුමනි, මම නුගේගොඩ, ගංගොඩවිල, උඩහමුල්ල, දුම්රිය පළ පාර, අංක 15/100 දරන ස්ථානයේ පදිංචි ෂෙල්ටන් ගුණසේකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු රොෂාන් රණසිංහ මහතා - පැමිණ නැත.

ගරු රෝසි සේනානායක මහත්මිය - පැමිණ නැත.

**ගරු හුනෙයිස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)

Hon. Speaker, I present the following petitions:

(1) A petition from Mr. M.A. Thushara Mallawarachchi of No.T/1/2, S.T.F. Houses, Gonahena, Kadawatha.

(2) A petition from Mr. H.M. Weerasinghe Herath of Teacher's Quarters, Viyadiguna Maha Vidyalaya, Vinithagama, Badulla.

(3) A petition from Mr. H.W. Saman Thushara Perera of No. 322/2, Pepiliyawela, Ganegama.

(4) A petition from Mr. Chamila Chandrasiri Ratnayake of No. 65/1, Wickremasinghe Place, Kalutara South, Kalutara.

(5) A petition from Mr. P. Sunil Jayaratne of 191/3, Sooriyapaluwa, Kadawatha.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට සුබ පතන්න කැමැතියි, එතුමා විරුද්ධ පක්ෂයේ නියෝජ්‍ය ප්‍රධාන සංවිධායක ධුරයට පත් වීම ගැන.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, ඒ සුබ පැතීම සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට මම ස්තුතිවන්ත වෙනවා. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපෙන් training.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අපිත් සුබ ප්‍රාර්ථනා කරනවා. මම හිතන්නේ ස්ථාවර නියෝග නම් හරියට ක්‍රියාත්මක කරවා ගන්න පුළුවන් වෙයි.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්: ගාල්ල දිස්ත්‍රික්කය
### காணி மறுசீரமைப்பு ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகள்: காலி மாவட்டம்
### LANDS BELONGING TO LAND REFORMS COMMISSION: GALLE DISTRICT

0214/'10

1. **ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4):

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, පිහිටි ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ ඉඩමේ ස්වභාවය කවරේද;

(iii) එක් එක් ඉඩමේ වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(v) එසේ නම්, ඉඩම් පවරා දුන් කාර්යය සහ පදනම කවරේද;

(vi) ඉඩම්ලාභී පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(vii) එක් එක් ඉඩමෙන් කොමිෂන් සභාවට ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා මේ වන විට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) காலி மாவட்டத்தில் காணி மறுசீரமைப்பு ஆணைக் குழுவிற்கு சொந்தமான காணிகள் உள்ளனவா என்பதையும்,

(ii) ஆமெனில், மேற்படி ஒவ்வொரு காணியினதும் பெயர், அளவு, அமைந்துள்ள கிராம சேவையாளர் பிரிவு, மற்றும் காணியின் இயல்பு யாதென்பதையும்,

(iii) மேற்படி ஒவ்வொரு காணியினதும் வருடாந்த வருமானம் எவ்வளவு என்பதையும்,

(iv) மேற்படி காணிகளின் உரிமை சட்டபூர்வமாக ஆட்களுக்கு அல்லது நிறுவனங்களுக்கு கையளிக்கப்பட்டுள்ளதா என்பதையும்,

(v) ஆமெனில், மேற்படி காணிகள் எவ்விடயத்திற்காக எவ்வடிப்படையில் கையளிக்கப்பட்டுள்ளது என்பதையும்,

(vi) காணிகளை பெற்றுக்கொண்ட ஆட்கள் அல்லது நிறுவனங்களின் பெயர், முகவரி, கையளிக்கப்பட்ட திகதி, காணியின் அளவு மற்றும் கால எல்லை யாதென்பதையும்,

(vii) ஒவ்வொரு காணியிலிருந்தும் ஆணைக்குழுவிற்கு கிடைக்கும் வருமானம் யாதென்பதையும்

அவர் இச்சபைக்கு சமர்ப்பிப்பாரா?

(ஆ) (i) ஆணைக்குழுவிற்கு சொந்தமான காணிகள் சட்டவிரோதமான முறையில் ஆட்கள் அல்லது நிறுவனங்களினால் அனுபவிக்கப்படுகின்றதா என்பதையும்,

(ii) ஆமெனில், இவர்களின் பெயர், அனுபவித்து வரும் காணியின் அளவு, மற்றும் காலஎல்லை யாதென்பதையும்,

(iii) இது தொடர்பாக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கை மற்றும் இதன் தற்போதைய நிலைமை யாதென்பதையும்,

(iv) ஆரம்பத்திலும் தற்போதும் ஆணைக்குழுவிற்கு சொந்தமான காணியின் அளவு எவ்வளவென்பதையும்,

(v) ஆரம்பத்தில் காணப்பட்ட காணியிலிருந்து கையளிக்கப்பட்ட காணியின் அளவு எவ்வளவென்பதையும்,

(vi) உரிமை கையளிக்கப்பட்டுள்ளவர்களின் பெயர், முகவரி மற்றும் காணியின் அளவு யாதென்பதையும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல்,ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he submit to this House-

(i) whether there are lands in the Galle District that belong to the Land Reforms Commission ;

(ii) if so, the name and the extent of each land, the name of the Grama Niladhari Division to which the land belongs and the condition of the land ;

(iii) the annual income from each of the aforesaid lands ;

(iv) whether the ownership of the aforesaid lands has been legally transferred to individuals or institutions ;

(v) if so, the purpose for which the lands were transferred and the basis on which it was done ;

(vi) the names of the individuals or institutions that received lands, their addresses, the dates of transfer, the extents of the lands and the period of time ;

(vii) the income earned by the commission from each of the aforesaid lands?

(b) Will he state-

(i) whether the lands that belong to the commission are illegally possessed by individuals or institutions ;

(ii) if so, their names, the extent of land so possessed and the duration of their possession ;

(iii) the courses of action that were taken in this regard and its current situation ;

(iv) the extent of land owned by the commission at its inception and at present ;

(v) out of the extent of land owned by the commission at its inception, the extent of land transferred to others ;

(vi) the names and the addresses of the persons to whom the possession of the land was transferred and the extent of land so transferred?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) පිළිතුර ඇමුණුම 1 හා ඇමුණුම 2හි සඳහන් කර ඇත. ඇමුණුම් සභාගත* කරමි.

(iii) බදු දී ඇති ඉඩම්වලින් ලබන වාර්ෂික ආදායම ඇමුණුම 2හි සඳහන් කර ඇත.

(iv) නීත්‍යානුකූලව පවරා දුන් ඉඩම් පිළිබඳ විස්තර ඇමුණුම 1 හා ඇමුණුම 2හි සඳහන් කර ඇත.

(v) නිවාස අරමුණු සහ කෘෂිකාර්මික කටයුතු සඳහා.

(vi) ඇමුණුම 1හි සහ ඇමුණුම 2හි සඳහන් කර ඇත.

(vii) බදු දී ඇති ඉඩම්වල ආදායම ඇමුණුම 2හි සඳහන් කර ඇත.

(ආ) (i) ඔව්.

(ii) සීමාසහිත බර්න්ස් ට්‍රේඩිං (පුද්ගලික) සමාගම - බද්දේගම පිලගොඩ වැලි වත්ත

(iii) කොළඹ දිසා අධිකරණයේ අංක 20439/L දරන නඩුව පවරා ඇත.

(iv) අක්. 6127 රූ. 02 පර්. 19

(v) අක්. 5059 රූ. 01 පර්. 39

(vi) ඇමුණුම 1හි දක්වා ඇත.

(ඇ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
**Annex tabled:*

***ඇමුණුම 1***

<u>ගාල්ල දිස්ත්‍රික්කය</u>

| ඉඩමේ නම | ප්‍රමාණය | | | පිහිටීම ග්‍රාම නිලධාරි කොට්ඨාශය | ඉඩමේ ස්වභාවය |
|---|---|---|---|---|---|
| | අක්: | රූ: | පර්: | | |
| ඇල්ලකන්ද වතුරාව පිලගොඩ වත්ත | 03 | 1 | 08 | ඇල්ලකන්ද වතුරාව | අනවසරකරුවන් 20දෙනෙකු පදිංචිව ඇත. |
| සීට්‍රස් වත්ත හත්හවුල | 124 | 3 | 25 | ඇල්ලකන්ද වතුරාව | පර්චස් 15 බැගින් කට්ටිකරුවන් අතර බෙදා දී ඇත. |
| කුරුගහකන්ද කොටස | 40 | | | මාබොටුවන | අනවසරකරුවන් 300 දෙනෙකු පදිංචිව ඇත. |
| ලේල්වල වත්ත | 03 | 2 | 00 | මාබොටුවන | අනවසරකරුවන් 35 දෙනෙකු පදිංචිව ඇත. |
| කොකාවල කොටස | 06 | 1 | 00 | පත්විල | අනවසරකරුවන් 30දෙනෙකු පදිංචිව ඇත. |
| කිතුල කන්ද | 35 | 30 | 00 | මහලපිටිය | අනවසරකරුවන් 140ක් පමණ පදිංචිව වගා කටයුතු කරයි. |
| වල්පිට වත්ත දියවර ගම්මානය | 16 | 2 | 09.36 | මල්පිට දකුණ | කට්ටිකරුවන් 101 දෙනෙකුට බෙදා දී ඇත. |
| ඇල්ලකන්ද වත්ත | 19 | 19 | 01 | – | අනවසරකරුවන් 50දෙනෙකු පදිංචිව ඇත. |
| ඇල්ලකන්ද හෙට්විදුව | 03 | 1 | 07 | – | අනවසරකරුවන් 20දෙනෙකු පදිංචිව ඇත. |
| ලේල්වල වත්ත | 01 | 0 | 27 | ඉහලකිඹිය | අනවසරකරුවන් 35දෙනෙකු පදිංචිව ඇත . |
| වල්පිට වත්ත දොලේගොඩ | 02 | 0 | 00 | ගනේගම නැඟෙනහිර | එක් කට්ටිකරුවෙකි. |
| අකුල හිටිකන්ද | 02 | 0 | 00 | හම්මැලිය | අනවසරකරුවන් 20දෙනෙකු පදිංචිව ඇත. |
| [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] පදිංචිව ඇත, |
| දරේකන්ද | 17 | 0 | 00 | කිඹිඇල | කට්ටිකරුවන් 59 අතර ප්‍රදේශීය ලේකම්ගේ බලපත්‍ර සහිතව බෙදාදී ඇත . |
| හේනෙකන්ද වත්ත | 09 | 0 | 29 | ඉහල කිඹිය | අනවසරකරුවන් 30දෙනෙකු පදිංචිව ඇත . |
| කොටාලූ කන්ද | 00 | 3 | 14.9 | ඇල්ලකන් වතුරාව | කට්ටිකරුවන් 01. |
| වික්ලෝහිල්ස් | 08 | 0 | 00 | කුඹලමල හේන | කට්ටිකරුවන් 26 |
| වික්ලෝහිල්ස් නාගහ | 18 | 0 | 32.2 | – | කට්ටිකරුවන් 26 |
| ගල්ගොඩ වත්ත | 03 | 0 | 00 | මහහේන්ගොඩ | කට්ටිකරුවන් 03 |
| පුහුල්දුව වත්ත | 18 | 0 | 00 | සන්දරවල | කට්ටිකරුවන් 48 |
| ලිහිණිගල මූකලාන | 41 | 0 | 00 | ඇල්පිටිය ප්‍රා. ලේ. කො. | අනවසරකරුවන් 30දෙනෙකු පදිංචිව ඇත. |
| ගල්ලිඳ වත්ත | 92 | 0 | 00 | නාගොඩ ප්‍රා. ලේ. කො. | අනවසරකරුවන් 331 දෙනෙකු පදිංචිව ඇත. |
| හොරලිය කන්ද ඉඩම | 01 | 0 | 00 | – | අනවසරකරුවන් 01 දෙනෙකු පදිංචිව ඇත. |
| කළුආරච්චිගොඩ වත්ත | 06 | 0 | 00 | – | අනවසරකරුවන් 03 දෙනෙකු පදිංචිව ඇත. |
| ජාලත්කන්ද වත්ත | 27 | 0 | 00 | නෙළුව ප්‍රා. ලේ. කො. | අනවසරකරුවන් 08 පමණ පදිංචිව ඇත. |
| ගොඩදෙනිකන්ද | 36 | 0 | 24 | තල්ගස්යාය | කට්ටිකරුවන් 318 |
| ගහකොළදෙනිය | 10 | 1 | 38 | පිලගොඩ | කට්ටිකරුවන් 27 |
| වික්ලෝහිල් ඉහල නාගහ | 18 | 0 | 32 | ඉහල කිඹිය | කට්ටිකරුවන් 52 |
| පෙට්රූ වත්ත ඒ | 08 | 0 | 00 | හල්පාතොට | අනවසරකරුවන් 15 දෙනෙකු පදිංචිව ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| පෙඩිරූ වත්ත | 12 | 2 | 00 | බද්දේගම | කට්ටිකරුවන් 37 |
| උස්ගලදූව | | | | මහහේන්ගොඩ | කට්ටිකරුවන් 103 |
| නිදන්වල කන්ද | 03 | 3 | 20 | පෝද්දල | කට්ටිකරුවන් 24 |
| පාමතේ කන්ද | 07 | 0 | 00 | පිලගොඩ | කට්ටිකරුවන් 71 |
| මනෝමති වත්ත | 18 | 0 | 00 | වදුරඹ | අනවසරකරුවන් 30 දෙනෙකු පදිංචිව ඇත. |
| පිලගොඩවැලි | 71 | 0 | 00 | බද්දේගම ප්‍රා. ලේ. කො. | අනවසර 150ක් පමණ පදිංචිව ඇත. අභියාචනාධිකරණ නඩුවක් ඇත. (බර්න්ස් ට්‍රේඩිංග් පුද් සමාගම) . |
| ගංගරවලදූව | 02 | 0 | 00 | බොරළුකඩ | අනවසරකරුවන් 16 දෙනෙකු පදිංචිව ඇත. |
| දෙයියන්දර වත්ත | 20 | 0 | 00 | – | අනවසර 30ක් පමණ පදිංචිව ඇත. |
| ඔලිම්පස් වත්ත | 15 | 3 | 30.5 | – | අනවසරකරුවන් 25 දෙනෙකු පදිංචිව ඇත. |
| ගුරුබැවිල කන්ද | 00 | 2 | 00 | ඉඳුරුපත්විල | අනවසරකරුවන් 02 දෙනෙකු පදිංචිව ඇත. |
| වතුරාව වත්ත | 13 | 3 | 16 | ඇල්ලකන්ද වතුරාව | කට්ටිකරුවන් 36 |
| ඔලිම්පස් වත්ත ඇතුරුමුල්ල | 40 | 0 | 00 | – | කට්ටිකරුවන් 43 |
| කුඹලමලහේන | 22 | 0 | 18.5 | කුඹලමලහේන | කට්ටිකරුවන් 03 |
| ගල්දූව වත්ත | 01 | 2 | 36.7 | – | අනවසරකරුවන් 07 |
| ගිමාරා ලැන්ඩ් | 01 | 0 | 38 | තිලක උදාගම | කට්ටිකරුවන් 20 |
| අරිද්දදූව වත්ත | 05 | 1 | 30 | හල්පාතොට | කට්ටිකරුවන් 20 |
| රන්දොල වත්ත | 04 | 0 | 00 | උඩකැරව බී | කට්ටිකරුවන් 20 |

| | | | | | |
|---|---|---|---|---|---|
| කිතුල්ගහ කැලේ | 03 | 1 | 00 | කොබෙයිතුඩාව | කට්ටිකරුවන් 11 |
| රත්මාහැර වත්ත | 06 | 3 | 00.2 | හේනගොඩ | කට්ටිකරුවන් 57 |
| පත්‍රාතැටිය වත්ත | 50 | 0 | 00 | කොබෙයිතුඩුව | අනවසරකරුවන් 60දෙනෙකු පදිංචිව ඇත. |
| මහදුරාගෙ වත්ත | 00 | 1 | 10 | බලපිටිය | කට්ටිකරුවන් 02 |
| මොරගහමෝදර කැලේ | 06 | 2 | 30 | නාතතොට | කට්ටිකරුවන් 24 |
| කඩවල මිකන්ද | 11 | 1 | 20.2 | පතිරාජ | කට්ටිකරුවන් 41 |
| ඉඳුරුව කුරුඳු වත්ත | 04 | 0 | 00 | දුවේමෝදර | කට්ටිකරුවන් 14 |
| ඇල්පිටිය වත්ත දිගලතා තැන්න | 40 | 0 | 00 | ඇල්පිටිය ප්‍රා. ලේ. කො. | අනවසරකරුවන් 25 දෙනෙකු පදිංචිව ඇත. |
| ඇල්පිටිය වත්ත ගල්ගොඩැල්ල | 15 | 0 | 00 | ඇල්පිටිය ප්‍රා. ලේ. කො. | අනවසරකරුවන් 15දෙනෙකු පදිංචිව ඇත. |
| බෙන්තොට වත්ත වඩුමුල්ල කොටස | 0 | 0 | 15.81 | බලපිටිය ප්‍රා. ලේ. කො. | අනවසරකරුවන් 25 දෙනෙකු පදිංචිව ඇත. |
| බෙන්තොට වත්ත අතුකෝරල කොටස | 01 | 2 | 05 | බලපිටිය ප්‍රා. ලේ. කො. | සී/ස ඇල්පිටිය උතුර සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිතියට ලබාදී ඇත. |
| බෙන්තොට වත්ත | 01 | 1 | 05.98 | බලපිටිය ප්‍රා. ලේ. කො. | අනවසරකරුවන් 03 දෙනෙකු පදිංචිව ඇත. |
| බෙන්තොට වත්ත අටකොහොට | 10 | 2 | 39.45 | බලපිටිය ප්‍රා. ලේ. කො. | අනවසරකරුවන් 14දෙනෙකු පදිංචිව ඇත. |
| බෙන්තොට වත්ත ප්‍රගති කොටස | 13 | 0 | 00 | ඉහලඹින්න | අනවසරකරුවන් 30 දෙනෙකු පදිංචිව ඇත. |
| තලාව වත්ත | 42 | 0 | 00 | ඉහලතලාව | අනවසරකරුවන් 82 දෙනෙකු පදිංචිව ඇත. |
| 33 කන්ද | 33 | 0 | 00 | ඒරමුල්ල | අනවසරකරුවන් 92 දෙනෙකු පදිංචිව ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| හිපන් වත්ත | 40 | 0 | 00 | දෙල්කබලගොඩ | අනවසරකරුවන් 32දෙනෙකු පදිංචිව ඇත. |
| තල්ගස්තැන්න වත්ත | 60 | 0 | 00 | ඉහලඹමන්න | අනවසරකරුවන් 100 දෙනෙකු පදිංචිව ඇත. |
| 97 කන්ද | 37 | 0 | 00 | පිණිකහන | අනවසරකරුවන් 76දෙනෙකු පදිංචිව ඇත. |
| මිරිස්වත්ත ඒරමුල්ල (තල්ගහදොල) | 22 | 0 | 00 | ඒරමුල්ල | අනවසරකරුවන් 23 දෙනෙකු පදිංචිව ඇත. |
| ඇල්ල අක්කර 50 | 50 | 0 | 00 | ඇල්ල | කට්ටිකරුවන් 100 |
| 18 කන්ද දින 100 | 10 | 0 | 00 | ඒරමුල්ල | කට්ටිකරුවන් 51 |
| ඇල්පිටිය වත්ත ( ගිණිගොඩ කොටස) | 20 | 0 | 00 | ඇල්පිටිය ප්‍රා. ලේ. කො. | අනවසරකරුවන් 45 දෙනෙකු පදිංචිව ඇත. |
| ඇල්පිටිය වත්ත මල්ලලගහදොල | 20 | 0 | 00 | ඇල්පිටිය ප්‍රා. ලේ. කො. | අනවසරකරුවන් 25 දෙනෙකු පදිංචිව ඇත, |
| ඇල්පිටිය වත්ත එලිහිද කොටස | 10 | 0 | 00 | ඇල්පිටිය ප්‍රා. ලේ. කො. | අනවසරකරුවන් 15 දෙනෙකු පදිංචිව ඇත. |
| හිල්සයිඩ් වත්ත | 40 | 0 | 00 | අක්මීමන ප්‍රා. ලේ. කො. | කට්ටිකරුවන් 274 |
| බීරිගොඩ වත්ත | 02 | 1 | 00 | අක්මීමන ප්‍රා. ලේ. කො. | කට්ටිකරුවන් 16 |
| මොන්රෝවියා වත්ත | 18 | 0 | 00 | හික්කඩුව ප්‍රා. ලේ. කො | සුනාමි පදිංචිකරුවන් සිටී. |
| නවාගන්නා කොළේ වත්ත | 41 | 1 | 18.5 | හික්කඩුව ප්‍රා. ලේ. කො | කට්ටිකරුවන් 122 |
| කොහිලගොඩ වත්ත | 02 | 1 | 24 | හික්කඩුව ප්‍රා. ලේ. කො | කට්ටිකරුවන් 06 |
| මොන්රෝවියා වත්ත දින 100 | 09 | 1 | 17 | හික්කඩුව ප්‍රා. ලේ. කො | කට්ටිකරුවන් 113 |
| මොන්රෝවියා වත්ත ගලතොට කොටස | 48 | 0 | 08 | හික්කඩුව ප්‍රා. ලේ. කො | කට්ටිකරුවන් 62 |
| මොන්රෝවියා වත්ත නව ජනපදය | 17 | 0 | 00 | හික්කඩුව ප්‍රා. ලේ. කො | කට්ටිකරුවන් 191 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ගලගොඩ වත්ත කටුදම්පෙ | 13 | 0 | 00 | හික්කඩුව ප්‍රා. ලේ. කො | කට්ටිකරුවන් 47 |
| මොන්රෝවියා වත්ත | 05 | 0 | 00 | හික්කඩුව ප්‍රා. ලේ. කො | ගොවිපලක් සඳහා ලබාදීමට පියවර ගනිමින් පවතී. |
| බොරළුව වත්ත | 03 | 0 | 00 | – | කට්ටිකරුවන් 10 |
| ගෝණතිප්පල වත්ත | 17 | 0 | 00 | බද්දේගම ප්‍රා. ලේ. කො. | කට්ටිකරුවන් 48 |
| ඇල්ල වත්ත කොට්දූව ඉඩම | 06 | 3 | 20 | – | කට්ටිකරුවන් 38 |
| මයියොක්කාහේන | 14 | 0 | 00 | – | කට්ටිකරුවන් 08 |
| මොරගොල්ල චින්තාමනි ඩේසිවැලි වත්ත | 10 | 0 | 00 | හබරාදුව ප්‍රා. ලේ. කො | කට්ටිකරුවන් 23 |
| පැලැස්ස වත්ත | 84 | 0 | 00 | හබරාදුව | කට්ටිකරුවන් 151 |
| කහවැත්ත කුරුඳු වත්ත | 07 | 0 | 00 | හබරාදුව ප්‍රා. ලේ. කො. | කට්ටිකරුවන් 60 |
| බෙරාවත්ත | 01 | 0 | 00 | – | කට්ටිකරුවන් 02 |
| වලහන්දූව වත්ත | 840 | 0 | 00 | අක්මීමන ප්‍රා. ලේ. කො | රාජ්‍ය වැවිලි සංස්ථාව |
| පින්නදූව වත්ත | 31 | 0 | 00 | අක්මීමන ප්‍රා. ලේ. කො | අනවසරකරුවන් 06 දෙනෙකු පදිංචිව ඇත. |
| කෙසෙල්ගස්හේන | 140 | 0 | 00 | අක්මීමන ප්‍රා. ලේ. කො | කට්ටිකරුවන් 150 |
| ලෙව්වම් බී වත්ත | 219 | 0 | 00 | අක්මීමන ප්‍රා. ලේ. කො | කට්ටිකරුවන් 390 |
| පෙඩරූ සී | 01 | 3 | 07 | අම්පෙගම | කට්ටිකරුවන් 14 |
| ගල්ගොඩේ කන්ද | 33 | 2 | 20 | තණබද්දේගම | කට්ටිකරුවන් 73 |
| පොල්ගහවිල රේන්ද වත්ත | 13 | 0 | 00 | දිවිතුර නැඟෙනහිර | කට්ටිකරුවන් 33 |
| කුසල්කන්ද වත්ත | 33 | 3 | 26 | අම්පෙගම | කට්ටිකරුවන් 191 |
| තාවලකන්ද නිතකොළණිය | 35 | 0 | 00 | ඇත්කඳුර | කට්ටිකරුවන් 130 |

| | | | | | |
|---|---|---|---|---|---|
| සතිසවිඩ් වත්ත | 21 | 0 | 15 | දිවිතුර දකුණ | කට්ටිකරුවන් 225 |
| පොල්ගහවිල ජනඋදාන ගම්මානය | 56 | 0 | 18.84 | දිවිතුර තැගෙනහිර | කට්ටිකරුවන් 250 |
| ගලදොළ වත්ත ඉඩම | 38 | 0 | 31 | දිවිතුර ගම | කට්ටිකරුවන් 80ක් අතර බෙදාදී ඇත. |
| කරාගොඩ වත්ත | 05 | 0 | 32 | මොරකැටිය | කට්ටිකරුවන් 02 |
| වැරණියහේන ඉඩම | – | – | – | වැරණියහේන | අනවසරකරුවන් 60 දෙනෙකු පදිංචිව ඇත. |
| තෙල්ලඹුර කොඩිගලකන්ද | 35 | 0 | 00 | තෙල්ලඹුර දකුණ | අනවසරකරුවන් 130 දෙනෙකු පදිංචිව ඇත. |
| අපර් හෝමදොල වත්ත | 754 | 3 | 16 | තෙල්ලඹුර දකුණ | රාජ්‍ය වැවිලි සංස්ථාව. |
| පත්තාරේ වත්ත | 04 | 0 | 00 | මොරකැටිය | අනවසරකරුවන් 10 දෙනෙකු පදිංචිව ඇත. |
| වැවේගොඩ කන්ද | 02 | 0 | 00 | තෙල්ලඹුර උතුර | අනවසරකරුවන් 09 දෙනෙකු පදිංචිව ඇත. |
| දෙමටගහ අද්දර | 10 | 0 | 00 | තල්පෙපත්තුව උතුර | කට්ටිකරුවන් 15 |
| වෙලෙන්දාව වත්ත | 204 | 2 | 15 | වෙලෙන්දාව | ගම් පුළුල් කිරීම යටතේ බෙදාදී ඇත. |
| පොල්ගහවිල ජන උදාන කොකරකන්ද | 56 | 0 | 18.84 | කරුබද්දේගම | කට්ටිකරුවන් 245 |
| වතුගහ ඉන්දුහේන | 08 | 0 | 39.96 | දිවිතුර තැගෙනහිර | කට්ටිකරුවන් 216 |
| දහවුල්හේන | 14 | 0 | 09.42 | නුගේතොට | කට්ටිකරුවන් 81 |
| මහබොරකන්ද ගුලනගොඩ | 22 | 3 | 30.7 | කරන්දෙනිය ප්‍රා. ලේ. කො. | කට්ටිකරුවන් 116 |
| රුක්අත්තනගොඩ කැලේකරුහේන වත්ත | 03 | 0 | 00 | වැලිවිටිය දිවිතුර | ප්‍රාදේශීය ලේකම් විසින් බෙදා දී ඇත. |
| හප්පිටිය වත්ත | 17 | 0 | 00 | නෙළුව ප්‍රා. ලේ. කො. | කට්ටිකරුවන් 14දෙනෙකුට බෙදා දී ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| පුංචි බොරකන්ද | 01 | 0 | 00 | කරන්දෙනිය ප්‍රා. ලේ. කො. | අනවසරකරුවන් 02 දෙනෙකු පදිංචිව ඇත. |
| හිංගල්ගොඩ වත්ත | 350 | 0 | 00 | තවලම ප්‍රා. ලේ. කො. | අනවසරකරුවන් 240 දෙනෙකු පදිංචිව ඇත. |
| මාරගහහේන | 03 | 2 | 00 | තවලම ප්‍රා. ලේ. කො. | කට්ටිකරුවන් 07 |
| ජෙස්මින්වැලි වත්ත | 02 | 0 | 00 | තවලම ප්‍රා. ලේ. කො. | අනවසරකරුවන් 10 දෙනෙකු පදිංචිව ඇත. |
| කලුවගල වත්ත | 08 | 0 | 02 | යක්කලමුල්ල ප්‍රා. ලේ. කො. | කට්ටිකරුවන් 09 |
| හෝමදොල වත්ත | 02 | 2 | 13.4 | හෝමදොල | කට්ටිකරුවන් 05 |
| තල්ගස්වල වත්ත දනාගෙ වත්ත | 05 | 0 | 00 | තල්ලම්පොල | අනවසරකරුවන් 10 |
| කලුවගොඩ මූලකාන | | | | කරාගොඩ | අනවසරකරුවන් 07 |
| නාවලකන්ද උක්වත්ත කොලණිය | 32 | 2 | 37.6 | කරන්දෙනිය ප්‍රා. ලේ. කො. | කට්ටිකරුවන් 61 |
| සෙන්ට්ලෙනාඩ් වත්ත රජයේ සේවක කොටස | 08 | 0 | 00.3 | කරන්දෙනිය ප්‍රා. ලේ. කො. | කට්ටිකරුවන් 70 |
| සෙන්ට් ලෙනාඩ් වත්ත සාමාන්‍ය කොටස | 07 | 3 | 29.7 | කරන්දෙනිය ප්‍රා. ලේ. කො. | කට්ටිකරුවන් 65 |
| සෙන්ට් ලෙනාඩ් වත්ත | 112 | 0 | 00 | කරන්දෙනිය ප්‍රා. ලේ. කො. | කට්ටිකරුවන් 650 |
| රත්නාකාර වත්ත | 08 | 2 | 34.1 | කරන්දෙනිය ප්‍රා. ලේ. කො. | අනවසර 03 |
| කැකිරිස් කන්ද වත්ත | 05 | 1 | 00 | කරන්දෙනිය ප්‍රා. ලේ. කො. | අනවසර 17 |
| කොටවෙල බැද්ද | 05 | 0 | 00 | කරන්දෙනිය ප්‍රා. ලේ. කො. | කට්ටිකරුවන් 53 |
| ඉංගල්වුඩ් වත්ත | 14 | 1 | 24.1 | – | කට්ටිකරුවන් 50 |
| මහබොරකන්ද වත්ත | 20 | 2 | 31.3 | කරන්දෙනිය ප්‍රා. ලේ. කො. | කට්ටිකරුවන් 100 |

| | | | | | |
|---|---|---|---|---|---|
| කොටවෙල බැද්ද | 15 | 0 | 00 | – | කට්ටිකරුවන් 53 |
| පන්විල වත්ත | 17 | 0 | 00 | හික්කඩුව ප්‍රා. ලේ. කො. | කට්ටිකරුවන් 15 |
| සෙන්ට් ලෙනාඩ් වත්ත (අස්වළු කන්ද) | 125 | 0 | 00 | කරන්දෙනිය ප්‍රා. ලේ. කො. | කට්ටිකරුවන් 63 |
| කරකොළ කන්ද | 12 | 0 | 00 | | අනවසර 25 |
| නාගොඩ වත්ත | 20 | 0 | 09 | කැප්පෙටියගොඩ | කට්ටිකරුවන් 193 |
| නාකියාදෙනිය වත්ත එම්. කේ. 3– 2 හේන | 26 | 0 | 18 | යටල වත්ත බටහිර | කට්ටිකරුවන් 73 |
| 22 කන්ද | 26 | 00 | 00 | යටවල වත්ත | කට්ටිකරුවන් 36 |
| උඩලාවත්ත මයියොක්කාහේන | 58 | 0 | 00 | උඩලාවත්ත දකුණ | කට්ටිකරුවන් 134 |
| සෙමරස් වත්ත | 76 | 0 | 39 | උඩුගම දකුණ | කට්ටිකරුවන් 241 |
| වරකපැලහේන | 53 | 1 | 21 | අයත් වත්ත නාකියාදෙනිය | කට්ටිකරුවන් 90 |
| දවුල්හේන | 113 | 3 | 07.8 | උඩුගම මධ්‍යම | කට්ටිකරුවන් 152 |
| 59 කන්ද | 171 | 0 | 00 | උක්ඹිවිට | කට්ටිකරුවන් 325 |
| දියවර ගම්මානය තල්ගස්වල | 26 | 1 | 13 | තල්ගස්වල | කට්ටිකරුවන් 181 |
| 68 කන්ද | 66 | 0 | 00 | ඌරල | කට්ටිකරුවන් 23 |
| නො 4 කන්ද | 40 | 0 | 00 | හගරන්වල | කට්ටිකරුවන් 54 |
| නාකියාදෙනිය බී. ඩී. 5 ඉඩම | 93 | 1 | 03 | යටල වත්ත බටහිර | කට්ටිකරුවන් 95 |
| කැකිරිහේන්දොල | | | | අයත් වත්ත | කට්ටිකරුවන් 54 |
| නාකියාදෙණිය වත්ත 50 කන්ද | 11 | 1 | 07.2 | අලුත්වත්ත | කට්ටිකරුවන් 12 |
| නාගොඩ වත්ත ගුලන කන්ද කොටස | 35 | 0 | 00 | කැප්පෙටියා ගොඩ | අනවසරකරුවන් 20 දෙනෙකු පදිංචිව ඇත |
| නාකියාදෙනිය වත්ත මැණික්දොල කොටස | 160 | 0 | 00 | හගරන්වල | කට්ටිකරුවන් 100 බෙදාදී ඇත |

| | | | | | |
|---|---|---|---|---|---|
| මයියොක්කාහේන යටල වත්ත | 58 | 2 | 00 | යටල වත්ත බටහිර | කට්ටිකරුවන් 84 |
| කිරළ කැටිය වත්ත | 21 | 0 | 37.28 | පරණ නානායම්ගොඩ | අනවසරකරුවන් 35 දෙනෙකු පදිංචිව ඇත |
| මාපලගම වත්ත | 19 | 0 | 00 | මාරකන්ද | ගම් පුළුල් කිරීම යටතේ බෙදාදී ඇත. |
| නාකියාදෙණිය වත්ත 18 කන්ද | 40 | 0 | 00 | අළුත් වත්ත | කට්ටිකරුවන් 40ක් අතර බෙදාදී ඇත |
| තල්ගස්වල වත්ත | 01 | 2 | 00 | තල්ගස්වල | ප්‍රාදේශීය සභාව |
| මාපලාගම රණවිරු ගම්මානය | 40 | 0 | 00 | මාපලගම | කට්ටිකරුවන් 52 |
| කෙසෙල්ගස් හේන | 10 | 0 | 00 | අක්මීමන | මහනගර සභාව ගාල්ල - පැවරීමට කටයුතු කරමින් පවති |
| ගල්ලිඳ වත්ත | 00 | 0 | 15 | නියාගම | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය. නියාගම (විකිණීමකි) |
| වෙලෙන්දාව | 13 | 0 | 23.83 | යක්කලමුල්ල | ප්‍රාදේශීය සභාව යක්කමුල්ල (විකිණීමකි) |
| වැවේගොඩ වත්ත | 00 | 0 | 10 | අක්මීමන | කැටන්දොල කාන්තා සංවර්ධන සමිතියට බදුදීමෙන් පවරාදීමට පියවර ගනිමින් පවති. |
| අටකොහොටකන්ද | 01 | 0 | 00 | ඇල්පිටිය | ශ්‍රී සුධර්මාරාම විහාරය තවදගල පැවරීමට පියවර ගනිමින් පවති. |
| මිරිස්වත්ත ජිරමුල්ල | 10 | 0 | 00 | ඇල්පිටිය | චමිලි අශෝක ලියනගේ (බදු) |
| ලෙච්චම් බී වත්ත | 08 | 0 | 00 | අක්මීමන | සහන ළමා සංවර්ධන පදනමට බදුදීමෙන් පවරාදීමට පියවර ගනිමින් පවති |
| පිත්තදුව වත්ත | 02 | 0 | 00 | අක්මීමන | ප්‍රාදේශීය සභාව . අක්මීමන. බදුදීමෙන් පවරාදීමට පියවර ගනිමින් පවති |

| | | | | | |
|---|---|---|---|---|---|
| කෙසෙල්ගස්හේන | 05 | 0 | 00 | අක්මීමන | කමිරි ප්‍රයිවට් ලිමිටඩ් බදුදීමෙන් පවරාදීමට පියවර ගනිමින් පවතී |
| මාකුරුගොඩ වත්ත | 00 | 3 | 00 | බද්දේගම | සී/ ස තෙලිකඩ මාදුවාන වි. සේ. සමිතිය. බදුදීමෙන් පවරාදීමට පියවර ගනිමින් පවතී |
| මොන්රෝවියා වත්ත | 28 | 2 | 18 | හික්කඩුව | සී/ රහිත කැකිල්ල මණ්ඩිය සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය. |
| ගුරුබැවිල වත්ත | 02 | 1 | 22 | බද්දේගම | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය. විකිණීමෙන් පවරාදීමට පියවර ගනිමින් පවතී. |
| මාකුරුගොඩ වත්ත | 02 | 0 | 00 | බද්දේගම | ජෝ ලංකා ඇගළුම් කම්හල ( බදු) |
| පින්නදූව වත්ත | 00 | 2 | 00 | අක්මීමන | පින්නදූව තෙල් පිරවුම්හල බදුදීමෙන් පවරාදීමට පියවර ගනිමින් පවතී |
| කෙසෙල්ගස්හේන | 00 | 1 | 00 | අක්මීමන | ජයෝදා සංවර්ධන පදනම බදුදීමෙන් පවරාදීමට පියවර ගනිමින් පවතී |
| ගල්ලිඳ වත්ත | 00 | 0 | 25 | නියාගම | රුහුණු සංවර්ධන බැංකුව බදුදීමෙන් පවරාදීමට පියවර ගනිමින් පවතී |
| ගල්ලිඳ වත්ත | 00 | 0 | 25 | නියාගම | ඩයලොග් ටෙලිකොම් ආයතනය. බදුදීමෙන් පවරාදීමට පියවර ගනිමින් පවතී |
| ගුරුබැවිල වත්ත | 00 | 0 | 05 | බද්දේගම | ඉඳුරුපත්විල ස.ණ.ස සමිතිය. විකිණීමෙන් පවරාදීමට පියවර ගනිමින් පවතී |
| හිල්සයිඩ් වත්ත | 03 | 0 | 00 | අක්මීමන | සැම්සන් රබර් ඉන්ඩස්ට්‍රීස් ( බදු) |
| කැටන්දොල වත්ත | 02 | 0 | 00 | ඇල්පිටිය | සී/ස එක්සෙල් ක්ලෝතින් පුද්. සමාගම ( බදු) |
| පින්නදූව වත්ත | 05 | 0 | 00 | අක්මීමන | සී/ස ක්ලැසික් කාර්ස් (පුද්) සමාගම-( අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අවලංගු කරන ලද 2002 - 2004 කාලසීමාව තුළ කරන ලද පැවරීමකි. |
| දොලබොඩ වත්ත | 02 | 0 | 00 | අක්මීමන | හියාරේ ශ්‍රී මහා විහාරය බදුදීමෙන් පවරාදීමට පියවර ගනිමින් පවතී |

ඇමුණුම 2

| ඉඩමේ නම | ප්‍රමාණය | | | වාර්ෂික බදු ආදායම(රු) | ඉඩමේ ස්වභාවය |
|---|---|---|---|---|---|
| | අක් | රූ | පර් | | |
| මාකුරුගොඩ වත්ත | 02 | 0 | 00 | 150000/- | ජෝ ලංකා ඇගළුම් කම්හල ( බදු) |
| මිරිස්වත්ත ජිරමුල්ල | 10 | 0 | 00 | 70500/- | චමිලි අශෝක ලියනගේ (බදු) |
| හිල්සයිඩ් වත්ත | 03 | 0 | 00 | 72900/- | සැම්සන් රබර් ඉන්ඩස්ට්‍රීස් ( බදු) |
| කැටන්දොල වත්ත | 02 | 0 | 00 | 76800/- | සී/ස එක්සෙල් ක්ලෝතින් පුද් සමාගම (බදු) |
| -එම- | 02 | 0 | 00 | 90000/- | ට්‍රෙන්ඩ් සෙන්ටර් (පුද්) සමාගම (බදු) |
| -එම- | 00 | 0 | 05.6 | 1137.50 | ඩී.ඩී.ත්‍රිමාවිතාරණ (බදු) |
| තල්ගස්විල වත්ත | 01 | 0 | 00 | 300/- | විද්‍යාතිලක පිරිවෙන (බදු) |
| ගල්ලිඳ වත්ත | 04 | 2 | 12.31 | 27000/- | පැරඩයිම් ක්ලෝතින් (බදු) |
| නාකියාදෙණිය | 03 | 0 | 00 | 300/- | සරණපාල පිරිවෙන (බදු) |
| ස්ටෝලන්ඩ් වත්ත | 03 | 0 | 00 | 250/- | උඩුගම ශ්‍රී මහින්දාරාමය (බදු) |
| මහහේන වත්ත | 05 | 0 | 00 | 900/- | මහින්ද ජයවර්ධන මහතා (බදු) |

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න කිහිපයක් තිබෙනවා අහන්න. අතුරු ප්‍රශ්න අහන්න කලින් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. මම ඉදිරිපත් කළ ප්‍රශ්නයේ (අ) (iii)ට අදාළ පිළිතුර ඇමුණුම 2හි තිබෙනවාය කියලා එතුමා කිව්වා. ඒ මුදලෙහි එකතුව විතරක් කියන්න පුළුවන්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

(අ) (iii)ට පිළිතුර වශයෙන් එකතුව මුදලක් ආලා නැහැ. සම්පූර්ණ විස්තරය එකින් එක තිබෙන්නේ.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ඔබතුමාට බොහොම ස්තුතියි. ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්නයක් විධියට මා මේ ප්‍රශ්නය අහන්නේ. පසු ගිය කාල වාකවානුවේ ගාල්ල දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් විශාල ප්‍රමාණයක් එහි ප්‍රධාන නිලධාරීන් විසින් අයථා ලෙස බැහැර කිරීමක් කරනු ලැබුවා. අපේ දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණ කමිටුවේදී සෑහෙන ප්‍රමාණයක් මේ ගැන කථා කළා. අක්මීමන, කෙසෙල්ගස් හේන, ලෙව්වමීවත්ත, පින්නදූව වත්ත ආදි වශයෙන් වූ ඉඩම්වලට අදාළව කරපු අයථා ගනුදෙනු සම්බන්ධයෙන් ඒ අදාළ නිලධාරින්ට එරෙහිව ජනාධිපති විමර්ශන ඒකකයෙන් විමර්ශනයක් කළා. මම දැන ගන්න කැමැතියි ඔවුන් සම්බන්ධයෙන් ගත්ත තීන්දුව මොකක්ද කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔබතුමාගේ ප්‍රශ්නයේ (ආ) (i) කොටසට සම්බන්ධ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයන් අරගෙන තිබීම ගැන නීත්‍යානුකූල පියවර ගනිමින් නඩු පැවරීම සඳහා කටයුතු ආරම්භ කර තිබෙනවා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු ඇමතිතුමනි, මගේ ප්‍රශ්නය වන්නේ ඒ සම්බන්ධයෙන් කටයුතු කරපු නිලධාරින්ට එරෙහිව ගත්ත ක්‍රියා මාර්ගය මොකක්ද කියන එකයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒ පිළිබඳව අපි සොයා බලා උත්තර දෙන්නම්.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කරන්න වෙනත් තැනක් නැති නිසා උපදේශක කාරක සභාවේ දී ඒ සඳහා අවස්ථාව සලසා දෙන්නය කියලා මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

කාරණාව ඉදිරිපත් කළොත් උපදේශක කාරක සභාවේ දී ඒ අවශ්‍ය පිළිතුරු ලබා ගන්නත්, ඒ ගත්ත පියවර ගැන සාකච්ඡා කරන්නත් පුළුවන්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අයත් වන උපදේශක කාරක සභාවක් නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු ජනාධිපතිතුමා යටතේ තිබෙන සියලු ආයතන සම්බන්ධයෙන් වන ප්‍රශ්නවලදී අග්‍රාමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවේ දී පිළිතුරු සපයනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගැටලුව තිබෙන්නේ ඒකමයි. ගරු කථානායකතුමනි, මේ වාගේ ගැටලුවක් මතු වුණු ප්‍රශ්නයකදී එයට අදාළ උපදේශක කාරක සභාවක් රැස් වන්නේ නැත්නම්, ගරු අග්‍රාමාත්‍යතුමාගේ මූලිකත්වයෙන් විශේෂ ඒකකයක් ඇති කරලා හරි පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාවක් දෙන්නට ඕනෑ. මෙතැනදී අපට ඒ සඳහා ඉඩක් ලැබෙන්නේ නැහැ නේ. අතුරු ප්‍රශ්න තුනෙන් ඉවර වෙනවා නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු ඇමතිතුමා හැටියට එතුමාගේ උපදේශක කාරක සභාවක් පවතිනවා. එතැනට ඉදිරිපත් කරන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය මා ගරු අග්‍රාමාත්‍යතුමාට විශේෂයෙන් කියන්නම් එතැනදී පිළිතුරු සපයන්නය කියා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු අග්‍රාමාත්‍යතුමාගේ අමාත්‍යාංශ කාරක සභාවේ දී බුද්ධ ශාසන විෂයයට අමතරව ගරු ජනාධිපතිතුමා යටතට පැවරෙන විෂයයන් සියල්ල ගැනත් ඉදිරිපත් කරන්න පුළුවන්?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

පාර්ලිමේන්තුවේ පිළිගත් සම්ප්‍රදායක් අප එසේ අනුගමනය කරමින් තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ නොවෙයි. කලින් පාර්ලිමේන්තු දෙකේත් එහෙමයි වුණේ.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

හරි. බොහොම ස්තුතියි.

## රැකියා සඳහා විදේශගත වන පුද්ගලයන්: රක්ෂණ ආවරණය
## வேலைவாய்ப்புக்காக வெளிநாடு செல்வோர்: காப்புறுதிக் காப்பீடு
## PERSONS LEAVING FOR OVERSEAS EMPLOYMENT: INSURANCE COVER

2. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

0445/'10

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) මේ දක්වා වූ පසු ගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රැකියා සඳහා විදේශගත වන පුද්ගලයන් රක්ෂණ සැලැස්මක් තුළින් ආරක්ෂා කළ යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එවැනි රක්ෂණ ආවරණයක් සඳහා එක් පුද්ගලයකුගෙන් කොපමණ මුදලක් අය කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) පසු ගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂයේදී ඉල්ලා සිටි රක්ෂණ හිමිකම් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) රක්ෂණ ගිවිසුම සඳහා මුදල් ගෙවා තිබුණද, රක්ෂණ හිමි පුද්ගලයන්ට හිමිකම් නොලැබීමට හේතු කවරේද යන්න එතුමා පැහැදිලි කරන්නෙහිද?

(ඊ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) இற்றைவரையான ஐந்து வருடங்களில் வெளிநாட்டு வேலைவாய்ப்புகளுக்காக சென்றவர்களின் எண்ணிக்கையை வருடாந்த அடிப்படையில் அவர் தெரிவிப்பாரா?

(ஆ) வெளிநாட்டு வேலைவாய்ப்புகளுக்காகச் செல்பவர்கள் ஒரு காப்புறுதித் திட்டத்தின்மூலம் பாதுகாக்கப்பட வேண்டும் என்பதை அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) ஆமெனில், அத்தகைய காப்புறுதிக் காப்பீடொன்றுக்கு ஒருவரிடமிருந்து எவ்வளவு தொகை அறவிடப்படுகின்ற தென்பதை அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(ஈ) கடந்த ஐந்து வருடங்களில் விடுக்கப்பட்ட இழப்பீட்டுக் கோரிக்கைகளின் மொத்த எண்ணிக்கையை அவர் தெரிவிப்பாரா?

(உ) காப்புறுதிப் பத்திரத்திற்கான கட்டணங்களை செலுத்திய போதும் மக்களுக்கு ஏன் இழப்பீடு கிடைப்பதில்லை என்பதை அவர் விபரிப்பாரா?

(ஊ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Employment Promotion and Welfare:

(a) Will he state the number of people go for foreign employments on per year basis during the last five years to date?

(b) Will he admit that the people going overseas for employment be protected through an insurance scheme?

(c) If so, will he inform this House how much is charged per person for such insurance cover?

(d) Will he mention the total number of claims made per year for the last five years?

(e) Will he explain as to why people do not get the claim even though they have paid for the insurance policy ?

(f) If not, why?

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

| | | |
|---|---|---|
| (අ) | 2005 වර්ෂයේදී | 231,290 |
| | 2006 වර්ෂයේදී | 201,948 |
| | 2007 වර්ෂයේදී | 218,459 |
| | 2008 වර්ෂයේදී | 250,499 |
| | 2009 වර්ෂයේදී | 247,119 |
| | 2010 වර්ෂයේදී | 266,989 |
| | එකතුව | 1,416,304 |

(ආ) ඔව්.

(ඇ) මුදල් අය නොකෙරේ.

විදේශ රැකියාව සඳහා පිටත්ව යන ශ්‍රමිකයින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියා පදිංචි වීම අනිවාර්ය වන අතර, ඒ සඳහා පනත අනුව අනුමත ගාස්තුව ගෙවිය යුතුය. එසේ ලියා පදිංචි වන පුද්ගලයින් සඳහා ජීවිත රක්ෂණයක් නොමිලේ ලැබේ. ඒ සඳහා රක්ෂණ වාරිකය කාර්යාංශය මගින් ගෙවනු ලැබේ. ඒ අනුව වර්ෂ 02කට ලියා පදිංචි වී යන පුද්ගලයින් සඳහා රුපියල් 800.00ක් ද, වර්ෂ 03කට ලියා පදිංචි වී යන පුද්ගලයින් සඳහා රුපියල් 850.00ක් වශයෙන් ද ගෙවනු ලබන වාරික මුදල වෙනස් වේ.

(ඈ)

| | |
|---|---|
| 2005 ඉල්ලුම් කළ රක්ෂණ හිමිකම් සංඛ්‍යාව - | 5,239 |
| 2006 ඉල්ලුම් කළ රක්ෂණ හිමිකම් සංඛ්‍යාව - | 6,206 |
| 2007 ඉල්ලුම් කළ රක්ෂණ හිමිකම් සංඛ්‍යාව - | 5,186 |
| 2008 ඉල්ලුම් කළ රක්ෂණ හිමිකම් සංඛ්‍යාව - | 4,923 |
| 2009 ඉල්ලුම් කළ රක්ෂණ හිමිකම් සංඛ්‍යාව - | 4,572 |
| 2010 ඉල්ලුම් කළ රක්ෂණ හිමිකම් සංඛ්‍යාව - | 5,886 |
| එකතුව | 32,012 |

(ඉ) රක්ෂණ ආවරණයට මුදල් අය කිරීමක් නැත.

රක්ෂණ ආවරණයෙන් පහත සඳහන් හේතූන් මත හිමිකම් නොලැබේ.

* ලියාපදිංචි වලංගු කාලය ඉක්මවා තිබීම.
* අදාළ සිදු වීම හේතුකොට ගෙන ශ්‍රී ලංකාවට පැමිණ නොතිබීම.
* රක්ෂණ හිමිකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන ඉදිරිපත් නොකිරීම.
* රක්ෂණ හිමිකමට අදාළ සිදුවීම වී මාස 06ක් ඇතුළත අයදුම් නොකිරීම.

(ඊ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා දී තිබෙන උත්තරය අනුව අපට පෙනෙනවා, යම් විධියකින් යම් අයට රක්ෂණය ලැබෙනවා, යම් අයට ලැබෙන්නේ නැහැයි කියන එක. නමුත් මීට වඩා විශාල බැරෑරුම් ප්‍රශ්නයක් තිබෙනවා. සාමාන්‍යයෙන් පෞද්ගලික අංශයෙන් යන අය කටුනායක ගුවන් තොටු පොළින් යන්න ඉස්සෙල්ලා මේ රක්ෂණ ක්‍රමය ලබා ගන්න අවශ්‍යයි. රක්ෂණ ක්‍රමය ලබා ගන්නා අයට ප්‍රශ්නයක් ඇති වුණොත් මොන වාගේ වරප්‍රසාදයක් ඔවුන්ට ලැබෙනවාද?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

මන්ත්‍රීතුමා, සාමාන්‍යයෙන් පළමුවන වතාවට රට යන කොට ලියා පදිංචි ගාස්තු හැටියට රුපියල් 10,200ක් අය කරනවා. පෞද්ගලික අංශයේ නියෝජිතයකු හරහා යනවා නම් ඒ රුපියල් 10,200න් සියයට 70ක් ඒ ඒජන්සියට නැවත භාර දෙනවා, ඔහුගේ යම් යම් වියදම් පියවා ගැනීම සඳහා. Welfare fund එකට සියයට 10ක් තබා ගන්නවා. සියයට 20ක් තමයි කාර්යාංශයේ තබා ගන්නේ. සියයට 20ක් කියන්නේ රුපියල් 2,000ක් විතර. ඒකෙන් තමයි මේ අය වෙනුවෙන් අපි රක්ෂණ වාරිකය ගෙවන්නේ. රක්ෂණය කිරීමේ සමහර අවස්ථාවලදී ඔබතුමා කියන ආකාරයේ යම් යම් ගැටලු සහගත තැන් මතු වෙලා තිබෙනවා. මෙවර රක්ෂණ භාර මණ්ඩලයත් එක්ක තමයි අපි මේ රක්ෂණය කරන්නේ. එය සම්පූර්ණයෙන්ම රජයේ ආයතනයක්. අපි ඒ මණ්ඩලයත් එක්ක කථා කර ගෙන යනවා, එවැනි අවස්ථාවලදී කටයුතු කරන්නේ කොහොමද කියලා. උදාහරණයක් හැටියට ලිබියාවට ගිහින් එහි අතර මං වුණු පිරිසක් සිටියා. එහි රැකියාවේ ප්‍රශ්නයක් මත ඒ අය නැවත ලංකාවට පැමිණියා. රක්ෂණයෙන් ආවරණය නොවුණත්, අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීම හරහා අපට පුළුවන් වුණා, ඒ සියලු දෙනාටම වන්දි හැටියට රක්ෂණ භාර අරමුදලින් මුදල් ලබා දෙන්න. රක්ෂණයෙන් ආවරණය නොවුණත් එවැනි සමහර කාරණා සම්බන්ධයෙන් කථා කරලා ඒ කටයුතු කරන මට්ටමට අපි ගිහින් තිබෙනවා. අපි දැනට සලකා බලා ගෙන යනවා, විදේශ සේවා නියුක්ති කාර්යාංශයටම ආදායමක් එන විධියට රක්ෂණයත් කරන්න පුළුවන්ද කියලා. එතකොට ඔබතුමා කියන ඒ සමහර දේවල් පිළිබඳව අපට අවධානය යොමු කරන්න හැකියාව තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මීට පෙර ඉතාමත් දූෂිත මට්ටමට කටයුතු සිද්ධ වෙලා තිබෙනවාය කියන එක ඔබතුමා පිළිගන්නවා ඇති. මම දන්නවා ඒක නිවැරදි කරන්න ඔබතුමා බොහෝ වෙහෙස මහන්සියක් ගන්නවා කියලා. තවම එහි නිසි ප්‍රතිඵල ලැබෙන්නේ නැති වුණත් මීට වඩා විධිමත් ක්‍රියාවක් එක්ක, මීට වැඩිය විනිවිදභාවයක් - transparency- තිබෙන කටයුත්තක් අපි කරන්න අවශ්‍යයි. මොකද, ඔබතුමා දැන් ලිබියාව සම්බන්ධයෙන් කිව්වා. ලිබියාවේ තිබෙන ප්‍රශ්නයට දැන් දවස් 110ක් විතර වෙනවා. නමුත් එතැනින් ලංකාවට එන්න ඉන්න පිරිස තවම ගෙනැල්ලා නැහැ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගෙනාවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ගෙනාවා කියන්නේ දහ දෙනෙක්, පහළොස් දෙනෙක් ගෙනෙන එක නොවෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු මන්ත්‍රීතුමනි, ලිබියාවේ ඉඳලා ලංකාවට එන්නට ඉල්ලීම් කරපු සියලු දෙනාම පාහේ අපි ලිබියාවෙන් නැවත ලංකාවට කැඳවා ගත්තා. ඊ ළඟට ඔබතුමා කියපු සමහර රක්ෂණ සම්බන්ධයෙන් මතු වෙච්ච කාරණා පිළිබඳව වහාම කටයුතු කරලා, නීතිපතිතුමාගේ අදහස් ලබා ගෙන ඒ තිබුණු යම් යම් ප්‍රශ්න මත සමහර රක්ෂණ කොන්ත්‍රාත් මම දැනටමත් අවලංගු කරලා තිබෙනවා. ඔබතුමා කියපු විධියට සමහර තැන්වල යම් යම් ප්‍රශ්නකාරී, ගැටලුකාරී තත්ත්වයන් මතු වෙලා තිබුණා. නීතිපතිතුමාගේ උපදෙස් වහාම ලබා ගෙන මම ඒවා අවලංගු කරන මට්ටමටත් ගිහිල්ලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 3-0678/'10-(2), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තුන්වැනි වතාවට කල් ගත්තේ. කමක් නැද්ද? ක්‍රිකට් ගැන මට එක ප්‍රශ්නයක් අහන්න බැරිද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේකට අදාළ නැහැ.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 4 - 0802/'10 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්: මාතර දිස්ත්‍රික්කය
காணி மறுசீரமைப்பு ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகள்: மாத்தறை மாவட்டம்
LANDS BELONGING TO LAND REFORMS COMMISSION: MATARA DISTRICT

0215/'10

5. **ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4):

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;
(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, පිහිටි ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ ඉඩමේ ස්වභාවය කවරේද;
(iii) එක් එක් ඉඩමේ වාර්ෂික ආදායම කොපමණද;
(iv) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;
(v) එසේ නම්, ඉඩම් පවරා දුන් කාර්යය සහ පදනම කවරේද;
(vi) ඉඩම්ලාභී පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය හා කාල සීමාව කවරේද;
(vii) එක් එක් ඉඩමෙන් කොමිෂන් සභාවට ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයන් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;
(ii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා කාල සීමාව කවරේද;
(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;
(iv) ආරම්භයේදී හා මේ වන විට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;
(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;
(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தில் காணி மறுசீரமைப்பு ஆணைக்குழுவிற்கு சொந்தமான காணிகள் உள்ளனவா என்பதையும்,
(ii) ஆமெனில், மேற்படி ஒவ்வொரு காணியினதும் பெயர், அளவு, அமைந்துள்ள கிராம சேவையாளர் பிரிவு, மற்றும் காணியின் இயல்பு யாதென் பதையும்,

(iii) மேற்படி ஒவ்வொரு காணியினதும் வருடாந்த வருமானம் எவ்வளவு என்பதையும்,

(iv) மேற்படி காணிகளின் உரிமை சட்டபூர்வமாக ஆட்களுக்கு அல்லது நிறுவனங்களுக்கு கையளிக் கப்பட்டுள்ளதா என்பதையும்,

(v) ஆமெனில், மேற்படி காணிகள் எவ்விடயத்திற்காக எவ்வடிப்படையில் கையளிக்கப்பட்டுள்ளது என்ப தையும்,

(vi) காணிகளை பெற்றுக்கொண்ட ஆட்கள் அல்லது நிறுவனங்களின் பெயர், முகவரி, கையளிக்கப்பட்ட திகதி, காணியின் அளவு மற்றும் கால எல்லை யாதென்பதையும்,

(vii) ஒவ்வொரு காணியிலிருந்தும் ஆணைக்குழுவிற்கு கிடைக்கும் வருமானம் யாதென்பதையும்

அவர் இச்சபைக்கு சமர்ப்பிப்பாரா?

(ஆ) (i) ஆணைக்குழுவிற்கு சொந்தமான காணிகள் சட்ட விரோதமான முறையில் ஆட்கள் அல்லது நிறுவனங் களினால் அனுபவிக்கப்படுகின்றதா என்பதையும்,

(ii) ஆமெனில், இவர்களின் பெயர், அனுபவித்து வரும் காணியின் அளவு, மற்றும் காலஎல்லை யாதென் பதையும்,

(iii) இது தொடர்பாக மேற்கொள்ளப்பட்டுள்ள நட வடிக்கை மற்றும் இதன் தற்போதைய நிலைமை யாதென்பதையும்,

(iv) ஆரம்பத்திலும் தற்போதும் ஆணைக்குழுவிற்கு சொந்தமான காணியின் அளவு எவ்வளவென் பதையும்,

(v) ஆரம்பத்தில் காணப்பட்ட காணியிலிருந்து கையளிக்கப்பட்ட காணியின் அளவு எவ்வளவென் பதையும்,

(vi) உரிமை கையளிக்கப்பட்டுள்ளவர்களின் பெயர், முகவரி மற்றும் காணியின் அளவு யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he submit to this House-

(i) whether there are lands in the Matara District that belong to the Land Reforms Commission ;

(ii) if so, the name and the extent of each land, the name of the Grama Niladhari Division to which the land belongs and the condition of the land ;

(iii) the annual income from each of the aforesaid lands ;

(iv) whether the ownership of the aforesaid lands has been legally transferred to individuals or institutions ;

(v) if so, the purpose for which the lands were transferred and the basis on which it was done ;

(vi) the names of the individuals or institutions that received lands, their addresses, the dates of transfer, the extents of the lands and the period of time ;

(vii) the income earned by the Commission from each of the aforesaid lands?

(b) Will he state-

(i) whether the lands that belong to the Commission are illegally possessed by individuals or institutions ;

(ii) if so, their names, the extent of land so possessed and the duration of their possession ;

(iii) the courses of action that were taken in this regard and its current situation ;

(iv) the extent of land owned by the Commission at its inception and at present ;

(v) out of the extent of land owned by the Commission at its inception, the extent of land transferred to others ;

(vi) the names and the addresses of the persons to whom the possession of the land was transferred and the extent of land so transferred?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) පිළිතුර ඇමුණුමෙහි සඳහන් කර ඇත.

(iii) පිළිතුර ඇමුණුමෙහි සඳහන් කර ඇත.

(iv) පවරා දුන් ඉඩම් පිළිබඳ විස්තර ඇමුණුමෙහි සඳහන් කර ඇත.

(v) නිවාස අරමුණු සහ කෘෂිකාර්මික කටයුතු සඳහා.

(vi) පිළිතුර ඇමුණුමෙහි සඳහන් කර ඇත.

(vii) බදු ඉඩම්වල ආදායම ඇමුණුමෙහි සඳහන් කර ඇත.

(ආ) (i) ඔව්.

(ii) එම ඉඩම්වල පදිංචිව සිටින අනවසරකරුවන් පිළිබඳ විස්තර රැස් කරමින් ඇත.

(iii) චක්‍රලේඛ ප්‍රකාරව අනවසරකරුවන් නියමානුකූල කිරීමට පියවර ගනිමින් පවතී.

(iv) අක්. 6254 රූ.03 පර්. 18.39

(v) අක්. 5278 රූ. 01 පර්.08

(vi) පිළිතුර ඇමුණුමෙහි දක්වා ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

(ඇ) පැන නොනඟී.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*

**Annex tabled:*

ඇමුණුම
Annex
இணைப்பு

0215/10

මාතර දිස්ත්‍රික්කය

| ඉඩමේ නම | ප්‍රමාණය | | | පිහිටීම ග්‍රාම නිලධාරි කොට්ඨාශය | වාර්ෂික බදු මුදල | ඉඩමේ ස්වභාවය |
|---|---|---|---|---|---|---|
| | අක්: | රූ: | පර්: | | රුපියල් | |
| ඉඳිකටුදෙනිය වත්ත | 06 | 0 | 00 | මාරඹ | | කටුපොල් වගාකර ඇත. රාජ්‍ය වැවිලි සංස්ථාව. |
| ඉඳිකටුදෙනිය වත්ත | 10 | 0 | 00 | මාරඹ | | බදුකරු ඉඩමේ බුක්තිය භාරගෙන නොමැත. කොටසක් රාජ්‍ය වැවිලි සංස්ථාව මගින් තේ පැළ සිටුවා ඇත. ඉතිරි කැලෑ බවට පත්ව ඇත. |
| හුලංදාව වත්ත ගල්හේන කොටස | 5 | 0 | 00 | මාරඹ | | අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අවලංගු කරන ලද 2002 - 2004 කාලසීමාව තුළ කරන ලද පැවරීමකි |
| හුලංදාව වත්ත ගල්හේන කොටස (ස්ටැෆර්ඩ් ඔරියන්ට් සමාගම) | 04 | 0 | 23.50 | මාරඹ | 48315/- | ස්ටැෆර්ඩ් ඔරියන්ට් සමාගමට බදු දී ඇත |
| හුලංදාව වත්ත | 1000 | 0 | 00 | මාරඹ | | තේ, කටුපොල් රබර්. රාජ්‍ය වැවිලි සංස්ථාව බුක්ති විඳී. |
| කිරිවත්දෙනිය වත්ත | 02 | 2 | 30 | | 450/- | වයි.සෙල්ලහේවා මහතාට බදු දී ඇත |
| පිටබැද්දර වත්ත | 03 | 0 | 00 | | 1350/- | සර්වෝදය ශ්‍රමදාන සංගමයට බදු දී ඇත |
| තැත්තහේන වත්ත | 00 | 0 | 15 | | 72000/- | වීගෝ (පුද්)සමාගමට බදු දී ඇත |
| සෙම්ඩේල් වත්ත | 06 ½ | 0 | 00 | නිමලව | | අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අවලංගු කරන ලද 2002 - 2004 කාලසීමාව තුළ කරන ලද පැවරීමකි |
| සෙම්ඩේල් වත්ත | 34 | 2 | 15.36 | නිමලව | | ඉඩම ලඳු කැලෑ බවට පත්ව ඇත |
| සෙම්ඩේල් වත්ත | 35 | 0 | 00 | පරගහ වත්ත | | නිවාස තනා පදිංචිව ඇත. කැබලි 145 |
| සෙම්ඩේල් වත්ත | 1 | 2 | 5.64 | නිමලව | 600/- | පූජ්‍ය බී. ධම්මාලෝක හිමි |
| හේමමාලි වත්ත | 20 | 0 | 00 | | 7000/- | මහා මත්තින්ද පිරිවෙන |
| පරදූව වත්ත | 14 | 0 | 00 | – | | ඉමේජ් ලංකා (පුද්) සමාගමට බදු දී ඇත. අංක 111/82/එල් නඩුව විභාග වෙමින් පවතී. |
| මදුරූ මූකලාව වත්ත | 05 | 0 | 00 | මාරඹ උතුර | | නිවාස තනා පදිංචිව ඇත. |
| රණවිරු ගම්මානය | 05 | 0 | 00 | මාරඹ උතුර | | නිවාස තනා පදිංචිව ඇත. කැබලි 53. |
| දියවර ගම්මානය | 05 | 0 | 00 | මාරඹ උතුර | | නිවාස තනා පදිංචිව ඇත. කැබලි 50 |
| මදුරුමූකලාන | 05 | 0 | 00 | මාරඹ උතුර | | අනවසරකරුවන් නිවාස තනා පදිංචිව ඇත. (බදු) |
| මදුරුමූකලාන | 02 | 0 | 00 | මාරඹ උතුර | | අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අවලංගු කරන ලද 2002 - 2004 කාලසීමාව තුළ කරන ලද පැවරීමකි |
| මදුරුමූකලාන | 05 | 0 | 00 | මාරඹ උතුර | | අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අවලංගු කරන ලද 2002 - 2004 කාලසීමාව තුළ කරන ලද පැවරීමකි |
| තෙත්කන්ද වත්ත | 14 | 1 | 29 | දෙදියගල | 90000/- | අක්කර 02 ක පමණ පොල් වගා කොට ඇති අතර. කුකුළු ගොවිපළක්ද අක්කර ¼ ක මිදි සහ දොඩම් වගාවක් ඇත. ( බදු) |
| කෝන්ගහහේන | 05 | 2 | 00 | පානදුගම | | නිවාස තනා පදිංචිව ඇත. කැබලි 22 |
| දෙවුන්දරගෙ ගොරකගහ වත්ත | 01 | 0 | 00 | පානදුගම | | නිවාස තනා පදිංචිව ඇත. කැබලි 01. |
| ශාන්ත විනිප්‍රිඩා | 15 | 0 | 00 | පරදූව | | ලඳු කැලෑ සහිත බිමකි. |
| ඇනාබැදිහේන | 17 | 0 | 00 | ඇල්ලෙවෙල | | නිවෙස් තනා පදිංචිව ඇත. |
| වෙරළුගහහේන | 27 | 0 | 00 | නිමලව | | නිවෙස් තනා පදිංචිව ඇත. කැබලි 125. |
| ගොඩපිටිතැන්න | 22 | 3 | 20 | හිග්ගොඩ | | නිවෙස් තනා පදිංචිව ඇත. |
| තිරිවානකැටිය | 98 | 0 | 00 | තාවලගොඩ | | අක්කර 40 ක් නිවෙස් තනා පදිංචිව ඇති අතර ඉතිරි අක්කර 58 හි වන වගාවක් ඇත. |
| මුත්තෙට්ටුව වත්ත | 01 | 3 | 23 | යකාබැද්ද | | ඉන්ධන පිරවුම්හලක් සඳහා. |
| මුත්තෙට්ටුව වත්ත | 01 | 1 | 06 | යකාබැද්ද | | කුඹුරු ඉඩමකි. |
| අධිකාරම් වත්ත | 04 | 1 | 24 | වැලිහේන | | නිවාස තනා පදිංචිව ඇත. කැබලි 14. |
| ඇටඹගහ යාය | 52 | 2 | 11 | ඌරුමුත්ත | | නිවාස තනා පදිංචිව ඇත. ඔප්පු ලබාදී ඇත. කැබලි 60. |
| ගල්කැටිය ගොඩ වත්ත | 00 | 2 | 32 | යකාබැද්ද | | නිවාස තනා පදිංචිව ඇත. ඔප්පු ලබාදී ඇත. කැබලි 02. |
| ශාන්ත විනිප්‍රිඩා වත්ත | 19 | 3 | 23.7 | පරදූව | | නිවාස තනා පදිංචිව ඇත. කැබලි 17 |
| විල්පිට වත්ත | 39 | 0 | 18 | උක්ගස්හේන | | නිවෙස් තනා පදිංචිව ඇත. කැබලි 76. |
| ගලගාව වත්ත | 450 | 0 | 00 | දෙමටපස්ස | | අක්කර 66 ක් මැනුම් කොට කැබලි 80 ක් බෙදා දී ඇත. ඉතිරි ප්‍රමාණය මැනුම් කරමින් පවතී. |
| දෙනිය වත්ත කොරටුව | 04 | 1 | 14 | හිග්ගොඩ | | අනවසර 07 |
| මල්මොරකැටිය | 02 | 0 | 05.33 | කතංකෙ | | නිවෙස් තනා පදිංචිව ඇත. කැබලි 01 |
| කොටිගහල වත්ත | 15 | 0 | 00 | වැලිහේන | | අනවසරකරුවන් අතරේ ප්‍රා. ලේ. විසින් බෙදාදී ඇත. කැබලි 30 |
| අඹුහේන සහ උරුලැඹුල්ලහේන | 10 | 0 | 34 | මිනිපෙගොඩ | | කැබලි 27 කට්ටිකරුවන් අතරේ බෙදාදී ඇත. |
| පිටකොරඹුල්ල | 05 | 0 | 00 | කලහගම | | කැබලි 19 කට්ටිකරුවන් අතරේ බෙදාදී ඇත. |
| රිලාමුල්ලහේන | 13 | 2 | 36 | ඇල්ගිරිය | | කට්ටිකරුවන් අතර බෙදා දී ඇත. |
| කතනෙ වත්ත | | | | | | තේ ශක්ති තේ කම්හලට ලබාදී ඇත. |
| මැදමණ්ඩිය හේන (භාග්‍යගම) | 28 | 0 | 00 | හොරගොඩ නැගෙනහිර | | ප්‍රා. ලේ. මගින් බලපත්‍ර ලබාදී ඇත. කැබලි 95. |
| අධිකාරිවිල්ලු | 18 | 0 | 00 | කිරිමැටිමුල්ල (දකුණ) | | ප්‍රාදේශීය ලේකම් බලපත්‍ර ලබාදී ඇත. කැබලි 112 |
| කොරහිලගොඩ වත්ත | 360 | 0 | 00 | හොරගොඩ | | කුරුඳු සහ තේ වගාකර ඇත. රාජ්‍ය වැවිලි සංස්ථාවට ගැසට් කර ලබාදී ඇත. |
| කන්දහේන | 02 | 2 | 00 | හොරගොඩ | | කැබලි 24 කි. අනවසරකරුවන් අතර බෙදාදී ඇත. |
| අරමනදූව | 01 | 0 | 00 | කිරිමැටිමුල්ල | | කැබලි 01. |
| ජෝනිඩේල් වත්ත | 48 | 0 | 00 | කිරිමැටිමුල්ල | | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අත්පත්කරගැනීම සඳහා පියවර ගනිමින් පවතී |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| නුපෙවෙල වත්ත | 06 | 0 | 20 | | | කට්ටිකරුවන් අතර බෙදාදී ඇත. කැබලි 05. |
| දික්හේන වත්ත පරවාහැර | 02 | 0 | 37 | | | කට්ටිකරුවන් අතර බෙදාදී ඇත. කැබලි 05. |
| කොටිගල් කන්ද වත්ත | 77 | 1 | 26 | | | කට්ටිකරුවන් පදිංචිව ඇත. කැබලි 60. |
| ලෙනාඩ් වත්ත | 47 | 3 | 33 | මිදිගම | 1080000/- | බදු පදනම මත ලෝඩ්ස්ටා පුද්. සමාගම. |
| ලෙනාඩ් වත්ත | 110 | 0 | 00 | මිදිගම | | නිවෙස් තනා වගාකොට ඇත. |
| කනංකෙ | 00 | 1 | 11.29 | පෝරඹ | | ගොඩනැගිලි ඉදිකර ඇත.(පොහොර ගබඩාව) |
| වාලිමවුන්ට් වත්ත | 69 | 0 | 12.22 | අගුරාජගම | | නිවෙස් තනා වගාකොට ඇත. |
| වාලිමවුන්ට් වත්ත | 20 | 0 | 00 | ජයවික්‍රම පුර | | කර්මාන්තපුරය |
| වාලිමවුන්ට් වත්ත | 04 | 1 | 16.90 | ජයවික්‍රම පුර | | නිවෙස් තනා පදිංචිව ඇත. |
| වාලිමවුන්ට් වත්ත | 14 | 3 | 13.34 | ජයවික්‍රම පුර | | නිවෙස් තනා පදිංචිව ඇත. |
| වාලිමවුන්ට් වත්ත | 07 | 0 | 00 | ජයවික්‍රමපුර | | වල්බිහිව ඇත. |
| වාලිමවුන්ට් වත්ත | 10 | 0 | 00 | ජයවික්‍රමපුර | | නිවාස ඉදිකර පදිංචිව ඇත. |
| වේරගංතලාව | 04 | 2 | 01.67 | නිමලව | | නිවාස ඉදිකර පදිංචිව ඇත. කැබලි 16. |
| කොම්පැණිහේන | 23 | 1 | 20.98 | උඩුකාව | | නිවෙස් තනා පදිංචිව ඇත. කැබලි 103. |
| හොරතොල්ලගොඩ (වේරගංතලාව ) | 10 | 2 | 35.78 | පැනැටියන | | නිවෙස් තනා පදිංචිව ඇත. කැබලි 14 |
| වාලිමවුන්ඩ් | 83 | 0 | 00 | | | වාණිජ බිම් කොටස් සඳහා කර්මාන්තපුරයට වෙන් කොට ඇත. |
| කුරුදු වත්ත | 01 | 2 | 03 | හල්ලල | | ජල යෝජනා ක්‍රමය. |
| කුරුදු වත්ත | 08 | 3 | 24 | හල්ලල | | නිවෙස් තනා ඇත. |
| පැලවත්ත | 07 | 1 | 24.75 | බෙරලැලිය | | වැලිපිටිය තැපැල් කාර්යාලය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කන්දගොඩැල්ල | 11 | 0 | 26 | වාවිව | | නිවාස තනා වගා කොට ඇත. |
| හෙට්ටිගෙදර වත්ත | 01 | 2 | 30 | කඩවැද්දුව | | නිවෙස් තනා පදිංචිව ඇත. |
| බතලහේන | 00 | 3 | 07.50 | | | නිවෙස් තනා පදිංචිව ඇත. |
| කෝවිල් කොරටුව | 00 | 2 | 02.23 | බතීගම | | නිවෙස් තනා පදිංචිව ඇත.- කැබලි 04. |
| කොස්නැම්ම වත්ත | 40 | 3 | 18.33 | උඩඅපරුක්ක | | නිවෙස් තනා පදිංචිව ඇත. කැබලි 72 |
| වල්පොලගෙ වත්ත | 00 | 1 | 17.33 | කඩවැද්දුව | | නිවෙස් තනා පදිංචිව ඇත. කැබලි 03 |
| අසමෝද ගන්හේන | 10 | 3 | 01.28 | කඩවැද්දුව | | නිවෙස් තනා පදිංචිව ඇත. කැබලි 29. |
| විජේකෝන් වත්ත | 01 | 2 | 09.72 | කඩවැද්දුව | | නිවෙස් තනා පදිංචිව ඇත. කැබලි 09. |
| වලස්ගල වත්ත | 19 | 3 | 06.07 | වලස්ගල | | නිවාස තනා වගාකොට ඇත. කැබලි 167. |
| හේවා බුලන්ගමගේ වත්ත | 00 | 2 | 11.27 | වේවැල්ල | | නිවාස තනා ඇත. |
| ගනේගොඩ වත්ත | 01 | 0 | 11.27 | බතීගම | | නිවාස තනා ඇත. කැබලි 09. |
| හෙට්ටියාමුල්ල | 00 | 0 | 11.6 | හෙට්ටියාමුල්ල | | නිවාස තනා ඇත. |
| බෙලිවත්තගෙ වත්ත | 00 | 0 | 21.09 | බතීගම | | නිවාස තනා ඇත. |
| මහදානගෙ වත්ත දූව | 00 | 0 | 22.71 | බතීගම | | නිවාස තනා ඇත. |
| විලේහේන | 01 | 3 | 25.24 | බතීගම | | නිවාස තනා ඇත. |
| දොඩන්ගහ වත්ත | 02 | 0 | 36.23 | | | නිවෙස් තනා පදිංචිව ඇත. කැබලි 19. |
| පනගිගහේන | 00 | 3 | 19.25 | බතීගම | | නිවාස තනා ඇත. |
| කිරාගෙවිල අද්දරහේන (පැලපොල්හේන) | 05 | 0 | 00 | පිටකටුවන | | නිවෙස් තනා ඇත. වගාකොට ඇත. කැබලි 15. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පිටමුල්ල පුවක් වත්ත | 03 | 3 | 36.94 | මාපලාන | | නිවෙස් තනා ඇත. කැබලි 18 |
| කපුහේන නොහොත් ජුල්ගහගොඩැල්ල | 09 | 2 | 00 | තුඹේ | | නිවෙස් තනා ඇත. කැබලි 26 |
| ඕකුරුවාව | 09 | 2 | 18 | -මාපලාන | | නිවෙස් තනා ඇත. කැබලි 36 |
| ජසය වත්ත | 08 | 2 | 00 | කඹුරුපිටිය | | නිවෙස් තනා ඇත. කැබලි 27 |
| තැඹිලිකන්ද | | | | කහගල | | නිවෙස් තනා ඇත. කැබලි 34 |
| දිවෙල්හේන නොහොත් කෝපිහේන | 00 | 1 | 17.57 | මාපලාන | | පෙර පාසලක් සඳහා. |
| දෙල්ගහ කනත්ත | 01 | 2 | 29.1 | කඹුරුපිටිය | | නිවෙස් තනා ඇත. කැබලි 14 |
| කපුකනත්ත වත්ත හේන | 02 | 1 | 00.68 | යටියන | | නිවෙස් තනා ඇත. කැබලි 10 |
| ඔකන්ද වත්ත | 00 | 3 | 17.50 | ගෝදාව | | නිවෙස් තනා ඇත. කැබලි 03 |
| පිලිහෙල ඉඩම | | | | බැරගම් මුල්ල | | නිවෙස් තනා වගාකොට ඇත. කැබලි 10 |
| ගලගම්මුල්ල | 00 | 1 | 12.29 | පලොල්පිටිය | | නිවෙස් තනා ඇත. කැබලි 04 |
| හිග්ගහ වත්ත | 00 | 0 | 35.92 | ගෝදාව | | නිවෙස් තනා වගාකොට ඇත. කැබලි 01 |
| වලකඩ වත්ත | 00 | 1 | 20 | පලොල්පිටිය | | නිවෙස් තනා ඇත. |
| කාමරංකාව | | | | මාපලාන | | වගාකොට නිවෙස් තනා ඇත. කැබලි 75 |
| නුගආරහේන | 00 | 1 | 25.68 | ගනේගම | | නිවෙස් තනා ඇත. කැබලි 02 |
| නාකන්දහේන | 27 | 2 | 35.97 | කරගොඩ උයන්ගොඩ | | නිවෙස් තනා ඇත. කැබලි 69 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කහගල මහහේන | 23 | 3 | 11.21 | කහගල | | නිවෙස් තනා ඇත. කැබලි 56 |
| කොර කොමහහේන | 15 | 0 | 18.62 | ඊරියතොට | | නිවෙස් තනා ඇත. කැබලි 32 |
| මිල්ලගහ හේන | 00 | 1 | 05.2 | පිටකටුවන | | නිවෙස් තනා වගාකොට ඇත. කැබලි 10 |
| බෙන්තිස්හේන | 53 | 2 | 03.9 | පලොල්පිටිය | | නිවෙස් තනා ඇත. කැබලි 197 |
| පුස්සගහ වත්ත | 05 | 2 | 35.32 | පිටකටුවන | | නිවෙස් තනා ඇත. කැබලි 51 |
| කහනකුට්ටිය | 35 | 1 | 03.99 | ඌරපොල | | නිවෙස් තනා ඇත. කැබලි 35. |
| හොරකුට්ටිය | 01 | 2 | 20 | කරපුටුගල | | නිවාස තනා වගා කොට ඇත. |
| වලව් වත්ත | 00 | 1 | 22 | සපුගොඩ | | නිවාස තනා පදිංචිව ඇත. කැබලි 02 |
| පාලුවත්ත | 00 | 3 | 19.61 | මාපලාන | | නිවාස තනා පදිංචිව ඇත. කැබලි 03. |
| ලිඳවලහේන | 04 | 2 | 02.97 | පිටකටුවන | | නිවාස තනා පදිංචිව ඇත. කැබලි 30 |
| නයිදමලේ හේන | 13 | 2 | 11.56 | කිරින්ද | | නිවෙස් තනා ඇත. කැබලි 16 |
| කපුහේන හෙවත් ඇඩිලැන්ඩ් වත්ත | 07 | 2 | 13.38 | ඇල්ලවෙල | | නිවාස තනා ඇත. වගා කටයුතු සිදුකර ඇත. කැබලි 35 |
| හිල්ලෙ ගෙදර වත්ත | 00 | 2 | 00 | | | නිවාස තනා ඇත. |
| දිවෙල්හේන නොහොත් විජේකෝන් වත්ත | 20 | 1 | 34.35 | පනන්වෙල | | නිවාස තනා වගා කටයුතු කර ඇත. කැබලි 75 |
| වැලිපොතහේන | 04 | 0 | 00 | බෙරපනාතර | | නිවාස තනා වගා කර ඇත. කැබලි 15 |
| කින කන්දහේන | 01 | 0 | 00 | කිරිපිටිය | | නිවාස තනා වගා කර |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | ඇත. කැබලි 06 |
| තැන්නහේන | 14 | 0 | 00 | බෙරපනාතර | | නිවාස තනා වගා කර ඇත. කැබලි 68 |
| පිග්ලැන්ඩ් වත්ත | | | 250 ඒ පාතවිට | | | නිවාස තනා ඇත. කැබලි 41 |
| ගොඩේපන්න වත්ත | 36 | 0 | 00 | ගින්නලිය උතුර | - | නිවාස තනා වගා කර ඇත කැබලි 31 |
| කැකුනගහහේන | 08 | 0 | 00 | බෙරලපනාතර | | අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අවලංගු කරන ලද 2002 - 2004 කාලසීමාව තුළ කරන ලද පැවරීමකි |
| කැකුණගහහේන | 02 | 0 | 00 | බෙරලපනාතර | | අත්පත් ප්‍රා. ලේ |
| පිල්ලහේන වත්ත | 27 | 1 | 30.31 | බෙරලපනාතර | | නිවෙස් තනා වගා කටයුතු කර ඇත. කැබලි 81 |
| ගින්නලිය වත්ත | 80 | 0 | 00 | ගින්නලිය | | නිවෙස් තනා වගා කටයුතු කර ඇත. කැබලි 95 |
| ලාවළුගහහේන | 20 | 3 | 30.48 | බෙරලපනාතර | | නිවෙස් තනා ඇත. කැබලි 36 |
| ආදපාල වත්ත | 32 | 0 | 00 | කොරඹුරුවාන | | නිවෙස් තනා වගාකර ඇත. කැබලි 105 |
| බෝමළුව වත්ත | 00 | 0 | 35.8 | රන්සැගොඩ | | නිවෙස් තනා ඇත. කැබලි 01 |
| කුණුකුරිය දොලහේන | 09 | 0 | 28.80 | දේවාලේගම බටහිර | | නිවාස තනා ඇත. කැබලි 19 |
| කුට්ටිගේ හේන | | | | මාකදුර | | නිවාස තනා ඇත. කැබලි 30 |
| දිද්දෙනිපොත වත්ත රතු කරුසගම | 20 | 0 | 00 | මුලටියන | | නිවාස තනා ඇත. කැබලි 62 |
| බෝලංගොඩ වත්ත | 06 | 1 | 22.01 | රදාවෙල | | නිවෙස් තනා වගාකර ඇත. කැබලි 36 |
| ආදපාන වත්ත | 32 | 0 | 00 | කොරඹුවාන | | නිවෙස් තනා වගා කර ඇත. කැබලි 105 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| තැන්නකැටියහේන නොහොත් ඉදිකැටියහේන | 18 | 0 | 00 | දේවාලේගම | | නිවෙස් තනා ඇත. කැබලි 08 |
| ඇතාගලහේන නොහොත් දියකෙලියහේන | 20 | 0 | 00 | දේවාලේගම | | නිවෙස් තනා වගාකර ඇත. |
| කලුගල මහහේන හෙවත් දංහේන | 04 | 2 | 16 | දෙයියන්දර | | නිවෙස් තනා ඇත. කැබලි 15 |
| මල්පුදනාගම | 25 | 0 | 00 | පිටබැද්දර | | නිවෙස් තනා ඇත. කැබලි 158 |
| දැරංගල වත්ත | 88 | 2 | 08 | පිටබැද්දර | | නිවෙස් තනා ඇත. කැබලි 93 |
| පිටබැද්දර වත්ත | 45 | 0 | 00 | පිටබැද්දර | | නිවෙස් තනා ඇත. කැබලි 168 |
| ගොරකවෙල වත්ත | 18 | 0 | 00 | ගොරකවෙල | | තේ වගාව ( බදු) |
| ගොරකවෙල වත්ත | 81 | 0 | 00 | ගොරකවෙල | | බෙදා දී ඇත. කැබලි 130 |
| නුන්ගල්ලහේන | 25 | 0 | 00 | තලපෙ කුඹුර | | නිවෙස් තනා ඇත. කැබලි 47 |
| විලේහේන | 10 | 2 | 24.50 | කිරිවැල්දොල | | නිවස් තනා ඇත. කැබලි 23 |
| දංකොළුව වත්ත | 450 | 0 | 00 | දංකොළුව | | විහාරය ඉදිකර ඇත. අත්පත් කරගෙන ඇත |
| හැත්පර්ඩ් වත්ත | 100 | 3 | 24 | මතුගොඩේ | | නිවාස තනා ඇත. කැබලි 81 |
| කම්බුස්සාවෙල හෙවත් කරලයින් වත්ත | 00 | 0 | 12.924 | මතුගොඩේ | | කඩ කාමර ඉදිකර ඇත. කැබලි 06 |
| ඉවුරහේන | 25 | 0 | 00 | විහාරහේන | | මතුරට වැවිලි සමාගම මගින් වෙනත් අයෙකුට බදුදී ඇත. |
| හේමමාලි වත්ත | 21 | 0 | 00 | නිශ්ශංකපුර | | ලදු කැලෑ සහිතයි. තේ වගා ව්‍යාපෘතිය සඳහා මැනුම් නියෝග ලබාදී |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | ඇත. |
| හේමමාලි වත්ත | 10 | 0 | 00 | ගල්වැටි දමා පැගිරි වවා ඇත. | | වගා කිරීම සඳහා ඇත. |
| හේමමාලි වත්ත | 02 | 1 | 00 | නිශ්ශංකපුර | | වගාකර ඇත. |
| එනසල් වත්ත | 94 | 1 | 07 | කොටපොල | | අමාත්‍ය - මණ්ඩල තීරණයක් මගින් අවලංගු කරන ලද 2002 - 2004 කාලසීමාව තුළ කරන ලද පැවරීමකි |
| එනසල් වත්ත | 07 | 1 | 06 | කොටපොල | | රණවිරුවන්ට බෙදාදී ඇත. |
| එනසල් වත්ත | 20 | 0 | 00 | කොටපොල | | බදුදීමට පියවර ගනිමින් පවති |
| කුරුළුගල්ල | 206 | 0 | 00 | මතුගොඩේ | | අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අවලංගු කරන ලද 2002 - 2004 කාලසීමාව තුළ කරන ලද පැවරීමකි |
| කුරුළුගල්ල | 140 | 0 | 00 | මතුගොඩේ | | අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අවලංගු කරන ලද 2002 - 2004 කාලසීමාව තුළ කරන ලද පැවරීමකි |
| බෙවරලිය වත්ත | 49 | 1 | 27 | කිරිවැල්දොල | | බදුදීමට පියවර ගනිමින් පවති |
| බෙවරලිය වත්ත | 958 | 2 | 34 | කිරිවැල්දොල | | වැවිලි සංස්ථාව. |
| බෙවරලිය වත්ත | 86 | 3 | 10 | කිරිවැල්දොල | | නිවාස ඉදිකර ඇත. කැබලි 49. |
| දෙබරගුලාන වත්ත | 00 | 1 | 24 | වැලිව | | නිවාස ඉදිකර ඇත. කැබලි 04 |
| ඔකන්ද හේන | 24 | 2 | 23 | මොරවක | | නිවාස ඉදිකර ඇත. කැබලි 45 |
| උග්ගල්පොත වත්ත | 49 | 2 | 00 | අලකොලදෙණිය දකුණ | | නිවාස ඉදිකර ඇත. වගා කටයුතු කර ඇත. මැනුම් නියෝගයක් නිකුත් |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | කර ඇත. කැබලි 31 |
| කෝප්ලන්ඩ් වත්ත | 01 | 0 | 00 | වරල්ල | | ආදාහනාගාරයක් සඳහා |
| කෝප්ලන්ඩ් වත්ත | 00 | 3 | 00 | වරල්ල | | තේ පැළ තවානක් සඳහා. |
| ලුම්බිණි වත්ත | 08 | 0 | 00 | කුඩලුදෙණිය | | නිවාස ඉදිකර වගා කටයුතු කර ඇත. කැබලි 16 |
| ලුම්බිණි වත්ත | 02 | 2 | 10 | කුඩලුදෙණිය | | නිවාස ඉදිකර වගා කටයුතු කර ඇත. කැබලි 15 කැබලි 85. |
| බඹරගොඩ | 08 | 3 | 12 | පල්ලේගම | | කැබලි 70 |
| මිහිරත් කන්ද | 14 | 2 | 13 | බටයාය | | නිවාස තනා ඇත. |
| පලිගුපිටිය වත්ත | 00 | 0 | 19.5 | පල්ලේගම | | සමූපකාර දෙපාර්තමේන්තුව. |
| කිරිවාන ගග | 86 | 0 | 00 | කොස්මෝදර | | නිවාස තනා වගාකර ඇත |
| නාවලහේන ( විල්හේන ) | 11 | 2 | 29 | කිරිවැල්දොල | | නිවාස තනා ඇත. කැබලි 16 |
| පුස්සවෙල සිතාඇල්ල ගොවිපල | 17 | 3 | 26.11 | පල්ලේගම | | නිවාස තනා ඇත. කැබලි47 |
| කදරත්දොල හේව | 18 | 0 | 08.37 | දංගල | | නිවාස තනා ඇත. කැබලි 21 |
| තිලන්දිගම | 108 | 3 | 11.37 | පෝරුපිටිය | | නිවාස තනා ඇත. කැබලි 145 |
| දිවදාව වත්ත | 86 | 1 | 37.6 | අඩාරදෙනිය | | නිවාස තනා ඇත. කැබලි 74 |
| ඉහලක් කන්ද වත්ත | 02 | 0 | 00 | පනාවල නාඩ කන්ද | | නිවාස තනා ඇත. කැබලි 21 |
| නිල්ගිරිය වත්ත | 23 | 0 | 00 | පරදුමුල්ල | | නිවාස තනා ඇත. කැබලි 23 |
| රන්දොල වත්ත | 07 | 0 | 02.73 | මොරවක | | කැබලි 15 |

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු ඇමතිතුමනි, අතුරු ප්‍රශ්න අහන්න බැරි නිසා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඇමුණුමෙහි පිටපතක් මා වෙත ලබා දෙන ලෙස.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හොඳයි.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6-0686/'10-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, අල්ලපු වත්තේ ඉන්නවා ඒත් එන්නේ නැහැ කියලා උත්තර නොදෙන අය, මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න මාස ගණන් ඉල්ලන්නේ මොනවාටද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නයට ඉතා නිවැරදි, හොඳ පිළිතුරක් ඔබතුමාට ලබා දීම සඳහා ඇමතිතුමා -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, අඩුම ගණනේ වැරදි උත්තර වෙලාවට දෙන එක හොඳයි නිවැරදිව දෙන්න අවුරුදු ගණන් ගන්නවාට වැඩිය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම හිතන්නේ හොඳ පිළිතුරක් හම්බ වෙයි මාසයකට පස්සේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මාසයකට පස්සේ කියන්නේ ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අපි බලමු.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 7-0803/'10-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මට ලැබී ඇති පිළිතුරේ සම්පූර්ණ විස්තරය නැහැ. ඔබතුමා මට සතියක් කල් දෙනවා නම් වඩා හොඳයි.

අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ සභාපති: විස්තර

அரசாங்க மருந்தாக்கல் கூட்டுத்தாபனத் தலைவர்: விபரம்

CHAIRMAN OF STATE PHARMACEUTICALS MANUFACTURING CORPORATION: DETAILS

0921/'10

8. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ සභාපතිවරයාගේ සම්පූර්ණ නම හා වයස කවරේද;

(ii) මෙම තනතුරට පත්වීමට පෙර ඔහු සේවය කළ ස්ථානය හා තනතුර කවරේද;

(iii) ඔහුගේ වෘත්තීය පළපුරුද්ද කවරේද;

(iv) ඔහුගේ මාසික වැටුප හා ලැබෙන වෙනත් දීමනා කවරේද;

(v) ඔහු එම තනතුරට පත් කළ බලධාරියා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்க மருந்தாக்கல் கூட்டுத்தாபனத்தின் தலைவரது முழுப்பெயர் மற்றும் வயது என்பவை யாவையென்பதையும்,

(ii) இப் பதவிக்கு நியமனம் பெறுவதற்கு முன்னர் இவர் கடமையாற்றிய இடம் மற்றும் பதவி என்பவை யாவையென்பதையும்,

(iii) இவரின் தொழில்சார் அனுபவம் யாதென்பதையும்,

(iv) இவரது மாதாந்தச் சம்பளம் மற்றும் கிடைக்கப் பெறுகின்ற ஏனைய கொடுப்பனவுகள் யாவையென் பதையும்,

(v) இவரை இப்பதவிக்கு நியமனம் செய்த அதிகாரி யார் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House -

(i) the full name and the age of the Chairman of the State Pharmaceuticals Manufacturing Corporation;

(ii) his place of work and the post he held before he was appointed to this post;

(iii) his professional experience;

(iv) monthly salary and other allowances paid to him at present;

(v) the authority who appointed him to the present post ?

(b) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) i. මහාචාර්ය ශාන්තලාල් දේවප්‍රිය ජයරත්න
වයස අවුරුදු 60

ii. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - වෛද්‍ය පීඨය.
මහාචාර්ය - වෛද්‍ය පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

iii. වෛද්‍යවරයකු සහ විශේෂඥ වෛද්‍යවරයකු වශයෙන් වසර 25ක රජයේ රෝහල්වල
සේවය සහ ජයවර්ධනපුර වෛද්‍ය පීඨයේ වසර 15ක සේවය

iv. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති තනතුර ද මොහු දරන බැවින් මෙම ආයතනයට අදාළ තනතුරට හිමි වැටුපෙන් 1/4ක් වන රුපියල් 7,500.00 හා ඉන්ධන දීමනාව පමණක් ගෙවනු ලැබේ.

v. ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා.

(ආ) පැන නොනඟී.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 9-0691/'10-(1),ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මොකක්ද මේකේ තේරුම? විලිලජ්ජාවක් නැති ආණ්ඩුවක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය බරපතළ ඇති.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ප්‍රශ්නය බරපතළ වාගේම රටේ ආර්ථිකයත් බරපතළයි. ඒවා තමයි අපි අහන්නේ. [බාධා කිරීම්]

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10-0804/'10-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11 -0859/'10- (2), ගරු අජිත් කුමාර මහතා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, ගාල්ල බස් නැවතුම් පළ හදලා ඉවර වෙන්නත් යනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමාත්, මමත් දෙදෙනාම දන්නවා, ගාල්ල බස් නැවතුම් පළේ ප්‍රශ්නය. සති දෙකෙන් පිළිතුරු ලැබෙනවා. එතකොට ඇමතිතුමා උත්තර දෙයි.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
බොහොම ස්තුතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගාලු උරුමයේ බොහොම සක්‍රිය මන්ත්‍රීවරයෙක් එතුමා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12 -0922/'10- (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

# පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත
### ஊழியர் ஓய்வூதிய நன்மைகள் நிதியம் சட்டமூலம்
### EMPLOYEES' PENSION BENEFITS FUND BILL

"මේ පනතේ විධිවිධාන ප්‍රකාරව විශ්‍රාම වැටුපක් සඳහා සුදුසුකම් ලබන ඇතැම් සේවානියුක්ත පන්තිවල ප්‍රයෝජනය සඳහා සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදලක් පිහිටුවීමටත් සහ ඒ හා සම්බන්ධ වූ හා එයට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් පනවනු ලබන පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.***

***2011 අප්‍රේල් 27 වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரின் சார்பாக மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2011 ஏப்பிரல் 27, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs;*

*to be read a Second time upon Wednesday, 27th April, 2011 and to be printed.*

### විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල පනත් කෙටුම්පත
### கடல்கடந்த ஊழியர்கள் ஓய்வூதிய நன்மைகள் நிதியம் சட்டமூலம்
### OVERSEAS EMPLOYEES' PENSION BENEFITS FUND BILL

"මේ පනතේ විධිවිධාන ප්‍රකාරව විශ්‍රාම වැටුපක් සඳහා සුදුසුකම් ලබන ඇතැම් සේවක පන්තිවල ප්‍රයෝජනය සඳහා විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදලක් පිහිටුවීම සහ ඒ හා සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.***

***2011 අප්‍රේල් 27 වැනි බදාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2011 ஏப்பிறல் 27, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs;*

*to be read a Second time upon Wednesday, 27th April, 2011 and to be printed.*

## විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත
ஓய்வூதியங்கள் (விளைவாந்தன்மையினவான ஏற்பாடுகள்) சட்டமூலம்
PENSIONS (CONSEQUENTIAL PROVISIONS) BILL

"2011 අයවැය යෝජනාවලදී ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවක් ප්‍රකාරව සේවා නියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල පනත සහ විදේශ සේවා නියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල පනත පැනවීම නිසා උද්ගත වූ ඇතැම් ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.***

***2011 අප්‍රේල් 27 වැනි බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2011 ஏப்பிறல் 27, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப் பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளை யிடப்பட்டது.*

*Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs;*

*to be read a Second time upon Wednesday, 27th April, 2011 and to be printed.*

## මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත
நிதித்தொழில் சட்டமூலம்
FINANCE BUSINESS BILL

"මුදල් ව්‍යාපාර කටයුතු විධිමත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.***

***2011 අප්‍රේල් 27 වැනි බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2011 ஏப்பிறல் 27, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs;*

*to be read a Second time upon Wednesday, 27th April, 2011 and to be printed.*

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත
பிரதேசிய சங்வர்தன வங்கி (திருத்தம்) சட்டமூலம்
PRADESHIYA SANWARDANA BANK (AMENDMENT) BILL

"2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.***

***2011 අප්‍රේල් 27 වැනි බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2011 ஏப்பிறல் 27, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையி டப்பட்டது.*

*Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs;*

*to be read a Second time upon Wednesday, 27th April, 2011 and to be printed.*

# පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 01, 02, 03, 04 සහ 05 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 20(7) දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

## I

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග 7(1) හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2011 අප්‍රේල් මස 27 වැනි බදාදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2011 අප්‍රේල් මස 27 වැනි බදාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඊ ළඟට, දිනට නියමිත කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක 1 සිට 5 දක්වා පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා ඉදිරිපත් කිරීම.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා ඒ යෝජනාව ඉදිරිපත් කර, දැනට එය ස්ථිර කර තිබෙනවා.

## ජනාධිපතිවරයා සහ අගමැතිවරයා විසින් අමාත්‍ය ධුරයන් දැරීම යෝග්‍ය නොවීම
## சனாதிபதியும் பிரதம அமைச்சரும் அமைச்சரவை அமைச்சுப் பதவிகளை வகித்தலின் பொருத்தமின்மை
## INAPPROPRIATENESS OF HOLDING CABINET PORTFOLIOS BY PRESIDENT AND PRIME MINISTER

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***
***ඊට අදාළ ප්‍රශ්නය - [2010 ඔක්තෝබර් 08]***
*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [2010 ஒக்ரோபர் 08]*
*Order read for resuming Adjourned Debate on Question - [08th October, 2010]*

"ඉතා ඵලදායී පරිපාලනයක් පවත්වාගෙන යාමටත්, අමාත්‍යවරුන්ගේ කටයුතු නිසි ලෙස සමාලෝචනය කිරීමටත්, ජනාධිපතිවරයා හා අගමැතිවරයා විසින් කිසිදු අමාත්‍ය ධුරයක් දැරීම යෝග්‍ය නොවන බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."- [ගරු රවි කරුණානායක මහතා]

"வினைத்திறமை மிக்கதொரு நிர்வாகத்தை மேற்கொள்ளு முகமாகவும் அமைச்சர்களது செயற்பாடுகளை விமர்சன ரீதியாக ஆய்வு செய்வதற்கும் ஏதுவான வகையில் சனாதிபதி மற்றும் பிரதம அமைச்சர் ஆகியோர் எந்தவோர் அமைச்சரவை அமைச்சுப் பதவியையும் வகித்தல் பொருத்தமானதல்லதென இப்பாராளு மன்றம் தீர்மானிக்கின்றது" - [மாண்புமிகு ரவி கருணாநாயக்க]

"That this Parliament resolves that holding of Cabinet Portfolios by the President and the Prime Minister is not appropriate in order to have a very effective administration and to critically review performance of the Ministers."- [The Hon. Ravi Karunanayake]

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Question again proposed.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

[අ. භා. 2.01]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, "ජනාධිපතිවරයා සහ අගමැතිවරයා විසින් අමාත්‍ය ධුරයන් දැරීම යෝග්‍ය නොවීම" යන මේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේ ගරු රවි කරුණානායක මැතිතුමාට මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපේ රටේ දැන් මේ සම්බන්ධව දැවැන්ත කතිකාවක් බිහි වෙලා තිබෙන වාතාවරණයක් අපි දකිනවා. ගරු කථානායකතුමනි, එක එක ආණ්ඩු එන කොට මේවා සම්බන්ධව විවිධ පොරොන්දු දෙනවා. ඇත්ත වශයෙන්ම මේ පොරොන්දු, පොරොන්දුවලට විතරක් සීමා වෙච්ච ඉතිහාසයක් තමයි අපි දකින්නේ.

විශේෂයෙන්ම ඈත අතීතයට යන්නේ නැතිව, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය 1994 ආරම්භ කරපු ආණ්ඩු කාලය තුළ ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශය මට මතකයි. ජනාධිපතිවරයා හෝ ජනාධිපතිවරිය විධියට ඉතාම අඩු කැබිනට් මණ්ඩලයක් පත් කර ගන්නවා විතරක් නොවෙයි, අග්‍රාමාත්‍යවරයා විධියට වැඩ කටයුතු කරන කොට කිසිම තනතුරක් භාර ගන්නේ නැතිව කුඩා කැබිනට් මණ්ඩලයකින් යුක්තව මේ අධික වියදම් පාලනය කරලා අලුත් ක්‍රමවේදයක් අනුව රට ගෙන යන්න ඕනෑ කියන කාරණය එහි බොහොම පැහැදිලිව තිබුණා. ඒක එතුමිය පෙන්වා දුන්නා. හැබැයි මම දන්නේ නැහැ මොකක් ද වුණේ කියලා. පහු වන කොට ඒක එහෙම පිටින්ම අහෝසි කර දමලා එතුමිය තමන් යටතේ මහා දැවැන්ත ආයතන ගණනාවක් තියා ගත්තා විතරක් නොවෙයි, මුදල් අමාත්‍ය ධුරයත් දරන තත්ත්වයට පත් වුණා. අවසානයේ අවුරුදු 10ක් විතර යන කොට රටේ ආර්ථිකය කඩා වැටුණා විතරක් නොවෙයි දොඩම් ගෙඩි ගොඩ බදා ගත්තා වාගේ සියලුම දේවල් එතුමිය බදා ගත්තා.

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ගත්තොත්, ලංකාවේ හිටපු හොඳ මැනේජර් කෙනෙකු විධියට, එහෙම නැත්නම් හොඳ කළමනාකාරිත්වයක් දරපු කෙනෙකු විධියට එතුමා කිසිම වෙලෙක තමන්ගේ අතට අමාත්‍යාංශ පවරා ගත්තේ නැහැ. අමාත්‍යාංශයේ ලේකම්වරු වෙන වෙන තැන්වල වැඩ කළා. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය කියන මුළු රටම පාලනය කරන්න පුළුවන් ශක්තිමත් වැඩ පිළිවෙළක් සහිත අමාත්‍යාංශය එතුමා පවරා ගත්තා. ඒකෙන් කරන්න තිබෙන කාරණය වුණේ මේ සියලුම අමාත්‍යාංශ පරිපාලනය කිරීමයි. අග්‍රාමාත්‍යවරයෙක් හෝ ජනාධිපතිවරයෙක් හෝ විධියට පත් වුණාට පස්සේ හොඳ මැනේජර් කෙනෙක් විය යුතුයි. එතුමාට තිබෙන ප්‍රධාන කාර්ය භාරය තමයි තමන්ගේ ඇමති මණ්ඩලය වැඩ කරන්නේ කොහොමද කියන එක හරිහමන් විධියට සොයා බලලා අලුත් ක්‍රමවේදයකට යන එක. නමුත් අද රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය තමයි සියලු දේවල්, ඒ කියන්නේ ඇමතිවරුන්ගේ අමාත්‍යාංශ ගත්තත් අමාත්‍යාංශවලින් කාල, භාගය සමහර වෙලාවට ජනාධිපතිවරයා යටතට පත් කර ගෙන තිබෙන එක. අද මේ ගරු සභාවේ ඇහැව්වා, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ගැන. අපේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාට ස්තුතිවන්ත වන්න ඕනෑ, එතුමා ඒ සම්බන්ධව අග්‍රාමාත්‍යතුමාට දැනුම් දීලා අවශ්‍ය කටයුතු ටික කරන්නම් කියලා කිව්ව එක ගැන.

අපි දන්නවා, සමහර ආයතන ජනාධිපතිතුමාගෙන් -

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් පැන නඟිනවා. ස්ථාවර නියෝගවල විවාද රීති යටතේ ඇති 78 වන ස්ථාවර නියෝගය පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරවන්න මම කැමැතියි.

මම අදාළ ස්ථාවර නියෝගය කියවන්නම්. එහි මෙසේ සඳහන් වනවා:

"78. ජනාධිපතිතුමාගේ හෝ වැඩබලන ජනාධිපතිතුමාගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ, විනිශ්චයකාරවරුන්ගේ හෝ යුක්තිය පසිඳලීමෙහි නියුක්ත අන් අයගේ පැවැත්ම පූර්ණ යෝජනාවකින් හැර මතු නොකළ යුතුය. තවද, කිසි සංශෝධනයක, මන්ත්‍රීවරයෙකුගෙන් අසනු ලබන ප්‍රශ්නයක හෝ අන්කිසි විෂයයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාවක් පිළිබඳ ව පැන නගින විවාදයක දී කරන ප්‍රකාශවල, ඉහත නම් සඳහන් කරන ලද අයගේ පැවැත්ම ගැන යමක් සඳහන් කිරීම රීති විරෝධී ය."

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ යෝජනාව පිළිබඳව මම මීට ප්‍රථමයෙන් තීන්දුවක් දීලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාට මේ පිළිබඳව අදහස් දක්වන්න පුළුවන්. [බාධා කිරීමක්]

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
මේක ගෙනෙන්න බැහැ මම හිතන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක එතුමා දැන ගෙන තමයි කථානායකතුමා විධියට අපට තීන්දුව දී තිබෙන්නේ, මේ කාරණය ගැන කථා කරන්න කියලා. කිසි ගැටලුවක් නැහැ. ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වනවා, ඒ රීති ප්‍රශ්නය නැඟුවාට. මම ඒකයි අහගෙන සිටියේ. කමක් නැහැ, ඔබතුමාට අයිතිය තිබෙනවා, රීති ප්‍රශ්නය නඟන්න.

මම කියන්න කැමැතියි, අද අපි දකිනවා, මේ ගරු පාර්ලිමේන්තුවේ සභා ගර්භය තුළ අහන සමහර ප්‍රශ්නවලට උත්තර දෙන්න කවුරුවත් සභා ගර්භයේ නැති බව.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க )
(The Hon. Lalith Dissanayake)
උත්තර දෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
උත්තර දුන්නාට අපි දැක්කා, සමහර ප්‍රශ්න සම්බන්ධව, කුඩා ප්‍රශ්න නැත්නම් -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමාට ලැබුණේ විනාඩි පහයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තව එක විනාඩියක් දෙන්න ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තත්පර තිහක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පැය ගණනක් කථා කරන්න පුළුවන් කථාවක් මේකේ තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වෙනම වෙලාවක කථා කරමු. දැනට ස්ථාවර නියෝග අනුව කටයුතු කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තව එක විනාඩියක් මම ඔබතුමාගෙන් ඉල්ලනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, ඉක්මනට.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ නිසා බාධා කරන්න එන්න එපා. මම කියන්න කැමැතියි, -

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, මේ ගොල්ලෝ පක්ෂයේ ව්‍යවස්ථාව හදා ගෙනත් නැහැ, තවම.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කරදර කරන එක පොඩ්ඩක් නවත්වන්න. ඉන්නකෝ, කෑ ගහන්නේ නැතුව.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමාගේ විනාඩිය පාවිච්චි කරන්න ඉඩ දෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කියන්න කැමැතියි, විශේෂයෙන් රවි කරුණානායක මැතිතුමා වාගේ උගතෙක්, බුද්ධිමතෙක්, මේ පාර්ලිමේන්තුවේ අලුත් සම්ප්‍රදායක් -[බාධා කිරීමක්] ඉතින්, ඇයි හිනා වෙන්නේ? [බාධා කිරීමක්] එතුමා කොහොමටත් උගත් බුද්ධිමත් කියන එක අපි දන්නවා. මොකද, එතුමා උගන්වලා තිබෙනවා. අඩුම තරමින් මේ වාගේ යෝජනාවක් ගෙනෙන්න පුළුවන් වන්නේ එහෙම බුද්ධියක් තිබෙන කෙනෙකුට විතරයි. නැත්නම් හැම දාම කත් අදින මිනිසුන්ට මේ වාගේ යෝජනා ගෙනෙන්න බැහැ. ඒ නිසා මම විශේෂයෙන් කියනවා, මේක ඉතාමත් හොඳ යෝජනාවක් කියලා.

රටක් විධියට ඉදිරියට යන්න පුළුවන් නම්, අලුත් ශ්‍රී ලංකාවක් බිහි කරන්නට ඕනෑ නම්, ආසියාවේ ආශ්චර්යය බවට ශ්‍රී ලංකාව පත් කරන්නට ඕනෑ නම් කරුණාකර ආණ්ඩුව මේ තීන්දුව අතට අර ගෙන ජනාධිපතිතුමා ළඟ කැලි - බෑලි එකතු කර ගෙන තිබෙන ඒවා ටික මේ ඇමතිවරුන්ට දී, ඇමතිවරුන්ට නිදහසේ වැඩ කර ගෙන යන්නට පුළුවන් ක්‍රමවේදයක් ඇති කර, හැම එකකටම අත ගහන්නේ නැතිව තමන්ගේ පරිපාලනය කර ගෙන යන්නට පුළුවන් වාතාවරණය ඇති කරන්න ඕනෑ. එසේ ඇති කළා නම් මේ රට මීට වඩා ආශ්චර්යවත් විධියට ඉදිරියට ගෙන යන්නට පුළුවන් බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 2.07]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියන ආකාරයට රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ බුද්ධිය නැවත වරක් ප්‍රදර්ශනය කරන යෝජනාවක් හැටියට එතුමා මේ යෝජනාව සැලකුවා. මට නම් පෙනෙන්නේ රවි කරුණානායක මන්ත්‍රීතුමාට අතීතය ටිකක් මතක් කර දෙන්නට ඕනෑය කියන එකයි.

මේ විධායක ජනාධිපති ධුරය සහ මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කරන ලද්දේ අපේ විපක්ෂ නායකතුමාගේ මාමණ්ඩිය වන ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා සහ එතුමාගේ ගෝලබාලයන් විසිනුයි. ඒ අවස්ථාවේදී විධායක ජනාධිපති ධුරයක් සහිතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කළා; විධායක ජනාධිපති ධුරයට බලතල රාශියක් ලබා දුන්නා. මෙන්න මේ බලතල තමයි අද යෝග්‍ය නොවේය කියා රවි කරුණානායක මන්ත්‍රීතුමා මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ. මේකට තමයි කියන්නේ දෛවයේ සරදම කියා. ඒ අවස්ථාවේදී පාලන බලය ලබා ගෙන මේ විධියට ව්‍යවස්ථාව හදා ගෙන පාලනය කර, දැන් මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට පත් වුණායින් පස්සේ තමයි මතක් වුණේ මේක යෝග්‍ය නොවේය කියා. එම නිසා මෙම යෝජනාව සද්භාවයෙන් ගෙනා යෝජනාවක් නොවෙයි.

ඒ වාගේම ගරු කථානාකතුමනි, මේක මේ රටේ පවතින ව්‍යවස්ථාව. මේක යෝග්‍ය නොවේය කියන අය තමන්ගේ මැතිවරණ ප්‍රකාශන කිසි දෙයක එක්සත් ජාතික පක්ෂයෙන් මෙවැනි අපේක්ෂකයකු බිහි වුණොත් මේ සියල්ල අත හරිනවාය කියා නැහැ; විධායක බලය අත් හරිනවාය කියා නැහැ; මේ විධියට ව්‍යවස්ථාව සංශෝධනය කරනවාය කියා නැහැ. මේ විධායක ජනාධිපති ධුරයට විරුද්ධ වුණු ජනතා විමුක්ති පෙරමුණත් ඔක්කොම එකතු වෙලා තමයි, ගිය වර සරත් ෆොන්සේකා මහතා මේ විධායක ජනාධිපති ධුරය සඳහා ඉදිරිපත් කළේ. ඒ අයත් කියලා නැහැ. විධායක ජනාධිපති ධුරය පතුරු ගහපු අයත් -ඒ අයත්- අපේක්ෂකයකු ඉදිරිපත් කළා, විධායක ජනාධිපති වන්නට කියා. එම නිසා ගරු කථානායකතුමනි, මේ යෝජනාවේ කිසිම සද්භාවයක් නැහැ. මම කියන්න කැමැතියි, මේක හරියට බඩේ බිජු තියා ගෙන කරන කථාවක් වාගෙයි කියලා. තමන්ගේ පක්ෂයේ ප්‍රතිපත්තිය මොකක්ද? මේ යෝජනාව රවි කරුණානායක මැතිතුමාගේ පෞද්ගලික අදහසක්ද? එහෙම නැත්නම් එක්සත් ජාතික පක්ෂය ඇතුළු විපක්ෂයේ පොදු ප්‍රතිපත්තියද? අපි පසු ගිය මැතිවරණ ගණනාවක් පැවැත්තුවා. ඒ මැතිවරණවලදී මැතිවරණ ප්‍රකාශනයන් රාශියක් ඉදිරිපත් කළා. ඒ කිසිම මැතිවරණ ප්‍රකාශනයක මෙවැන්නක් අන්තර්ගත වෙලා තිබුණේ නැහැ.

ඊ ළඟට මා කියන්න කැමැතියි, මේ රටේ ජනතාවට විමුක්තිය ලබා දීම සඳහා ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් විධායක ජනාධිපති ධුරය පාවිච්චි කළ බව. මේ රටේ ජනතාව තළන්නට පෙළන්නට නොව මේ රටෙන් ත්‍රස්තවාදය තුරන් කිරීමේ කටයුත්ත යථාර්ථයක් බවට පත් කිරීම සඳහා එතුමා විධායක ජනාධිපති ධුරය අවියක් කර ගත්තා. ජේ. ආර්. ජයවර්ධන මහත්මයාගේ අරමුණ වුණේ ඒක නොවෙයි. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැදීමෙන් ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා බලාපොරොත්තු වුණේ එක්සත් ජාතික පක්ෂය සදාකාලිකවම බලයේ තියන්නයි. නමුත් අපේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා එයින් බැහැරව ගිහිල්ලා, මේ රටේ තිස් වසරක් තිස්සේ තිබුණු ඒ දරුණු ත්‍රස්තවාදය අතු ගා දැමීමට විධායක ජනාධිපති ධුරය පාවිච්චි කළා. ඒ වාගේම එතුමා එම ක්‍රියාවලියේදී මේ රටේ සියලුම දේශපාලන බලවේග ඒක රාශි කර ගනිමින් එල්ටීටීඊ සංවිධානයට සහ රාජ්‍ය විරෝධීන්ට, මේ රටේ ඉඳ ගෙන කුමන්ත්‍රණය කරන අයට, මේ රටෙන් පිට ඉඳ ගෙන කුමන්ත්‍රණය කරන අයට -ඒ කුමන්ත්‍රණ කිසිවකට- හිස ඔසවන්නට ඉඩ දුන්නේ නැහැ. එපමණක් නොවෙයි. අද එක්තරා ආකාරයක ජාතික ආණ්ඩුවක් බවට අපේ රජය පත් කර ගන්නට සියලු දේශපාලන පක්ෂවල නියෝජිතයන් රජයට එකතු කර ගන්නට වඩාත් ඵලදායි දේශපාලන මාවතක යන්නට එතුමා මේ විධායක ජනාධිපති ධුරය උපයෝගි කර ගත්තා. ගරු කථානායකතුමනි, ඒ නිසා එතුමා ගෙන යන ලද මේ වැඩ පිළිවෙළ තුළ විධායක ජනාධිපති ධුරයෙන් ලබා දෙන්නට පුළුවන් වුණු ඉහළම ප්‍රතිලාභය මේ යුගයේදී මේ රටේ ජනතාවට ලබා දීමට එතුමාට පුළුවන් වුණු බව මා ප්‍රකාශ කරන්නට කැමැතියි. ඒ නිසා මෙම යෝජනාව හාස්‍යයට කාරණයක් වන බව ප්‍රකාශ කරන අතරම, එක්සත් ජාතික පක්ෂයේ ඉහළ තානාන්තරයකට එන්නට බලාපොරොත්තුවෙන් සිටින රවි කරුණානායක මන්ත්‍රීතුමාට අපි සුබ පතනවා. ඒ සමඟම මෙවැනි දෙබිඩි ප්‍රතිපත්ති යෝජනා නොකරන ලෙස ඉල්ලා සිටිමින්, මේ යෝජනාවට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා.

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ. භා. 2.13]

**ගරු රවි කරුණානායක මහතා**

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මා ඉදිරිපත් කළ මෙම පෞද්ගලික යෝජනාව සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරමින් කථා කරපු සියලුම මන්ත්‍රීවරුන්ට මගේ අවංක ස්තුතිය මා පුද කරන්න කැමැතියි. විවිධ ආකාරයෙන් අදහස් ලැබුණා. අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා අන්තිමට ඉදිරිපත් කරපු අදහස්වලින් මම පටන් ගත්තොත් මම කියන්න කැමැතියි, විධායක ජනාධිපතිවරයා හා අගමැතිවරයා වැනි රටේ බලවත් පුද්ගලයන් විසින් කිසිම ඇමති ධුරයක් දැරීම යෝග්‍ය නොවේය කියන එක මගේ යෝජනාවේ හරය බව.

ඒ විතරක් නොවෙයි. ගරු කථානායකතුමනි මම කිව්වා, ඔබතුමාගේ තීන්දුව දෙන වෙලාවේ මම සංශෝධනයක් ඉදිරිපත් කරනවා කියලා, මේ යෝජනාව වර්තමාන ආණ්ඩුවට බලපාන්න අවශ්‍යතාවක් නැහැ, ඉදිරියට ක්‍රියාත්මක වන ආණ්ඩු තුළින් මේක

[ගරු රවි කරුණානායක මහතා]

අනිවාර්යයෙන්ම ඉටු කළ යුතු දෙයක් ලෙස මම පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටින බවට. ඔබතුමා අපේ එක්සත් ජාතික පක්ෂයෙන් ඇහුවා පක්ෂයේ ස්ථාවරය මොකක්ද කියලා. අපි 1977 දී විධායක ජනාධිපති ධුරය ගෙනාවා තමයි. ඒ අහිතකර බලතල එක් පුද්ගලයෙකු -චන්ද්‍රිකා කුමාරතුංග වන්න පුළුවන්, මහින්ද රාජපක්ෂ වන්න පුළුවන්- අරගෙන මේ කටයුතු කරලා තිබෙන ආකාරය රටට කිසි සේත්ම ගැළපෙන්නේ නැති නිසා තමයි විධායක ජනාධිපති ක්‍රමය ගෙනාපු අපි කිව්වේ මේක නිවැරැදි කරන්න ඕනෑය කියලා. ජනතාව තුළින් අපි හෙට බලයට ආවාම පළමුවෙන්ම කරන්නේ විධායක ජනාධිපති ධුරය අහෝසි කරලා ඒ බලතල පාර්ලිමේන්තුව තුළට ගෙනෙන එකයි. ඒක මේ අවස්ථාවේදී පෞද්ගලික මන්ත්‍රීවරයෙකු ඉදිරිපත් කරන යෝජනාවක් හැටියට නොවෙයි, අපේ පක්ෂය අරගෙන තිබෙන ස්ථාවරයක් හැටියට මේ අවස්ථාවේදී හෙළිදරවු කරනවා.

ඒ විතරක් නොවෙයි. අපි 2010 ජනාධිපති ධුරයට තරග කරන අවස්ථාවේදී පොදු අපේක්ෂකයකු ඉදිරිපත් කළා. ඒ ඉදිරිපත් කරපු අවස්ථාවෙත් අපි බොහොම සෘජුව සියලුම පක්ෂ එකතු වෙලා කිව්වේ අපි විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා, ජනාධිපති සහ අගමැති කිසි සේත්ම ඇමති ධුරයක් ලබා ගන්නේ නැහැ කියායි. ඉතින් ආණ්ඩුව මෙවැනි දේවල් කියවා තේරුම් නොගැනීම අපේ තිබෙන ප්‍රශ්නයක් නොවෙයි ඒ අයට තිබෙන ප්‍රශ්නයක් ලෙසයි මම මේ අවස්ථාවේදී මතක් කරන්නේ.

ගරු කථානායකතුමනි, මෙය යහ පාලනය සම්බන්ධයෙන් ගෙනාපු යෝජනාවක්. අපට තිබෙන එකම දේ තමයි -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
රීති ප්‍රශ්නයක්. ගරු අස්වර් මන්ත්‍රීතුමා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Hon. Speaker, the Hon. Member says that the President cannot hold any portfolio which is in contravention of Article 44 (2) of the Constitution. Sir, it very clearly states, I quote:

> "The President may assign to himself any subject or function and shall remain in charge of any subject or function not assigned to any Minister under the provisions of paragraph (1)……"

Therefore, Sir, even in India, the President is holding portfolios. In Sri Lanka, from the time of the Rt. Hon. D.S. Senanayake, we had the Executive Prime Minister. But, here Sir, this Motion has been moved in violation of Article 44(2) of Chapter VIII of the Constitution which allows the President to hold any portfolio. Although you have debated it, - [*Interruption.*]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ පිළිබඳව මා සොයන්නම්. රවි කරුණානායක මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ සම්බන්ධයෙන් එතුමා කිව්වා ඉන්දියාවේ ජනාධිපති ගැන. ඉන්දියාවේ ජනාධිපති විධායක ජනාධිපති කෙනෙක් නොවෙයි. මා දන්නේ නැහැ මොනවාද මේ කථා කරන්නේ කියලා. අගමැතිට වෙනත් තනතුරක් නැහැ. යෝජනාව ඉදිරිපත් කරලා අපි කිව්වේ ඒ සම්බන්ධයෙන් තමයි. ජනාධිපතිතුමාට රටේ විශාල කාර්ය භාරයක් කරන්න තිබෙනවා. එම නිසා ඇමති ධුරයක් අරගෙන මොනවාද කරන්නේ? මෙය යහ පාලනය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන යෝජනාවක්.

ඒ විතරක් නොවෙයි. ඡන්දෙ කාලයේ විතරක් මේ ගැන කථා කරලා ඡන්දයට පස්සේ මේවා ගැන අමතක කරන එක තමයි අපරාධය. 1995 චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය මේක කිව්වා. 2000 ජනාධිපති ධුරයට තරග කරන කොටත් මේ අදහසම යොමු කළා. ඊට පස්සේ 2005 සහ 2010 ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ සියලුම ජනාධිපති අපේක්ෂකයින් මෙවැනි අදහස් ඉදිරිපත් කරලා තමයි අද මේ වාගේ තත්ත්වයකට ඇවිල්ලා තිබෙන්නේ. දැන් මා නිදසුනක් ගන්නම්. [බාධා කිරීම්] නිදසුනක් ගන්නේ යහ පාලනය තුළින් - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ කථාව අවසන් කළොත් හොඳයි. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
යහ පාලනය තුළින් මා නිදසුනක් ගන්නම්. [බාධා කිරීම්] අද විධායක ජනාධිපති තමයි රටේ මුදල් ඇමති. රටේ මුදල් ඇමති තමයි අද මහ බැංකුවේ පරිපාලනය ගෙන යන්නේ. මහ බැංකුව අධීක්ෂණ කටයුතු කරනවා. අද මූල්‍ය ආයතන ගණනාවක් කඩා වැටිලා තිබෙනවා. මේ කඩා වැටීම සම්බන්ධයෙන් වග කියන්නේ කවුද? මුදල් ඇමතිද? විධායක ජනාධිපතිද? [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මා නිවැරැදි කිරීමක් කරන්න කැමැතියි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් ඒ සම්බන්ධයෙන් තමයි, ඊට වඩා හුහක් ශුභදායී - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
යෝජනාවට තිබෙන කාලය අවසානයි. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මේ අසත්‍ය කියන්නේ. භාගයක් කියන්නේ අසත්‍ය. අවබෝධයක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන අවබෝධයක් නැහැ. ප්‍රජාචාරය ඉගෙන ගෙන නැහැ. සදාචාරය ඉගෙන ගෙනත් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන් අවස්ථාවක් මේ. ඒ වාගේම තමයි, -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොනවාද මේ කියන්නේ? ඩී.එස්. සේනානායක හිටපු අගමැතිතුමා, ඩඩ්ලි සේනානායක හිටපු අගමැතිතුමා, සර් ජෝන් කොතලාවල හිටපු අගමැතිතුමා -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකද මේ කුලප්පු වෙලා තිබෙන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ හැම අගමැතිවරයෙක්ම විවිධ අමාත්‍යාංශවල තනතුරු දැරුවා. මොනවාද මේ කථා කරන බයිලා? මේකද අලුත් බයිලාව? රනිල් වික්‍රමසිංහ මහත්මයාට සූට් එක විතරද ඉතිරි කරන්න ඕනෑ? ඒකද කියන්නේ? අගමැති කියලා සූට් එක විතරද අඳින්න ඕනෑ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මෙය එතුමාගේ අදහසක් පමණයි. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
රටේ විධායක ජනාධිපතිතුමා තමයි මුදල් ඇමති. මුදල් ඇමතිතුමා මහ බැංකුව හරහා වාණිජ බැංකුවලට අධ්‍යක්ෂවරුන් පත් කිරීමක් කරලා තිබෙනවා. [බාධා කිරීම්] මේ අධ්‍යක්ෂවරුන් පත් කරන කොට - [බාධා කිරීම්] අද කොමර්ෂල් බැංකුවට පත් කරලා තිබෙනවා සුදුසු නැති පුද්ගලයෙක්. [බාධා කිරීම්] මේ සම්බන්ධයෙන් කවුද වග කියන්න අවශ්‍ය වන්නේ? [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. කාලය අවසන්. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද යෝජනාවට සභාව එකඟද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, අපි විරුද්ධයි. මෙය ප්‍රතික්ෂේප කරනවා. එතුමාට එතුමාගේ පක්ෂයේ මන්ත්‍රීවරුත් නැහැ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. සභාව එකඟ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එවැනි කටයුත්තක් නැවැත්වීම තුළින් යහ පාලනයට තිතක් තියලා තිබෙන්නේ. කිසිම ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීම්]

***ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.***
*வினா விடுக்கப்பட்டு நிராகரிக்கப்பட்டது.*
*Question put, and negatived.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් අපි යනවා දෙවන යෝජනාවට. දෙවන යෝජනාව ගරු රවි කරුණානායක මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
What is your point of Order?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරයකු යෝජනාවක් ඉදිරිපත් කරන කොට කරුණාකරලා අනෙක් අයට අහ ගෙන ඉන්න කියන්න. [බාධා කිරීම්] ඔක්කෝම එක පාරටම නැඟිටලා කෑ ගහලා, මේකට බාධා කරලා මේක නතර කරන්න බැහැ. [බාධා කිරීම්] පස්සේ විරුද්ධ වෙන්න පුළුවන්. නමුත් මෙතුමා කථා කරන කොට මේ සියලු දෙනා නැඟිටලා කෑ ගහනවා. බූමි තෙල් ගෑවිච්ච ගැරඬි වාගෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ හොඳ අදහසක්. එතුමාත් ඒ විධියටම කටයුතු කරාවිය කියලා අපි බලාපොරොත්තු වනවා. අනෙක් අයත් ඒ විධියට කටයුතු කරන්න. දෙවන යෝජනාව ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE), රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (PAC) සහ උපදේශක කාරක සභාවල සියලුම රැස්වීම්වලට සහභාගි වීමට මාධ්‍යවේදීන්ට අවසර ලබා දීම

அரசாங்கப் பொறுப்புமுயற்சிகள் பற்றிய குழு (COPE), அரசாங்கக் கணக்குக் குழு (PAC) மற்றும் ஆலோசனைக் குழுக் கூட்டங்களில் பிரசன்ன மாயிருக்க ஊடகவியலாளர்களுக்கு அனுமதியளித்தல்

GRANTING PERMISSION TO JOURNALISTS TO ATTEND ALL MEETINGS HELD UNDER COMMITTEE ON PUBLIC ENTERPRISES (COPE), PUBLIC ACCOUNTS COMMITTEE (PAC) AND CONSULTATIVE COMMITTEES

[අ. භා. 2.22]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සහ උපදේශක කාරක සභාවල සියලුම රැස්වීම්වලට මාධ්‍යවේදීන්ගේ සහභාගිත්වය තුළින් එම සාකච්ඡා වඩාත් ඵලදායී, අර්ථවත් හා විනිවිදභාවයකින් යුක්ත වනු ඇති බැවින් මාධ්‍යවේදීන්ට එම රැස්වීම්වලට සහභාගි වීමට අවසර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

[ගරු රවි කරුණානායක මහතා]

ගරු කථානායකතුමනි, අවුරුදු 18ක් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජිකයකු හැටියට කටයුතු කරලා මට පෙනී ගොස් තිබෙනවා ඒ කාරක සභාව හරහා ඉතාමත් වැදගත් කාර්ය භාරයක් රට වෙනුවෙන් කරන්න පුළුවන්ය කියා. මීට පෙර මේ සම්බන්ධයෙන් යෝජනා ගණනාවක් මේ සභාවට ඉදිරිපත් වුණත් ඒ යෝජනා එතැනින්ම නැවතුණා. ඒකේ තිබෙන හරය රටේ අභිවෘද්ධියට පාවිච්චි කරන්නේ නැහැයි කියන එක මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු වශයෙන් ඉඳලා අද කථානායක ධුරය දරා සිටිනවා. මේ අවස්ථාවේදී අපට අවශ්‍ය වන්නේ කුමක්ද? අද ගරු මන්ත්‍රීවරු ගණනාවක් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට සහභාගි වෙනවා. ඒ ඉදිරිපත් වෙන්නේ නිර්දේශපාලනීය කටයුත්තක් කරන්නයි. හැබැයි ඒ තුළ සාකච්ඡා කරන දේ සීමා වෙන්නේ එම කමිටුව පවත්වන කාරක සභා කාමරයට විතරයි. ඒ සම්බන්ධයෙන් අපේ නොයෙක් යෝජනා සහ reports ඉදිරිපත් කරලා තිබෙනවා. මා ඉස්සෙල්ලාම අවධානයට යොමු කරනවා ගරු ජෝන් අමරතුංග මැතිතුමා 1999 දී ඉදිරිපත් කරන ලද වාර්තාව. ඊට පස්සේ හිටපු අමාත්‍ය ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමා, ගරු රෝහිත බෝගොල්ලාගම මැතිතුමා, ගරු රවුෆ් හකීම් මැතිතුමා, ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා සහ ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමා අදහස් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ අය බොහොම වැදගත් නිර්දේශපාලනීය අදහස් ටිකක් ඉදිරිපත් කරලා තිබෙනවාය කියන එක තමයි අපි මේ අවස්ථාවේදී කියන්නේ.

ඒ වාගේම අපට අවශ්‍ය වන්නේ ජනමාධ්‍යට මෙවැනි අවස්ථාවකට එන්න අවස්ථාව සලසා දීමයි. මොකද, ඒක ඇතුළේ සාකච්ඡා කරන ප්‍රශ්න සාමාන්‍යයෙන් මේ රටේ ජනතාව දන්නා ප්‍රශ්න. එම නිසා මෙවැනි අවස්ථාවන් ජනමාධ්‍යටත් විවෘත කරන්න පුළුවන් නම් මා හිතන විධියට රටේ ආර්ථිකය සම්බන්ධයෙන් විතරක් නොවෙයි පාර්ලිමේන්තුවේ කටයුතුවලදීත් ඉදිරි දැක්මක් සහිතව වැඩ කරන්න පුළුවන් අවස්ථාවක් ඇති වෙනවා. මොකද, යම් විධියේ වැරැද්දක් වෙලා තිබෙනවා නම් ඒක ජනමාධ්‍ය තුළින් ප්‍රසිද්ධ කරන්න පුළුවන්. හැබැයි යම් අවස්ථාවක රටේ අභිවෘද්ධියට ප්‍රශ්නයක් ඇති වන අවස්ථාවක් තිබෙනවා නම් ඒ අවස්ථාවේදී සභාපතිට පුළුවන් මාධ්‍යයෙන් එළියට ගිහිල්ලා කටයුතු කරන්න. නමුත් සමස්තයක් වශයෙන් එසේ කළ යුතු වන්නේ නැහැ. දැන් බලන්න, පාර්ලිමේන්තුවේ අපි කථා කරන ඕනෑම අවස්ථාවක ජනමාධ්‍යවලින් පැමිණ සිටිනවා. වෙනත් ප්‍රවෘත්ති සාකච්ඡාවක් තිබෙනවා නම් ඒ අයට එන්නය කියනවා. ඒ අවස්ථාවල මෙවැනි දේවල් අනිවාර්යයෙන්ම සාකච්ඡා කරලා තිබෙනවා. නිදසුනක් වශයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අපි හෙජින් සූදුව සම්බන්ධයෙන් සාකච්ඡා කළා. එදා ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ඇවිල්ලා අපිත් එක්ක ඒ ගැන සාකච්ඡා කරලා බොහොම තියුණු තත්ත්වයකට ගෙනැත් කරුණු පෙන්වා දුන්නා. එදා ආපු සභාපතිවරුන්, මහ බැංකුවෙන් ආපු කට්ටිය ඔක්කෝම පිළිගත්තා මේ රටට මේක යම් විධියකින් ප්‍රශ්නයක් ඇති වෙලා තිබුණාය කියලා. මේ ගැන මුලින්ම සාකච්ඡා කරලා මාධ්‍යයෙන් ප්‍රසිද්ධ වුණා නම් අද රටට ඇති වෙලා තිබෙන කෝටි 11,100ක විතර අවදානම් තත්ත්වය නැති වෙන්න කටයුතු කරන්න තිබුණා. නමුත් මේක මාධ්‍ය තුළින් එළියට යන්න අවස්ථාව ලැබුණේ නැහැ. එතැන නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට මාධ්‍යට කථා කරන්න කිසි සේත්ම අවසරයක් නැහැ. ඒ නිසා මම මේ අවස්ථාවේදී ඉතාමත් ඕනෑකමින් මේ කාරණය කියනවා. විනිවිදභාවයක් තිබෙනවා නම් අපට මෙය හෙළිදරවු කිරීමට, ජනමාධ්‍යට විවෘත කිරීමට අවස්ථාව ලබා දෙන්න කියන යෝජනාවයි මම ඉදිරිපත් කරන්නේ. අවුරුදු තුනකට ඉස්සෙල්ලා හෙජින් සූදුව ගැන කථා කළා. ඒක සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා දැන් දවස් දෙකකට ඉස්සෙල්ලාත් පාර්ලිමේන්තුවේදී කිව්වා. අපි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මේවා ගැන කථා කළා. ඒ කථා කරන අවස්ථාවේදී ඒ ගොල්ලන් පිළිගත්තා කරපු දේ වැරදියි කියලා. ඒ වැරැද්ද නිවැරදි කරන්න තිබුණා. ජනමාධ්‍ය තුළින් මේ කාරණය ප්‍රසිද්ධ වුණා නම් මේක ජනතාව තුළට යනවා. එතකොට සංවාදයක් ඇති වෙන්න ඉඩ තිබුණා. ඒ තුළින් වැරැද්ද නිවැරදි කරන්න අවස්ථාව තිබුණාය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ඒ වාගේම අපි දකුණු අධිවේගී මාර්ගය සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී කථා කළා. මමත්, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත්, ඉරාන් වික්‍රමරත්න මැතිතුමාත්, විජයදාස රාජපක්ෂ මැතිතුමාත් ඉන්න අවස්ථාවක මේක ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේදී අපි මේ ගිණුම් ගැන කථා කළා. ඒ ගැන කථා කරන අවස්ථාවේදී අපට පෙනුණා, ඉතාමත් අධික වියදමක් දරලා මෑත කාලයේදී මේ සංවර්ධනය ඉදිරියට ගෙන යන්න කටයුතු කර ගෙන යනවාය කියලා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මම රීති ප්‍රශ්නයක් මතු කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
රීති ප්‍රශ්නයක්. ගරු ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඔබතුමාගේ අවසරය පිට රීති ප්‍රශ්නයක් මතු කරන්නට කැමැතියි. මේ උත්සාහය මේ සභාව පාලනය කරන රීති සංශෝධනය කිරීමටයි. ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් මේ රීති සංශෝධනය කිරීම සඳහා විශේෂ කාරක සභාවක් -කමිටුවක්- පිහිටුවා තිබෙනවා. ඒ නිසා මේ යෝජනාව ඉදිරිපත් කළ යුත්තේ මේ සභාවට නොවෙයි. එම යෝජනාව ඉදිරිපත් කළ යුත්තේ ඔබතුමා මුලසුන දරන රීති සංශෝධනය කරන කාරක සභාවටයි කියන ටික මම ඉතාම වුවමනාවෙන් සහ ඉතාම ගෞරවයෙන් කියනවා. ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් තිබෙන කමිටුවට කරන අභියෝගයක් හැටියටයි අපි මෙය දකින්නේ කියන ටික මතක් කරන්නට ඕනෑ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අඬ අඬා කථා කරනවා. උත්තර දෙන්න බැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. මේ යෝජනාව ගැන අදහස් දක්වන්න පුළුවන්. ඉන් පසුව ඒ කමිටුවට මේ සියලු දෙනාගේම අදහස් ගන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. අන්න ඒක තමයි විනිවිදභාවය කියන්නේ. මන්ත්‍රීවරයෙක් කොයි පැත්තේ හිටියත් යම් විධියකට රටේ ආර්ථිකයට ප්‍රශ්නයක් ඇති වන විධියට කටයුතු කිරීම කිසි සේත්ම අදහස් කරන්නේ නැහැ. එහෙම නම් විනිවිදභාවයක් ඇති කරන්න සියලුම මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත ඇති. ඒ කැමැත්ත නිසා තමයි මේ සම්බන්ධයෙන් මාධ්‍යට ඇවිල්ලා එතැන වන දේ වාර්තා කරන්න අවස්ථාවක් ලබා දෙන්න ඕනෑ වන්නේ. දැන් මම අධිවේගී මාර්ග සම්බන්ධයෙන් කිව්වා. කටුනායක අධිවේගී මාර්ගයේ 1999 වර්ෂයේ ඇස්තමේන්තු වියදම රුපියල් මිලියන 2,100ක් ලෙස වාර්තා වෙලා තිබෙනවා කියන එක දැන් දවස් දෙකකට ඉස්සෙල්ලා වාචික ප්‍රශ්නවලට උත්තරයක් ලෙස ලැබුණා. ඉන් පසුව 2001 වර්ෂයේ මේක රුපියල් මිලියන 5,000කට වැඩි වුණා. ඉන් පසුව 2003 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ මේ සම්පූර්ණ ගිවිසුම අහෝසි කරලා දැම්මා. ඉන් පසුව 2006 දී ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමා කටුනායක අධිවේගී මාර්ගය ඉදි කරන්න රුපියල් මිලියන 12,800ක් යනවා කියලා වාර්තා කළා. ඉන් පසුව දැන් මේක නිම කරන්න රුපියල් මිලියන 32,800ක් යනවා කියලා නිර්මල කොතලාවල නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාව තුළින් අපට පෙනී ගියා. අපි මේක ගැන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී කථා කළා. ඒ කථා කරන අවස්ථාවේදී විනිවිදභාවයකින් යුතුව, මාධ්‍යට කථා කරලා මේ ගැන පෙන්වන්න ඉඩ තිබුණා නම් අවුරුදු දහයකින් මේක දහ අට ගුණයකින් පමණ වැඩි වන ආකාරය අපට ජනතාවට පෙන්වන්න ඉඩ තිබුණා. මේක වසන් කරන්න හදන්නේ ඇයි? මාධ්‍යයි මේකයි අතර කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ අවස්ථාවේදී මම කිව්වා වාගේ යම් විධියකින් රටේ අභිවෘද්ධියට ප්‍රශ්නයක් තිබෙනවා නම් එවැනි අවස්ථාවලදී සභාපතිට ඒ අය එළියට යවන්න පුළුවන්. නමුත් සමස්තයක් වශයෙන් අපි මේක විවෘත කරන එක හොඳයි කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම තමයි මහ බැංකුව. අපි 2005 දී මහ බැංකුවේ අධිපති සහ ඒ සියලුම නිලතල දරන පුද්ගලයන් කැඳෙව්වා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී අපි ඒ අයගෙන් ප්‍රශ්න කරලා, විමර්ශනයට ලක් කරන අවස්ථාවේදී මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබුණා. මේ සල්ලි එකතු කරන ආයතන මහ බැංකුවේ අධීක්ෂණය යටතේද පවත්වා ගෙන යන්නේ කියලා අපි ප්‍රශ්න ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේදී ඔවුන් පොරොන්දුවක් දුන්නා. "අපට මාස හයක් දෙන්න, අපි ඒ අධීක්ෂණය තුළින් මේක නිවැරදි කරලා ජනතාවගෙන් එකතු කරලා තිබෙන සල්ලි ආරක්ෂා කරනවා" කියලා කිව්වා. මාස හයක් යන්න ඉස්සෙල්ලා මොනවාද වුණේ? සියලු මූල්‍ය ආයතන කඩා වැටෙන්න පටන් ගත්තා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු කථානායකතුමනි, සභාව නොමඟ යවනවා. ලංකාවේ එකදු ලියා පදිංචි මූල්‍ය ආයතනයක් හෝ බැංකුවක් කඩා වැටිලා නැහැ. මේ සක්විති, Golden Key සහ අනෙකුත්-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කාලය යනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

සක්විති සහ දඩුවම් මුදලාලි ලියා පදිංචි වෙලා නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මේ යෝජනාව ස්ථිර කළාට පසුව ඔබතුමාට කථා කරන්න පුළුවන්. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, බලන්න මේ නොදැනුවත්කම තිබෙන්නේ. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

සභාව නොමඟ යවන්න බැහැ. මම හිතන්නේ තමුන්නාන්සේලාට පුළුවන් හොඳ පිළිතුරක් දෙන්න. මේ පිළිබඳව හොඳ පිළිතුරක් දෙන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී එදා ප්‍රශ්න ඇහුවා. මහ බැංකුවේ අධිපතිගෙන් ප්‍රශ්න ඇහුවාම එදා මොනවාද වුණේ? ලියා පදිංචි වුණේ නැත්නම් ඒක මහ බැංකුවේ වැරැද්ද. ඒ සල්ලි එකතු කරන අවස්ථාවේ ඇයි ඒකට ඉඩ දුන්නේ? මෙන්න මේක මාධ්‍ය තුළින් හෙළිදරවු කළා නම් අද සක්විති, Golden Key වාගේ කට්ටියගේ ප්‍රශ්න උද්ගත වෙන්නේ නැහැ. මේ සම්බන්ධව තමයි අද මම මේ පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරන්නේ. නොදැනුවත්කම යටපත් කිරීම නොව ඒක ජනතාවට පෙන්වා දීලා වැරැද්ද නිවැරදි කරලා කටයුතු කරන්න ඕනෑ කියන අදහස මා කාරුණිකව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා යෝජනාව ස්ථිර කරන්න. ඔබතුමා වෙනුවෙන් විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ. භා. 2.31]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවට, මුළු රටටම බලපාන අතිශයින්ම වැදගත් යෝජනාවක් තමයි ගෙනාවේ. මේ සඳහා අපට ස්ථාවර නියෝග සංශෝධනය කරන්න වෙයි. අපේ ස්ථාවර නියෝග අනුව මේ කාරක සභාවලට මාධ්‍යවේදීන්ට එන්න ඉඩ දෙන්නේ නැහැ. නමුත් මම දන්නා කාලයේ ඉඳන්, මා ඒ කාරක සභාවල සභාපති හැටියට හිටපු කාලයේ ඉඳන් සඳහන් කළා මාධ්‍යවේදීන්ව මේ කාරක සභාවලට ගෙනැල්ලා වාර්තා කරන්න ඉඩ දෙන්න කියලා. අපි ඒ ආදර්ශය ගත්තේ ඇමෙරිකා එක්සත් ජනපදයෙන්. අපේ COPE එක ඒ කාලයේ කොංග්‍රස් එක අධ්‍යයනය කරන්න ගියා. එතැනදී බොහොම පැහැදිලිව පෙනුණා මොන ආකාරයටද මේ කමිටුවල වැඩ කරන්නේ, ඒ ගැන රටට ප්‍රසිද්ධියක් දෙන්නේ කියලා. මාධ්‍යවේදීන්ට ආරාධනා කරලා ඒවායේ සටහන් අරගෙන එදාම ඒවා ප්‍රසිද්ධ කරන්න ඉඩ දීලා තිබුණා. ඒ තුළින් මේ සභාවලට ගිය, එහෙම නැත්නම් රට පාලනය කළ මැති ඇමතිවරු, නිලධාරින් පරිස්සම් වුණා. මොකද, ඒ අයට බේරිලා යන්න

[ගරු ජෝන් අමරතුංග මහතා]

අවස්ථාවක් නැහැ, ඒ කටයුතුවලට ප්‍රසිද්ධියක් ලැබෙන නිසා. මේ කමිටු දෙකේ වාර්තා හදලා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පසුව තමයි මාධ්‍යවේදීන්ට ඒ ගැන ප්‍රකාශයක් කරන්න පුළුවන් වන්නේ. එතකොට අශ්වයා ඉස්තාලෙන් පැනලා ගිහින් ඉවරයි. සමහර විට ඒ නිලධාරි මහත්වරු ආ ගිය අතක් නැහැ. එහෙම නැත්නම් ඒ මැති ඇමතිවරු වෙනස් වෙලා. ඒක නිසා තමයි මාධ්‍යවේදීන්ට මේ කමිටුවලට ඇවිල්ලා කරුණු වාර්තා කරන්න අවස්ථාව ඉල්ලන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක්. ගරු ජෝන් අමරතුංග මැතිතුමා කලින් සඳහන් කළා, COPE එකේදී, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී අහන සාක්ෂි, ප්‍රශ්න ගැන අවසාන වාර්තාවක් එන තුරු මේ සභාවේ අහන්න බැහැ කියලා. හරි. ඒක තමයි අපිත් දරන ස්ථාවරය. සභිකයෙක් හැටියට හිටියාට එතැන කෙරෙන දේවල් මෙතැනට ඇවිත් මේ සභාවේ කියන්න අයිතියක් නැහැ. මේක තමයි මතු කරපු රීති ප්‍රශ්නය. මූල්‍ය ආයතන ගැන රවි කරුණානායක මැතිතුමා සඳහන් කළේ COPE එකේදී එතුමා ඒ ආයතනවලින් ප්‍රශ්න කළා කියන එකයි. එතකොට මෙහෙම කරන්න බැහැ නේ. [බාධා කිරීමක්] You just stated that. I fully agree with you. I just want to bring it to the notice of the Hon. Speaker, whatever that was mentioned, whether it is from the PAC or COPE report, should be expunged. It is not fair for an Hon. Member, who is a Member of the COPE, knowing the cross-examination or the inquiry going on, to make reference in the House before the report comes. It is not fair.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ රීති ප්‍රශ්නය ගැන සොයා බලා ස්ථාවර නියෝගවලට පටහැනි යමක් තිබුණොත් එය කපා හැරීමට කටයුතු කරනවා. [බාධා කිරීම්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

නැහැ, නැහැ. ගරු කථානායකතුමනි, ඒ වාර්තා මේ සභාවට ගෙනැල්ලා සභාවෙන් ඒවා නිකුත් කරලා තිබෙනවා, ප්‍රසිද්ධ කරන්න. පරණ එකක් ගැන ඒ කිව්වේ. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම දන්නේ නැහැ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා නින්දෙන් නැඟිටලා කතා කළාද කියන එක. මම වාර්තා පහක් ඉදිරිපත් කළා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි. මම ඒ ගැන සොයා බලන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒවා ඒ කමිටුවලට අදාළ වාර්තා. මෙතැනදී ඒවා කතා කරන්න බැරි නම් කොහේදී කතා කරන්නද? ලකුණු දමා ගන්න නිකම් බොරුවට මේකට මැදිහත් වෙන්න එපා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි. මම ඒ ගැන සොයා බලා පටහැනි යමක් තිබේ නම් ඒවා ඉවත් කිරීමට කටයුතු කරනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, එවැනි සාකච්ඡාවක් COPE කමිටුවේ හෝ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කෙරෙනවා නම් ඒක ගැන මේ සභාවේ කතා කරන්න බැහැ කියනවා. නමුත් සාකච්ඡා කරලා, වාර්තා හදලා, මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පසුව එන කරුණු ගැන තමයි මෙතුමා කතා කළේ. අපි කියන්නේ ඒක නොවෙයි. අපි කියන්නේ එතකොට මේක ප්‍රමාද වැඩියි කියන එකයි. එදිනෙදා වෙන සිද්ධීන් හැම දෙයක්ම ජනතාවට දැන ගන්න අවස්ථාවක් සලසා දෙන්න පුළුවන් වෙන්න ඕනෑ. මේකේ මූලික අදහස, නිලධාරි මහත්වරු වැරදි කරනවා නම්, මැති ඇමතිවරු වංචා කරනවා නම් ඒ ගැන ජනතාවට දැන ගන්න සලස්වන එකයි. මේක අපේ රටේ විතරක් නොවෙයි ඇමෙරිකාවේත් බොහොම ප්‍රසිද්ධියේම බොහොම ලස්සණට කෙරෙනවා; ප්‍රංශයේ කෙරෙනවා; යුරෝපීය රටවල්වල කෙරෙනවා. ඉතින් මේක ලංකාවේ කරන්න බැරි ඇයි කියන ප්‍රශ්නය තමයි මෙතුමා මේ සභාවට ඉදිරිපත් කරන්නේ. අපේ ව්‍යවස්ථාවේ තිබෙනවා නම් මූල්‍ය පාලනය පාර්ලිමේන්තුව සතුයි කියලා, ඒ කාර්ය භාරය හරි හැටි ඉෂ්ට කරන්න, මේ කමිටු දෙකේ කටයුතු පිළිබඳව ජනතාව දැනුවත් කරන්න මාධ්‍යවේදීන්ට එන්න අවස්ථාව ලබා දිය යුතුයි කියන යෝජනාව ස්ථිර කරමින් මම වාඩි වෙනවා. ස්තුතියි.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ. භා. 2.36]

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ගරු කථානායකතුමනි, රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ මෙම යෝජනාව සම්බන්ධයෙන් කරුණු දැක්වීම පටන් ගන්නයි මම උත්සාහ කරන්නේ. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මේ සභා ගර්භයේදී තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය ආරක්ෂා කර දීමට ඔබතුමා දරන වෑයම අපේ මේ සියලු මන්ත්‍රීවරුන්ම අනවශ්‍ය ලෙස පාවිච්චි කරන්න ඕනෑ නැහැ කියලා මම හිතනවා. ගරු කථානායකතුමනි, පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ යෝජනාවක් ඉදිරිපත් කරන කොට අපි කල්පනාකාරි වෙන්න ඕනෑ, ඒ යෝජනාව ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් හිතේ තියා ගෙන ඒ යෝජනාව ඉදිරිපත් කරන්න.

උදාහරණයක් හැටියට මේ යෝජනාව ගත්තොත්, දැනටම ඔබතුමාගේ සභාපතිත්වයෙන් යුක්ත කමිටුවක් සලකා බලා ගෙන යනවා, මෙම යෝජනාවට ඉඩ දෙන්න පුළුවන් ආකාරයට කුමන ස්ථාවර නියෝගද වෙනස් කළ යුතු වන්නේ කියලා. යම් කිසි විධියකින් මේ කටයුතු මාධ්‍යට විවෘත කළොත් ඒ සභාව ඉදිරියේ මතු වන කාරණාවලදී යම් යම් නිලධාරින්ට සහ පුද්ගලයන්ට සිදු වන්නට පුළුවන් අසාධාරණයත් සැලකිල්ලට ගනිමින් ඒ විවෘත කිරීම කරන්නට ඕනෑය කියන එක පිළිබඳව කල්පනා කර බැලීමට තමයි ඔබතුමාගේ සභාපතිත්වයෙන් යුක්ත කමිටුවක් පත් කර තිබෙන්නේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒක අදාළ -

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
රවි කරුණානායක මන්ත්‍රීතුමා කථා කරන කොට බාධා කරද්දී, අපි බාධාකාරයෝ. මම කථා කරන කොට ඔබතුමා බාධා කරද්දී, ඔබතුමා බාධා නොකරන්නෙක්?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
තමුන්නාන්සේ කියන එකට නේ මම සහයෝගය දෙන්නේ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු කථානායකතුමනි, මීට පෙර ගෙනාපු යෝජනාව ගනිමු. මීට පෙර ගෙනාපු යෝජනාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් හරහාම පැමිණිය යුතුයි නේ. මීට පෙර ගෙනාපු යෝජනාවේ තිබුණේ, ජනාධිපතිතුමා සහ අග්‍රාමාත්‍යතුමා අමාත්‍ය ධුරයන් දරන්න බැහැ කියන එක. හැබැයි හිටපු ජනාධිපතිතුමිය විසින් ආරක්ෂක ඇමැතිකම වෙනත් ඇමතිවරයෙකුට පැවරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා, ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපිට එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විජයදාස රාජපක්ෂ මහත්මයා තර්ක කරලා, හිටපු අග විනිසුරු සරත් එන්. ද සිල්වා මහත්මයා දීපු නඩු තීන්දුවකුත් තිබෙනවා, ආරක්ෂක ඇමතිකම වෙනත් කෙනෙකුට පැවරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි කියලා දීපු තීන්දුවක් තිබෙනවා. එතකොට මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කරන ශ්‍රේෂ්ඨාධිකරණය පවා තීන්දු කරලා තිබෙනවා, - [බාධා කිරීමක්] සරත් එන්. ද සිල්වා මහත්මයා මෝඩයෙක් නොවෙයි නේ. මෝඩයෙක්ද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අපි දන්නේ නැහැ. අපි නොවෙයි පත් කළේ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඒක තමයි, මෝඩයෙක් වෙන්න බැහැ නේ. එතකොට, සරත් එන්. ද සිල්වා මහත්මයා දීපු තීන්දුවක් තිබෙනවා, ආරක්ෂක ඇමතිකම ජනාධිපතිවරයෙක් වෙනත් කෙනෙකුට පැවරුවොත් ඒක නීත්‍යානුකූල නැහැ, නීති විරෝධීයි කියලා. ඒ අනුව තමයි තිලක් මාරපන මහත්මයාට දුන්නු ආරක්ෂක ඇමතිකම නැවත පවරා ගත්තේ. ඒ නිසා අපි පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනාවක් ගෙනෙන කොට, ඒක ගෙන එන්නන් වාලේ ගෙන එන්නේ නැතිව, සද්භාවයෙන් එය ක්‍රියාත්මක කිරීමේ වුවමනාව තිබෙනවා නම් ඒ අදාළ තැන් ආමන්ත්‍රණය කළ යුතුයි. ඒ යෝජනාව පැමිණිය යුතුව තිබුණේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතුය කියලායි. මෙතැනට පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනාවක් හැටියට ගෙනල්ලා ඒ කාරණය ක්‍රියාත්මක කරන්න බැහැ. ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි.

කථානායකවරයා හැටියට ඔබතුමාට මා ඉතාම ගරු කරනවා. ඔබතුමා ඉතාම අපක්ෂපාතීව නිතරම උත්සාහ කරනවා ගරු සභාවේ දෙපැත්තේම සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ භාෂණයේ නිදහස -කථා කිරීමේ නිදහස- ලබා දෙන්න. හැබැයි එයින් ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ හෝ අපි කවුරුත් අයුතු ලෙස ප්‍රයෝජන ගැනීම මේ ගරු සභාවේ උන්නතියට හොඳක් වන කාරණයක් වන්නේ නැහැ.

දැන් මේ අද ඉදිරිපත් කරන යෝජනාව ගත්තොත්, COPE එකේ කටයුතු මාධ්‍යට විවෘත කිරීම සම්බන්ධව හොඳ සහ නරක දෙකම තිබෙනවා. ඉතින් ගරු කථානායකතුමනි, ඒ යෝජනාවේ හොඳ පමණක් කථා කරන්නේ නැතිව, එහි නරක පැත්ත ගැනත් සලකා බලා, අවශ්‍ය විධියට ස්ථාවර නියෝග සංශෝධනය කරන්නට කල්පනා කරලා, ඔබතුමාම ඔබතුමාගේ සභාපතිත්වයෙන් යුතුව කමිටුවක් පත් කරලා තිබෙනවා, අවශ්‍ය විධියට ඒවා සංශෝධනය කරන්න. එහෙම නැත්නම් සිදු වන්නේ මොකක්ද? දැන් ගරු ජෝන් අමරතුංග, අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාම කිව්වා වර්තමානයේ COPE කමිටුව ඉස්සරහපිට සාකච්ඡා වන්නා වූ කාරණයක් මේ ගරු සභාවේ කථා කිරීම යෝග්‍ය නැහැ කියලා. හැබැයි එතුමා කිව්වේ මේ සභාවට ඉදිරිපත් කරපු පරණ කාරණා නම් එහෙම කථා කළාට කමක් නැහැ කියලායි. යම් කිසි විධියකට මෙය මාධ්‍යට විවෘත කළොත් මොකක්ද වන්නේ? මම මේ කියන්නේ විවෘත කළොත් තිබෙන එක නරක පැත්තක්. වර්තමානයේ COPE කමිටුවේ සාකච්ඡා වන කාරණයක් පාර්ලිමේන්තුවේවත් කථා නොකළ යුතුය කියන අපි, වර්තමානයේ සාකච්ඡා වන කාරණයක්, පාර්ලිමේන්තුවේවත් කථා නොකරන කාරණයක් මාධ්‍යට විවෘත කරලා එහෙම පිටින්ම එය මාධ්‍ය තුළ සාකච්ඡා කරන්න ඉඩ හරිනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
එහෙම නම් අපට වඩා දියුණු රටවල ඒක කරන්නේ කොහොමද?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මම මේ කියන්නේ එක පැත්තක්. ගරු කථානායකතුමනි, වර්තමානයේ COPE කමිටුවේ සාකච්ඡා වන දෙයක් මේ ගරු සභාවේවත් කථා කරන එක සදාචාරයට එකඟ නැහැ කියලා අපි පිළිගන්නවා. ඒ එක්කම අපි අනෙක් පැත්තෙන් කියනවා, මේ ගරු සභාවේවත් කථා නොකළ යුතු දෙයක් එදාම විවෘතව මාධ්‍යට දැම්මාට කමක් නැහැ කියලා. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ දෙක මැද්දේ විසඳුමක් -මැද්දක්-සොයා ගත යුතුයි. ඒ විසඳුම, ඒ මැද්ද සොයා ගන්න තමයි ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සඳහා ඔබතුමාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් පත් කර තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ යෝජනාව යැවිය යුත්තේ එතැනටයි.

මේ ගරු සභාවට මේ යෝජනා ආවාට පස්සේ ඉතාම අපක්ෂපාතීව අදහස් ප්‍රකාශ කරන්නට ඔබතුමා ඉඩ දෙනවා. හැබැයි ඔබතුමා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මේ ගරු සභාවේ සෑම මන්ත්‍රීවරයකුටම ගෞරව කරමින්, එතුමන්ලාට අදහස් ප්‍රකාශ කරන්නට දෙන අයිතිය පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

යෝජනා හරහා වැරදි විධියට භාවිත කිරීම එතරම් යෝග්‍යයි කියලා මම හිතන්නේ නැහැ. මේ සමහර යෝජනා ක්‍රියාත්මක කළ නොහැකි ඒවා. ක්‍රියාත්මක කරන්න පුළුවන් ක්‍රමවේදය පැත්තකින් තියලා ක්‍රියාත්මක කළ නොහැකි ක්‍රමවේදයක් භාවිත කිරීම, මාධ්‍යට පමණක් අදහස් ප්‍රකාශ කිරීම සඳහා ගන්නා වූ හුදු වෑයමක් ලෙසයි අපට පෙනෙන්නේ. ඒ නිසා ගරු කථානායකතුමනි, මේ පළමුවැනි යෝජනාව ගත්තත්, දෙවැනි යෝජනාව ගත්තත් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සද්භාවයෙන්ම ගෙනා යෝජනාද, එහෙම නැත්නම් නිවැරදි ක්‍රමවේදය දැන දැනත්, මෙවැනි යෝජනාවක් ගෙනාවා කියලා මාධ්‍යට ප්‍රකාශ කිරීම සඳහා පමණක්ම ගෙනා යෝජනාද කියන ප්‍රශ්නයත් මේ වෙලාවේ මට මතු වනවා.

ගරු කථානායකතුමනි, පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා ගෙන ඒමේදී ඒවා, හුදු "පටු දේශපාලන වාසි" කියන කාරණාව ඉක්මවා ගිහිල්ලා, සද්භාවයෙන්ම ක්‍රියාත්මක කරන්න අවශ්‍යතාව තිබෙනවා නම්, ඒ ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේදය ආමන්ත්‍රණය කොට ඒ යෝජනා ගෙන ඒම සුදුසුය කියලායි මම කල්පනා කරන්නේ.

COPE කමිටුව මාධ්‍යට විවෘත කිරීම පිළිබඳව පක්ෂ විපක්ෂ අදහස් තිබෙනවා. COPE කමිටුවේ දේවල් මාධ්‍යට විවෘත කිරීමේ හොඳ නරක දෙකම තිබෙනවා. මේ හොඳයි, නරකයි කියන දෙකේම මැද්දක් සොයා ගෙන ස්ථාවර නියෝග සංශෝධනය කරලා ඒ අනුව කටයුතු කරන්නේ කොහොමද කියන කාරණය ඔබතුමාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් මඟින් මේ වන විට සලකා බලමින් යනවා. එහෙම සලකා බලමින් යන කොට එයට බාධාවක් වන විධියට වෙනත් දේශපාලන පරමාර්ථ ඉස්මතු වන ආකාරයට කටයුතු කිරීම, එම යෝජනාවේ තිබෙන හොඳ පැත්ත ක්‍රියාත්මක කිරීමට ලැබෙන උපකාරයක් නොව බාධාවක් කියායි මා කල්පනා කරන්නේ. ගරු කථානායකතුමනි, ඒ නිසා පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා ඉදිරිපත් කිරීමේ දී ඔබතුමා මේ සභාවට දී තිබෙන්නා වූ අනර්ඝතම ආදර්ශය -පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන්ට තමාගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ආරක්ෂා කිරීමට ඔබතුමා දිවි හිමියෙන් බැඳී සිටින බව ආදර්ශයෙන් පෙන්වා දීම කියන කාරණය- අයුතු විධියට පාවිච්චි කිරීම යෝග්‍ය නොවේය කියා මා කල්පනා කරනවා. විශේෂයෙන්ම ගරු දයාසිරි ජයසේකර මැතිතුමාට අලුත් තනතුර - විපක්ෂයේ නියෝජ්‍ය ප්‍රධාන සංවිධායක තනතුර- ලැබුණායින් පසුවවත් ජෝන් අමරතුංග විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට අභියෝගයක් වන විධියට පළමුවැනි test එක පාස් වෙයි කියලා මම හිතුවා. නමුත් එතුමා අද පළමුවැනි test එකෙන්ම fail වුණා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පළමුවැනි test එක fail වීම සම්බන්ධයෙන් ගරු ජෝන් අමරතුංග විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා බොහොම සතුටින් ඉපිලෙමින් ඉන්නේ. බොහොම ස්තුතියි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මේ පැත්ත ප්‍රජාතන්ත්‍රවාදීයි. ඔය පැත්ත වාගේ නොවෙයි.

[අ. භා. 2.44]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ඔබතුමා කථානායක ධුරය දරන මේ කාල සීමාව තුළදීම මේ පාර්ලිමේන්තුවටත්, රටටත්, ඒ වාගේම දකුණු ආසියාවටමත් ආදර්ශයක් වෙන්න මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න ඔබතුමාට හැකියාව ලැබෙයි කියලා මා විශ්වාස කරනවා. මම එහෙම කියන්නේ, අවුරුදු 11ක් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙකු හැටියට හිටපු අත් දැකීම් එක්ක. මොකද, පාර්ලිමේන්තුවේ 225 දෙනාම නියෝජනය කරන්න මේ පාර්ලිමේන්තුව තුළින් පත් කර තිබෙන COPE එකත්, PAC එකත් ස්ථිර කාරක සභා හැටියට තමයි තිබෙන්නේ. අද අපි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා හුඟක් වෙලාවට කරන්නේ, මේ ප්‍රධාන සභාව තුළදී ඉදිරිපත් කෙරෙන යෝජනා පිළිබඳ තර්ක විතර්ක කිරීම හා අදහස් දැක්වීමයි. හැබැයි ඒ අදහස් ඵලදායී ලෙස මහ ජනතාවට හා රටට වග කියන්නේ එක්කෝ උපදේශක කාරක සභා ඇතුළේ, එහෙම නැත්නම් තේරීම් කාරක සභා ඇතුළේ, එහෙමත් නැත්නම් මෙවැනි ස්ථාවර කාරක සභා ඇතුළේ. එතැනදී තමයි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වැදගත් වෙන්නේ. මේක එක් එක් අවස්ථාවල්වල දෝලනය වෙමින් තමයි ක්‍රියාත්මක වෙන්නේ කියන එක අවුරුදු ගණනාවක් තිස්සේ අපට පෙනෙනවා.

විශේෂයෙන්ම පසු ගිය කාලයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව තුළදී අපට පුළුවන් වුණා, රටට ඉදිරිපත් කරන්න, රටේ ජනතාවට ඉදිරිපත් කරන්න, මේ උත්තරීතර පාර්ලිමේන්තුව ඇතුළෙන් රටට වැඩක් වෙනවාය කියන කාරණය. මට මතකයි, විශේෂයෙන්ම වැට් බදු වංචාව පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව කැඳවා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කරපු වෙලාවේදී ඒ සම්බන්ධ තොරතුරු විශාල වශයෙන් රටට හෙළිදරවු වුණු බව. ගෙවපු ආදායම් බදු පිළිබඳ වංචා සිද්ධ වෙලා තිබෙන බව එහිදී ඔප්පු වුණා. ඒ විතරක් නොවෙයි. නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ජයවර්ධනපුර රෝහල, රක්ෂණ සංස්ථාව, ඒ වාගේම රටේ මුළුමහත් බැංකු පද්ධතිය හා ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳව යම් යම් කාරණා මෙහිදී අනාවරණය වුණා. ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා ගෙනාවා; වාර්තා ඉදිරිපත් වුණා. නමුත් අන්තිමට මොකක්ද සිද්ධ වුණේ? අපට මතකයි, එවකට කථානායකතුමා වශයෙන් සිටි ගරු වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමාට සිද්ධ වුණේ ඒවා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යොමු කරන්න පමණයි. ඔබතුමා ඒ වෙලාවේදී මේ ගරු සභාව නියෝජනය කළා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිය ඒ වාර්තාවලට, ඒ පරීක්ෂණවලට, විජයදාස රාජපක්ෂ කමිටු වාර්තාවට සිද්ධ වුණේ මොකක්ද කියලා අදත් මේ පාර්ලිමේන්තුවට කිසිවෙකු වග කියන්නේ නැහැ. අවසාන වශයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවවත් ඒ සම්බන්ධව මේ පාර්ලිමේන්තුවට වග කියන්නේ නැහැ. අන්න ඒ කාරණාවෙන් ඔප්පු වෙන්නේ මොකක්ද? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පුළුවන් වෙලා තිබෙනවා, මේ පාර්ලිමේන්තුවත් හෑල්ලු කරන්න. ඒක තමයි සිද්ධ වුණු අවසාන ප්‍රතිඵලය. නැත්නම් පාර්ලිමේන්තුවේ වාර්තා වුණු, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී ගත් ඒ තීරණ, ඒවායේදී නිශ්චිත වශයෙන්ම අනාවරණය වූ කරුණු, සාක්ෂි හැටියට හෙළිදරවු වුණු දේවල් අද හමස් පෙට්ටියට ගිහිල්ලායි තිබෙන්නේ. අර සාමාන්‍යයෙන් කියමනක් තිබෙනවා නේ "අල්ලා ගත්තාට හපන්න බැහැ" කියලා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේත් සිද්ධ වෙලා තිබෙන්නේ එහෙම තමයි. රටේ මහ ජන මුදල්, රටේ ජනතාවගේ බදු මුදල් වංචා කළේ කවුද, ඒ නිලධාරීන් කවුද කියලා අල්ලා ගත්තාට වැඩක් නැහැ, තීරණයක් ගන්න බැහැ. එය සීමා වුණේ වාර්තා කිරීමට පමණයි. හැබැයි යම් ප්‍රමාණයකින් හරි ඒ පිළිබඳව සමාජයේ ජන මතයක් හැදුණා. මම හිතන්නේ මෙතැන අද ආණ්ඩු පක්ෂය නියෝජනය කරන ගරු ඇමතිතුමන්ලාත් එදා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිටියා. මම අවංකව විශ්වාස කරනවා, ගරු මහින්ද අමරවීර ඇමතිතුමා, කලින් කථා කරපු ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා වැනි අය දේශපාලන අරමුණකින් තොරව, මේවා අපේ රටේ ආයතන, මේවා රාජ්‍ය ආයතන, මේවායේ සිද්ධ වන වංචා හා දූෂණ හෙළිදරවු වෙන්න ඕනෑ කියන පදනමේ ඉඳ ගෙන මිසක්, ඒ

කාගෙන්වත් පෞද්ගලිකව පළි ගන්න නොවෙයි කථා කළේ කියලා.

ඔබතුමාට මතක ඇති, ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ මිලියන ගණනක දේවල් ඉතිරි වුණා. රටට ඉතිරි වුණා; භාණ්ඩාගාරයට ඉතිරි වුණා. අඩු තරමේ ඒ නිලධාරින් ස්වයංවාරණයක් ඇති කර ගත්තා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ගැන, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ගැන මාධ්‍ය මඟින් රටේ අවධානයට යොමු වෙච්ච හැම අවස්ථාවේම එතැනට සහභාගි වන නිලධාරින් යම් ස්වයංවාරණයකට ලක් වනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කථාව අවසන් කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ, අවසාන කරනවා.

අද මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මාධ්‍යවේදීන්ට පුළුවන් වෙලා තිබෙන්නේ, මාධ්‍ය ආයතනවලට පුළුවන් වෙලා තිබෙන්නේ, අර පැපරාසිවරුන් වාගේ ගිහින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ මොනවා ද වෙන්නේ කියා දොර ළඟට කන තියා අහලා, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ මොනවා ද වෙන්නේ කියා සොයා බලා වාර්තා කරන්නට විතරයි. මේ පැපරාසි ක්‍රියාවලියෙන් එහාට ගිහින් මේ මාධ්‍ය ආයතනවලට ඉතාමත්ම නිවැරදිව තොරතුරු වාර්තා කරන්නට ඒක නිරාවරණය කරන්නටය කියා ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. කථාව අවසාන කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒකෙන් කවුරුවත් අපහසුතාවට පත් වන්නේ නැහැ. මොකද, ඒ නිලධාරිනුත් යම් ස්වයංවාරණයක් ඇතිව ඒ කමිටුවේ අපත් ස්වයංවාරණයක් ඇතිව, වග කීමක් සහිතව ඒ කටයුතු සිද්ධ කරන බවට සහතිකයක් හදා ගන්නට පුළුවන්. එහෙම නැතිව දැන් මේ කියන විධියට නොවෙයි. ඔබතුමාගේ කාල සීමාව ඇතුළතම ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගන්නට හැකියාව ලැබේවායි මා නැවතත් ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 2.50]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Thank you for affording me this good opportunity. Sir, we are governed in this Parliament by the Constitution of Sri Lanka. It has been revised and approved by the whole House. Then, there are other things that govern the proceedings of the House, which we call the Standing Orders. There is also another set of regulations. That is the Parliament (Powers and Privileges) Act. These are all well defined statutes. My contention is, no Member in this House who understands the contents of these three statutes would bring any Motion - a private Member's Motion or otherwise - contravening any of these statues. This is very clear, for example, in Section 17 of the Parliament (Powers and Privileges) Act, which states, I quote:

"Evidence of proceedings in Parliament or committee not to be given without leave.

No member or officer of Parliament and no shorthand Writer employed to take minutes of evidence before the House or any committee shall give evidence elsewhere in respect of the contents of such evidence or of the contents of any manuscript or document laid before Parliament or any committee or in respect of any proceedings or examination had at the Bar or before any committee of Parliament without the special leave of Parliament first had and obtained."

When it comes to even the Consultative Committees, COPE or the Public Accounts Committee, it is very clear in the Standing Orders that you have to get the approval of the Hon. Speaker before anything is published or given out. Sir, even the stenographers or others employed by those committees have no right to take down anything and give out directly without your permission. So, your power is very sacrosanct. You are the guardian of the rights and privileges of the Members and you uphold the Constitution and the Standing Orders - you are doing it very well - and the most important one is the Parliamentary (Powers and Privileges) Act.

Sir, you have already appointed a committee to revise the Standing Orders. The proceedings are going on. The Hon. Ravi Karunanayake, who moved this Motion is also a Member. I think the Chief Opposition Whip - not the new Deputy Opposition Whip ඒ පතෝල අරන් ආවාට හරි යන්නේ නැහැ - the original Opposition Whip - knows this. He is also a Member. Sir, while the revision of the Standing Orders are being discussed minutely, it is an indictment on the Hon. Speaker himself to come before this Parliament and divulge the contents of the proceedings.- [*Interruption.*]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! There is a point of being raised by the Hon. John Amaratunga.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Sir, there is no indictment on you or anybody by doing this. This is a recommendation to the Committee. We have the right to discuss. He cannot say that we cannot discuss. What is wrong with that? - [*Interruption.*] Why are you accusing the Hon. Speaker?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අදහස් දක්වන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
You are a Member. When we are discussing that, a Member has all the right to make his proposals and propose amendments before the Committee. This is premeditated. But, this cannot be allowed because you will be contravening and discussing things against the laid down procedure, the Standing Orders, the Constitution, et cetera. That is my contention. Even in the Standing Orders it states that while the proceedings of any committee is on - you know it -you cannot give it to the newspapers, to the media and you cannot divulge information, unless of course, with the consent of the Committee and the approval obtained from the Hon. Speaker. That is very important.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි ගරු මන්ත්‍රීතුමා, අපි මේ පාර්ලිමේන්තුවේ කටයුතු මහ ජනතාවට හා මාධ්‍යට වඩාත් සමීප කරන්න දැන් කටයුතු කර ගෙන යනවා; ඒ වාගේම සාකච්ඡා වෙනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒක තමයි මම කියන්නේ. ඒකට අපි එකඟයි ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම හිතන්නේ අදහස් දැක්වීමට කිසිම බාධාවක් නැහැ කියලායි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒකට සම්පූර්ණයෙන් එකඟ වෙලා තමයි අර සංශෝධනය කරන කොමිටිය දැන් පත් කරලා තිබෙන්නේ. මම ප්‍රකාශ කරන්නේ they have put the cart before the horse. අශ්වයාට ඉස්සෙල්ලා කරත්තය දානවා. බූරුවාට ඉස්සෙල්ලා ලණුව ගෙනි යන්න හදනවා, සිරිකොත කරනවා වාගේ. ඒක කරන්න එපා කියලා තමයි මම ඉල්ලා සිටින්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එලදායී අදහස් පමණක් ඉදිරිපත් කළාට ප්‍රශ්නයක් නැහැ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Therefore, we are opposed to this, unless of course, the Hon. Speaker or the Committee takes an ultimate decision. Thank you.

[අ. භා. 2.56]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම බොහොම සන්තෝෂ වනවා, අද දවසේ ඉදිරිපත් කරනු ලබන මෙම පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා පිළිබඳව ඔබතුමාම මූලාසනයේ සිටිමින් සවන් දී ගෙන, "මොනවාද මේ යෝජනා, මේවායෙන් ඉෂ්ට වන්න පුළුවන් හොඳ දේවල් මොනවාද, නරක දේවල් මොනවාද" කියලා යම් කිසි අවධානයක් ලබා ගෙන ඉන්න එක ගැන. ඒ පිළිබඳව මම විශේෂයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ඇත්ත වශයෙන්ම මේ යෝජනාවෙන් අපි ක්‍රියාත්මක කරන්න හැදුවේ, ඔබතුමාගේ මේසය මත තිබෙන නැත්නම් ඔබතුමාගේ නායකත්වයෙන් සාකච්ඡා කෙරෙන Standing Orders පිළිබඳව අපේ පාර්ලිමේන්තුවේ සංශෝධනය වන්න තිබෙන කාරණාවලදී අපේ අදහස් මොනවාද කියන එක පිළිබඳව කීමටයි. කවුරුවත් ඒකට කලබල විය යුතු නැහැ. මේවාට points of Order ගෙනැල්ලා නැත්නම් රීති ප්‍රශ්න ගෙනැල්ලා "මේවා අහෝසි කළ යුතුය" කියලා කීම නොවෙයි කළ යුත්තේ. අපට කරන්න අවශ්‍යව තිබෙන ප්‍රධානම දේ තමයි මේ වාගේ දෙයක් කරන්න හැදුවොත් මොන වාගේ තත්ත්වයක් ඇති වෙයිද කියලා - ඩිලාන් පෙරේරා ඇමතිතුමා කිව්වා වාගේ- දෙපැත්තම කල්පනා කරලා කථා කරන එක. මෙතැන මේ වාගේ යෝජනාවක් ගෙනාවාම රීති ප්‍රශ්න ගෙනැල්ලා, මේවා මේ සභාවේ සාකච්ඡා කරන්න බැහැයි කියලා කියනවා. එහෙම නම් මොකටද මේවා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්නේ. අපි ඒකයි අහන්නේ. දෙපාර්ශ්වයේම අදහස් අරගෙන හොඳ දෙයක් වෙනුවෙන් අප සියලු දෙනාම එකට එකතු වෙලා කටයුතු කරමු. මේ අලුත් ශ්‍රී ලංකාව, ආසියාවේ ආශ්චර්යය කරා යන්න නම් අපෙත් අදහස් අරගෙන යන්න ඕනෑ. ඒකයි අපි මේ කියන්නේ.

මූලික වශයෙන් මම කියන්න කැමැතියි, COPE කමිටුවේ, ඒ වාගේම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පසු ගිය අවුරුදු ගණනාවක් ඇතුළත මාත් කටයුතු කෙරුව බව. අපි දැක්කා, ඒවා ඇතුළේ සිද්ධ වෙච්ච දේවල්; ඒවායෙන් එළියට එන කොට ඇති වෙලා තිබුණු තත්ත්වයන්. ඇත්ත වශයෙන්ම අපි මාධ්‍යවේදීන්ට ස්තුතිවන්ත වන්න ඕනෑ. මේ ක්‍රියාදාමය මාධ්‍යවල පළ වීම නිසාත්, COPE කමිටුවෙන් ඇති වුණු තීන්දු නැත්නම් ඇති වුණු සිද්ධීන් පිළිබඳ ආන්දෝලාත්මක කරුණු මාධ්‍යවේදීන් ඉදිරිපත් කළ නිසාත් තමයි අඩුම තරමින් හොරකම ඔය තරමින්වත් නතර වුණේ. නැත්නම් ඒ හොරකම් ඊට වැඩිය දුර යනවා ගරු කථානායකතුමනි. ඒ නිසා මම මෙය විශේෂයෙන් කියන්න කැමැතියි. අපි රට රටවල සංචාරය කරලා තිබෙනවා. ඒ වාගේම ඒවායේ conduct කරන Public Accounts Committee ගැන අපි බලලා තිබෙනවා. ඒවායේදී අපි දැකලා තිබෙනවා, ඒ රටවල කොයි විධියටද මේවා ක්‍රියාත්මක වන්නේ කියන එක. මම ඔබතුමාට යෝජනා කරන්න කැමැතියි, මේ කමිටු ඇතුළට මාධ්‍යවේදීන්ට එන්න දීලා, ඒවා සම්බන්ධයෙන් වාර්තා මාධ්‍යවල පළ කරන්න කලින් ඒ වායේ තියෙන්නා වූ නොවැදගත් දේ ඉවත් කර, යම් කිසි පුද්ගලයකුට හානි වන කාරණා අඩු කරලා, පොඩ්ඩක් සංශෝධනය කරලා, -හැන්සාඩ් වාර්තාව වාගේ යම් කිසි කපා කොටා හැරීමක් කරලා- ඒවා මාධ්‍යවලට ඉදිරිපත් කරනවා නම් හොඳයි කියන එක.

මාධ්‍යවේදීන්ට කිසි සේත් එන්න දෙන්නේ නැතුව, COPE කමිටුවේ දේවල් එළියට දාන්න දෙන්නේ නැතුව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දේවල් එළියට දාන්න දෙන්නේ නැතුව කථා කරනවා නම් මම හිතන්නේ රටේ හොරකම්, මං කොල්ල කෑම්, දූෂණ, රාජ්‍ය තන්ත්‍රය විසින් හොරකම් කරන ඒවා, මැති

ඇමැතිවරුන්ගේ දූෂිත ක්‍රියාකාරකම්, මේවා සියල්ලම ආරක්ෂා වෙලා හොරකම් කරන මිනිහාට වැඩි වැඩියෙන් හොරකම් කරන්න අවස්ථාව ලබා දීමේ අවසාන ක්‍රියාවලිය තමයි මේකෙන් සිද්ධ වන්නේ. පාර්ලිමේන්තුව අලුත් යුගයක් කරා ගෙන යන නායකයකු විධියට මම ඔබතුමාට ගෞරවයෙන් නැවතත් කියන්න කැමැතියි, මේ ක්‍රමවේදය තුළ තිබෙන හොඳ නරක සියල්ල අපි සාකච්ඡා කරලා බලලා කටයුතු කරන්න ඕනෑයි කියන එක.

අද අපි දන්නවා, COPE කමිටුවේ, ඒ වාගේම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරය දරන්නේ ඇමතිවරුන් බව. මේ අය කැමැති නැහැ, තමන්ගේ අමාත්‍යාංශවල තිබෙන ඒවා හාරා අවුස්සනවාට. ඒක හින්දා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒකට විරුද්ධව කථා කරනවා. මාධ්‍යවේදීන්ට එන්න දෙන්න එපායි කියනවා. ඒක නොවෙයි සිද්ධ වන්න ඕනෑ. ඒ ඇමතිවරුනුත් දැන ගන්න ඕනෑ, සමහර වෙලාවට තමන්ගේ අමාත්‍යාංශයේ, - අපි දන්නවා, නිවැරදි විධියට වැඩ කටයුතු කරන්න ඇමතිවරුන් පුළුවන් තරම් උත්සාහ කරන බව. - ආයතනවල ඉන්න නිලධාරීන් දැවැන්ත හොරකම්වලට සම්බන්ධ බව. ඒක නිසායි අපි කිව්වේ, අපට -විරුද්ධ පාර්ශ්වයට- මේ කොමිටිවල සභාපති ධුර දෙන්න, අපි සූදානම් මේ කොමිටි හරියට ක්‍රියාත්මක කරන්න කියලා. ලංකාවේ නොවෙයි, ලෝකයේ වෙනත් රටවල තිබෙන මෙවැනි කොමිටි දිහා බලන කොට අපට පෙනෙනවා, ඒ COPE කමිටුව රැස් වෙලා පැයකට පස්සේ තමයි ඒකේ අදාළ කාරණා ටික මාධ්‍යවල පළ වන්නේ කියලා. හැබැයි ඒ පැය ඇතුළත රටේ ජනතාව බලා ගෙන ඉන්නවා, මේ COPE කමිටුව ඇතුළේ මොකක්ද වන්නේ කියලා. සමහර ඇමතිවරුන් ගෙනැල්ලා ප්‍රශ්න කරනවා, COPE කමිටුව ඇතුළේ. ඒ ඔහු කරපු කාරණා සම්බන්ධයෙන්. ඒක ඉතාම වැදගත්. රටක මුදල් පිළිබඳ විනිවිදභාවය -transparency එක- අවශ්‍ය නම් ඒ කමිටු එලෙස ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය කාරණයක් විධියට තමයි අපි දකින්නේ. ඒ නිසා තමයි අපි මේ යෝජනාව ගෙනාවේ. ගරු කථානායකතුමනි, ඔබතුමා කථානායකතුමා විධියට මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කරන්නය කියලා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා.

දැන් බලන්න, අද පත්තරේ පළ කරලා තිබෙනවා, "Leave politics out of cricket" කියලා. මේ අපේ හිටපු ක්‍රිකට් පුහුණුකරු ලියලා තිබෙන්නේ. මේවා පත්තරවල පළ කළාම මොකක්ද තිබෙන ප්‍රශ්නය? මේකෙන් මොකක්ද කියන්නේ? ලංකාවේ හිටපු ක්‍රිකට් පුහුණුකරු කියනවා, "Leave politics out of cricket"; කරුණාකරලා ක්‍රිකට්වලින් දේශපාලනය අයින් කරන්න කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ඒක මේ යෝජනාවට අදාළ නැහැ. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමා කියනවා: "Allow players to focus only on the game and not be distracted by politics".

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාගේ කාලය දැන් අවසන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න. මේ ගොල්ලෝ කියන්නේ මොකක්ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අර්ථවත් වෙන්න, අර්ථවත් වෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හිටපු ක්‍රිකට් පුහුණුකරු කියනවා, "කරුණාකරලා අපට game එක play කරන්න දෙන්න; දේශපාලන පන්දු කෙළියට ක්‍රිකට් ක්‍රීඩාව පාවිච්චි කරන්න දෙන්න එපාය" කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම හොඳයි. දැන් කථාව අවසාන කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අද ක්‍රිකට් ආයතනය බිලියන 4.5ක් ණය වෙලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒවා මේ යෝජනාවට අදාළ නැහැ. ඒ නිසා දැන් නවත්වන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් මේවා ගැන කථා කළාම මොකක්ද තිබෙන ප්‍රශ්නය? ඒ නිසා මම කියන්න කැමැතියි ගරු කථානායකතුමනි, ඔබතුමා මේ පිළිබඳව සොයා බලා සාධාරණ -

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன )
(The Hon. Gitanjana Gunawardena )

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මේ කියන්නේ, to leave cricket out of politics. ඒකයි කියන්නේ. Leave cricket out of politics, එතුමා ඔය වැරදියට කියවන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

"Leave politics out of cricket" ඒකයි වෙලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, අපි ඒකයි කිව්වේ. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, මම ඒකයි කිව්වේ. වෙන එකක් නොවෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කියවා ඕනෑ විධියකට අදහස ගන්න. දැන් නවත්වන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් විනාඩියක් ඉල්ලා ගත්තා. කරුණාකරලා -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් විනාඩිය ගිහිල්ලා හුඟක් වෙලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මේවා කියයි කියලා භය වෙන්න එපා. මේවා කියයි කියලා ආණ්ඩුවේ ඇමතිවරු භය වෙන්න ඕනෑ නැහැ. අපි සාධාරණව වැඩ කරලා තිබෙනවා නම් කිසි ගැටලුවක් නැහැ. ගරු කථානායකතුමනි, මේ යෝජනාව සඳහා ඔබතුමාගේ නායකත්වය දෙන්න කියලා ආදරයෙන්, ගෞරවයෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මේ යෝජනාව පිළිබඳව අදහස් දක්වන්න තවත් ගරු මන්ත්‍රීතුමන්ලා ඉන්නවාද? කවුරුවත් නැහැ වාගෙයි පෙනෙන්නේ. හොඳයි එහෙම නම් යෝජනා කරපු මන්ත්‍රීතුමාට - [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

එතුමා පැනලා ගිහිල්ලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා එතුමා වෙනුවෙන් විවාදය අවසන් කරන්න. [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order. The reply speech must be given by the mover of the Private Members' Motion. That is the procedure.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

The Motion must go through the procedure.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, -

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. M.L.A.M. Hisbullah - Deputy Minister of Child Development and Women's Affairs)

Sir, the Hon. Member concerned must be responsible for this.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා එනවා. එතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ. භා. 3.04]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අපේ ප්‍රතිවිරුද්ධ කණ්ඩායමේ මන්ත්‍රීවරුන්ගේ හිතේ ඇති අපි අවදියෙන් සිටියේ නැහැ කියලා. අපි අවදියෙන් සිටියේ.

මම මේ අවස්ථාවේදී සියලුම මන්ත්‍රීවරුන් තමන්ගේ වැදගත් අදහස් ඉදිරිපත් කර තිබීම ගැන අගය කරනවා. ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා කිව්වා වාගේ පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනාවක් කියන්නේ මන්ත්‍රීවරයෙකුට තිබෙන අයිතිවාසිකමක්. දැන් මේක යටපත් කරන්න හදනවා නම් අපි මේ අදහස් මහ පාරට ගිහිල්ලා කෑ ගහලා කියන්නද? මේ වාගේ දේවල් යටපත් කරනවා කියන්නේ මන්ත්‍රීවරයෙකුට තිබෙන වරප්‍රසාද අවලංගු කරන්න හදන කටයුත්තක්. ඉතින් ඊට වැඩිය එතුමා ප්‍රායෝගිකව කිව්වා, "අපි මැදක් හොයන්න ඕනෑ" කියලා. ඉතින් මැදක් හොයන්න මුලකුත්, අගකුත් අවශ්‍යයි. අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ ඒ මුල. ආණ්ඩුව ඒ පැත්තෙන් හරියාකාරව ඉදිරියට ගෙන යන්න අවශ්‍ය නම්, මේක විනිවිද්භාවයකින් කටයුතු කරන ආණ්ඩුවක්ද, නැද්ද කියන එක තමයි අපට පාවිච්චි කරන්න අවශ්‍ය වන්නේ.

ගරු කථානායකතුමනි, මම හිතන්නේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා වාගේ, අපේ ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා ඉතාමත් ඕනෑකමින් කිව්වා වාගේ ප්‍රශ්නයක් ඇති වුණාට පසුව, අපි ලොකුවට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මෙන්න මේක වුණා; ඊට පස්සේ ඇයි මන්ත්‍රීවරු-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කථා කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අගය කරනවා මගේ මේ පෞද්ගලික යෝජනාව පිළිබඳ සාකච්ඡාව අවසන් කරන අවස්ථාවේ ඔබතුමා මුලසුනට පැමිණීම පිළිබඳව. ගරු ජෝන් අමරතුංග මැතිතුමා ඉතාම වැදගත් අදහසක් ඉදිරිපත් කළා, ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන අවස්ථාවක අශ්වයා පැනලා ගියාට පස්සේ ඉස්තාලය වහලා වැඩක් නැහැ කියලා. අන්න ඒ වාගේ දෙයක් තමයි අප මේ අවස්ථාවේදී කරන්නේ. මෙම කාරක සභාවල රැස්වීම් මාධ්‍යට විවෘත කරනවාය කියන්නේ මොකක්ද? කොහොමත් මාධ්‍ය දන්නවා මොනවාද වෙන්නේ කියන එක. එක තැනක විතරක් ඒ විධියට ප්‍රසිද්ධ කරන්න එපා කියන්නේ ඇයි කියන ප්‍රශ්නය තමයි අපට තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී මම තවත් දෙයක් ඉදිරිපත් කරනවා. එක්සත් ජාතික පක්ෂය 2001 ඉඳන් 2004 වන කල් රට පාලනය කරන කොට අපි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිකම ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමාට දුන්නා. එතුමා එදා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම තමයි ගරු අනුර ප්‍රියදර්ශන යාපා මන්ත්‍රීතුමාට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිකම දුන්නා. විනිවිදභාවයක් අවශ්‍ය නිසා තමයි, සම්පූර්ණයෙන්ම දූෂණය නැති කරන්න අවශ්‍යතාව තිබුණු නිසා තමයි ඒ වාගේ ආදර්ශයක් ලබා දෙන්න එක්සත් ජාතික පක්ෂයේ අපි එවැනි දෙයක් කළේ. විනිවිදභාවයක් ගැන කථා කරන මේ ආණ්ඩුවේ ඔබතුමන්ලාට අද ඒ ශක්තිය තිබෙනවාද? තුනෙන් දෙකක් තිබෙනවාය කියනවා. විධායක බලතල අතේ තිබෙනවා. පළාත් සභාවේ, පාර්ලිමේන්තුවේ බලය ආදි සියලු දේම තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය කළා වාගේ ආණ්ඩුව එවැනි කටයුත්තක් ඉදිරිපත් කරන්නේ නැත්තේ ඇයි? පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිකම දෙන්න පුළුවන් විපක්ෂයේ මන්ත්‍රීවරයකුට. ඒ වාගේම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිකමත් දෙන්න පුළුවන් ඒ වාගේ මන්ත්‍රීවරයකුට. එහෙම දුන්නා නම් මෙවැනි ප්‍රශ්නයක් මතු වන්නේ නැහැ. එතකොට විනිවිදභාවයෙන් කටයුතු කරන්න පුළුවන්. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දේවල් මාධ්‍යට දෙන්නේ නැහැ කියලා එකක් නැහැ නේ. අවශ්‍ය නම් ආණ්ඩු පක්ෂය ඒ තොරතුරු එළියට දමනවා. විපක්ෂයෙන් එහෙම කළොත්, ඔන්න ප්‍රශ්නයක් ඇති වෙනවා. එතකොට ඉතින් එයින් හිරිහැර කිරීමක් නේ සිදු වෙන්නේ. සියයට 80ක්, 85ක් තිබෙන එක තව සියයට 15ක් එකතු කරලා යම් විධියකින් මධ්‍යස්ථභාවයක් ඇති කරන්න අපට පුළුවන්. ඒ අදහස අපේ ගරු කථානායකතුමාත්, ඔබතුමාත් ඇතුළු ඒ කොමිටිය තුළිනුත් හෙළිදරවු වේවි කොහොමත්.

අප ඉදිරිපත් කරලා තිබෙන වාර්තා හතර පහේම පෙන්වා දී තිබෙනවා මාධ්‍ය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට පැමිණීමේ අවශ්‍යතාව. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට මහා කාර්ය භාරයක් පැවරිලා තිබෙනවා. අප ඒක කිව්වේ නැත්නම් කියාවි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී දැන ගන්නා දේවල් හෙළිදරවු කරනවාය කියලා. මෙන්න, වාර්තා කරලා තිබෙන දේවල්. මේකේ තිබෙනවා "Good Governance" කියලා. Now, Hon. Deputy Speaker, good governance that is there is not practised by the Central Bank. Today, the commercial banks are basically having a mega problem. On one side, they say that each CEO must work for 10 years; that is maximum and the Directors must retire at the age of 70 years. The Board of Directors of the Commercial Bank of Ceylon PLC had their Annual General Meeting recently. What happened there? You have people who are more than 70 years old going on in service. So far, we have not complained. But, the people who are complaining are the people of the Central Bank. But, are they complying? No. They give exemptions for some people if they are politically biased or if they can be controlled or if they can be manipulated or if they can sing hosannas for dinner. Well and good! The Central Bank permits that to take place. Otherwise, they are basically stumped at the point. Then, you have good governance that is there. You must allow people who have credibility to come to the Board of Directors of the Commercial Bank of Ceylon PLC. Now, Mr. Ranjit Fernando, one the top best of bankers, had been asked to go out and then you have nominated a person who has a criminal record and had been given a suspended sentence. I am not mentioning the name simply because we basically protect their character even though they do not have one. But, see the difference. The Central Bank brings in good governance as a -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
The Central Bank also -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I am talking about the AGM of the Commercial Bank that was held recently. There cannot be hundreds of directors. Only one went out and one came in. On that particular basis, you have nominated a person who had been given a sentence suspended for 10 years. Now, he comes to the Board of Directors and one of the best of bankers, Mr. Ranjit Fernando goes out. This is the good governance that the Government is trying to pursue through the Central Bank. When we questioned this at the Committee on Public Enterprises, what did the Governor say? He said, “Good governance is what we want to pursue” මෙන්න මේ වාගේ අවස්ථාවක මාධ්‍යට හෙළිදරවු කළා නම් මෙවැනි දූෂිත කටයුත්තක් සිදු වන්නේ නැහැ. That is why we believe in transparency. If we do not speak that in Parliament, it is a criminal offence; either we do not have the guts to speak or we do not represent the people in true spirit. Now, what you all are trying to do is to conceal that information. As soon as I got up to ask an Oral Question which had been referred to the Ministry of Finance and Planning, the Deputy Minister who does not answer the Questions in Parliament jumped up and tried to tell different things. Now, when we answer with specific facts; then they are stymied, they are silent and their stony silence shows us that the truth is being concealed.

The Hon. Dilan Perera was trying to say that Private Members' Motions must not be misused. On the other

[ගරු රවි කරුණානායක මහතා]

side, he is trying to bring in ideas to conceal our rights. Why is that? If we, as the Members of Parliament, are unable to bring in a Private Members' Motion to Parliament, are we going to shout at the top of our voices on the main roads on this? I guess that is not the spirit. If there is a clean governance that is expected, if there is transparency that is wanted and if you really want to bring Sri Lanka into the prosperous future that is expected, then, you should open yourself into a completely different vicissitude and look at Sri Lanka in a larger picture.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉතාමත් ඕනෑකමින් කියන්නේ මෙකේ වෙනසක් ඇති කරන්න අවශ්‍යයි කියන එකයි. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සහ උපදේශක කාරක සභාවල සියලුම රැස්වීම්වලට සහභාගි වීමට මාධ්‍යවේදීන්ට අවසර ලබා දිය යුතුයි. හැබැයි මෙම කාරක සභාවල රැස්වීම්වලට සහභාගි වීමට මාධ්‍යට අවසර ලබා දුන්නත්, ඒකේ එක කොටසක් ඉන්නවා; ඔවුන් බයේ දඟලනවා. කියාපු ඒවාවත් මාධ්‍යට වාර්තා කරන්නේ නැහැ. ඒ වාගේ මාධ්‍යක් නොවෙයි අපට අවශ්‍ය කරන්නේ. ආණ්ඩුව කියන එක සිරස් තලයට දාලා විපක්ෂය කියන එක පේන්නේ නැති තැනක දැම්මොත් මාධ්‍යට අවසර දුන්නාට වැඩක් නැහැ. ජනතාව දැනුවත් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් තමයි අපට අවශ්‍ය වන්නේ. ඒකට තමයි මේ අවස්ථාවේදී අපි මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. වාණිජ බැංකුවල තිබෙන ප්‍රශ්න ගැන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී අපි සාකච්ඡා කළා. රටේ ජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් අපි ඉදිරිපත් කරන්න ඕනෑ. වාණිජ බැංකුවල සල්ලි ගන්න පුළුවන්ද නැද්ද කියන කාරණය ඉතාමත් වැදගත් කාරණයක් විධියට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අපි සාකච්ඡා කළා. ඒ සල්ලි ආරක්ෂා කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් තමයි ජනතාව දැනුවත් කිරීම තුළින් අපි බලාපොරොත්තු වන්නේ. ආණ්ඩුව විනිවිදභාවය රැක ගෙන දූෂණය නැති කරන්න හදනවා නම්, මෙවැනි යෝජනාවකට ආණ්ඩුවට කිසි සේත්ම විරුද්ධ වන්න බැහැ. එහෙම විරුද්ධ වුණොත් ඒ විරුද්ධ වන්නේ දූෂණය වහ ගන්නයි; විනිවිදභාවය නැති කරන්නයි; ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයකුගේ කට හඬ යටපත් කරන්නයි. යම් විධියකින් හෝ මේ යෝජනාවට ආණ්ඩුව විරුද්ධ වුණොත්, එවැනි වැඩ පිළිවෙළකට තමයි ආණ්ඩුව යන්න හදන්නේ. ඒ නිසා අපට අවශ්‍ය වන්නේ ඊට වඩා හාත්පසින්ම වෙනස් දෙයක්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක දැන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමා කමිටුවක් පත් කරලා වාර්තාවක් ලබා ගෙන තමුන්නාන්සේත්, මමත් ඇතුළුව අනෙකුත් දේශපාලන පක්ෂවල නායකයෝත් මේ ගැන අධ්‍යයනය කරලා -අවශ්‍ය දේ කොහොමද කරන්නේ කියලා- එය ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒකයි ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා කිව්වේ. ඒ නිසා තව යෝජනාවක් ඉදිරිපත් කළාය කියලා අමුත්තක් වෙන්නේ නැහැ. තමුන්නාන්සේ කථා කළාට කමක් නැහැ, කථා කරන්න. නමුත් අලුතෙන් යමක් කෙරෙන්නේ නැහැ. දැනට ඒක ආරම්භ වී බොහෝ දුර ගිහිල්ලා. අපේ අදහස ඒකයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දුර ගිය එකයි ගමනේ අවසානයයි දෙකක් නේ. 1995 දී, විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න ඕනෑය කියලා චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය කිව්වා. 1999 දීත් කිව්වා. 2005 ඇවිල්ලාත් ඒ බයිලාවම ගැහැව්වා. 2010 දීත් ඉල්ලුවේ ජනාධිපති ධුරය අහෝසි කරන්නය කියලායි. නමුත් අද මොනවාද කියන්නේ? මේක ආයෙමත් ඉදිරියට දීර්ඝ කරන්නයි හදන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේලාත් එකඟ වෙන්න එපායැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි එකඟ වෙලායි තිබුණේ. අපි අනිවාර්යයෙන්ම කිව්වා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේලා අපි එකඟ වෙලා අපේ අය වැය විවාදයේ පළමු වරට කාරක සභා අවස්ථාවක් ඇති කළා, අය වැය ඇස්තමේන්තු පිළිබඳව දීර්ඝ විමර්ශනයක යෙදෙන්න. නමුත් තමුන්නාන්සේලාම පස්සේ කිව්වා, මේක අවශ්‍ය නැහැයි කියලා. අමාත්‍යවරයා සියලුම නිලධාරීන් එක්ක ඇස්තමේන්තු පිළිබඳව විමර්ශනයක යෙදෙන්නට ඒක තමයි හොඳම අවස්ථාව. ඒක ඉන්දියාව අනුගමනය කරනවා. වෙනත් රටවල් අනුගමනය කරනවා. නමුත් තමුන්නාන්සේලා ඊට පස්සේ අවුරුද්දේ ඇවිල්ලා කිව්වා, "අපට ඕක ඕනෑ නැහැ. අපට දවස් ගණන වැඩි කරලා දෙන්න. පැය ගණන වැඩි කරලා දෙන්න." කියලා. අපට විතරක් නොවෙයි. පාර්ලිමේන්තු කටයුතුවලදී තමුන්නාන්සේලා-අපි දෙ ගොල්ලටම මූල්‍ය තත්ත්වය පිළිබඳව තිබෙන වගකීම වඩා යහපත් කරන්න උත්සාහයක යෙදෙනවා. I am sorry to take your time. පාර්ලිමේන්තුවේ මන්ත්‍රී සංඛ්‍යාව 225 දක්වා වැඩි වෙලා තිබෙනවා. 1995 හදපු ස්ථාවර නියෝග සමහර ඒවා තවම ක්‍රියාත්මක වෙනවා. කථානායකතුමා ආරම්භ කර තිබෙන දේ අනුව අපි දෙ ගොල්ල එකතු වෙලා සමහර ඒවා විවිධ කාරක සභාවල මීට වඩා ලිහිල් කරමින් සාකච්ඡා කළොත් මේ මූල්‍ය ප්‍රතිපාදනවල ඔබතුමන්ලා හරි හෝ වැරදි හෝ චෝදනා සහගතව ඉදිරිපත් කරන නාස්තිය ආදී දේවල් නිලධාරීන්ගෙන් හරියට දැන ගන්න පුළුවන්. දෙවන කාරණයට ඔබතුමාත් මාත් එක්ක එකඟ වෙයි. විගණකාධිපතිතුමාගේ -Auditor-Generalගේ- බලතල වැඩි කරන්න ඕනෑ. Audit variationsවලදී එතුමාට දඬුවමක් නියම කරන්න පුළුවන්. වෙන රටවල්වල ඒවා නියම කරනවා. ආපසු මෙහේ ඇවිල්ලා අවුරුදු ගණන් ප්‍රමාද වෙවී ඉන්න ඕනෑ නැහැ. මම නම් හිතන්නේ වඩා හොඳ අපි තමුන්නාන්සේලා මේවා කථා කරමු කියන එකයි. ඔබතුමාගේ යෝජනාව දැනට හුඟක් දුරට ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි. මේ යෝජනාව එතරම් හොඳ නම් අපි ක්ෂණිකව වැඩේ ඉවර කරමු. ඔබතුමා ඉදිරිපත් කරපු අදහස ගැන නොවෙයි

කථා කළේ. ඔබතුමා කථා කළේ මූල්‍ය විනයක් සම්බන්ධයෙනුයි. අපි ඒ ගැන කථා කරලා තිබෙනවා. මේක ඊට පෙර එන ක්‍රියාවක් සම්බන්ධයෙනුයි. මේ අවස්ථාවේ ඒක මාධ්‍යට විවෘත කළා නම් එයින් සියයට 50ක් අඩු වෙනවා. මොකද මේක මාධ්‍යට ගියොත් ප්‍රශ්නයක් ඇති වෙනවා. ඇමතිතුමනි, ඒ වාගේ deterrent effect එකක් තිබෙනවා නේ. ඒක තමයි අපි කියන්නේ. ඔබතුමා ඉන්දියාව ගැන කථා කළා. ඔව්. ඉන්දියාවේ මිලියන 1,200ක ජනගහනයට කැබිනට් ඇමතිවරු ඉන්නේ 31යි. ලංකාවේ මිලියන 20කට 85ක් විතර ඉන්නවා. මේක නේ තියෙන්නේ. ඒත් උදේ පාන්දර ඇවිල්ලා ප්‍රශ්නවලට උත්තර දෙන්නේ නැති ඇමතිවරු ඉන්නේ. තව මොනවාද කියන්නේ? අපි කියන්නේ ඊට වැඩිය ප්‍රායෝගිකව මේ ගැන කටයුතු කරන්න ඕනෑය කියලායි. රටේ ආර්ථිකය කියන්නේ කොළ පාට, නිල් පාට, රතු පාට නොවෙයි. මේක ජාතික ආර්ථිකයක්. ඔබතුමන්ලා කැවාට පස්සේ සුද්ධ කරන්න තිබෙන්නේ අපි. අපි ප්‍රශ්නයක් ඇති කළොත් සුද්ධ කරන්න තිබෙන්නේ ඔබතුමන්ලාට. ඔය වාගේ තට්ටු මාරු ක්‍රමයක් නොවෙයි අපට අවශ්‍ය වන්නේ. අපට අවශ්‍ය කරන්නේ දුගී දුප්පත්කම නැති කරන්න පුළුවන් වැඩ පිළිවෙළක්. එහෙම නැතිව, එක හොරෙක් වහන්න තව හොරෙක් නොවෙයි. ඔය වාගේ අපට කොතරම් චරිත ඝාතන කරලා තිබෙනවාද? එක විධියකින්වත් යමක් ඔප්පු කරන්න පුළුවන්ද? ඒ අප විවෘතව සිටින නිසා. අපි කියන්නේ නැහැ, මාධ්‍යට කථා කරන්න එපා කියලා. අපට කොච්චර ප්‍රශ්න ඇති කළාද? හැම දවසේම මන්ත්‍රීවරු උඩ පැන පැන ප්‍රශ්න අහන්න හදනවා. අහන්න දෙයක් නැහැ. මොකද අපි මේ වාගේ අභියෝග කරන්නේ ප්‍රශ්න නැති නිසායි. මම හිතන්නේ අපට අවශ්‍ය වන්නේත්, ඔබතුමාට අවශ්‍ය වන්නේත් විනිවිදභාවයකින් ගෙන යන්න පුළුවන් ආණ්ඩුවක්. කවුරුත් කැමැති වන්නේ ඒකටයි. ඕනෑම ජනාධිපතිවරයෙක්, ඕනෑම අගමැතිවරයෙක් කැමැති වන්නේ එයටයි. ඉතින් ඒකට හොඳම සාක්ෂිය තමයි මාධ්‍ය. මම කියන්නේ නැහැ, සියලුම මාධ්‍ය අපි කියන දේ ඒ ආකාරයෙන්ම ලියනවාය කියලා. ඒ ගොල්ලන්ට ඕනෑ පැත්තකින් ලියන්න ඉඩ තිබෙනවා. ඒක ඒ ගොල්ලන්ගේ මාධ්‍ය නිදහස. නමුත් ඒ නිදහස ඇති කිරීම තමයි අවශ්‍ය වන්නේ. ඒක තමයි මේ අවස්ථාවේ අපි ඉදිරිපත් කරන යෝජනාව. මෙතරම් ළඟට ඇවිල්ලා මේක හොඳ යෝජනාවක් කියලා ඇමතිතුමා කියනවා නම් විපක්ෂයෙන් අප මේක ගෙනාපු නිසාද තව වුට්ටක් ඇදලා සභාපතිතුමාගේ කොමිටිය තුළින් තියෙනවා කියලා, ඒකට අදහස් යොමු කරන්න කියන්නේ? මේක තමයි තිබෙන ප්‍රශ්නය. There must be a sense of togetherness in this. අපි විපක්ෂයේ හිටියාම ඔන්න ගහනවා; ඔබතුමන්ලාගේ ආණ්ඩුව නිසා අපි ප්‍රශ්න ඇති කරනවා. එහෙම නොවෙයි, අපි හැම අවස්ථාවේම කියන්නේ ජාතික ආර්ථිකයක් හදන්න අවශ්‍යයි කියලායි.

There is an absolute necessity for national economy. That is what is lacking in this country. Whether it is an appointment to a commercial bank; whether it is a failed finance company; whether it is the Bribery or Corruption Commission that is non-functional, ඒක තමයි පණ ගන්වන්න අවශ්‍ය වන්නේ. ඇමතිතුමනි, ඔබතුමා කියන කරුණු අනුව මේකෙන් අපට අර්ථ කථනය කරන්න පුළුවන් මොකක්ද? මේ යෝජනාව අපි සාමූහිකව සම්මත කරලා පුළුවන් තරම් ඉක්මනට අපේ කථානායකතුමාට කියන්න දැන් අපි මේක විවෘත කරමු කියලා. අපි මාධ්‍යට එන්න කියමු. ඒක තුළින් මේ පාර්ලිමේන්තුවේ මීට වැඩිය හුඟක් හොඳ තත්ත්වයක් ඇති වෙනවා. ඒ වාගේම තමයි මේ පාර්ලිමේන්තු රැස්වීම් සජීවී විකාශනයකට හෙළිදරවු කරන්න පුළුවන් නම් මේ පාර්ලිමේන්තුවේ හැසිරීම සියයට සියයකින්ම හොඳ වෙනවාය කියන මතයේ මම සිටිනවා.

මෙතැන ඉන්නේ යම් විධියකින් ප්‍රශ්නයක් ඇති වුණාම උඩ පැන පැන කෑ ගහන කට්ටියක්; මෙහේ විධායක ජනාධිපති ඉන්නවා නම්, අගමැති ඉන්නවා නම් ඒ ගොල්ලන්ගෙන් ලකුණු දාගන්න කෑ ගහන කට්ටියක්. නමුත් ඒ සජීවී විකාශනය තුළින් සැබෑ නායකයෝ වෙන්නේ අපේ ජනතාවයි. අපේ මන්ත්‍රීවරු හැසිරෙන ආකාරය දිහා ඒ අය බලා ගෙන සිටිනවා නම්, ඉන් පසුව ඒ අය ඡන්දය දෙන ආකාරය වෙනස් කරන්න පුළුවන් මට්ටමක් ඇති වෙනවා. මම හිතන විධියට විවෘතභාවය තමයි හොඳම. That is the best form of protecting the interests of the voters. අපේ ඡන්ද දායකයෝ ආරක්ෂා කරන හොඳම මාර්ගය තමයි විවෘතභාවය ඇති කිරීම. ඒක තුළින් භේද භින්න වන්න අවශ්‍යතාවක් නැහැ. තියෙන ප්‍රශ්නය හෙළිදරවු කරලා අපි ඉදිරියට ගමන් කරමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතින් මේ අවස්ථාවේදී මම මීට වැඩිය මගේ කථාව ගෙන යන්න අවශ්‍යතාවක් නැහැ. අපේ Chief Government Whip සම්පූර්ණයෙන් මේකට අනුමැතිය දෙනවා වාගේම අනික් සියලුම මන්ත්‍රීවරු මේ යෝජනාවට සම්පූර්ණ සහයෝගය දෙනු ඇතැයි මා විශ්වාස කරනවා. රටේ ආර්ථිකය සවි ශක්තිමත් කරලා ජනතාවට අදට වැඩිය හොඳ යහ පාලනයක් ඇති කරන්න පුළුවන් පණක් තියෙන ජනමාධ්‍යක් ඇති කරලා ඒ අයට ජනතාව වෙනුවෙන් වැඩ කටයුතු කරන්න, මාධ්‍යට මෙය විවෘත කරන්න අවස්ථාව ලබා දෙන්න කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

යෝජනාවට සභාව එකඟ ද? යෝජනාව සභාවට ඉදිරිපත් කරනවා. සභාව එකඟ ද? [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

විරුද්ධයි. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඡන්දයක්?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

Voice Vote.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

We want to take the Vote by name, Sir.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Voice Vote පිළිගන්නවා ද? [බාධා කිරීම්] පිළිගන්නවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Hon. Deputy Speaker, there is a request by the Mover. - [*Interruption.*]

***ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.***
*வினா விடுக்கப்பட்டு நிராகரிக்கப்பட்டது.*
*Question put, and negatived.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.- [*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I have already given an Order on that Motion. - [*Interruption.*] මී ළඟ යෝජනාව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා.

## පුත්තලම දිස්ත්‍රික්කය තුළ කාර්මික උද්‍යාන පිහිටුවීම
## புத்தளம் மாவட்டத்தில் கைத்தொழிற் பேட்டைகளைத் தாபித்தல்
## ESTABLISHMENT OF INDUSTRIAL ESTATES IN PUTTALAM DISTRICT

[අ. භා. 3.22]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Hon. Deputy Speaker, before I present the Motion, that is listed under my name, to the House, I would like to place on record the sincere thanks of all the Muslim Members of this House and the staff of Parliament to the Hon. Speaker for having given approval to my proposal to commence Sittings on Friday at 1.30 p.m., enabling us to attend the obligatory *Jummah* prayers in the mosque. We are thankful to the Hon. Speaker, the Deputy Speaker, the Deputy Chairman of Committees, the Leader of the House, the able Chief Government Whip and also the Chief Opposition Whip, the original Whip, not the duplicate Whip.

Now, Sir, I will read out the Motion in my name appearing in today's Order Paper. This is the first Motion that I am moving in the First Session of Seventh Parliament.

"Establishment of Industrial Estates in the Puttalam District,-That this parliament resolves that Industrial Estates be established at suitable locations in the Puttalam District with a view to boosting up industries in the District and to provide employment Opportunities to the youth"

"புத்தளம் மாவட்டத்தில் கைத்தொழில் பேட்டைகளைத் தாபித்தல்,- புத்தளம் மாவட்டத்தில் கைத்தொழில்களை மேம்படுத்தும் நோக்கிலும் இளைஞர்களுக்குத் தொழில்வாய்ப்புக்களை வழங்குவதற்காகவும் இம் மாவட்டத்தில் பொருத்தமான அமைவிடங்களில் கைத்தொழில் பேட்டைகள் அமைக்கப்பட வேண்டுமென இப்பாராளுமன்றம் தீர்மானிக்கின்றது."

The Puttalam District in the North Western Province occupies a historical place in the country. It is to Puttalam that Ibn Battuta from Morocco came and he even showed the path to the Adam's Peak. The Puttalam District is full of raw materials. There is the salt industry and it is one of the first places where the industry was started and the other one is in Hambantota. There is fishing, prawn culture and ceramics. Particularly, I must mention the famous Dankotuwa Porcelain factory, පිඟන් කර්මාන්ත ශාලාව. මැටි කර්මාන්තය තිබෙනවා, උළු කර්මාන්තය තිබෙනවා නයිනමඩම ආදී ප්‍රදේශවල. [බාධා කිරීමක්] ඔව්. ඉතින් මැටි ටිකක් ඕනෑ නම්, ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාට ඒ පළාතෙන් ගෙනැවිත් දෙන්න පුළුවන්. එපමණක් නොවෙයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
බුරුල කර්මාන්තය.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
බුරුල කර්මාන්තයත් තිබෙනවා. තමුන්නාන්සේගේ සිරිකොතට බුරුවන් ටිකක් එවන්නට පුළුවන්. මේක ඉවර වුණාට පස්සේ මම ඒ වැඩේ හරියට කරන්නම්. භය වන්න එපා. [බාධා කිරීම්] බූරුවෝ ඕනෑ තරම් ඉන්නවාද? අපේ බූරුවෝ දක්ෂයි දක්කන්න. කල්පිටියේ බූරුවෝ ඉතාම දක්ෂයි. [බාධා කිරීම්] කට වහ ගෙන ඉන්න.

පොල් කර්මාන්තය තිබෙනවා. ඉදි කර්මාන්තය කරන්න පුළුවන්. ඒ වාගේම තල්. கற்பிட்டிப் பிரதேசத்திலே பனைமரங்கள் இருக்கின்றன. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අන්න බූරුවෝ කෑ ගහනවා කියලා කවුද කියනවා, ජෝන් අමරතුංග මහත්මයාගේ පිටිපස්සෙන් ඉඳගෙන. තල් කර්මාන්තය කරන්නට පුළුවන්. ඒ වාගේම අනෙකුත් කර්මාන්ත රාශියක් පුත්තලම දිස්ත්‍රික්කයේ ඒ කලාපයේ ඇති කරන්නට පුළුවන්.

முக்கியமாக, எல்.ரீ.ரீ.ஈ. இனரால் வடக்கிலிருந்து விரட்டப் பட்டவர்கள் உட்பட சுமார் இரண்டு இலட்சம் பேர் புத்தளம் மாவட்டத்தில் இருக்கின்றார்கள். தற்பொழுது மாண்புமிகு றிஸாத் பதியுதீன் அவர்கள் கைத்தொழில் அமைச்சராக நியமிக்கப் பட்டிருப்பதை எண்ணி நாம் மிகவும் சந்தோஷப்படுகின்றோம். அவருடைய பிரதேசத்தைச் சேர்ந்த மக்களும் புத்தளத்திலே இருக்கிறார்கள். மன்னார் மாவட்டத்திலுள்ள சில கிராமங்களின் பெயர்கள் புத்தளம் மாவட்டத்திலுள்ள மீள்குடியேற்றக் கிராமங் களுக்கு இடப்பட்டிருக்கின்றன. குறிப்பாக, எருக்கலம்பிட்டி, முசலி மற்றும் ஏனைய கிராமங்களிலிருந்து இடம்பெயர்ந்து வந்தவர்கள் மீள்குடியேறியுள்ள இடங்களைக் குறிப்பிடலாம். எனவே, அங்கு இப்படியான கைத்தொழிற்பேட்டைகளை ஆரம்பிப்பதன்மூலம் அங்குள்ள சிங்கள, தமிழ், முஸ்லிம் மக்களுக்குத் தொழில்வாய்ப்புக் களை வழங்கக்கூடியதாக இருக்கும்.

කර්මාන්තය ගමට ගේන්න ඕනෑ. ඒකයි මහින්ද චින්තනය කියන්නේ. අද කර්මාන්ත පුරවර රටේ හැම තැනම බිහි වෙනවා. ඒ ලාභ ප්‍රයෝජනය පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාවටත් දෙන්න කියලායි අපි ඉල්ලා සිටින්නේ. වැව් දියේ කර්මාන්ත කරන්න පුළුවන්. කලා ඔය තිබෙනවා. ඉස්සන් කර්මාන්තය කරන්න පුළුවන්. ඒ වාගේම තමයි පොල් කර්මාන්තය කරන්න පුළුවන්. පොල් කර්මාන්තය දියුණු කිරීම පමණක් නොවෙයි, the coir is being exported, Sir. There is a very big demand for the coir that is manufactured in the Puttalam District. You can streamline, you can develop those industries. In the North Western Province, we have the biggest Tamil village called Udappuwa where a large number of Tamil youth reside. There is a famous Kovil there. There is

the fishing industry; we can even set up a fish packaging industry - in other words, a sardine factory in Udappuwa. Now, all these industries could be sited there. Puttalam is also recorded in the history as the place where King Vijaya landed, Thammennawa.

இன்றுகூட கரைத்தீவிலே பொன்பரப்புவெளி என்று கூறப் படுகின்ற அந்த இடத்தில் மக்கள் வாழ்கின்றார்கள். இப்பொழுது புத்தளம் பல பிரதேச சபைகளை உள்ளடக்கியதாக இருக்கின்றது. கடந்த பிரதேச சபைத் தேர்தலின்பொழுது புத்தளத்திலுள்ள பிரதேச சபைகள் அனைத்திலும் ஐக்கிய மக்கள் சுதந்திரக் கூட்டமைப்பு அமோக வெற்றியீட்டியதை நீங்கள் அனைவரும் அறிவீர்கள். முன்னர் இந்தச் சபையிலேயிருந்த, கால்நடை வளர்ப்பு அமைச்சின் பிரதி அமைச்சராகப் பணிபுரிந்த மாண்புமிகு கே.ஏ. பாயிஸ் அவர்கள், அங்குள்ள மக்களின் அதிகப்படியான வாக்குகளைப் பெற்று மேதகு ஜனாதிபதி அவர்களின் கரத்தைப் பலப் படுத்தியிருக்கிறார். எவரும் எதிர்பார்க்காத, வரலாற்று முக்கியத்துவம் வாய்ந்த வெற்றியை ஈட்டிய அவர், புத்தளம் நகரத்தை அபிவிருத்தி செய்வதற்காக புத்தளம் நகர சபைத் தலைவ ராகப் பதவியேற்றுள்ளார்; அவர் முன்பும் அங்கே இருந்தவர்தான்.

ஆராய்ச்சிக்கட்டுவ பிரதேசத்திலும் தென்னை சம்பந்தமான எத்தனையோ தொழிற்சாலைகளை அமைக்கலாம். நான் ஒருதடவை அங்கு சென்றபொழுது 20 ஆண்டுகளுக்கு மேலாக அந்தப் பிரதேச சபையில் பதவி வகிக்கின்ற, சிரேஷ்ட உறுப்பினரான கௌரவ சி.எம்.எம்.ஷரீப் அவர்களைச் சந்தித்தேன். அவர் முன்பு ஐக்கிய தேசியக் கட்சியைச் சேர்ந்தவராக இருந்தார். பின்னர் அவர் மேதகு ஜனாதிபதி அவர்களின் தலைமையை ஏற்று ஐக்கிய மக்கள் சுதந்திர முன்னணிக்கு வந்த பின்னர், ஐக்கிய தேசியக் கட்சியில் இருந்தபோது பெற்ற வாக்குகளைவிட அதிகமான வாக்குகளைப் பெற்று அங்குள்ள மக்களுக்கு அதிக சேவையைப் புரிந்துவருகின்றார். அவரும்கூட, இறால் பண்ணைக் கைத்தொழிலின்மூலமாக அப்பிரதேசத்தை அபிவிருத்தியடையச் செய்யலாம் என்று ஆலோசனை கூறி, எங்களுக்குப் பல விபரங்களைத் தந்திருக்கிறார்.

There is a statistician, Sir, named Mr. Marcus in the Puttalam Kachcheri. He has also given us a lot of statistics regarding this, Sir. Puttalam is a very important district with so many electorates. Then, there is Anamaduwa, Chilaw, Nattandiya and Wennappuwa. ප්‍රාදේශීය සභා 16ක් තිබෙනවා. ඒ පළාත්වල ක්‍රමානුකූලව කර්මාන්තශාලා පිහිටුවලා, මහින්ද චින්තනය තුළින් රටට ලබා දෙන ඒ ආර්ථික වර්ධනය ඒ පළාතටත් ඒ මඟින් ලබා දීමට කදිම අවස්ථාවක් ලැබෙන බව ගරු අගමැතිතුමා මේ සභා ගර්භයට පිවිසෙන වෙලාවේ එතුමාටත් ඇසෙන්නට මා කියනවා. එතුමා අපට ඒක ඉෂ්ට කර දෙයි.

He is a well-known historian, an author and a writer of reports, the late Kala Bhushana Shajahan Master. He has written a very valuable book - புத்தளம் வரலாறு - on the history of the entire Puttalam. Then, there is also Kala Bhushana Alhaj M.I.M. Abdul Latheef, a writer, an author, a historian and also a senior media person from Puttalam. He has researched the area from Wanathawilluwa up to Marichchi Kaddi. The entire roadway was covered with jungles. There was no road. Historically there was a road and it is Kala Bhushana Alhaj M.I.M. Abdul Latheef who brought it to limelight by writing research articles indicating that we can open up this road for public transport thereby giving a fillip to the development of the entire area. Our Government has done it; our Government had accomplished this task. When you want to travel from Colombo to Jaffna or Mannar, we have reduced the distance by about 100 miles. So, all these are miracles performed by the Mahinda Rajapaksa regime.

Then, Sir, there is a Member who was talking about හොරකම් කරනවා, ගසා කනවා, in the Motion that he moved. "කොහෙද යන්නේ මල්ලේ පොල්" වාගේ කථා කරන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව, ස්ථාවර නියෝග පිළිබඳව, සොරුන් ගැන, පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ගෙනා අවස්ථාවේදී කථා කරනවා. සොරුන් ගැන එතුමන්ලා කථා කරනවා නම් අපටත් මේ සභාවේ ඒ ගැන කථා කරන්න අයිතිවාසිකමක් තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හේලීස් සමාගමෙන් ගැහුවේ කවුද? සොයා බලන්න ඕනෑ. ඒ වාගේම රොටන් වැන්ඩර් සමාගමෙන් ගැහුවා. ඒක බංකොලොත් වුණා. සතොස කෑවේ කවුද? ඒ පිළිබඳවත් අපට සාකච්ඡා කරන්නට වෙනවා. සොරකම් පිළිබඳව ඒ ගොල්ලෝ කථා කරනවා නම් අපටත් ඒවා ගැන කථා කරන්නට වෙනවා.

පුත්තලම් දිස්ත්‍රික්කය සශ්‍රීක ප්‍රදේශයක්. ඒ ප්‍රදේශය සංවර්ධනය කරන්න ඕනෑ. විජය රජ්ජුරුවෝ ගොඩ බැහැලා අලුත් සංස්කෘතියක් මේ රටේ ඇති කරන්නට මුල් වූ ප්‍රදේශයක් ඒක. අපේ පූජ්‍ය එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේ මේ ගරු සභාවේ ඉන්නවා. උන්වහන්සේ ඒවා ගවේෂණය කරනවා. උන්වහන්සේ ඒ ස්ථානවලටත් ඇවිල්ලා ගවේෂණය කරලා ඒ පළාත දියුණු කිරීමේ අදහස සිතේ තබා ගෙන කටයුතු කරනවා ඇතැයි අපි හිතනවා.

විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සිමෙන්ති කර්මාන්තය ගැන මතක් කළා. මෙතැනදී අපට අමතක කරන්න බැහැ, එච්.එස්. ඉස්මයිල් මැතිතුමා. ප්‍රථම මුස්ලිම් කථානායකතුමා වුණේ එතුමායි. ඉස්සර කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාවක් තිබුණා. කොටින් ඇවිල්ලා ඒක කඩා විනාශ කරලා දැම්මා. ආණ්ඩුව අදත් ඒක හදන්න බලනවා. නමුත් දැන් හැම දාම සිමෙන්ති නිෂ්පාදනය කරන හොඳ කර්මාන්තශාලාවක් තිබෙනවා. ඒ සිමෙන්ති කර්මාන්තශාලාව තවත් වර්ධනය කරලා ඒ මඟින් කුඩා කර්මාන්තශාලා ඇති කරලා එමඟින් ඒ ප්‍රදේශයේ තරුණ පිරිසට රැකියා දීමේ හොඳ කාර්යය ක්‍රියාත්මක කරන්නටය කියා අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම කජු වගාව ගැනත් කියන්න ඕනෑ. [බාධා කිරීමක්] ඔව්. මගේ කතාව අවසන් කරන්නම්. එම්.එල්.එම්. අබුසාලි මැතිතුමා ඇමතිවරයා වශයෙන් ඉන්න කොට කජු තළලා පැකට් කරන කර්මාන්තශාලාවක් හැදුවා. ඒක දැන් වහලායි තිබෙන්නේ. වනිතා පක්ෂය පවා එහි රැකියාව කළා. අපේ ගැහැනු දරුවන් 50කට, 60කට ඒකෙන් රක්ෂා ලැබුණා. ඒ වාගේම වනාතවිල්ලුවේ කජු කර්මාන්තශාලාවට අයිති හොඳ බංගලාවකුත් තිබෙනවා. ඒ නිසා කජු කර්මාන්තය වර්ධනය කිරීම පිණිසත් ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමා තමන්ගේ අවධානය යොමු කර ඒ කාර්යයත් ඉෂ්ට සිද්ධ කර දේවිය කියන බලාපොරොත්තුවෙන් මේ යෝජනාව මම සභාව අභිමුඛයේ තබනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
යෝජනාව ස්ථිර කිරීම ගරු වික්ටර් ඇන්ටනි මන්ත්‍රීතුමා.

[අ. භා. 3.35]

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරන අතර ඒ පිළිබඳව වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීම යෝග්‍යායි කියා මා විශ්වාස කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය ඉතා කාලෝචිත යෝජනාවක් හැටියට මා දකිනවා. අද අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩසටහන යටතේ "දිවි නැඟුම" වැඩසටහන ආරම්භ කර තිබෙන මොහොතක ප්‍රදේශයේ සම්පත් කළමනාකරණය කරලා එය ජන ජීවිතයට මුසු කරන්න කටයුතු කිරීම තමයි මේ යෝජනාව තුළින් ඉදිරිපත් වන ඉතා වැදගත්ම කරුණ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුත්තලම දිස්ත්‍රික්කය කියන්නේ සම්පත් අනූන -සම්පත්වලින් පිරිච්ච- ප්‍රදේශයක්. මම හිතන්නේ වෙන කිසිම ප්‍රදේශයක නැති සම්පත් ප්‍රමාණයක් පුත්තලම දිස්ත්‍රික්කයේ තිබෙනවා. ඈත අතීතයේ ඉඳලා ගරු ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා පුත්තලම දිස්ත්‍රික්කයත් එක්ක විශාල සම්බන්ධතාවක් තිබෙන නිසා එතුමාට මේ සම්පත් පිළිබඳ හොඳ ඇගැයීමක් තිබෙනවා. පොල් ත්‍රිකෝණය ගැන බලන විට පුත්තලම දිස්ත්‍රික්කයත් පොල් ත්‍රිකෝණයට හසු වෙනවා. ඉතාමත් හොඳ පොල් වැවෙන ප්‍රදේශයක් තමයි පුත්තලම දිස්ත්‍රික්කය. ඒ වාගේම පොල් ආශ්‍රිත නොයෙකුත් කර්මාන්ත අතර "ඩීසී" කර්මාන්තය, තෙල් කර්මාන්තය, කොහු කර්මාන්තය, ලිංගුස් ලුණු කර්මාන්තය ආදී බොහෝ දේවල් ඉතාමත් හොඳින් පවතින හෙයින් ඒවා ප්‍රවර්ධනය කරලා වැඩිදියුණු කරන්න පුළුවන් ප්‍රදේශයක් හැටියට තමයි පුත්තලම දිස්ත්‍රික්කය අප දකින්නේ. ඒ වාගේම, "පුත්තලම" කී පමණින් බොහෝ විට ලුණු කර්මාන්තය තමයි අපට නිතරම මතක් වෙන්නේ. පුත්තලමේ ලුණු කර්මාන්තය විශාල ලෙස පැතිරී තිබෙනවා. ඒක පුත්තලම දිස්ත්‍රික්කයට ලැබුණු දේව බලපෑමක් හැටියටයි හුඟ දෙනෙක් සලකන්නේ. සමහර වෙලාවට පුත්තලමේ කිවුල් දිය තිබෙන ජලාශවලත් ලුණු මිදෙනවා. ඒ නිසා විධිමත් විධියට ලුණු කර්මාන්තය දියුණු කරන්න පුළුවන් දිස්ත්‍රික්කයක් හැටියට පුත්තලම් දිස්ත්‍රික්කය අපි දකිනවා. ලුණු නිෂ්පාදනය කරනවා විතරක් නොවෙයි. ඒ තිබෙන යම් යම් සමිති සමාගම් මඟින් විශේෂයෙන් කාන්තා සමිති මඟින් ලුණු පැකට් කරලා විදේශගත කරන මට්ටමට කටයුතු කරන්න පුළුවන් නම් ඒක ඉතා වැදගත්ය කියා මා හිතනවා. මහින්ද චින්තනයේ ඉතාමත් වැදගත් දර්ශනයක් තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික ඵලදායිතාව. වැඩි වශයෙන් මේ රටේ සම්පත් කළමනාකරණය කරලා විදේශගත කළොත් තමයි අපට එයින් ප්‍රයෝජනයක් ලැබෙන්නේ. මේ සම්පත් විධිමත් විධියට කළමනාකරණය කරලා ඩොලර්වලින්, යෙන්වලින්, ප්‍රෑන්ක්වලින්, මාර්ක්වලින් මේ රටේ ජනතාවට සල්ලි ගෙනෙන්න පුළුවන්කමක් තිබෙනවා නම් ඒක තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආර්ථිකයේ තිබෙන වැදගත්ම අවස්ථාව.

පුත්තලම දිස්ත්‍රික්කය සම්පත්වලින් අනූන බව මා කිව්වා. විශේෂයෙන්ම පුත්තලම දිස්ත්‍රික්කයේ කිරි සම්පත ගැනත් කියන්න ඕනෑ. පුත්තලමට කිලෝමීටර් 7ක් එහා පැත්තෙන් කොට්ටුකච්චිය ගොවි ගම්මානය -ගොවිපළ- තිබෙනවා. එහි එළු කර්මාන්තය තිබෙනවා; බැටළු කර්මාන්තය තිබෙනවා; කිරි ගව කර්මාන්තය තිබෙනවා. විශාල සම්පත් ප්‍රමාණයක් තිබෙන ප්‍රදේශයක්. මෙහි විශාල කැළෑ ප්‍රදේශයක් තිබෙන නිසා ආණමඩුව කියන්නේ කෘෂිකර්මය වාගේම සත්ව පාලනයත් කරන්න පුළුවන් ප්‍රදේශයක් හැටියටයි මා දකින්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අස්වර් මන්ත්‍රීතුමාගේ යෝජනාව තුළින් උද්‍යාන පිහිටු වීමක් සම්බන්ධයෙනුයි කියන්නේ. අද කර්මාන්ත පුර තිබෙනවා. පුත්තලම දිස්ත්‍රික්කයේ කර්මාන්ත පුර දෙකක් තිබෙනවා. එකක් බංගදෙනිය, සිත්තමඩම ප්‍රදේශයේයි. අනික තිබෙන්නේ පුත්තලම සිමෙන්ති ෆැක්ටරිය ආශ්‍රිතවයි. මා හිතන්නේ කාර්මික උද්‍යාන පිහිටු වනවාය යන්නෙන් ගරු අස්වර් මන්ත්‍රීතුමා අදහස් කළේ මේක ජන ජීවිතයට ගෙන ගොස් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ජනතාවගේ ආර්ථික සංවර්ධනය සඳහා පටන් ගන්නය කියන එක බවයි මගේ අදහස.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය ඉතා වැදගත් යෝජනාවක්. පුත්තලම දිස්ත්‍රික්කයේ කියන්න බැරි තරම් සම්පත් ප්‍රමාණයක් තිබෙනවා. විශේෂයෙන් වයඹ පළාතට අයිති වෙන්නේ කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක දෙකයි. මේ ඕනෑම බිම් තීරුවක ඕනෑ තරම් මල් වගා කරන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා ඇති කල්පිටිය කියන්නේ අධික උෂ්ණත්වයකින් යුත් වැලි තිබෙන ප්‍රදේශයක් බව.

නමුත් නුවරඑළිය ප්‍රදේශයේ හැදෙන මල් වර්ග අද හැදෙනවා, කල්පිටිය ප්‍රදේශයේත්. මා දන්නවා, දළුව ප්‍රදේශයේ තිබෙනවා, විශාල මල් වගාවක්. තනිකර නුවරඑළියේ වැවෙන මල් තිබෙන්නේ. අතිලස්සනට ඒවා හැදිලා තිබෙනවා. ඒ වාගේම ඒ මල් විදේශගත කිරීමත් කරනවා. පළල් කොළ, පත්‍ර ඕනෑ තරම් විදේශගත කිරීමට පුළුවන් විධියට අද පුත්තලම් දිස්ත්‍රික්කයේ හැදිලා තිබෙනවා. මේවා හොඳ ආදායමක් ලැබෙන කර්මාන්ත.

අතිගරු ජනාධිපතිතුමා දැන් ආර්ථික යුද්ධය පටන් ගෙන තිබෙනවා. දුප්පත්කම පරාජය කිරීමේ යුද්ධයයි දැන් මේ පටන් ගෙන තිබෙන්නේ. ඒ නිසා මේ සම්පත් විධිමත් විධියට කළමනාකරණය කරලා ජන ජීවිතයට ඇතුළත් කරන්නට පුළුවන් නම්, මේ ආර්ථිකය දියුණු කර අපේ රටේ දුප්පත්කම බොහෝ දුරට අවසන් කරන්නට පුළුවන් කියලා මා හිතනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මට සංඥා කරනවා, "වෙලාව හරි" කියලා. මේ විෂය හරි පුළුල් විෂයයක්. මේක කථා කරන්නට පුළුවන් විෂයයක්. ගරු අස්වර් මැතිතුමාට මා ස්තුතිවන්ත වනවා, මේ ප්‍රදේශය දිහා බලලා එතුමා මෙවැනි පොඩි යෝජනාවක් හරි ගෙනැල්ලා, මේ පිළිබඳව ගෞරවනීය සභාවේ අවධානය යොමු කරවීම ගැන. අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩසටහන සාක්ෂාත් කර ගැනීම සඳහා එතුමා දරන උත්සාහයට මේ පුත්තලම දිස්ත්‍රික්කය අනුගත කරන්නය කියන එකයි එතුමාගේ ඉල්ලීම. ඒ නිසා එයට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ. භා. 3.41]

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලෝචිත වූත්, ඉතාමත්ම වැදගත් වූත් යෝජනාවක් ගරු අස්වර් මන්ත්‍රීතුමා විසින් ගෙනැවිත් තිබෙනවා. හදිසියේ නමුත් මේ පිළිබඳව වචනයක් දෙකක් කථා කරන්නට මා කල්පනා කළේ, එම යෝජනාවේ ඇති කාලෝචිත වැදගත්කම නිසායි. අපේ රට ගැන හිතන කොට බොහෝ දෙනෙක් කල්පනා කරනවා, මන්නාරම් දිස්ත්‍රික්කය, පුත්තලම් දිස්ත්‍රික්කය කියන්නේ වැඩක් ගන්නට බැරි නිසරු පසකින් සහ ලඳු කැලෑවලින් යුක්ත බොහෝම දුෂ්කර දිස්ත්‍රික්ක කියලා. නමුත් ඓතිහාසික යුගය වශයෙන් සලකන විට අතීත කාල පරිච්ඡේදය තුළ ඉතාමත්ම සශ්‍රීකව, ඉතාමත්ම දියුණුව තිබුණු ප්‍රදේශ දෙකක් හැටියට මේ ප්‍රදේශ දෙක සලකන්නට පුළුවන්. එයින් පුත්තලම දිස්ත්‍රික්කය ගැන විතරක් අපි කථා කළොත්, අනුරාධපුර රාජධානි

කාලයේ දී දක්ෂිණ දේශය හැටියට සැලකුව කොටසට අයත් ප්‍රදේශයක් තමයි පුත්තලම දිස්ත්‍රික්කයේ වැඩි හරියක් තිබෙන්නේ. මේ හරහා ගලා යන ගංගාවන් උපයෝගී කර ගෙන කරන ලද වාරිමාර්ග සමූහයක්, වාරිමාර්ග පද්ධතියක් අපිට දකින්නට ලැබෙනවා. බොහෝ විට විදේශිකයන්ගේ ආක්‍රමණ නිසා සහ ඔවුන්ගේ වෙනත් නොමනා ක්‍රියාකාරකම් නිසා ඒ පැරණි ආර්ථික සංවර්ධන රටාව, වාරි රටාව සම්පූර්ණයෙන්ම වාගේ විනාශයට පත් වුණත්, ඒවායේ නෂ්ටාවශේෂ අද අපිට දකින්නට ලැබෙනවා.

ඒ වාගේම පුත්තලම දිස්ත්‍රික්කය පිළිබඳව කථා කරනවිට ඓතිහාසික වශයෙන් ගැනෙන සාධක රාශියක් අපට දකින්නට ලැබෙනවා. විල්පත්තුව අභය භූමිය තුළ ගවේෂණයක් කළොත් ඕනෑම කෙනෙකුට දකින්නට ලැබෙනවා, එය සුවිශාල පැරණි නෂ්ටාවශේෂවලින් පිරුණු ප්‍රදේශයක් බව. මෝදරගම් ආර දිගේ ඉහළ සිට පහළට විල්පත්තුව අභය භූමිය මැදින් මුහුදු වෙරළ දක්වා ගමන් කළොත් ඕනෑම කෙනෙකුට පෙනෙනවා, අතීතයේ මොන විධියේ සෞභාග්‍යයක් මේ ප්‍රදේශය තුළ පැතිරී තිබුණාද කියලා. ඒ වාගේම මේ මුහුද ආශ්‍රය කර ගෙන මේ ප්‍රදේශයේ පැරණි ජාත්‍යන්තර වරායන් කිහිපයක් තිබුණු බව ඉතිහාසයේ සඳහන් වනවා. එයින් එකක් තමයි ටොලමිගේ සිතියමේ සඳහන් කර තිබෙන මර්ගන කියන වරාය. ග්‍රීක ජාතික ටොලමි මේ ගැන සඳහන් කර තිබුණාට, ඒක ඔහු ආරංචි මාත්‍රයකින් සටහන් කරන ලද එකක් නොවන බවත්, ඒක ඓතිහාසික එකක් බවත් මෝදරගම් ආර අයිනේ තිබෙන සිනාඩියගල කියන නෂ්ටාවශේෂ භූමියේ ශිලා ලේඛනයක මේ මර්ගන වරාය ගැන කොටලා තිබීමෙන් පැහැදිලිව වෙනවා. දියුණු වරායක් හැටියට, ජාත්‍යන්තර වාණිජ කර්මාන්තයේ යෙදුණු තැනක් හැටියට මේ වරාය පිළිබඳව පැහැදිලි විස්තරයක් ඒ ශිලා ලේඛන ආශ්‍රයෙන් අපට පෙනෙනවා. විශේෂයෙන් ක්‍රිස්තු වර්ෂ ආරම්භයට අයිති ශිලා ලේඛනයක සඳහන් වන බව මෙයින් අපට පෙනෙනවා.

පුත්තලම දිස්ත්‍රික්කයේ පොල් කර්මාන්තය පිළිබඳව විශිෂ්ට වාර්තා අතීතයේ තබලා තිබෙන බව පේනවා. නිදර්ශනයක් වශයෙන් මම එක කරුණක් පැහැදිලි කරන්නම්. පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රදේශය අපේ පැරණි පොත පතේ සඳහන් කර තිබෙන්නේ "අන්තර සමුද්ද" කියන වචනයෙන්. මොකද, කටක් වාගේ පිහිටලා තිබෙන විශාල මුහුදු ප්‍රදේශයක් තිබෙනවා. ඒ නිසා කල්පිටිය ප්‍රදේශය, අපේ පොත් පත්වල "අන්තර සමුද්ද" කියන නමින් ව්‍යවහාර කර තිබෙනවා. මිහින්තලේ ආරාමවල නඩත්තුව සඳහා පැරණි රජ දරුවන් විසින් මේ ප්‍රදේශයේ විශාල පොල් ඉඩමක් පූජා කරපු බව මිහින්තලේ තිබෙන ශිලා ලේඛනයක සඳහන් කර තිබෙනවා. ඒ පොල් ඉඩම පිළිබඳව කදිම විස්තරයක්, ක්‍රිස්තු වර්ෂ ආරම්භයේ සියවස්වල -තුන්වන හතරවන සියවස්වල- කොටා ඇති එම ශිලා ලේඛනයේ සඳහන් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. පොල්වලට අමතරව, පුත්තලම දිස්ත්‍රික්කයේ පොල් කටු කර්මාන්තය අතිශයින්ම දියුණුව තිබුණු කර්මාන්තයක් හැටියට අපේ පාලි අට්ඨ කථා ග්‍රන්ථවල සඳහන් කර තිබෙනවා. ඉතාම කදිමට නිර්මාණය කරන ලද පොල් කටුවකින් සකස් කරන ලද කෙණ්ඩියක් මිහින්තලේ අසපුවට ගෙන ආපු ආකාරයක් පිළිබඳව එක කථාවක සඳහන් වෙනවා මට මතකයි. ඒ නිසා පුත්තලම දිස්ත්‍රික්කයේ ඓතිහාසික වශයෙන් වැදගත් වන මේ කරුණු සලකලා බලන විට අතීතයේ තිබුණු දියුණුව අපට පැහැදිලි වෙනවා. එහෙම නම් මේ ප්‍රදේශය මුඩු බිමක් නොවෙයි; සංවර්ධනය කරන්න බැරි ප්‍රදේශයක් නොවෙයි; සංවර්ධනය කරන්න පුළුවන් හොඳ ප්‍රදේශයක් හැටියට අපට තීරණය කරන්නට පුළුවන්කම ලැබෙනවා.

පුත්තලම ප්‍රදේශයේ නාවික කර්මාන්තය දියුණු වී තිබුණු බවට කදිම නිදර්ශන දකින්නට ලැබෙනවා. ආනමඩුව කිට්ටුව තිබෙන තෝනිගල පරමාකන්ද විහාරස්ථානය ආශ්‍රිතව තිබෙන ශිලා ලේඛන රාශියක සඳහන් වෙනවා, පුත්තලම දිස්ත්‍රික්කයේ නාවික කර්මාන්තය කරපු පුද්ගලයින් පිළිබඳව. නාවික හමුදා මෙහෙයවපු නාවික කටයුතු කරපු ආකාරය පිළිබඳව ඒ ශිලා ලේඛනවල සඳහන් කර තිබෙනවා. මේ තෝනිගල ශිලා ලේඛන අයිති වන්නේ ක්‍රිස්තු වර්ෂ දෙවන සිය වසේ අග භාගයටයි. අද ඉතාම දියුණුව පවතින රටවල්වල නාවික කටයුතු ආරම්භ කරන්නටත් පෙරාතුව අපේ රටේ ජනතාව පුත්තලම දිස්ත්‍රික්කය ආශ්‍රිත කර ගෙන නාවික කටයුතුවල යෙදී සිටිය ආකාරයත්, නාවික හමුදා භාරව කටයුතු කරපු නාවික කටයුතුවල යෙදී සිටි නානාපතිවරුන් ආදීන් පිළිබඳවත් ඒ ශිලා ලේඛනවල සඳහන් කර තිබෙනවා. ඒ නිසා පුත්තලම දිස්ත්‍රික්කය වර්තමානයේදී සංවර්ධනය කිරීමේදී ඒ පැරණි ඓතිහාසික පුවත් ආශ්‍රය කර ගෙන කදිම ආදර්ශයක් ලබා ගන්නට පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම ඒ ප්‍රදේශය තුළ අද හානියට පත් වෙලා තිබෙන විශාල වැව් පද්ධතියක් තිබෙනවා. පළමුවන පරාක්‍රමබාහු රජතුමා දක්ෂිණ දේශයේ පාලකයා වශයෙන් කටයුතු කරද්දී මේ ප්‍රදේශයේ එක්දහස් හයසිය ගණනක වාරි වැඩසටහනක් කර තිබෙනවා. ඒවා නැවත වාරයක් පණ ගන්වලා අරගෙන මේ හරහා ගලන ගංගා, ඔයවල් ආශ්‍රය කර ගෙන මේ ප්‍රදේශය සංවර්ධනය කිරීමේ විශිෂ්ට වැඩ පිළිවෙළක් කරන්නට අවශ්‍යයි කියන එකත්, ඒ වාගේම ඒ සඳහා අවශ්‍ය කරන පසුතලයත් මේ පුත්තලම දිස්ත්‍රික්කය තුළ පවතින බවත් සඳහන් කරන අතරම, මේ යෝජනාව ඉතාමත් කදිම, ඒ වාගේම කාලෝචිත යෝජනාවක් බවත් සඳහන් කරමින් මගේ කරුණු පැහැදිලි කිරීම මෙයින් අවසන් කරනවා. තෙරුවන් සරණයි!

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මේ යෝජනාව පිළිබඳව අදහස් දක්වන්න ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් වෙනවාද? මී ළඟට, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා.

[අ. භා. 3.50]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව ස්ථිර කළ පුත්තලම් දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වික්ටර් ඇන්ටනි මැතිතුමාටත්, ඒ වාගේම අපේ ගෞරවයට පාත්‍ර වී සිටින ගරු පූජ්‍ය මේධානන්ද හිමිපාණන්ටත් අපගේ ස්තුතිය පුද කරනවා. උන්වහන්සේ කදිම හෙළිදරව්ව කිරීම් ටිකක් කළා.

පුත්තලම දිස්ත්‍රික්කයේ නාවික කර්මාන්තය පවා දියුණු වෙලා තිබුණා. මම කිව්වා වාගේ අපි ඒ ගැන සාජහන්ගේ පොතේ කියවලා තිබෙනවා. අද හුඟක් දෙනෙකුට ඒක අමතක වෙලා, අපේ හාමුදුරුවනේ. නමුත් ඒක දැන් කරන්නට පුළුවන්. ලංකාවේ නව සංචාරක කේන්ද්‍රස්ථානයක් වශයෙන් කල්පිටිය දියුණු කිරීමට අතිගරු ජනාධිපතිතුමන් දැන් වැඩ රාශියක් ආරම්භ කරලා තිබෙනවා. කල්පිටිය වරාය ඔබවහන්සේ කිව්වා වාගේ එදා මාන්තෙයි කියන මන්නාරමටත්, කල්පිටියටත් මධ්‍යස්ථව තිබුණු වරායක්. කොළඹ වරාය නුදුටු කාලයේ ඉතිහාසයේ තිබුණු වරායක්. මාන්තෙයි කියන ප්‍රදේශයෙන් තමයි ලෝක සංචාරක ඉබන් බතූතා මොරොක්කෝවේ සිට ලංකාවට ගොඩ බැස්සේ චීන ජාතික පාහියන් භික්ෂුව වාගේ. එතුමා වයඹ පළාත සම්බන්ධව, විශේෂයෙන් පුත්තලම සම්බන්ධව හුඟක් දේවල් ලියලා, කටු කරලා, ඒවා පොත් පත්වලට අඩංගු කරලා ලෝකයට දීලා තිබෙනවා, ගරු මේධානන්ද හිමියන් කිවූ ටොලමිගේ ලෝක සිතියම වාගේ. ආරම්භයේදීම ලෝකයම ලංකාව හඳුනා ගත්තේ ඉබන් බතූතාගේ ලෝක සිතියම මඟිනුයි.

පොල් කටු කර්මාන්තය ගැනත් උන්වහන්සේ මේ අවස්ථාවේදී ප්‍රකාශ කළා. කදිමයි! අපේ හාමුදුරුවනේ. අපි ගියා ඒ දවස්වල

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

ජෝර්දානය, ඉරානය සහ අනෙකුත් රටවල්වලට. This charcoal has a special place in their country and they say the best quality charcoal is from Puttalam. That is a great pride for the people of Puttalam.

ඒ වාගේම තමයි වංශ කථාවේ තිබෙන තම්මැන්නාව නැත්නම් තම්බපන්නිය. විජය රජ්ජුරුවන් සහ කුවේණිය හමු වූ තැන දැන් කරෙයිතීවු ප්‍රාදේශීය සභාව කියලා හඳුන්වනවා. එහි පස රතු පැහැති ඉතාමත්ම සාරවත් පසක් අර යාපනයේ තින්නවේලි දිස්ත්‍රික්කයේ තිබෙනවා වාගේ. එතැනත් අපට කර්මාන්ත ඇති කරන්න පුළුවන්. ඒ වාගේම, charcoal industries could be developed. ඒ වාගේම තමයි නාවික කර්මාන්තය; naval industry. ඒකත් කර්මාන්තයක්. ඒ තුළින් පුත්තලම දිස්ත්‍රික්කයේ විශාල සංඛ්‍යාවකට රැකී රක්ෂා දෙන්න පුළුවන්. පුත්තලම දිස්ත්‍රික්කයේ පමණක් නොව අනෙක් දිස්ත්‍රික්කවල අයටත් එහාට ඇවිල්ලා රැකී රක්ෂා කරන්නට පුළුවන් වෙනවා.

තව දෙයක් තිබෙනවා. කල්පිටිය තීරුවේ නොරොච්චෝලය ආසන්නව ගර්කින් වගාව සිදු කරනවා. එදා විපක්ෂය කිව්වා Norachcholai Coal Power Plant එක දැම්මාම ගර්කින් වගාව නැති වෙයි කියලා. නැහැ, අද එය ඉතා සරු සාරයි. We can have industries for that and give innovative ideas to the farmers of Kalpitiya. ලංකාවේ ගර්කින් වගාව ඉතාමත් සරු සාරයි. ඒ දවස්වල කවුරුවත් ගර්කින් වගා කළේ නැහැ. මුහුදටයි, පුත්තලම් කළපුවටයි අතර කාන්තාරයක් වාගේයි තිබුණේ. එක පැත්තක ඉඳලා අනෙක් පැත්තට සමහර තැන්වල කිලෝමීටර් එකක්වත් නැහැ. බලන්න, කොයි තරම් ආර්ථික සංවර්ධනයක් ඇති වෙලා තිබෙනවාද කියා. ගරු ජෝන් අමරතුංග විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා දන්නවාද දන්නෙත් නැහැ ලංකාවේ විශාලම පේර ගෙඩි තිබෙන්නේ පුත්තලමේ, කල්පිටියේය කියා. ඔබතුමා දන්නවාද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
දන්නවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒකේ රස විඳලා තිබෙනවාද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔව්.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
එන්න, පේර ගෙඩි ටිකක් දෙන්නම්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මා ළඟ තිබෙනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
තිබෙනවාද? කාටවත් පෙන්වන්න එපා. එහෙම නම් පේර කර්මාන්තය මඟින් we can make *pera* crush and *pera* drinks like other fruit juices - apples and grapes. So, we can make juices out of them and have industries for those purposes.

විල්පත්තුව අභය භූමිය ගැන අපේ ස්වාමීන් වහන්සේ පවසන අවස්ථාවේදී මට මතක් වුණා අප අතර සිටි පුත්තලම නගර සභාවේ හිටපු නගරාධිපති, වයඹ පළාත් සභික එම්.අයි.බී. හාෆි මහතා මේ පිළිබඳව හොඳ ගවේෂණයක් කරලා තිබෙන බව. அல்ஹாஜ் மர்ஹூம் எம்.ஐ.பி. ஹாபி அவர்கள் - அன்று புத்தளம் நகர சபையின் தலைவராகவும் வடமேல் மாகாண சபையின் உறுப்பினராகவும் இருந்து செயற்பட்டவர் - இப்படியான கைத்தொழிற்பேட்டைகளை நிறுவக்கூடிய அருமையான இடங்களையெல்லாம் அடையாளம் கண்டார். நான் 15 ஆண்டுகளாக புத்தளம் தொகுதிக்குப் பொறுப்பாக இருந்தேன். அத்தொகுதியின் அபிவிருத்திக்காக என்னுடைய பன்முகப்படுத்தப் பட்ட நிதி முழுவதையும் வழங்கினேன். புத்தளம் சம்பந்தமாகப் பேசுவதற்கும் இந்த தனிநபர் பிரேரணையைக் கொண்டு வருவதற்கும் காரணமாக இருந்தது புத்தளம் மக்களோடு எனக்கு இருந்த சம்பந்தமாகும். [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව අවසන් කරන්නම්. පුත්තලම දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 7,70,000යි. භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 3,072යි. දිස්ත්‍රික්කය තුළ පවතින නිෂ්පාදන කර්මාන්ත සංඛ්‍යාවත් සඳහන් ලේඛනයක් මා ළඟ තිබෙනවා. කාලය නැති නිසා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම එම ලේඛනය **සභාගත*** කරනවා.

ඒ වාගේම හෙක්ටෙයාර් 48,379ක භූමි ප්‍රමාණයක පොල් වගාව කෙරෙනවා. හෙක්ටෙයාර් 12,033ක වෙනත් වගාවන් තිබෙනවා. මේ ආදී වශයෙන් නොයෙකුත් සම්පත්වලින් ආඪ්‍ය වූ, විශාල සම්පතකට හිමිකම් කියන පුත්තලම දිස්ත්‍රික්කය සංවර්ධනය කිරීමට අපේ ඇමතිතුමා, අපේ ආණ්ඩුව ක්‍රියා කළ යුතු යැයි මා කියනවා. இறுதியாக நான் ஒன்றைச் சொல்லி முடிக்கின்றேன்.

"கைத்தொழிலொன்றைக் கற்றுக்கொள்
கவலை உனக்கில்லை ஒத்துக்கொள்".

එයින් කියන්නේ "මොකක් හෝ කර්මාන්තයක් ඉගෙන ගන්න, එතකොට ඔබට කිසිම සැක සංකාවක් ඇති වෙන්නේ නැහැ" කියන එකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුත්තලම ප්‍රදේශය එවැනි අපූරු ප්‍රදේශයක්, මනරම් වූ ප්‍රදේශයක් බව තමුන්නාන්සේලාටත්, රටටත් නැවත වාරයක් හඳුන්වා දෙමින් තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

---

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
** ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
** Document not tendered.*

# කෑගල්ල දිස්ත්‍රික්කය තුළ කෞතුකාගාරයක් පිහිටුවීම
## கேகாலை மாவட்டத்தில் நூதனசாலையொன்றினைத் தாபித்தல்
## ESTABLISHMENT OF A MUSEUM IN KEGALLE DISTRICT

[අ. භා. 3.57]

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ඇති පෞරාණික, සංස්කෘතික, සමාජමය වටිනාකමක් ඇති ස්ථානවල තොරතුරු ලබා ගත හැකි හා කෞතුක භාණ්ඩ සඳහා කෞතුකාගාරයක් පිහිටුවීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කයට වැදගත් වන කෞතුකාගාරයක් පිහිටුවීම පිළිබඳ යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම මේ අවස්ථාවේ ගරු කථානායකතුමාටත්, ඔබතුමාටත් මගේ ස්තුතිය හා ගෞරවය පුද කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව ගෙන එන අවස්ථාවේ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා මේ ගරු සභාවේ රැඳී සිටීම ගැන විශේෂයෙන්ම මා ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම එතුමාගේ අදහස් මෙයට එකතු කරයි කියලා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව පසු ගිය හයවැනි පාර්ලිමේන්තුවේදීත් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් විධියට න්‍යාය පුස්තකයට ඇතුළත් වී තිබුණා. විශේෂයෙන්ම මම මේ යෝජනාව ඉදිරිපත් කරද්දී කෑගල්ල දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගාමිණී රත්නායක සහෝදරයා ගෞරවයෙන් යුතුව සිහිපත් කරනවා. ඔහුට මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න බැරි වුණත්, මේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියා අපෙන් ඉල්ලීමක් කළා.

විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කය කිව්වාම ඉතා වැදගත් දිස්ත්‍රික්කයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අපේ රටේ ඉතිහාසය දිහා බැලුවාම දේශපාලන, ආර්ථික, සමාජයීය, ආගමික, සංස්කෘතික තොරතුරු පිළිබඳව විපරමක් කරද්දී, ගැඹුරින් අධ්‍යයනයක් කරද්දී ඓතිහාසික අගය විධියට ගත්තත් පොළොන්නරුව, අනුරාධපුර දිස්ත්‍රික්ක හැරුණාම ඊ ළඟට තිබෙන්නේ කෑගල්ල දිස්ත්‍රික්කය කියන එක කවුරුත් පිළිගන්නා කාරණයක්. විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කය ඓතිහාසික වශයෙන් වැදගත් වන්නේ ප්‍රාග් ඓතිහාසික යුගයේ ඉඳලාමයි. වර්තමානය දක්වා හැම යුගයකටම අයත් බැඳීමක් මේ දිස්ත්‍රික්කයේ තිබෙනවා.

එහෙම ඉතිහාසයක් තිබෙන දිස්ත්‍රික්කයක් කෑගල්ල දිස්ත්‍රික්කය. අපි දන්නවා බොහෝ දිස්ත්‍රික්ක එක කාල රාමුවකට, එක විෂයයකට, එක කාරණයකට පමණයි වැදගත්කමක් තිබෙන්නේ. නමුත් කෑගල්ල දිස්ත්‍රික්කය ගත්තාම ප්‍රාග් යුගයේ ඉඳලා අද වන තෙක් ඉතිහාසයක් තිබෙන, වැදගත්කමක් තිබෙන දිස්ත්‍රික්කයක් හැටියට තමයි අපි දකින්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

කරුණාකර නිශ්ශබ්ද වන්න. කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු ජගත් බාලසූරිය මහතා (ජාතික උරුමයන් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜகத் பாலசூரிய - தேசிய மரபுரிமைகள் அமைச்சர்)
(The Hon. Jagath Balasuriya - Minister of National Heritage)

"ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මෙම දිස්ත්‍රික්කය ඉතිහාසයේ විශාල කාල පරිච්ඡේදයක් පුරා පැතිරුණු, කරුණු ගණනාවක් ගොනු කර ගන්න පුළුවන් දිස්ත්‍රික්කයක්. සෑම යුගයකටම අයත් පුරා විද්‍යාත්මක ස්ථාන, ඒ වාගේම ඓතිහාසික වටිනාකම් ඇති ස්ථාන, නටබුන්, ලේඛන, විවිධ සාහිත්‍ය මූලාශ්‍ර වැනි බොහෝ දේවල් කෑගල්ල දිස්ත්‍රික්කයෙන් බිහි වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉතිහාසය විවර කර ගන්න උත්සාහ කළොත් ඒ සඳහා මූලාශ්‍ර ගොඩක් තිබෙනවාය කියා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ක්‍රි. පූ. 3 වන සියවසේ සිට බ්‍රාහ්මී අක්ෂරවලින් රචිත කටාරම් ලෙන් ලිපි තිබෙනවා. ඒ වාගේම පුරා විද්‍යාත්මක සහ වාස්තු විද්‍යාත්මක නටබුන් තිබෙනවා. ඒ වාගේම පාලි හා සිංහල වංශ කථා ඇතුළු සාහිත්‍ය මූලාශ්‍ර අපට මේ දිස්ත්‍රික්කයෙන් අධ්‍යයනය කරන්න පුළුවන්. ඒ වාගේම පුස්කොළ සන්නස්, වට්ටෝරු ආදී ලේඛන ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම විදේශීය ලේඛකයන් විසින් රචිත කෘතීන් ගණනාවක් තිබෙනවා.

විශේෂයෙන්ම ලංකාවේ ප්‍රථම පුරා විද්‍යා කොමසාරිස් එච්.සී.පී. බෙල් මහතාගේ කෑගල්ල දිස්ත්‍රික්කය පිළිබඳ වාර්තාව මෙහිදී ප්‍රමුඛස්ථානයක් ගන්නවා කියා මා කල්පනා කරනවා. ඒ වාගේම ඒ ලිඛිත සහ නටබුන් විධියට තිබෙන දේවල් හැරුණාම මුඛ පරම්පරාගතව ජන කවි, ජන කථා සහ විවිධ ජනශ්‍රැති ප්‍රමාණයක් මේ දිස්ත්‍රික්කය පුරා විහිදී තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියල්ල අධ්‍යයනය කළාට පසුව මේ දිස්ත්‍රික්කයට ඉතා වැදගත් ඉතිහාසයක් තිබෙනවා කියා අපි විශ්වාස කරනවා.

අපේ ඉතිහාසය හැදෑරීම, ඉතිහාසයේ තිබෙන මූලාශ්‍ර හැදෑරීම කියන එක අපේ රට අනාගතයට ගමන් කිරීමේදී ඉතා වැදගත් කාරණයක් කියන එක අපි දන්නවා. අනාගතය නිර්මාණය කිරීමේදී අපට ඉතිහාසයෙන් ගන්න පුළුවන් වටිනා බොහෝ

[ගරු අජිත් කුමාර මහතා]

දේවල් තිබෙනවා කියා අපි විශ්වාස කරනවා. ඒ නිසාම එය විෂයයක් විධියට අධ්‍යයනය කරන්න අපි කවුරුත් කැමැතියි. ඒ වාගේම ඒ වටිනා දේවල් ඉදිරියට ගෙන යන්න අපි කවුරුත් කැමැතියි. මේ පිළිබඳව රටේ වැදගත් අවධානයක් යොමු විය යුතුයි කියා මා විශ්වාස කරනවා.

ඒ වාගේම කැගල්ල දිස්ත්‍රික්කයේ අලුලෙන, අඹේපුස්ස, දිවල, සල්ගල, ලෙනගල, දනකිරිගල ආදී ස්ථානවල විශාල බ්‍රාහ්මී ලිපි මාලාවක් තිබෙනවා. මුළු දිස්ත්‍රික්කය පුරා විසිරුණු ලිපි ප්‍රමාණයක් තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම මේ ලිපිවලින් බුදු දහම පිළිබඳව, ලංකාවේ ශාසනික ඉතිහාසය පිළිබඳව, ලංකාවේ රජ පෙළපත පිළිබඳව, පාලන ක්‍රමය පිළිබඳව තොරතුරුත්, ඒ වාගේම ලංකාවේ කෘෂිකර්මය, වෙළඳාම සහ මුදල් පරිහරණය වාගේ ආර්ථිකමය වශයෙන් වැදගත් තොරතුරු ගණනාවකුත් අපට එළි දක්වා ගන්න පුළුවන්. ඒ වාගේ විශාල සෙල් ලිපි ප්‍රමාණයක් කැගල්ල දිස්ත්‍රික්කය පුරා තිබෙනවා. දැදිගම අබේදාන සෙල් ලිපිය, දෙවනගල අංක 01 සෙල් ලිපිය, නාරම්බැද්ද සෙල් ලිපිය සහ උස්සාපිටිය වහරක්ගොඩ තිබෙන සෙල් ලිපි තුන ආදී වශයෙන් ඉතා වැදගත් ලේඛන ප්‍රමාණයක් මේ දිස්ත්‍රික්කය පුරා විසිරී තිබෙනවා.

ඒ වාගේම පුරා විද්‍යා සහ වාස්තු විද්‍යාත්මකව තිබෙන නටබුන් බැලුවාම පාෂාණ යුගයේදී මිනිසුන් සිටියාය කියා තහවුරු කරන ගල් ලෙන් රාශියක් කැගල්ලෙන් හමු වෙලා තිබෙනවා. දොරවක, අලුලෙන, අස්මඩල, බතලෙගල, ලෙනගල, අම්බලකන්ද, බෙලිගල, සල්ගල, කැලැඳඹුල්ල ආදී ස්ථානයන් ඒ අතර ප්‍රධාන තැනක් ගන්නවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ක්‍රි. පූ. 20,000ත් 30,000ත් අතර වන ශිලා යුගයට අයත් ගල් මෙවලම්, හැළි වළං දොරවක ගල් ලෙන තුළින් හමු වෙලා තිබෙනවා. ඒ වාගේම මාවනැල්ලට නුදුරුව තිබෙන අස්මඩල ගමේ තිබී මිනිස් ඇට සැකිලි සහිත වළං කැබැලි හමු වෙලා තිබෙනවා. ඒ වාගේම කැගල්ල දිස්ත්‍රික්කයේ විශාල මානව ඉතිහාසයක් තිබුණු බවට අපි කැගල්ල දිස්ත්‍රික්කය අධ්‍යයනය කළාට පස්සේ තොරතුරු සොයා ගෙන තිබෙනවා. ඒ වාගේම බෞද්ධ ස්මාරක ගණනාවක් සොයා ගෙන තිබෙනවා. විශේෂයෙන්ම රඹුක්කන තිබෙන දැලිවල කොටවෙහෙර ඒ අතර වැදගත් තැනක් ගන්නවා. ලංකාවේ ස්තූප කලාවේදී ඉතා වැදගත්, ඓතිහාසිකව වැදගත් සහ ස්තූප විකාශනයේ විශේෂම තැනක් විධියට දැලිවල කොටවෙහෙර වැදගත් තැනක් ගන්නවා.

අපේ රටේ ඉතිහාසය පිළිබඳව හැදෑරීමේදී, ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළේ මාතලේ අලු විහාරයේදීද, අලුලෙනේද කියලා මතභේදයක් තිබෙන බව අපි දන්නවා. වළගම්බා රජතුමා දවස ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළා යැයි විශ්වාස කරන අලුලෙන මේ දිස්ත්‍රික්කයේ පිහිටා තිබෙනවා. ඒ වාගේම ඒ අලුලෙනේ පන්සියයකට රැස් වෙන්න පුළුවන් ඉඩකඩ තිබුණා කියා අපි දන්නවා. ඒ වාගේම දැදිගම කොටවෙහෙර, බෝධිය, පැරකුම්බා රජතුමාගේ සෙල් ලිපි සහ පුවරු ලිපි ඉතා වැදගත් තැනක් ගන්නවා. සූතිඝර චෛත්‍යය ස්තූප කලාවේ වැදගත් තැනක් ගන්නවා. ඒ නිසා පුරා විද්‍යා කැණීම්වලදී විශේෂයෙන්ම සෙනරත් පරණවිතාන මැතිතුමා සහ එච්.සී.පී. බෙල් මැතිතුමා කැණීම් කළ යුතු තැන් නිර්දේශ කළා. ඒ අනුව සෙනරත් පරණවිතාන මැතිතුමා මේ සම්බන්ධයෙන් විශාල ලෙස මැදිහත්වීම් කර තිබෙනවා. විශේෂයෙන්ම දැදිගම කොටවෙහෙරේදී බුද්ධ ප්‍රතිමා, කාසි සහ මූර්ති හමු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ලෝකඩ ඇත් පහන සොයා ගෙන තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ඇත් පහන තාක්ෂණයෙන් ඉතාම වැදගත් නිර්මාණයක් විධියට අපි අසා තිබෙනවා. ඒ ඇත් පහනේ තෙල් අඩු වන විට වායුවේ තෙරපීම මත ඇත් බඳේ තිබෙන තෙල් පහනට පිරිලා ඒ පහන දීර්ඝ කාලයක් පත්තු වෙන්න පුළුවන් විධියට සාදා තිබෙනවා. ඒ නිසා කැගල්ල දිස්ත්‍රික්කය ඉතා ඉහළ තාක්ෂණයක් තිබුණ, නිර්මාණ හැකියාවක් තිබුණ, ඉතිහාසයක් තිබුණ දිස්ත්‍රික්කයක් කියා අපි දකිනවා.

විශේෂයෙන්ම දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ ශිල්පයේ බලපෑම අලවතුරේ ගනේගොඩ විහාරයට තිබුණා. ඒ වාගේම බැරන්ඩි කෝවිල හින්දු ගෘහ නිර්මාණ ශිල්පයේ බලපෑම අනුව නිර්මාණය කරලා තිබෙනවා. කැගල්ල දිස්ත්‍රික්කයේ මෙවැනි ඉතිහාසයක් තිබෙනවා. විශේෂයෙන්ම ඒ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරයෙක් ඒ විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සිටිනවා. කැගල්ල දිස්ත්‍රික්කයේ තිබෙන ඒ මහා විශාල ඉතිහාසය නිරූපණය කරන්න, ඒ ඉතිහාසය අධ්‍යයනය කරන්න, ඒ ඉතිහාසයෙන් ගත යුතු දේ අනාගතයට එකතු කරන්න, ඒ සඳහා කෞතුකාගාරයක් පිහිටු වීම ඉතා වැදගත් කියන යෝජනාව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින්, ඒ වෙනුවෙන් මේ ගරු සභාවේ සියලු දෙනාගේම අවධානය යොමු වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. කවුරු හෝ මන්ත්‍රීවරයෙක් මෙම යෝජනාව ස්ථිර කරන්න.

[අ. භා. 4.07]

**ගරු වයි.ජී. පද්මසිරි මහතා**
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)

ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා ස්ථිර කරන ගමන්ම එතුමාට ස්තුතිවන්ත වනවා, කැගල්ල දිස්ත්‍රික්කයට කෞතුකාගාරයක් යෝජනා කරමින් ඒ ඓතිහාසික කැගල්ල දිස්ත්‍රික්කයේ වැදගත් තොරතුරු බිඳක් මේ උත්තරීතර සභාව හමුවේ තැබීම පිළිබඳව. මා මේ යෝජනාව පිළිබඳව ඉතාම කෙටියෙන් වචන ස්වල්පයක් සඳහන් කරන්න කැමැතියි.

ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා කිව්වා වාගේම ඉතාම වටිනා පුරාවිද්‍යාත්මක වටිනාකම් රාශියක් කැගල්ල දිස්ත්‍රික්කය පුරා විසිරී පැතිරී තිබෙනවා. ඒ වාගේම තවමත් ගවේෂණයට ලක් නොවූ ස්ථාන රාශියක් තිබෙනවා. මේ අවස්ථාවේදී අපි සතුටු වනවා, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා හැටියට ගරු ජගත් බාලසූරිය මැතිතුමා අපේ දිස්ත්‍රික්කයෙන්ම පත් වී සිටීම පිළිබඳව. එතුමාට ලොකු භාරදූර කටයුත්තක් පැවරී තිබෙනවා. විශේෂයෙන් තමන් ජීවත් වන දිස්ත්‍රික්කය හැටියට ඒ දිස්ත්‍රික්කයේ ඓතිහාසික වටිනාකම මතු කර, අනාගත පරපුර වෙනුවෙන් යමක් කිරීමට එතුමාට හොඳ අවස්ථාවක් උදා වී තිබීම පිළිබඳව ඒ දිස්ත්‍රික්කයේ කෙනෙකු හැටියට මමත් මේ අවස්ථාවේදී ඉතාමත්ම සතුටට පත් වනවා.

ලංකාවේ පුරා විද්‍යාව ආරම්භ වීමට හේතු වුණු බෙල් වාර්තාවේ කැගල්ල දිස්ත්‍රික්කය පිළිබඳව සඳහන් වනවා. ඒ බෙල් වාර්තාවට අනුව ස්ථාන සිය දහස් ගණනක් පිළිබඳව එතුමා කරුණු රාශියක් එකතු කරලා තිබෙනවා. 1890 පමණ කාලයේ එතුමා පුරා විද්‍යා කොමසාරිස්වරයා හැටියටත්, පසුව දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා හැටියටත් දිස්ත්‍රික්කය පුරා සංචාරය කරමින්, ඇවිදිමින් විවිධ තොරතුරු ඒක රාශි කර තැබීමේ අගය කියා නිම කළ නොහැකියි. ඒ ස්ථාන පිළිබඳව අදටත් ගවේෂණ කරමින් ඉදිරියට යා යුතුව තිබුණත්, යම් කිසි ආකාරයකට ඒ ගවේෂණ කටයුතු නතර වෙලා තිබෙනවා. අපේ රටේ පුරා විද්‍යා තොරතුරු ඒක රාශි කිරීම දිස්ත්‍රික්ක කිහිපයකට පමණක් සීමා වෙලා තිබෙනවා.

කාලයක් තිස්සේ ප්‍රදේශයේ ජනතාව කළ ඉල්ලීමක් පරිදි, ස්වාමීන් වහන්සේලා කළ ඉල්ලීමක් පරිදි පුරා විද්‍යා දෙපාර්තමේන්තුව පැරණි ස්මාරක කිහිපයක් කැණීම්වලට භාජනය කළාට පසුව දැන් තොරතුරු ප්‍රසිද්ධියට පත් කරලා තිබෙනවා, ඒවා අවුරුදු 3,000ක් පැරණි සොහොන් තුනක් බවට. අවුරුදු 3,000ක කාල නිර්ණයක් කරලා තිබෙනවා. අවුරුදු 3,000කටත් වඩා පැරණියි කියන එක තමයි පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ විද්‍යාඥයින් විසින් අපට දැනුම් දීලා තිබෙන්නේ. ඒ ස්ථානය මායා රටට අයිතියි. ඒ රාජ්‍ය 32න් එකක් වන පාලංගමුව කියන ප්‍රදේශයෙන් තමයි මේ සොහොන් සොයා ගෙන තිබෙන්නේ. දැන් මේ ස්ථානය නැවතත් වසා දමා ගිහින් තිබෙනවා. එයින් එක කොටසක් කොළඹ පුරා විද්‍යා කෞතුකාගාර භූමියට ගෙනෙන්නත් යෝජනා කළාය කියා කිව්වා. නමුත් අපේ අදහස නම් එය එම ප්‍රදේශයේම ආරක්ෂා සහිතව තබා ගැනීමයි.

ඒ විතරක් නොවෙයි. විවිධ කැටයම්, ලී කැටයම් තිබෙන ගොඩනැඟිලි කෑගල්ල දිස්ත්‍රික්කයේ තිබෙනවා. එයින් එකක් තමයි රුවන්වැල්ල ජුබිලි අම්බලම. එය අවුරුදු එකසිය ගණනකට පෙර හදපු එකක් වුණත් ඇම්බැක්කේ දේවාලයේ තිබෙන කැටයම්වලට ඉතාම සමාන කැටයම් එහි තිබෙනවා. එම ප්‍රදේශයේ පැරණි නිර්මාණකරුවන්ගේ ඉතාම වටිනා නිර්මාණයන් සහිත ඒ ස්ථානය රැක ගත යුතුව තිබෙනවා.

මා ජාතික උරුමයන් පිළිබඳ උපදේශක කාරක සභාවටත් එම ප්‍රශ්නය යොමු කළා. විශේෂයෙන් තොරතුරු මධ්‍යස්ථානයක් හැටියට එම ස්ථානය පවත්වාගෙන යෑමේ වැදගත්කමක් තිබෙනවා. හතර කෝරළය සහ තුන් කෝරළය වශයෙන් කෑගල්ල දිස්ත්‍රික්කය කොටස් දෙකකට ගත්තොත් මෙම කලාප දෙකේම තිබෙන මේ ඓතිහාසික ස්ථාන රැක ගත යුතුව තිබෙනවා. ලෙවන්ගම විහාරස්ථානයේ, තුන් කෝරළයට තිබෙන එකම ටැම්පිට විහාරයේ ලී දිරාපත් වූ අවස්ථාවේදී පළාත් සභාවේ මුදලක් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට වෙන් කරවා ගෙන එම ස්ථානය තවත් අවුරුදු සිය ගණනක් පවතින විධියට සංරක්ෂණය කර ගන්න මට මෑතකදී පුළුවන්කම ලැබුණා. නමුත් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ අවධානය තව තවත් යොමු කළ යුතු ස්ථානයක් තමයි ලෙවන්ගම විහාරස්ථානය කියන්නේ.

මේ එක්කම සඳහන් කරන්න ඕනෑ දැදිගම, කොටවෙහෙර ප්‍රදේශයේ දැනටමත් කෞතුකාගාරයක් තිබෙන බව. ඒ කෞතුකාගාරය තවත් වැඩිදියුණු කරලා ඒක දිස්ත්‍රික්කයේම පොදු කෞතුකාගාරය කරන්නත් පුළුවන්කම තිබෙනවා. ඒ එක්කම සීතාවක රාජධානියටත් බලපාන විධියට, තුන් කෝරළයටත් බලපාන විධියට කෞතුකාගාරයක් ඉදි වෙනවා නම් හොඳයි. පුරා විද්‍යා ප්‍රාදේශීය කාර්යාලය පවත්වා ගෙන යන ඒ මානියංගම ප්‍රදේශයේ, රාජසිංහ මාළිගාව භූමිය පිහිටි ඒ ප්‍රදේශයේ ඒ කෞතුකාගාරය පිහිටුවනවා නම් වඩාත් සුදුසුයි කියන එකයි ප්‍රදේශවාසීන් හැටියට අප දකින්නේ.

තොරතුරු මධ්‍යස්ථාන කිහිපයක්ම තිබෙනවා. සංචාරකයන් විශාල ප්‍රමාණයක් ඒක රාශි වන කෑගල්ලේ පින්නවල සහ රුවන්වැල්ල ජුබිලි අම්බලම වාගේ ස්ථාන සංචාරකයන්ගේ තොරතුරු මධ්‍යස්ථාන හැටියට ඉතා වැදගත් ස්ථාන බව සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට වඩා කරුණු දක්වන්න මා කාලය ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මේ යෝජනාව අගයමින්, ස්ථිර කරන බව සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මී ළඟට පුරා විද්‍යා චක්‍රවර්තී පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමිපාණෝ.

[අ. භා. 4.13]

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව අර මුලින් මා සඳහන් කරපු යෝජනාව වාගේම කදිම කාලෝචිත යෝජනාවක්. මීට වර්ෂ ගණනාවකට උඩදී දැදිගම කොටවෙහෙර සංරක්ෂණය පිළිබඳව පවත්වපු සාකච්ඡාවකදී මම ඉදිරිපත් කළා, කෑගල්ල දිස්ත්‍රික්කයේ තිබෙන වැදගත් පුරා විද්‍යාත්මක ස්ථාන පිළිබඳව ජනතාව කිසියම් දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සුදුසුයි කියලා. කාලය විසින් එය අමතක කර දාලා තිබෙනවා. නමුත් කෑගල්ල දිස්ත්‍රික්කය පිළිබඳව වර්තමාන යුග බෙදීම් පසෙකින් තබා අපි අතීතය දිහා සලකා බලන විට, මේ ප්‍රදේශය අයත් වුණේ පැරණි මලය රට කියන ප්‍රදේශයට සහ අනුරාධපුර යුගයේදී දක්ෂිණ දේශය නමින් හඳුන්වපු ප්‍රදේශයේ කොටසක් හැටියටයි. දැදිගම පවතින පුරා වස්තු අතර ඇති දැදිගම චෛත්‍යය අපි හඳුන්වන්නේ සූතිඝර චෛත්‍යය කියලායි. එහෙම කියන්නේ පළමුවැනි පරාක්‍රමබාහු රජ්ජුරුවෝ ඉපදුණු ස්ථානයේ ඒ චෛත්‍ය ඉදි කරලා තිබෙන නිසායි. ඒකයි සූතිඝර චෛත්‍යය කියලා කියන්නේ. පළමුවැනි පරාක්‍රමබාහු රජ්ජුරුවෝ බිහි වුණු ස්ථානය. ඒ තිඹිරි ගෙය වට කරලා තමයි ඒ චෛත්‍යය හදලා තිබෙන්නේ. එහි ලකුණු, පැරණි ස්වරූපය බලන්න ඉතිරි කරලා දැනට ඒ චෛත්‍යය තහවුරු කරලා තිබෙනවා. මේ ස්ථානය -දැදිගම- වංශ කථාවේ සඳහන් වෙන්නේ ජාතිගාම කියලායි. මේක දක්ෂිණ දේශයේ අගනුවර වශයෙන් කලක් පැවතුණා. දක්ෂිණ දේශයේ අගනුවර වශයෙන් පඬුවස්නුවර කලක් පැවතුණා වාගේ දක්ෂිණ දේශයේ අගනුවර හැටියට කලක් පැවතුණේ දැදිගමයි. ඒ නිසා කෑගල්ල දිස්ත්‍රික්කයට විශේෂ වැදගත්කමක් එනවා දක්ෂිණ දේශයේ අගනුවර වශයෙන් කාලයක් පැවතුණු එකත්, මහා පරාක්‍රමබාහු රජ්ජුරුවන්ට සම්බන්ධ සූතිඝර චෛත්‍යය එතැන පිහිටා තිබීමත් කියන කරුණු දෙක පමණක් ගත්තත්.

ඒ වාගේම කෑගලු දිස්ත්‍රික්කය ඉතාම පැරණි ඉතිහාසයක් ඇති ප්‍රදේශයක්. එවකට පුරා විද්‍යා අධ්‍යක්ෂවරයා වශයෙන් හිටිය එච්.සී.පී. බෙල් මහත්මයා ලියපු කෑගලු වාර්තාවේ මේ පිළිබඳව යම් යම් තොරතුරු ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් ඒ වාර්තාවට වඩා තවත් බොහෝ තොරතුරු කෑගලු දිස්ත්‍රික්කයට එකතු වෙමින් පවතිනවා; දැනටත් එකතු වෙලා තිබෙනවා. අනෙක් අතට කෑගල්ලේ යටහලෙන සහ ලෙනගල කියන ස්ථාන දෙකේ තිබෙන ශිලා ලේඛන ගත්තොත් අපේ වංශ කථාවේ සඳහන් වන ඓතිහාසික කරුණු සමහරක් අපිට ස්ඵුට කර ගැනීමට නැත්නම් තහවුරු කර ගැනීමට හේතු වන ශිලා ලේඛන බව පැහැදිලි කරන්න පුළුවන්. යටහලෙන සහ ලෙනගල තියෙන ශිලා ලේඛනවල සඳහන් වන රජ පරපුර යම් යම් කරුණු සාධක අනුව අපි නිගමනය කරනවා, කැලණිය පාලනය කරපු කැලණි රාජ පරම්පරාව තමයි ඒ කියලා. ඒ විතරක් නොවෙයි. මේ රාජ පරම්පරාව අනුරාධපුරය පාලනය කරපු දේවානම්පියතිස්ස රජතුමාගේ සහෝදරයකුගෙන් පැවැත එන පරම්පරාවක් හැටියටත් ශිලා ලේඛන ආශ්‍රයෙන් අපිට කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්කම ලැබිලා තියෙනවා. ඒ අතින් කෑගලු දිස්ත්‍රික්කය ඓතිහාසික වශයෙන් අපිට බොහොම වැදගත් වන පුරාවස්තු, අභිලේඛන රැක ගෙන තිබෙන ප්‍රදේශයක් හැටියට අපි සලකනවා.

[ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි ]

ඒ වාගේම මේ යෝජනාව ඉදිරිපත් කරපු ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, කෑගල්ලේ අලුලෙන සම්බන්ධව. අලුලෙන කියන ස්ථානයේදී ත්‍රිපිටක සංගායනාව කළාය කියන මතයක් තිබෙනවා. ඒ පිළිබඳව එක්තරා මහත්මයෙක් තීරණාත්මක පොතකුත් ලියලා තිබෙනවා. එ ග්‍රන්ථය මා කියවා තිබෙනවා. ඒ කොහොම වෙතත් වළගම්බා රජතුමාගේ කාලයේදී බැමිණිටියා සාය නිසා හාමුදුරුවරු ලංකාවෙන් පිටට වැඩියා. අපේ ධර්මධර මහ රහතන් වහන්සේලා විශාල පිරිසක් ඉන්දියාවට වැඩම කළා. උන්වහන්සේලා ලංකාවට පැමිණ මණ්ඩලාරාම කියන සම්මේලනය පැවැත්වූවා. අපේ පොත්වල තිබෙන තොරතුරු අනුව උන්වහන්සේලා සම්මේලනය පැවැත්වූ ස්ථානය තමයි කෑගලු දිස්ත්‍රික්කයට අයිති වට්ටාරම කියන නමින් හඳුන්වන ස්ථානය. ක්‍රිස්තු පූර්ව සියවස්වල සිදු වුණු මණ්ඩලාරාම සම්මේලනය - ධර්මය පොත්පත්වල ලියන්න ඉස්සෙල්ලා පැවැත්වූ සම්මේලනය- පැවැත්වීමේ ගෞරවයත් කෑගලු දිස්ත්‍රික්කයට හිමි වනවා. ඒ නිසා අපි කෑගලු දිස්ත්‍රික්කය අමතක කර තිබීම වැරදියි.

මෑත කාලය ගන්න කොට, කෝට්ටේ රාජධානි කාලයේ හයවන සිරිපැරකුම්බා රජතුමා තමන්ගේ පුත්‍රස්ථානයේ වැඩුණු සපුමල් කුමාරයා යැව්වා, යාපනය ජයග්‍රහණය කරන්න. අපේ ගරු අස්වර් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාවේ කියපු පුත්තලම, පොන්පරිප්පුව, තම්මැන්නාව, මාන්තෙයි මල්විල හරහා තමයි ඒ මුහුදු බඩ ගමන් මාර්ගය තිබුණේ. දෙවුන්දර තුඩුවේ ඉඳලා උතුරු තුඩුව දක්වා ගිය ඓතිහාසික ගමන් මාර්ගය තමයි ඒ. ඒ ගමන් මාර්ගයේ තමයි සපුමල් කුමාරයා යාපනයට ගියේ. යාපනය ජයග්‍රහණය කරලා, හය වන පැරකුම්බා රජතුමාගේ නියෝගය මත යාපනයේ හිටිය ආර්ය චක්‍රවර්තිගේ අන්තඃපුරය ගෙනැල්ලා නැවැත්වූයේ -ඒ අන්තඃපුරයේ හිටිය තරුණ කාන්තාවන් නැවැත්වූවේ- කෑගල්ලේ කොටගම කියන ස්ථානයේ. කොටගම කියන ස්ථානයේ දෙමළ භාෂාවෙන් ලියා තිබුණු ශිලා ලේඛනයක තිබුණා ගීයක්. අද ඒක දකින්න ලැබෙන්නේ නැහැ. නමුත් පිටපත් කරලා වග කිව යුතු ලෙස වාර්තාවට ඇතුළත් කර තිබෙනවා. ඒක ගීයක්. යාපනයේ හිටිය පාලකයන්ගේ අන්තඃපුරය එතැන නවත්වා සිටි බවට කරුණු ඒ ගීය තුළින් කියැ වෙනවා. අන්න ඒ වාගේ බොහෝ දේ කෑගලු දිස්ත්‍රික්කය පිළිබඳව කථා කරන්න පුළුවන්. දැනට දැලිවල කොටවෙහෙර කෞතුකාගාරයක් තිබෙනවා. ඒක ඒ ස්ථානයට විතරක් සීමා වුණු දෙයක්. දැලිවල කොටවෙහෙර තිබිලා හම්බ වුණු කරඬුව තමයි ලංකාවේ පැරණි චෛත්‍යය ආකෘතිය පිළිබඳව කදිම පුරා විද්‍යා සාධකය බවට පත් වෙලා තිබෙන්නේ. එබඳු කරඬුවක් අපට නැවත හමු වෙලා තිබෙන්නේ, - [බාධා කිරීමක්]

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)
කීරවැල්ල.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
පොතුවිල් ආසන්නයේ තිබෙන කොටවෙහෙර කියන ස්ථානයෙන් තමයි තවත් ඒ වාගේ කරඬුවක් හම්බ වෙලා තිබෙන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එතුමා කියන්නේ කීරවැල්ල කියලායි.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
ඒ නිසා ලොකු සමානත්වයක් තිබිලා තියෙනවා. ඒ වාගේම දළ දා වහන්සේ වැඩමවා ගෙන ආපු ඒ රාජ පරම්පරාවලට කෑගලු දිස්ත්‍රික්කයෙන් කීරවැල්ල කියන ගම නින්දගමක් වශයෙන් දුන්න බව අපේ රාජාවලිය කියන පොතේ සඳහන් කරලා තිබෙනවා. නමුත් අද එබඳු ගමක් නොවෙයි, කීරවැල්ල වත්ත කියලා වත්තක් තෝලංගමුවේ සෙන්ට්‍රල් එක ආසන්නයේ තිබෙනවා. එබඳු ගමක් අපට දැන් හොයන්න පුළුවන්කමක් නැහැ. කීරවැල්ලේ ඇති වෙච්ච මේ රජ පරම්පරාව කෝට්ටේ රාජධානියේ රජවරුන්ට බිසෝවරුන් සපයපු පිරිසක් හැටියට අපේ ඉතිහාසයේ කියැ වෙනවා. ඒ නිසා ඒ පැරණි පරම්පරා පිළිබඳව කථා කරන කොටත් ඒක ඓතිහාසික වශයෙන් අපට බොහොම වැදගත් වන තැනක්.

අනෙක් එක, රඹුක්කන තිබෙන ගල් කාමරය. ඒක ලංකාවේ තිබෙන සුවිශේෂ නිර්මාණයක්. වැද්දන් පදිංචිව සිටි ස්ථානයක් හැටියට ඒ ගැන සඳහන් කරලා තිබුණත්, ඊට වඩා වැදගත් අර්ථයක් ඒ ගල් කාමරය තුළ දකින්නට ලැබෙනවා කියන එක තවත් ගවේෂණ කිරීමේදී අපට දකින්න පුළුවන්. ඊට එහායින් ඇති පදියගම්පල කන්දේ තිබෙන ක්‍රිස්තු පූර්ව යුගයට වැටෙන බ්‍රාහ්මී අක්ෂර ලිපි ටික ආදිය සලකා බලන විට තවත් ගොඩක් වැදගත් වන තොරතුරු අපට මේ කාරණය සම්බන්ධයෙන් සඳහන් කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෞතුකාගාරයක් ඇති කිරීමේ වැදගත්කම ගැන කියන්න අපට පුළුවන්. කෑගලු දිස්ත්‍රික්කයේ කෙළවරට වෙන්න තිබෙන පරපේ කන්දේ ශිලා ලේඛනයක් සහිත ගල් කණුවක් තිබෙනවා. පසු ගිය කාලයේ ඒ ගල් කණුව මහත්මයකුගේ ගෙදර වී අටුවට කණුවක් හැටියට තියලායි තිබුණේ. මම දන්නේ නැහැ දැන් ඒක කොහොමද තිබෙන්නේ කියලා. යම් තැනක කෞතුකාගාරයක් හදලා මෙන්න මේ වාගේ දේවල් එකතු කරලා ඒවා ප්‍රදර්ශනයට තබා තිබෙනවා නම් ඒක බොහොම වැදගත් වෙනවා. ඒ වාගේම ඒ පුරා වස්තුත් ආරක්ෂා වෙනවා. මා කරුණු කීපයක් විතරයි තැනින් තැනින් සඳහන් කළේ. කෑගලු දිස්ත්‍රික්කයට අයිති බොහෝ පුරා වස්තු විනාශ වෙමින් යන වකවානුවක් බවට අද පත් වෙලා තිබෙනවා. සමහර ඒවා නිධන් හොරු හාරනවා. සමහර ශිලා ලිපි විනාශ කරනවා; චෛත්‍ය විනාශ කරනවා. දැන් දෙවනගල සම්පූර්ණයෙන් විනාශ වන තත්ත්වයට ඇවිත් තිබෙනවා. බුරුම රට ජය ගන්න ගිය සේනාධිපති වූ, පළමුවෙනි පරාක්‍රමබාහු රජ්ජුරුවන්ගේ කීර්ති නගරගල්ල නම් සෙනෙවියාට දීපු නින්ද ගම් පිළිබඳව සඳහන් වන ශිලා ලේඛනය තිබෙන්නේ දෙවනගලයි. දෙවනගල රතනාලංකාර කියන හාමුදුරුවන් වැඩ සිටි ස්ථානය හැටියට සැලකෙන කදිම පුරා විද්‍යා භූමියක් එය. එය විනාශ වෙමින් පවතිනවා. ඒ නිසා ඒවා රැක ගැනීම පිණිස කිසියම් ක්‍රියා මාර්ගයක්, ජනතාව දැනුවත් කිරීමේ ක්‍රියා මාර්ගයක් වාගේම මේ විනාශ වන පුරාවස්තු කෞතුකාගාරයක ආකෘති හැටියටවත් සකස් කරලා තැබීමට කිසියම් පියවරක් ගත්තොත් ඉතාම හොඳයි කියන එක මේ අවස්ථාවේදී සඳහන් කරමින්, මේ වගේ වටිනා යෝජනාවක් ඉදිරිපත් කරපු ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමාට අපේ ප්‍රසාදය පළ කරමින් මගේ වචන කීපය අවසන් කරනවා. තෙරුවන් සරණයි!

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබවහන්සේට අපේ ප්‍රණාමය. මී ළඟට ගරු ජගත් බාලසූරිය ඇමතිතුමා.

[අ. භා. 4.24]

**ගරු ජගත් බාලසූරිය මහතා (ජාතික උරුමයන් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜகத் பாலசூரிய - தேசிய மரபுரிமைகள் அமைச்சர்)
(The Hon. Jagath Balasuriya - Minister of National Heritage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ඇති පෞරාණික, සංස්කෘතික, සමාජමය වටිනාකමක් ඇති ස්ථානවල තොරතුරු ලබා ගත හැකි වන පරිදි සහ එහි ඇති කෞතුක භාණ්ඩ සඳහා කෞතුකාගාරයක් පිහිටු වීමට පියවර ගත යුතුය කියා යෝජනාවක් කළා. මේ යෝජනාවේදී එතුමා කෑගලු පුරාණය පිළිබඳ පැහැදිලි විස්තරයක් කළා. ඊට අමතරව අපේ පූජ්‍ය එල්ලාවල මේධානන්ද නායක ස්වාමීන් වහන්සේත් කරුණු ඉදිරිපත් කළා. ගරු වයි.ජී. පද්මසිරි මන්ත්‍රීතුමාත් තුන් කෝරළයේ ඉතිහාසය පිළිබඳ විස්තරයක් කළා.

මෙහිදී අපට මූලික ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය තමයි රජයේ ප්‍රතිපත්තියක් හැටියට තිබෙන කෞතුකාගාර පිහිටුවීම පිළිබඳ සැලැස්ම. නොබෝදා අතිගරු ජනාධිපතිතුමා සංචාරයක් සඳහා පොළොන්නරුවට ගියා. ලංකාවේ සැලකිය යුතු පෞරාණික වටිනාකමක් ඇති භාණ්ඩ සහ ස්ථාන තිබෙන්නේ උතුරු මැද පළාතේයි. නමුත් උතුරු මැද පළාතට තිබෙන්නේ එක කෞතුකාගාරයක්. එය පිහිටා තිබෙන්නේ අනුරාධපුරයේ. උතුරු මැද පළාතට දිස්ත්‍රික්ක දෙකක් තිබෙනවා. එකක් අනුරාධපුරය දිස්ත්‍රික්කය. අනික පොළොන්නරුව දිස්ත්‍රික්කය. අතිගරු ජනාධිපතිතුමා මේ ප්‍රදේශවලට ගිය විට පොළොන්නරුව ප්‍රදේශයේ පිරිස් සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවය කරන පිරිස් ඉල්ලීමක් කළා, පොළොන්නරුවටත් කෞතුකාගාරයක් ලබා දෙන්න කියලා. ඒ අවස්ථාවේදී මේ තත්ත්වය වටහා ගත් අතිගරු ජනාධිපතිතුමා යෝජනා කළා, අනුරාධපුරයට අමතරව උතුරු මැද පළාතේ තිබෙන පොළොන්නරුව දිස්ත්‍රික්කයටත් කෞතුකාගාරයක් ලබා දීමට වහාම ක්‍රියා කරන්න කියලා. ඒ නිසා ඒ පදනම මත ප්‍රතිපත්තියක් හැටියට අපි අජිත් කුමාර මන්ත්‍රීතුමාගේ යෝජනාව පිළිගන්නවා. නමුත් අපේ අමාත්‍යාංශයට තිබෙන මූල්‍ය ප්‍රතිපාදන මත දිස්ත්‍රික් මට්ටමෙන් ඉතාම වැදගත් යැයි කියන ප්‍රදේශවලට ප්‍රථමයෙන්ම කෞතුකාගාර ඇති කරන්න අපට සිදු වෙනවා. ඉන් පස්සේ ලංකාව පුරාම දිස්ත්‍රික් පදනමක් මත මේ කෞතුකාගාර ඇති කිරීමට තමයි අපි සැලසුම් කරලා තිබෙන්නේ.

කෑගල්ලේ ඉතිහාසය ගත්තොත් අපට මූලික වශයෙන් ප්‍රාග් ඓතිහාසික හා ඓතිහාසික යුගවල බෙදීම් මත විවිධ පුරා විද්‍යා ස්ථාන සහ විවිධ භාණ්ඩ දකින්න පුළුවන්. මෑත කාලයේ ඉතිහාසය වන පෘතුගීසි යුගය, ඕලන්ද යුගය සහ බ්‍රිතාන්‍ය යුගය ගත්තත් එහෙමයි. විශේෂයෙන්ම ඒ යුගවලදී පෘතුගීසීන්, ඕලන්දකාරයින් සහ ඉංග්‍රීසීන් උඩ රට රාජධානිය අල්ලා ගැනීමට බොහෝ විට ගියේ මේ කෑගල්ල දිස්ත්‍රික්කය හරහායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බලන "බැලුම් ගල" කියලා විශාල පර්වතයක් තිබෙනවා. සතුරු හමුදා එන කොට එහි සිට නිරීක්ෂණය කරලායි පහර දුන්නේ. මේ පිළිබඳව ජන කථා තිබෙනවා, ජන ශ්‍රැති තිබෙනවා. ඒ වාගේම පුරාවිද්‍යාත්මක සාධකත් තිබෙනවා. මේ කරුණුවලින් විදහා පාන්නේ ප්‍රාග් ඓතිහාසික යුගයත්, ඓතිහාසික යුගයත්, මෑත කාලීන යුගයත් ගත්තාම කෞතුකාගාරයක් පිහිටු වීමේ වැදගත්කමයි. දැනට අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කර ගෙන යන්නේ පළාතකට එක කෞතුකාගාරයක් පිහිටු වීමයි. අනාගතයේදී දිස්ත්‍රික්කයක් පදනම් කර ගෙන කෞතුකාගාර ආරම්භ කිරීමට අපි සැලසුම් කරලා තිබෙනවා.

මෙතැනදී අජිත් කුමාර මන්ත්‍රීතුමාගේ යෝජනාවට ප්‍රතිපත්තියක් හැටියට අපි එකඟ වෙනවා.

අපේ අමාත්‍යාංශයට ලැබෙන මූල්‍ය ප්‍රතිපාදන මත දිස්ත්‍රික්කයක් පදනම් කර ගෙන කෞතුකාගාර ආරම්භ කිරීමට අපි සැලසුම් කරලා තිබෙනවා කියන පණිවුඩය මේ ගරු සභාවට ඉදිරිපත් කරමින් මාගේ මේ පැහැදිලි කිරීම මින් අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

පිළිතුරු කථාව, ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු පහක් තිබෙනවා.

[අ. භා. 4.30]

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඉදිරිපත් කළ "කෑගල්ල දිස්ත්‍රික්කය තුළ කෞතුකාගාරයක් පිහිටුවීම" කියන යෝජනාව ස්ථිර කිරීම ගැන වයි.ජී. පද්මසිරි මැතිතුමාට මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඒ සම්බන්ධයෙන් අදහස් එකතු කළ පූජ්‍ය එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේටත්, අමාත්‍ය ගරු ජගත් බාලසූරිය මැතිතුමාටත් මාගේ ස්තුතිය හා ගෞරවය මේ අවස්ථාවේදී මම පුද කරනවා.

විශේෂයෙන්ම මේ වෙලාවේ මේ යෝජනාව ගැන කරුණු ගණනාවක් අපි කථා කළා. ගරු ඇමතිතුමනි, අපි කලින් කථා කළා වාගේ, විශේෂයෙන්ම අවුරුදු තිස් හතළිස්දහසක ඉඳලා මානව වංශ කථාව හෙළිදරව් කරපු දිස්ත්‍රික්කයක් විධියට පූර්ව ශිලා යුගයේ ඉඳලාම මේ දිස්ත්‍රික්කය වැදගත් වනවා. අවසාන වශයෙන් ගෞරවනීය එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේත්, ගරු වයි.ජී. පද්මසිරි මන්ත්‍රීතුමාත් මතු කළ කාරණා සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරවනවා. මේ රටේ තිබෙන පුරාවිද්‍යා ස්මාරක ස්ථාන සොයා ගනිමින්, ඒවා හෙළිදරවු කරමින්, ඒවා සංරක්ෂණය කරන්න, ඒවා පිළිබඳව නාමාවලියක් හදන්න දැනටමත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වැඩ පිළිවෙළක් සකස් කර ගෙන යන බව අප දන්නවා. ඒ අනුව බැලුවොත් කෑගල්ල දිස්ත්‍රික්කය ඒ වාගේ විශාල වැදගත්කමක් තිබෙන තැනක්. ඒ පිළිබඳව මැදිහත් වන්න.

පසු ගිය කාලයේ මහාචාර්ය සෙනරත් පරණවිතාන මැතිතුමාගේ ගුණ සමරු උත්සවයක් පැවැත් වුණා. ඉතාම අතළොස්සක් පමණ පිරිසක් තමයි හිටියේ. ඒකට ප්‍රධාන හේතුවක් තමයි අපේ රටේ ඉතිහාසය පිළිබඳව, එහි වටිනාකම පිළිබඳව, විශේෂ ස්ථාන පිළිබඳව, ඒ ඒ පුද්ගලයන් පිළිබඳව අද සමාජයේ අලුත් පරම්පරාවට අදහසක් නැතිකම. ඒ නිසා කෑගල්ල දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, මුළු රටේම එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නය කියන යෝජනාවත්, එවැනි දේවල් අධ්‍යයනය කිරීම සඳහා කෞතුකාගාර පිහිටු වීම පමණක් නොවෙයි ඊට එහා ගිය, බිම් මට්ටමේ, ග්‍රාමීය මට්ටමේ අධ්‍යාපන ආයතන කේන්ද්‍ර කර ගත් වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියන ඉල්ලීමත් කරනවා.

අපි මේ පිළිබඳව අධ්‍යයනය කළාට පස්සේ කෑගල්ල දිස්ත්‍රික්කය පදනම් කර ගෙන තිබෙන සතර කෝරළය විශාල අධ්‍යාපනික ප්‍රබෝධයක්, සාහිත්‍යමය ප්‍රබෝධයක් තිබුණ, ග්‍රන්ථ රාශියක් නිර්මාණය වුණු තැනක් බව දකින්නට ලැබෙනවා. ඒ නිසා එවැනි දේවල් මුද්‍රණය කරන්න, එවැනි දේවල් සමාජගත

[ගරු අජිත් කුමාර මහතා]

කරන්න, ඒවායේ වටිනාකම් හෙළිදරව් කරන්න අවශ්‍ය මැදිහත් වීම කරන්නය කියන ඉල්ලීම මේ අවස්ථාවේ කරනවා. ගරු ඇමතිතුමා ප්‍රකාශ කළ පරිදි ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ තිබෙන හැකියාව අනුව ක්ෂණිකවම එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න බැරි වුණත් ප්‍රතිපත්තිමය වශයෙන් කෑගල්ල දිස්ත්‍රික්කයට කෞතුකාගාරයක් අවශ්‍යයි කියන කාරණය ඉදිරිපත් කිරීම අගය කරමින්, ඉදිරියේ දී ඒ සඳහා ඉතා ඉක්මනින්ම මැදිහත් වන්න ඔබතුමාට ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මේ වැදගත් යෝජනාව ඉදිරිපත් කරද්දී ඒ සඳහා සහයෝගය ලබා දුන් සියලු දෙනාටම නැවත වතාවක් ස්තුතිය සහ ගෞරවය පුද කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. The next motion is to be moved by the Hon. Thilanga Sumathipala.

## ශ්‍රී ලංකාවේ ජීවත් වන අඩු පහසුකම් සහිත නිවාස හිමියන්ගේ නිවාස ප්‍රශ්න විසඳීමට ප්‍රායෝගික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
## இலங்கையில் குறைந்த வசதிகளுடன் கூடிய வீடுகளில் வாழ்கின்ற வீட்டுரிமையாளர்களின் வீட்டுப் பிரச்சினையை தீர்ப்பதற்கான நடைமுறைச் சாத்தியமான நிகழ்ச்சித் திட்டமொன்றை நடைமுறைப்படுத்துதல்
## IMPLEMENTING A PRACTICAL PROGRAMME TO ADDRESS THE HOUSING ISSUES OF THE OWNERS OF HOUSES LACKING IN FACILITIES LIVING IN SRI LANKA

[අ. භා. 4.34]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
නමෝ බුද්ධාය!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නමින් ඇති පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකාවේ ජීවත්වන සෑම පවුලකටම ඔවුන්ගේ මූලික අවශ්‍යතාවන් වන පානීය ජලය, විදුලිය, සනීපාරක්ෂක පහසුකම් හා මුළුතැන් ගෙයකින් සමන්විත නිවසක ජීවත් වීමේ අයිතිය සුරක්ෂිත කිරීම වෙනුවෙන් මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ තට්ටු නිවාස හා තට්ටු නිවාස පොකුරු යෝජනා ක්‍රම කොළඹ හා තදාසන්න නගරවල ඉදි කරමින් ජනතාවගේ නිවාස ප්‍රශ්න විසඳීම සඳහා ප්‍රායෝගික වැඩසටහනක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි පසු බිමක් හැටියට යමක් එකතු කළ යුතු යැයි මා විශ්වාස කරනවා. ශ්‍රී ලංකාවේ ජීවත් වන අඩු පහසුකම් සහිත නිවාස හිමියන්ගේ නිවාස ප්‍රශ්න විසඳීමට ප්‍රායෝගික කඩිනම් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව දැන් පැන නැඟී තිබෙනවා. මෙය මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ ද සඳහන් කර ඇති වැදගත් හා අපගේ දැඩි අවධානය යොමු විය යුතු කාර්යයක්. 1930 දශකයේ පටන් කොළඹ නගරයේ දකුණින් හා තදාසන්න ප්‍රදේශවලින් යම් යම් රැකියා පතා පැමිණි බොහෝ පිරිස් -වරාය හා දුම්රිය ආශ්‍රිත රැකියා- රජයේ ඉඩම්වල අනවසරයෙන් පදිංචි වී කුඩා නිවාස ඒකක නිර්මාණය කර ගනු ලැබුවා. එය අද මෙහි ජීවත් වන පිරිස් අතර සියයට 51කටත් වඩා ඉහළයි. ඔවුන් යට කර ගෙන ඇති ඉඩම් ප්‍රමාණය අක්කර 1,000කටත් වඩා විශාලයි. එය නගරයේ මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 11 දක්වා ඉහළ ගිහින්. මොවුන්ගේ මෙම නිවාස තුළ සාමාන්‍යයෙන් සාමාජිකයින් පස් දෙනකු ජීවත් වනවා. ඉඩ ප්‍රමාණය අඩි 350කටත් වඩා අඩුයි. මෙම ප්‍රශ්නය විසඳීම සඳහා 1979 පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය මඟින් නාගරික සංවර්ධන වැඩ පිළිවෙළක් ආරම්භ කරනු ලැබුවා. විවිධ කාලවල මාලිගාවත්ත, සීවලීපුර, බණ්ඩාරනායකපුර වැනි නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කළා. එහෙත් දේශපාලන අනුග්‍රහය හා රැකවරණ නිසා පැල්පත් හා මුඩුක්කු ප්‍රශ්නය විසඳාලීම දුෂ්කර වී තිබෙනවා. ක්‍රමානුකූලව පැල්පත් හා මුඩුක්කු ඉවත් කොට, විකල්ප නිවාස අඩු ආදායම්ලාභීන්ට දීම වෙනුවට පවතින පැල්පත් හා මුඩුක්කු දියුණු කිරීම තුළින් දේශපාලන වාසි ලබා ගැනීමට දේශපාලනඥයෝ නිරන්තරයෙන් උනන්දු වුණා. එහෙත් කොළඹ නගරයේ සැලසුම්සහගත නොමැති ස්වභාවය සහ අවසර නොලත් ඉදිකිරීම්, විවිධ බලපෑම් මත ඉදි කර ගෙන ඇති අඩු පහසුකම් ඇති නිවාස හා කුඩා නිවාස, රජයේ රක්ෂිතවල, විශේෂයෙන් දුම්රිය රක්ෂිත, මහා මාර්ග රක්ෂිත, ඇළ මාර්ග රක්ෂිත හා ගංගා අසබඩ රක්ෂිතවල දැනටමත් ඉදි කර ගෙන තිබෙන අනුමැතියකින් තොර ඉදිකිරීම් කෙරෙහිද අපගේ අවධානය යොමු විය යුතුයි. මෙම රක්ෂිතවල පදිංචිකරුවන් දුම්රිය ධාවනයට, රථ වාහන ධාවනයට මෙන්ම සාමාන්‍ය පරිදි ජලය බැස යන මාර්ගවලටද බාධා ඇති වන පරිදි කටයුතු කරන බව කවුරුත් දන්නා කරුණක්. මහ කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය යටතේ, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් කොළඹ නගරය කේන්ද්‍ර කර ගෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අටක පමණ ක්‍රියාත්මක කළ වැඩසටහන යටතේ ඇළ මාර්ග රාශියක් මැනවින් සංවර්ධනය කර ඇතත්, එම ඇළවල් හරහා කොන්ක්‍රීට් කණු දමා විවිධ බලපෑම් ඇති කරමින් ඉදි කර තිබෙන අනවසර නිවෙස් හා බැම් ඉවත් කොට දැන් මනා සැලසුමක් හා යහපත් කළමනාකරණයක් යටතේ සකස් වෙමින් පවතින බව පවසන්නේ සතුටින්.

පසු ගිය අය වැය කථාවේදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉතා පැහැදිලිව ප්‍රකාශ කර සිටියේ ලබන වසර 6 තුළ නිවාස ඒකක දසලක්ෂයක් සංවර්ධනය කරන බවයි. එහිදී අඩු පහසුකම් ඇති හා ඉතාම කුඩා නාගරික නිවාස වෙනුවෙන් නිවාස ඒකක 70,000ක් ලබා දීමට කටයුතු කරන බවත් පැවසුවා. එමෙන්ම වතු හා අඩු පහසුකම් ඇති නිවාස වෙනුවෙන් ගම නැඟුම, ජන සෙවණ ව්‍යාපෘතිය, පළාත් සභා සහ අනෙකුත් ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් මඟින් ද වසරකට නිවාස ඒකක 80,000ක් ඉදි කිරීමටද එතුමා ඉලක්ක කර ගෙන තිබෙනවා. එමෙන්ම කොළඹ නගරයේ ඇති පැරණි නිවාස යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන්ද අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි වර්තමාන නිවාස අමාත්‍යතුමා විසින් මේ වන විටත් කරගෙන යනවා.

කොළඹ නගරයේ කොටුව, කොම්පඤ්ඤ වීදිය වැනි ප්‍රදේශ වාණිජ කටයුතු හා සංචාරක හෝටල් ඉදි කිරීම වැනි කාර්යයකට යොදා ගැනීම වඩාත් සුදුසු බව නගර නිර්මාණ ශිල්පීන්ගේ මතය වෙනවා. ඒ අනුව කොළඹ කොම්පඤ්ඤ වීදිය සහ බේරේ වැව අවට ප්‍රදේශය වඩාත් දර්ශනීය හා දැකුම්කලු ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමටත්, මෙයට සංචාරක සංවර්ධන කලාපයක් ලෙස ප්‍රමුඛත්වය ලබා දීමටත් ගරු ගෝඨාභය රාජපක්ෂ

මැතිතුමාගේ නායකත්වයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් දැනටමත් සැලසුම් සකස් කරමින් ක්‍රියාත්මක වෙමින් සිටින බව මම සඳහන් කරන්නට කැමැතියි. රජය අදහස් කරන්නේ වර්ෂ 2016 වන විට සංචාරක කර්මාන්තය දියුණු කොට මිලියන 2.5ක විදේශ සංචාරකයින් මෙරටට ගෙන්වා ගැනීමටත්, ඒ තුළින් අපගේ විදේශ විනිමය වර්ධනය කර ගැනීමටත්. මෙම කාර්යයන් ඉටු කර ගැනීමට නම් දැනට ඉතා අක්‍රමවත්ව පවතින මෙම අඩු පහසුකම් ඇති නිවාස වෙනත් සුදුසු ස්ථානවලට ගෙන යැමට සිදු වෙනවා. එම නිවාස තුළ සාමාන්‍ය වැසිකිළි පහසුකම් නැහැ; පානීය ජල පහසුකම් නැහැ. සමහර ස්ථානවල පොදු ජල පයිප්පයකින් පවුල් විස්සක පමණ සංඛ්‍යාවක් ජලය බෙදා ගන්නවා. බොහෝ විට අපද්‍රව්‍ය ගලා යැමට සලස්වා ඇත්තේ ගලා බසින ජල මාර්ගවලට හා කානුවලටයි. එහි නිවැසියකු මිය ගිය පසු අවශ්‍ය ගෞරව දක්වන්නට දේහය තබන්නටවත් ස්ථානයක් ඔවුනට නැහැ. මෙමඟින් ඔවුන්ටත් අනෙක් පදිංචිකරුවන්ටත් සමාජ ප්‍රශ්න රාශියක් ඇති වන අතර, ලෙඩ රෝග ද ඉතා ඉක්මනින් බෝ වනවා. ඇළ මාර්ග අවහිර කිරීමේ අවාසනාවන්ත අත් දැකීම් මෙම පාර්ලිමේන්තු සංකීර්ණයේදී පසු ගිය දා අපටත් විඳින්නට සිදු වුණා. මදුරුවන්ගෙන් බෝවන රෝග වර්ධනයටත් අනවසර ඉදි කිරීම් නිසා බලපෑම් ඇති වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන් මෙම අය කිසිදු බදු මුදලක්, ජල ගාස්තුවක් මේ වන තෙක් රජයට ගෙවන්නේ නැහැ. බොහෝ පිරිසක් විදුලිය පවා නීති විරෝධීව ලබා ගෙන තිබෙන බව අප කවුරුත් දන්නා කරුණක්. සමහර පිරිස් එහි ජීවත් වන වැසියන්ව නා නා විධ විෂමාචාර ක්‍රියාවන්වලට -මත් ද්‍රව්‍ය අලෙවිය සහ භාවිතය වැනි- යොමු කොට තිබෙනවා.

මෙම ගරු සභාවට මතක ඇති, ත්‍රස්තවාදී ව්‍යාපාරවලට පවා මෙම භූමි භාග ප්‍රයෝජනයට ගත් ආකාරය. ඇත්ත වශයෙන්ම ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීම ගැන වහවහා කටයුතු කළ යුතු අවස්ථාවක අප දැන් සිටිනා බව පැහැදිලියි. ඊට අවශ්‍ය හොඳ පසු බිමක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් දැනටමත් ආරම්භ කර තිබෙන බව සතුටින් ප්‍රකාශ කර සිටිනවා.

පසු ගිය කාලයේ කොළඹ නගරයේ සමහර සංවර්ධන කාර්යයන් කිරීමේදී එම ස්ථානවල අනවසරයෙන් පදිංචිව සිටි අය ඉවත් කිරීමට සිදු වුණා. උදාහරණයක් වශයෙන් 1983 දී සුගතදාස ක්‍රීඩාංගණය ඉදි කිරීමේදී එහි අනවසරයෙන් පදිංචිව සිටි පවුල් 240ක් පමණ ජීවත් වූ අඩු පහසුකම් ඇති නිවාස කඩා ඉවත් කිරීමට සිදු වුණා. එහෙත් ඔවුන් නැවත පදිංචි කර තිබෙන ස්ටේඩියම් වත්ත තුළ ඔවුන්ට සරිලන යටිතල පහසුකම් එදා සපයා නොමැති බැව් මේ වන විට හෙළි වී තිබෙනවා. මෙම සියලු කරුණු සැලකිල්ලට ගෙන කොළඹ නගරයේ හා ඒ අවට අඩු පහසුකම් නිවාසවල පදිංචිකරුවන් නැවත වෙනත් ස්ථානයක පදිංචි කිරීමේ කාර්යය ඔවුන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ යහපත සඳහා, අභිවෘද්ධිය සඳහා රජය ගන්නා ක්‍රියාමාර්ගයක් මිස ඔවුන්ට තවදුරටත් මූලික පහසුකම් කිසිවක් නොමැතිව ජීවත් වීමට ඉඩ දීමේ ක්‍රියාවලියක් නොවන බව අප සියලු දෙනා පිළිගන්නා කරුණක්. අඩු පහසුකම් ඇති නිවාසවාසීන් කොළඹ නගරය තුළ විවිධ සේවාවලට සහභාගි වන, නගරය තුළ රැකියාවල හා විවිධ කාර්යයන්වල යෙදී සිටින පිරිසක් නිසා ඔවුන් නගරය තුළම සිටිය යුතු යැයි සමහර අයගේ මතයක් තිබෙනවා. මෙම කුඩා නිවාස ඒකක තුළ මේ වන විට ඔවුන්ගේ තුන්වන පරපුරත් ජීවත් වෙනවා. මෙය ඉතාමත් සංකීර්ණ තත්ත්වයක්. වෙනත් රටවල මෙවැනි විරල පහසුකම් ඇති නිවෙස් ඉවත් කිරීමේ ක්‍රියවලීන් ඉතා සාර්ථක ලෙස ඉටු කර තිබෙනවා. විශේෂයෙන් සිංගප්පූරුව සහ කොරියාව ක්‍රියා කර ඇත්තේ නැවත පදිංචි කළ ස්ථානවල ඔවුන්ට අවශ්‍ය ජීවත් වීමේ සියලු පහසුකම් ක්‍රමවත් ලෙස සලසා දීමටයි. ඒ අන්දමින් ක්‍රියා කිරීම හා මේ පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීම යුගයේ අවශ්‍යතාව යයි මා විශ්වාස කරනවා. අප විසින් මනා ලෙස කළමනාකරණය කරමින් සැලසුම්සහගතව මෙම අයට මීට වඩා හොඳ පරිසරයක මූලික පහසුකම් වන ජලය, විදුලිය, සෞඛ්‍ය හා අධ්‍යාපන මෙන්ම අවශ්‍ය අනිකුත් යටිතල පහසුකම් ඇති ස්ථාන ලබා දිය යුතු වෙනවා. එම නිසා මෙම කාරණය ගැන අප සියලු දෙනාගේම විශේෂ අවධානය යොමු කොට, මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතනවලට පූර්ණ සහයෝගය ලබා දෙමින් ඉලක්කගත වැඩසටහනකට අප ස්ථිර ලෙස යොමු විය යුතු බව තවදුරටත් මා මේ ගරු සභාවට යෝජනා කර සිටිනවා.

අවුරුදු සියයකට පසු මේ වන විට රුපියල් බිලියන 2.6ක් වැය කරමින් මට්ටක්කුලිය සහ වැල්ලවත්ත ප්‍රදේශ සම්බන්ධ කරමින් කොළඹ නගරයේ දැනට පානීය ජල නළ පද්ධතියක් සහ මල නළ පද්ධතියක් ඇති කිරීම ක්‍රියාත්මක කරමින් තිබෙනවා. මේ මල නළ පද්ධතිය තුළින් නගරයේ පුරවැසියන් ලක්ෂ නවයකට අත්‍යවශ්‍ය වන වැසිකිළි පද්ධතියේ අඩු පාඩුකම් සුරක්ෂිත කරන්නට පුළුවන් වී තිබෙනවා. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ නායකත්වයෙන් යුත් එම වැඩසටහන ගැන සඳහනක් කරන්නට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

අවුරුදු සියයකට කලින් තිබුණු තාක්ෂණය අනුව මේ මල නළ පද්ධතිය ක්‍රියාත්මක කර ගෙන යන විට, අනවසර ඉදි කිරීම් නිසා අවුරුදු විසිපහක් තිහක් තිස්සේ ඒවාට අවශ්‍ය පහසුකම් ලබා ගැනීමට පුළුවන් කමක් තිබුණේ නැහැ. නමුත් මේ රජය වග කීමක් ඇති රජයක් හැටියට යටිතල පහසුකම්වල විශේෂ අවශ්‍යතාවක් හැටියට පානීය ජලය සහ සනීපාරක්ෂාව සඳහා මල නළ පද්ධතිය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංවිධානය කර තිබෙනවා. මෙය ක්‍රියාත්මක කිරීමත් සමඟ අවසානයේදී - last mile එකේ- එය ගෙදරකට සම්බන්ධ කර ගැනීමේදී ක්‍රමවත් විධිමත් නිවාස පද්ධතියක් නොමැති නම් එය කළ නොහැකි වනවා. එම නිසා වග කීමක් ඇති රජයක් හැටියට මෙපමණ මුදලක් යටිතල පහසුකම් සඳහා වැය කරද්දී නිවාස පද්ධතියේ ක්‍රමවේදය සහ ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වන වැඩසටහන ගැන අප සැලසුමක් ඇති කළ යුතු යයි මා නැවතත් කියා සිටිනවා.

පීටර් කෙනමන් මැතිතුමාගේ යුගයේ 1970-75 වසර පහේදී මේ රටේ නිවාස ඉදි කිරීම විශාල ප්‍රබෝධයක් ඇතිව ක්‍රියාත්මක වුණු බව සඳහන් කරන්නට මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ඊට කලිනුත් 1960-65 වසරවල විශේෂයෙන් මහල් නිවාස ලබා දී අපගේ නිවාස ප්‍රශ්නය දෙස බලන්නට එතුමාට පුළුවන් වුණා. අද මිලියන 20කට කිට්ටු ප්‍රමාණයක ජනගහනයක් ජීවත් වන මේ රටේ, පවුලකට හතර දෙනෙකු පස් දෙනෙකු දැම්මත් මිලියන හතරකට වඩා ප්‍රමාණයකට නිවාස අවශ්‍යතාව තිබුණත් නගරයේ පමණක් නිවාස අසූදහසක පමණ අඩුවක් තිබෙනවා. එම නිසා මේ නිවාස ලබා දෙන විට ඒ නිවාස මහල් නිවාස නම් කොළඹ නගරයේ හා තදාසන්න ප්‍රදේශවල ඇති ඉඩම්වල වටිනාකම මත පෞද්ගලික අංශයේ සහභාගිත්වයත් ඇතිව එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට සිද්ධ වනවා.

මම කියන්න සන්තෝෂයි, දැනට මාස 10කට කලින් මම මේ යෝජනාව ඉදිරිපත් කරන කොට තිබුණු තත්ත්වය එසේ වුණත් පසු ගිය මාස හතරපහ තුළ නාගරික සංවර්ධන අධිකාරියට පුළුවන්කම ලැබිලා තිබෙනවා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් රුපියල් බිලියන 5ක් -රුපියල් මිලියන 5,000ක් - debenture එකක් වශයෙන් ඒක රාශි කරලා, perch එකක් සඳහා රුපියල් මිලියන දෙක ගණනේ වැය කරලා අක්කර 78ක් නාගරික සංවර්ධන අධිකාරිය යටතට අරගෙන සංවර්ධනය කිරීමට. මේ තුළින් අපිට පෙනෙනවා අවිධිමත්ව තිබුණු සැලැස්ම බොහොම අමාරුවෙන් ක්‍රමවත්ව එක තලයකට ගෙනෙන්න යන බව. අපි අවංකව කථා කරනවා නම් මම හිතනවා කොළඹ නගර සභාවේ බලය 1966න් පසුව කවදාකවත් වාමාංශික රජයකට තිබිලා නැහැ කියලා. අවිධිමත් සැලැස්මක් නගර සභාව තුළින් ක්‍රියාත්මක වුණාම මධ්‍යම රජය විශාල අසීරු තත්ත්වයකට පත් වන බව මම

[ගරු තිලංග සුමතිපාල මහතා]

සඳහන් කරන්න ඕනෑ. ඒ නිසා අනාගතයේදී බලාපොරොත්තු වන්නේ නිසි බලය ඇති පුද්ගලයින් විසින් මෙම නාගරික ප්‍රදේශවල ක්‍රමවත්, විධිමත් වැඩසටහනකට යන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මම නැවත වරක් කියා සිටින්නේ අවම අවශ්‍යතාවක් වන විදුලිය ද සහිතව පාසලක්, ක්‍රීඩාංගණයක්, ප්‍රජා ශාලාවක්, නිවසටම සම්බන්ධ වැසිකිළි පද්ධතියක් සහිත නිවාස සංකීර්ණයක් ඊට අවශ්‍ය මාර්ගද සමඟ අපි ඉදි කළ යුතුය කියන කාරණයයි. ඒ අනුව මෙම උත්තරීතර සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අපි ඉල්ලා සිටින්නේ මෙම යෝජනාවට සහයෝගය දක්වන ලෙසයි. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මෙම යෝජනාව ස්ථිර කරනු ලබන්නේ ගරු දුමින්ද සිල්වා මන්ත්‍රීතුමා. මම හිතනවා කොළඹ සංවර්ධනය සනිටුහන් කරන හොඳ අවස්ථාවක් දැන් මේ ගරු සභාවේ ප්‍රදර්ශනය වනවාය කියලා.

[අ. භා. 4.48]

**ගරු ආර්. දුමින්ද සිල්වා මහතා**
(மாண்புமிகு ஆர். துமிந்த சில்வா)
(The Hon. R. Dumindha Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා. ඒ වාගේම මේ නිවාස යෝජනා ක්‍රමය ගැන වචන ස්වල්පයක් කථා කරන්න මට අවස්ථාවක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුති කරනවා.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයක් යටතේ ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් කොළඹ පැල්පත්වාසීන් වෙනුවෙන් නිවාස 75,000ක යෝජනා ක්‍රමයක් ආරම්භ වෙලා තිබෙනවා. අද වන කොට කොළොන්නාව, බොරැල්ල, දෙමටගොඩ, මැද කොළඹ හා උතුරු කොළඹ යන ප්‍රදේශවල ඒ නිවාස යෝජනා ක්‍රමය ආරම්භ වෙලා ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මේ යෝජනා ක්‍රමය ගෙනෙන්න මාස කිහිපයකට ඉස්සර වෙලා අපි දන්නවා එක්සත් ජාතික පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් ගිහිල්ලා පැල්පත්වාසීන්ව දැනුවත් කළේ, ඔවුන්ව අරගෙන ගිහිල්ලා වන්නියට අත අරිනවාය, මේ පැල්පත් සම්පූර්ණයෙන්ම අයින් කරලා, මේවා පෞද්ගලීකරණය කරලා විකුණනවාය කියලායි. ඒ විධියට ඒ අහිංසක ජනතාවට මානසික පීඩනයක් ඇති කරලා කෙටි දේශපාලන වාසියක් ගන්න හදපු පක්ෂයක් තමයි එක්සත් ජාතික පක්ෂය. එහෙත් ඉතා කෙටි කාලයක් තුළදී ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා නාගරික සංවර්ධන අධිකාරිය යටතේ මේ වැඩ පිළිවෙළ ආරම්භ කරලා ක්‍රියාත්මක කළායින් පස්සේ ජනතාවට පැහැදිලි වුණා මේ හැදෙන්නේ ඒ ජනතාවට ලැබෙන නිවාස කියලා. මේ නිවාස යෝජනා ක්‍රමයේ ක්‍රීඩාංගණ, වැසිකිළි පද්ධති, lifts යන සෑම දෙයක්ම ඇතුළත් වන බව මම මේ ගරු සභාව ඉදිරියේ කියන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි. කොළඹ නගරය ගත්තාම අපි දන්නවා ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් කොළඹ නගරය අලංකාර කිරීම සහ කොළඹ තිබුණු කුණු ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම නිරාකරණය කිරීම සඳහා එතුමා විශාල දායකත්වයක් ලබා දීලා අද වන කොට කොළඹ තිබුණු කුණු ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම නිරාකරණය වෙලා තිබෙන බව. කොළොන්නාව ආසනය ගත්තාම විශාල ප්‍රශ්නයක් වෙලා තිබුණා කුණු ප්‍රශ්නය. දවසකට කොළඹ තිබෙන කුණු ටොන් 800ක් කොළොන්නාවට ගෙනැල්ලා දමන තත්ත්වයක් තිබුණා. කුණු කන්දක් තිබුණේ. පෞද්ගලිකව එතුමා කොළොන්නාවට පැමිණිලා ඒ නිලධාරින්ව ගෙනැල්ලා කිව්වා, "සම්පූර්ණයෙන්ම මේ කුණු කන්ද නැති වන්න ඕනෑ, ප්‍රමිතියට කුණු දැමෙන්න ඕනෑ" කියලා. ඒත් නිලධාරින් ඒ වෙලාවේ කිව්වා මේක කරන්න බැහැ කියලා. ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කොළඹ නගරය අලංකාර කිරීම සහ කොළඹ සුද්ධ පවිත්‍ර කිරීමේ වැඩ පිළිවෙළ එතුමාගේ අතට අරගෙන කිරීම ගැන අපි අගය කරන්න ඕනෑ. මොකද, ඒ වෙලාවේ මම එතැන හිටියා. එතුමා ඒ නිලධාරින්ට කිව්වේ, "මේක රොකට්වුවක් හදට යවන වැඩක් නොවෙයි. මම සතියයි දෙන්නේ. සම්පූර්ණයෙන්ම මේ කුණු කන්ද සමතලා වෙලා ප්‍රමිතියට පස් දාලා තියෙන්න ඕනෑ" කියලා. අද වන කොට කොළොන්නාව ආසනයේ පොතුවිල් කුඹුර කුණු දමන ප්‍රදේශය සම්පූර්ණ තැනිතලා ක්‍රීඩාංගණයක් බවට පත් වෙලා තිබෙනවා. අද කොළඹ දිස්ත්‍රික්කයේ අහිංසක ජනතාව වෙනුවෙන් ඉදි වන පැල්පත් සම්පූර්ණයෙන්ම නැති වෙලා ලෑලි ගෙවල්, පොල් අතු ගෙවල්, ටකරම් යුගය සම්පූර්ණයෙන්ම නැති කරලා මහල් නිවාස ඇති කරලා ඒ අයගේ සිහිනය එළ ගැන්වෙන, ඒ දරුවන්ට හොඳ පරිසරයක් තුළ ජීවත් වන වාතාවරණය උදා කරන දවස වැඩි ඈතක් නැහැ කියමින් ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ස්තුතිවන්ත වෙමින් මම මගේ කථාව අවසන් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා.

[අ. භා. 4.52]

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ කොළඹ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිලංග සුමතිපාල මැතිතුමාට කොළඹ දිස්ත්‍රික්කයෙන් විශාල ජන වරමක් ලැබුණා. මම හිතන්නේ ඒ ජන වරමට ගෞරවයක් වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධාන ප්‍රශ්නයක් පිළිබඳව පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කරලා ඒ යුතුකම් ඉටු කරන්න කටයුතු කිරීම පිළිබඳව සහෝදර මන්ත්‍රීවරයෙකු හැටියට අපි අගය කරනවා. විශේෂයෙන්ම අපේ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා කියපු ආකාරයටත්, ඒ වාගේම දුමින්ද සිල්වා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරපු ආකාරයටත් කොළඹ දිස්ත්‍රික්කයේ තිබුණු ප්‍රධාන ප්‍රශ්නයක් තමයි මේ පැල්පත්වාසීන්ගේ තිබුණු ඒ ගැටලුකාරී තත්ත්වය. විශේෂයෙන් එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට පත් වන කොට නැත්නම් මේ වර්තමාන ආණ්ඩුව ක්‍රියාත්මක වන කොට තිබුණු තත්ත්වයත් එක්ක තමයි මේ යෝජනාව ඉදිරිපත් කරන්න මුල් වුණේ.

අපි දැක්කා පසු ගිය කාලවල්වල විවිධ අවස්ථාවලදී මේ පැල්පත්වාසීන් ඉතාම පීඩාකාරී විධියට හිටපු ආකාරය. එක්කෝ ඔවුන්ට ස්ථිර නිවාසයක් නැහැ. ඒ වාගේම ස්ථිර බිම් කඩක් නැහැ. එහෙම නැත්නම් අනවසර ඉඩමක ඔවුන් සිටින්නේ. ඒ තත්ත්වයත් එක්ක එකම පවුලේ විශාල පිරිසක් ඉතා කුඩා බිම් කොටසක කුඩා නිවාසයක නැත්නම් ස්ථිර නැති ආකාරයට සකසා ගත්ත නිවාසයක ජීවත් වීම නිසා විශාල වශයෙන් මානසික

පීඩනයන්ට ඔවුන් ලක් වෙලා හිටියා. ඒ වාගේම අපි දැක්කා සමාජමය ගැටලු රාශියක් ඒ හරහා මතු වෙනවා. ඔවුන්ට ස්ථිර ආදායම් මාර්ග නැතිකම නිසා විවිධ ආදායම් මාර්ග හොයා ගෙන යන්න සිද්ධ වුණා. ඒ තත්ත්වයන් තුළ සමාජය බලාපොරොත්තු වෙන්නේ නැති විශේෂයෙන්ම රටේ පවතින නීති රීතිවලට එකඟ නැති දේවල්වලට පවා ඒ ජනතාව හිතාමතා යොමු වුණා නොවෙයි, යොමු වෙන්න ඔවුන්ට සිදු වුණා.

ඔවුන්ගේ දරුවන්ගේ අවශ්‍යතාවන් ඉටු කරන්න; ඒ වාගේම දරුවන්ට කෙසේ හෝ අධ්‍යාපනය ලබා දීලා ඒ කටයුතු කරන්න; එක පැත්තකින් පවුලේ ආර්ථිකය ශක්තිමත් කර ගන්න ඒ අයට ඒ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිදු වෙලා විවිධ අතකොළු බවට ඔවුන් පත් වෙලා හිටපු ආකාරයක් අපි දැක්කා. මැතිවරණයක් එන වෙලාවට විවිධ පක්ෂවල නායකයෝ ගිහිල්ලා ඔවුන්ට තාවකාලික සතුටක්, වින්දනයක් ලබා දීලා ඔවුන්ගේ ඡන්දය ලබා ගන්නවා මිසක් ස්ථිරසාර වැඩ පිළිවෙළකට යොමු කරන සැලැස්මක් සකස් කරන්න ඒ බලධාරින් කටයුතු කරලා තිබුණේ නැහැ. ඒ නිසා අද අපි විශේෂයෙන්ම සතුටු වනවා, අපේ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය තුළ වග කීමක් අපේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටත් භාර දීලා අනික් පැත්තෙන් නිවාස සහ ඉදිකිරීම් ආමාත්‍යවරයා හැටියට ගරු විමල් වීරවංශ අමාත්‍යතුමා ඒ වගකීම් කොටස භාර අරගෙන අහිංසක ජන ජීවිත උසස් කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ සහෝදර මන්ත්‍රීතුමන්ලාත් එක්ක පැහැදිලි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ගෙන යාම ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මම මේ වෙලාවේදී මතක් කරන්න ඕනෑ මා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේත්, වයඹට ඇතුළු වන දොරටුවේ අලව්ව පාලම යටත් මේ වාගේ පවුල් 60ක ප්‍රමාණයක් ඉතාම අහිංසක විධියට ජීවත් වුණු බව. විවිධ අවස්ථාවලදී රූපවාහිනියේත්, ඒ වාගේම විවිධ පුවත් පත් තුළිනුත් ඔවුන්ගේ දුක් අඳෝනාවන් පිළිබඳව හැම අවස්ථාවේදීම සටහන් වෙලා තිබුණා. පසු ගිය කාලයේදී තිබුණු විශාල ප්‍රශ්න, ගැටලු නිසා ඔවුන් ඒ ස්ථානයෙන් ඉවත් කරන්න උසාවි නියෝගයක් පවා ගෙනාවත් ඔවුන් ඒ ස්ථානයෙන් ඉවත් කරන්න බැරි වුණා. පසු අවස්ථාවකදී මා ඔය ගලා ඒ නිවාස සියල්ලම යට වුණාට පසුව ඔවුන්ට යන්න එන්න තැනක් නැති වුණාම අපි ඔවුන් තාවකාලිකව වෙනම ස්ථානයක පදිංචි කරවා ඒ පවුල් 60 සඳහාම පසු ගිය මාසයේ 28 වැනි දා නීත්‍යානුකූලව ඔප්පු ලබා දෙන්න හැකියාව ලැබුණු බව සතුටින් ප්‍රකාශ කරන්න ඕනෑ. කිසියම් හෝ බිම් කඩක අයිතිය නැතිව පාලම යට සිටි ඒ ජනතාවට සමාජයේ අය කිච්චේ ඉංගම්මාරුවේ අය කියායි. අද ඒ අයට ඉඩම් කැබැල්ලක අයිතිය ලබා දෙන්න අපට හැකියාව ලැබී තිබෙනවා. අපේ අතිගරු ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ තුළින් කොළඹ දිස්ත්‍රික්කය, කොළඹ නගරය සංවර්ධනය කරනවා වාගේම අනෙක් නගර සංවර්ධනය කිරීමත් සමඟම සෑම ගමකටම යන්න අවශ්‍ය පාරවල් හදා දෙන්න අතිගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වෙනවා. පාරවල් හදා දෙනවා විතරක් නොවෙයි හැම කෙනෙකුටම ස්ථිර නිවසක අයිතිය ලබා දෙන්නටත්, එසේ ජීවත් වෙන්නට අවශ්‍ය පරිසරය සකස් කර දෙන්නටත් එතුමා බලාපොරොත්තු වෙනවා. මේ සැබෑ වෙමින් පවතින්නේ ඒ බලාපොරොත්තුවය කියන එක අප මතක් කරන්න ඕනෑ. ඒ සෑම නිවසකටම අවශ්‍ය විදුලිය ලබා දීම, පානීය ජලය ලබා දීම වාගේම හැම පවුලකම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා ගන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කර දීමත් අපේ ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ වෙලා තිබෙනවා. ඒ නිසා කොළඹ දිස්ත්‍රික්කයේ වාගේම අපේ රටේ අනිකුත් දිස්ත්‍රික්කවලත් තිබෙන නිවාස ප්‍රශ්නය ආදී මූලික අවශ්‍යතාවන් ඉටු කරන්න අද අපේ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය තුළින් වැඩ පිළිවෙළක් සකස් වෙලා තිබීම අපි මේ අවස්ථාවේදී විශේෂයෙන් අගය කරනවා. ඒ නිසා මේ සභාවේදී මා නැඟී සිටියේ ඒ වැඩ පිළිවෙළට ගෞරවයක් වශයෙනුයි. ඒ වාගේම මා නියෝජනය කරන දඹදෙණිය මැතිවරණ කොට්ඨාසයේ අලව්ව පාලම යට ඉතා අහිංසකව සිටි ඒ ජනතාවට අපි ඉඩම් කොටසක් ලබා දුන්නා. තනිවම නිවාසයක් හදා ගන්න බැරි පවුල් ප්‍රමාණයකුයි ඒ ස්ථානයේ ඉන්නේ. ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා සමඟ අපි සාකච්ඡා කළා, ඒ අයට අපේ රජයේ ආධාර මත නිවාස සංවර්ධන අධිකාරියේ අනුග්‍රහය මත නිවාස ඉදි කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමුය කියා. ගරු ඇමතිතුමාගෙනුත් ඒ පිළිබඳව සුබවාදී පිළිතුරක් ලැබීම විශේෂයෙන්ම මේ වෙලාවේදී අගය කරනවා. ඒ වාගේම මේ යෝජනාව ඉතාම අගනා යෝජනාවක්ය කියන සටහනත් තබමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. Is the Hon. Earl Gunasekara speaking on this Motion? No. Then, the reply would be given by the Hon. Thilanga Sumathipala.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට කතා කරන්න දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

It can be either way. The Opposition and the Government are together in the Private Members' Motion. Hon. Arundika Fernando, do you want to speak? Then, you can speak for five minutes.

[අ. භා. 4.58]

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් විධියට කොළඹ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා මේ සභාවට ඉදිරිපත් කළ යෝජනාව මට පෙර කතා කරපු අපේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාම කීවාක් මෙන් ඉතාමත් කාලෝචිත යෝජනාවක්. ඇත්තෙන්ම ඒ පිළිබඳව අද රජය ක්‍රියා කරන ආකාරය පිළිබඳව සියලු දෙනාගේම ප්‍රශංසාව මේ රජයට හිමි වෙන්න ඕනෑ. කොළඹ නගරයේ පැල්පත් නිවාස ප්‍රශ්නය විසඳන්න නිදහසින් පසු බිහි වූ හැම රජයක්ම අවුරුදු ගණනාවක ඉඳලා තමන්ට පුළුවන් පමණින් උත්සාහ කළා. නමුත් මෙවැනි කාලෝචිත ප්‍රායෝගික වැඩසටහනක් ක්‍රියාත්මක වුණේ මේ අවස්ථාවේදීය කියන එකයි අපි හිතන්නේ. ඒ නිසා අපි සියලු දෙනාගේම සහයෝගය රජයට ලබා දෙන්න ඕනෑ. විශේෂයෙන්ම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඇතුළු ඒ කණ්ඩායමටත්, ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ගරු විමල් වීරවංශ ඇමතිතුමා ගෙන යන මේ වැඩසටහනට අපේ සහයෝගය ලබාදෙන්න වුවමනායි.

නාගරික නිවාස ගැන කතා කරද්දී මම තවත් කාරණයක් කියන්න කැමතියි. මූලාසනයේ සිටින ඔබතුමාගේ යෝජනාවේදී පුත්තලම් දිස්ත්‍රික්කය ගැන කතා කළා. අද වන කොට පුත්තලම් දිස්ත්‍රික්කයත් දැවැන්ත විධියට නාගරීකරණයට ලක් වෙමින් පවතිනවා. මා නියෝජනය කරන වෙන්නප්පුව මැතිවරණ

[ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා]

කොට්ඨාසය ගැන බැලුවත් අද වන කොට වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසය තුළින් නිවසක් හදා ගන්නට පර්චස් 5ක් 10ක්වත් සොයා ගන්නට බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අද වන කොට ඒ ප්‍රදේශයේත් තට්ටු නිවාස යෝජනා ක්‍රමවලට යා යුතු තත්ත්වයක් උදා වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා අද මේ ගරු සභාවට කොළඹ දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන යෝජනාව නාගරීකරණයට ලක් වන සියලුම ප්‍රදේශවලට, ඉතා ශීඝ්‍රයෙන් නාගරීකරණයට ලක් වන සෑම ප්‍රදේශයකටම ඉතාම කාලෝචිත සුදුසු යෝජනාවක් කියලා මා හිතනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වනවා, පුත්තලම් දිස්ත්‍රික්කය ගැන හැම දාමත් උනන්දු වන මන්ත්‍රීවරයකු හැටියට අදත් තමුන්නාන්සේ විශේෂයෙන් පුත්තලම දිස්ත්‍රික්කය ගැන කථා කිරීම ගැන. සමහර වෙලාවට අපි ඉතිහාසය ගැන කථා කරද්දී පුත්තලම දිස්ත්‍රික්කය අමතක කරන බව මම මේ ගරු සභාවට කියන්න කැමැතියි. මේ රටේ ඉතිහාසයේ පළමුවන රාජධානිය තමයි පුත්තලම දිස්ත්‍රික්කය. අපි රාජධානි ගැන කථා කරද්දී අනුරාධපුරය, පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව, පඬුවස්නුවර ගැන කථා කරනවා. හැබැයි පුත්තලම දිස්ත්‍රික්කය අමතක කරනවා. විජය රජ්ජුරුවෝ තම්බපණ්ණියෙන් මුලින්ම මේ රටට ගොඩ බැහැලා, මුල්ම රාජධානිය, ජනාවාසය ඇති කළේ පුත්තලම දිස්ත්‍රික්කයේ තමයි. එහෙම නම් පුත්තලම දිස්ත්‍රික්කය තමයි අපේ පළමු වන රාජධානිය.

හුඟක් වෙලාවට අපි අමතක කරන කාරණාවක් තමයි, පුත්තලම දිස්ත්‍රික්කය සියලු සම්පත්වලින් ගහණ දිස්ත්‍රික්කයක් කියන එක. එම දිස්ත්‍රික්කය තුළ කලා ඔය, දැදුරු ඔය, මා ඔය වාගේ සුන්දර ගංගා තුනක් තිබෙනවා. ඒත් එක්කම සුන්දර ඉන්දියන් සාගරයට මුහුණ පා තිබෙන ප්‍රධාන දිස්ත්‍රික්කයක්; වී ගොවිතැන ඇතුළු කෘෂි කර්මාන්තයට සම්පූර්ණයෙන් සම්බන්ධ වන දිස්ත්‍රික්කයක්; ධීවර කර්මාන්තයට සම්බන්ධ වන දිස්ත්‍රික්කයක්. කල්පිටිය ප්‍රදේශයත් එක්ක සංචාරක ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම හොඳින් කරන්නට පුළුවන් දිස්ත්‍රික්කයක්. මේ අංශ තුන පිළිබඳව දැඩි අවධානය යොමු කළොත්, පුත්තලම දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරය, කෘෂි කර්මාන්තය සහ ධීවර කර්මාන්තය මඟින් මේ රටේ ආර්ථිකයට ලොකු හයියක් දෙන්නට පුළුවන්. විශේෂයෙන්ම තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාගේ මේ යෝජනාවත් එක්ක කථා කරනවා නම්, දියුණු වෙමින් පවතින පුත්තලම් දිස්ත්‍රික්කය තුළ නාගරීකරණයට ලක් වන ප්‍රදේශවල පැල්පත් නිවාස වෙනුවට ප්‍රධාන නිවාස යෝජනා ක්‍රම, තට්ටු නිවාස යෝජනා ක්‍රම ඇති වන්නට ඕනෑය කියලා -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ කරන මේ යෝජනා ශීඝ්‍රයෙන් නිම කර ගැනීම පිණිස ගරු ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම්තුමාට අපි එහෙට ආරාධනා කරමු.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

ඇත්ත වශයෙන්ම කියනවා නම්, එවැනි ක්‍රමවත් වැඩ පිළිවෙළක් ඇති කළ යුතුයි. කොළඹ නගරය තුළ අද සිදු වෙමින් පවතින මේ ශීඝ්‍ර සංවර්ධනය අපේ නගරවලටත් එන්න ඕනෑ කියලා මා හිතනවා. නගර නිර්මාණය වන්නට ඕනෑ. අපේ හැම නගරයක්ම ගත්තොත්, කුරුණෑගල, කෑගල්ල, නුවර, ගම්පහ, ගාල්ල ආදී මේ සෑම නගරයකම පැල්පත් නිවාස සෑහෙන ප්‍රමාණයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නාගරීකරණයට ලක් වුණු ප්‍රදේශවල මේ පැල්පත් නිවාස තිබෙනවා. ඒවා ඉවත් කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් ඇති කළ යුතුයි. අද කොළඹට සිදු වන දියුණුව අපේ ගමටත් සිදු වන්නට ඕනෑ.

අපි පසු ගිය දවස්වල ලෝක කුසලාන ක්‍රිකට් තරගය නැරඹුවා. ඒ ලෝක කුසලාන ක්‍රිකට් තරගය රූපවාහිනී නාලිකාවලින් පෙන්වන කොට අපේ රටේ තැනින් තැන තිබෙන පැල්පත් නිවාසත් පෙන්වූවා. ඇත්තටම කථා කළොත්, ඉන්දියාව, තායිලන්තය, වියට්නාමය, මැලේසියාව වැනි රටවල් ගත්තාම ඒ රටවල මීට වඩා විශාල සංඛ්‍යාවක් පැල්පත් නිවාස තිබෙනවා. අද මේ රජය ගෙන යන වැඩ පිළිවෙළත් එක්ක අපේ රටේ ඒ තත්ත්වය අඩු වෙලා තිබෙනවා. නමුත් ඒ ක්‍රිකට් තරගය රූපවාහිනී නාලිකාවලින් පෙන්වන කොට ඒ අය උලුප්පා පෙන්වූවා, තවමත් මෙහෙම පැල්පත් නිවාස තුළ ජීවත් වන ජනතාවක් අපේ රටේ සිටිනවා කියලා. අපි ඒක හොඳටම දැක්කා. අපි හිතනවා, අතිගරු ජනාධිපතිතුමාත් එක්ක මේ රජය ගෙන යන වැඩ පිළිවෙළත් එක්ක, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ ගෙන යන වැඩ පිළිවෙළත් එක්ක මේ පැල්පත් නිවාස කොළඹින් සම්පූර්ණයෙන්ම ඉවත් කරන්නට අපට පුළුවන් වෙයි කියලා. ඒ එක්කම අපේ පුත්තලම ප්‍රදේශය වැනි නාගරීකරණයට ලක් වන ප්‍රදේශවලිනුත් පැල්පත් නිවාස සම්පූර්ණයෙන්ම ඉවත් කරලා ඒ අයටත් හොඳ නිවාස ලබා දෙන්නට පුළුවන් වාතාවරණයක් ඇති වෙයි කියන විශ්වාසය අපට තිබෙනවා.

මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් එතුමාට අපේ ස්තුතිය පුද කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාගේ පිළිතුරු කථාව.

[අ. භා. 5.05]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දුමින්ද සිල්වා මන්ත්‍රීතුමා මෙම යෝජනාව පිළිබඳව විග්‍රහ කළා. එතැනදී ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ කොළඹ නගරයේ මෙහෙයුම පිළිබඳවත් කථා කළා. විශේෂයෙන්ම අද කොළඹ නගරය පිරිසිදු කර අලංකාර කර තිබෙනවා. අද ලංකාවට එන විදේශිකයකුට, විශේෂයෙන්ම අවුරුදු ගණනාවකට පසුව කොළඹ නගරයට එන කෙනෙකුට විශාල වෙනසක් පෙනෙනවා. ඒ ගැනත් එතුමා සඳහන් කළා. ඒක හැමෝටම ඇහැට පෙනෙන වෙනසක්. ඒ ගැන අපි සන්තෝෂ වනවා.

ඒ වාගේම කොළඹ ඝන අපද්‍රව්‍ය ගැනත් සඳහන් කළා. විශේෂයෙන්ම කොලොන්නාව ප්‍රදේශය පිළිබඳව. කොළඹ නගරයේ දවසකට ඝන අපද්‍රව්‍ය ටොන් 1,200ක් වාගේ ප්‍රමාණයක් මුදා හරිනවා. ඒකට අපිට විධිමත් සැලැස්මක් තිබිලා නැහැ. අපි හැම තිස්සේම කළේ ඉඩම් ගොඩ කිරීමයි; land filling. එම නිසා අපට ඒ ප්‍රශ්නය ඇති වුණා. ඒ ප්‍රශ්නය අවුරුදු 25කට වැඩි කාලයක් පවතිනවා. කොළඹ නගර සභාව ඇති කර ගත් ගිවිසුම් නිසා රජය අපහසු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ ගැන අපි

සටහන් කළ යුතුයි. මොකද, ඒ ප්‍රදේශයේ බොහෝ පිරිසකට, දහස් ගණනකට විශාල පාරිසරික ගැටලුවලට මුහුණ පාන්න සිද්ධ වුණා. ඒක මේ රජයේ වරද නොවෙයි. ඒක UDA එකේ වරද නොවෙයි. ඒක පැහැදිලිවම නගර සභාව විසින් ඇති කර ගෙන තිබෙන ගිවිසුමක ප්‍රශ්නයක්.

ඒ විතරක් නොවෙයි. ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ විධියට, මෙම යෝජනාවේ අරමුණ අද කොළඹ නගරයට බහුතරව බලපෑවත්, විශේෂයෙන්ම මුළු ලංකාවේම නාගරික ප්‍රදේශවල තිබෙන නිවාස තදබදයට, එහෙම නැත්නම් නිවාස ප්‍රශ්නයට විසඳුමක් දිය යුතුය කියන අදහසත් එතුමා එක් කළා. එතුමාගේ අදහස අනුව කුරුණෑගල දිස්ත්‍රික්කය ජනාකීර්ණ වෙමින් පවතිනවා. නාගරීකරණයත් එක්ක නගර බද ප්‍රදේශවලට විශාල ඉල්ලුමක් තිබෙනවා, නගරය තුළම ජීවත් වෙමින් රැකී රක්ෂාවලට යන්න, තමන්ගේ නොයෙකුත් කර්තව්‍යයන්වලට යෙදෙන්න. නාගරීකරණයේදී නගරයේ නිවාස අවශ්‍යතාව ගැන එතුමා සඳහන් කළා. ඒ ගැන මා සන්තෝෂ වනවා.

අපේ අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා බොහොම පැහැදිලිව කිව්වා, අවිධිමත්, සැලැස්මකින් තොර නිවාස පද්ධති නිර්මාණය කිරීම සහ අනවසර නිවාස ඉදි කිරීමට දීපු අවස්ථාව නිසා අද කොළඹ නගරය මුහුණ පා තිබෙන ගැටලුව ලංකාවේ සෙසු ප්‍රධාන නගරවලට -මහනුවර, කුරුණෑගල, ගාල්ල වැනි නගරවලට- දැනටත් යම් කිසි දුරට බලපා තිබෙනවාය, එය නොවෙන්න නම් ක්‍රමවත් වැඩසටහනකට යා යුතුයි කියලා.

මා බොහොම සන්තෝෂ වනවා, මෙම යෝජනාවට සියලු දෙනාගේම සහයෝගය ලබා දීම ගැන. අපේ අරමුණ, අපේ සිහිනය මහින්ද චින්තන ඉදිරි දැක්ම ක්‍රියාත්මක කරලා, එයට සහයෝගය දීලා, අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ඒ වැඩ පිළිවෙළේ කොටස්කරුවන් වෙලා, මේ රට ආශ්චර්යයක් බවට පත් කරන කොට, විශේෂයෙන් ලංකාව ආසියාවේ ආශ්චර්ය බවට පත් වන කොට එහි කේන්ද්‍රස්ථානය කොළඹ දිසාව බවට පත් කරන්නයි. ඒකයි අපි ප්‍රාර්ථනා කරන්නේ. ඒ සඳහා විධිමත්, ක්‍රමවත් වැඩසටහනකට ගිහින්, මේ රටේ සාමාන්‍ය ජනතාවගේ, මධ්‍යම පාන්තික ජනතාවගේ, ඒ වාගේම දෛනිකව රාජකාරි සඳහා නගරයට පැමිණ යන අයගේ නිවාස අවශ්‍යතාව සඳහා සැලසුමක් ඇතුව කටයුතු ක්‍රියාත්මක කළ යුතුයි; ක්‍රියාත්මක වන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය ශක්තිය සහ හැකියාව මේ රජයට තිබෙනවා. ඒ වෙනුවෙන් අපි හැම දෙනාගේම සහයෝගය ලබා දීලා, ඒ කටයුතු ක්‍රියාත්මක කරන්න හැකියාව ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා. සියලු දෙනාටම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. I must record that the first Private Members' Motion in the Seventh Parliament was debated in a commendable manner. I thank all the Hon. Members who enriched the Debate and it augurs well for many more Private Members' Motions to be taken up in the future. Already, 110 Private Members' Motions are listed in the Order Book.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලය වෙනුවට නව ක්‍රමවේදයක්
## இலங்கை பத்திரிகைச் சபைக்குப் பதிலாகப் புதிய முறைமையியல்
## NEW SYSTEM IN PLACE OF SRI LANKA PRESS COUNCIL

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මම විශේෂයෙන් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"නිදහස් මාධ්‍යවේදීන්ට පසු ගිය කාල වකවානුවේදී දැවැන්ත හිරිහැර කිරීම්, අතුරුදහන්වීම් සහ ජීවිතවලින් වන්දි ගෙවීමට පවා සිදු වූ අතර එම සිද්ධීන් පිළිබඳව මේ වන තුරුත් කිසිදු පියවරක් ගෙන නොමැත.

එබැවින් මේ සියලු කරුණු සලකා බලා මාධ්‍යවේදීන්ට දඬුවම් පමුණුවන පුවත් පත් මණ්ඩලය අහෝසි කර නිවැරදි මාධ්‍ය භාවිතයක් වෙනුවෙන් හැම මාධ්‍යවේදියකුටම සාධාරණයක් ඉටු වන සේ සහ ජනතාවට සාධාරණයක් ඉටු වන සේ නව ක්‍රමවේදයක් සකස් කරන මෙන් මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති ඇමතිතුමාත් ඉන්න නිසා මා මේ කාරණය විශේෂයෙන් කියන්න කැමැතියි. මා මේ යෝජනාව මුලින්ම ඉදිරිපත් කළේ මීට වඩා ටිකක් වෙනස් විධියකටයි. ඇත්ත වශයෙන් අද වන කොට මාධ්‍යවේදීන්ට ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව මහා විස්තරයක් මා ඒ යෝජනාවේ ඇතුළත් කළා. ඒක කපා, කොටා, මේ පොඩි කෑල්ල ඉදිරිපත් කරන්න කියලා තමයි මට දැනුම් දුන්නේ. මා කනගාටු වනවා, මේ රටේ මාධ්‍යවේදීන්ට ඇති වී තිබෙන ඉරණම පිළිබඳව කියන්න තිබෙන අයිතියත් මන්ත්‍රීවරයකු වන මට නැති කරලා තිබෙන එක ගැන. ඒක කපලා කොටලා තමයි මට එව්වේ මේ කෑල්ල කියන්න කියලා. දැන් මේකේ ඇත්ත කථාව මම කියවන්නම්. නිදහස් මාධ්‍යවේදීන්ට පසු ගිය කාල වකවානුවේදී වර්තමාන ආණ්ඩුව යටතේ දැවැන්ත හිරිහැර කිරීම්, අතුරුදහන්වීම් සහ ජීවිතවලින් වන්දි ගෙවීමට පවා සිදු වූ අතර එම හිරිහැර කිරීම්, අතුරුදහන් වීම් සහ මරා දැමීම් යුද සමයේ සිදු වූ කාරණා ලෙස හුවා දක්වමින් ආණ්ඩුව එම සිද්ධීන්වලින් මඟ හරිමින් තමන්ගේ වග කීමෙන් ගැලවුණු අතර පසු ගිය කාල වකවානුවේදී මාධ්‍යවේදීන්ට ඇති වූ සිද්ධීන් පිළිබඳව මේ වන තුරුත් කිසිදු පියවරක් ගෙන නොමැත. "ලංකා ඊ-නිවුස්" ආයතනයට ගිනි තැබීමේ සිද්ධිය සමඟින් තවත් වටයකින් මාධ්‍ය මර්දනය කිරීම සඳහා ආණ්ඩුව කැස කවමින් සිටින අතර ඒ අනුව "ලංකා ඊ-නිවුස්" වෙබ් අඩවියේ ප්‍රධාන කර්තෘවරයා අත් අඩංගුවට ගනිමින්

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ඔහු එම සිද්ධියට සම්බන්ධ බවට වක්‍ර ලෙස චෝදනා ගොනු කරමින් ආණ්ඩුව ක්‍රියා කර ගෙන යයි. ඊට අමතර පුවත් පත් මණ්ඩලය හරහා ආණ්ඩුව -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Hon. Member, I think you are reading out the deleted portion also.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

No, no. Now, I am speaking. There is no problem. First, I moved the Motion and now I am speaking.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

All right. You proceed.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

Thank you. - [*Interruption.*] ඉතින් මට පොත බලා ගෙන කියන්න පුළුවන් නේ.

- පුවත් පත් හා පුවත් පත් තොරතුරු මර්දනය කිරීම සඳහා ක්‍රියා කරමින් සිටී. එබැවින් මේ සියලු කාරණා සලකා බලා මාධ්‍යවේදීන්ට දඬුවම් පමුණුවන මේ මණ්ඩලය අහෝසි කරලා අලුත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා තමයි මා මේ ඉල්ලීම කළේ. මේක කියෙව්වේ වෙන කාරණයක් නිසා නොවෙයි. මාධ්‍ය මර්දනය සම්බන්ධව, මාධ්‍යවේදීන්ට සිදු වන අකටයුතුකම් ගැන අඩුම තරමේ අද මන්ත්‍රීවරයකුටවත් මේ පාර්ලිමේන්තුවේ යෝජනාවක්වත් ගෙනෙන්න බැරි තැනකට පත් කරලා තිබෙනවා. අඩුම තරමේ ශෝක යෝජනාවක්වත් ගෙනෙන්න බැරි තැනකට පත් කරලා ඉවරයි. විශේෂයෙන් මා මේ යෝජනාව ඉදිරිපත් කළේ වෙන හේතුවක් නිසා නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාල වකවානුවේ නොයෙකුත් සිද්ධීන් සිදු වුණා. රිචඩ් ද සොයිසා ගැන මම කථා කරන්න යන්නේ නැහැ. රිචඩ් ද සොයිසා ඝාතනය කරපු එක වැරදියි කියලා මම දහ පාරකට වඩා මේ පාර්ලිමේන්තුව ඇතුළේ කියලා තිබෙනවා. එකොළොස්වන පාරටත් ඕනෑ නම් මම කියන්නම්. එදා ඝාතනය කරපු එකත්, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තුළ ඝාතනය කරපු එකත් සියයට 100ක් වැරදියි. එතැන ඉඳලා තමයි මම කථා කරන්නේ. ඒක නිසා දැන් නැඟිටලා කියන්න එපා, ඒ කාලයේ රිචඩ් ද සොයිසා මැරුවා, ඇයි ඒකට මොකුත් කියන්නේ නැත්තේ කියලා. එහෙම කියලා හරි යන්නේ නැහැ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல - வெகுசன ஊடக, தகவல் அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Mass Media and Information)

කවුද කළේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒක තමයි මම කිව්වේ. ඒක යූඑන්පී ආණ්ඩුව කළා නම් වැරදියි.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

කවුද කළේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

යූඑන්පී ආණ්ඩුව නොවෙයි කවුරු කළත් වැරදියි. මම ඒක කථාවක් විධියට නොවෙයි කියන්නේ. අරයා මැරුවා, මෙයා මැරුවා කියලා කියන්න තරම් කාරණයක් නැහැ. යූඑන්පී එකේ ඉඳන් ඒ මිනී මරපු කට්ටිය අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. ඒකයි තිබෙන ප්‍රශ්නය. [බාධා කිරීමක්] එදා ඒ මරපු කට්ටිය ගැන අද කථා කරලා වැඩක් නැහැ. යූඑන්පී එකේ ඉඳන් ඇණ ගහපු කට්ටිය අද තමුන්නාන්සේලාගේ පැත්තේ. ඉතින් ඒක නිසා අපට දැන් ඒ ගැන කථා කරන්න බැහැ. තමුන්නාන්සේලාට කථා කරන්නත් බැහැ. 1988-1989 කාලයේදී ත්‍රිමාවිතානට ඇණ ගැහුවේ කවුද කියලා ඇහුවොත් අද එයා ඒ පැත්තේ. ඉතින් අපි මොකද කරන්නේ? මේ ඇති වෙලා තිබෙන තත්ත්වයත් එක්ක - [බාධා කිරීමක්] ඒක තමයි. පොඩ්ඩෙන් මමත් බේරුණේ. නැත්නම් මාවත් අරගෙන ගිහින් ඇණ ගහලා මරලා දමනවා. හැබැයි මේ -

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

පරාල ඇණ මදි. ඒකයි වුණේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

පරාල ඇණ මදි. කල්පනා කරලා බැලුවාම පරාල ඇණ ලොකු මදියි. ඊට පස්සේ අත හැර දමලා නිකම් සිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියන්නේ වෙන කාරණයක් නොවෙයි. කිසියම් ආණ්ඩුවකින් වැරැද්දක් කළා නම් කාගේ ආණ්ඩුවද කියන එක නොවෙයි වැදගත්කම තිබෙන්නේ.

අද වන කොට යුද්ධය අවසන් වෙලා තිබෙනවා. මිනිසුන්ට නිදහසේ තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න තිබෙන අයිතිය සම්බන්ධයෙන් අපි මේ පාර්ලිමේන්තුවට ගිය සතියේ පනත් කෙටුම්පතක් ගෙනෙන්න හැදුවා. පාර්ලිමේන්තුවට ඒ පනත් කෙටුම්පත ගෙනෙන්න හදන කොට කිව්වා, පනත් කෙටුම්පතක් සකස් කරලා තිබෙන්නේ, ඒක හරි, ඔක්කොම හදලා තිබෙන්නේ, ඒක ගෙනෙන්නම් කියා. තවම එහෙම පනත් කෙටුම්පතක්වත් ආණ්ඩුවට ගෙනෙන්න බැරි වෙලා තිබෙනවා. ඒක තවම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කෙටුම්පත් කරමින් තිබෙනවා. තොරතුරු දැන ගැනීමේ අයිතිය සම්බන්ධවත් ගරු කරු ජයසූරිය මැතිතුමා දැන් සති කීපයකට කලින් යෝජනාවක් ගෙනාවා. ඒක ඉදිරිපත් කරන්න දුන්නේ නැහැ. මොකද, ආණ්ඩුවේ එක ක්‍රියාත්මක කරනවාය කියලා කිව්වා. මේ වාගේ තත්ත්වයක් තමයි අද ඇති වෙලා තිබෙන්නේ. මා විශේෂයෙන් කියන්න කැමැතියි, පසු ගිය ඉතිහාසයේ අපේ රටේ මාධ්‍යවේදීන් සම්බන්ධයෙන් ඇති වෙලා තිබුණු කාරණා සම්බන්ධව. මා යුද්ධය හා සම්බන්ධ කළේ, වෙන කාරණයක් නිසා නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුද වාතාවරණය තුළ අපේ මාධ්‍යවේදීන් 18 දෙනකු ඝාතනය කරලා තිබෙනවා. ඒ අය සිංහල

වන්න පුළුවන්, දෙමළ වන්න පුළුවන්, එල්ටීටීඊකාරයන් කියලා කියන්න පුළුවන්. කෙසේ වෙතත්, කවුරු වුණත් ඔවුන්ව මරන්න කාටවත් අයිතියක් නැහැ. ඔවුන්ව එළියට දමා, ඔවුන්ට විරුද්ධව නඩු පවරා, ඔවුන්ව හිරේ දමන්න අයිතිය තිබෙනවා. ඉතින් ඒ නිසා මා කියන්න කැමැතියි, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
තමුන්නාන්සේලාගේ ජනාධිපති අපේක්ෂකතුමා නොවෙයිද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තමුන්නාන්සේලාගේ පැත්තේ ඉඳලා කළාම හොඳයි. මා කියන්නේ ඒ කාලයේ කරන එකත් වැරදියි. සරත් ෆොන්සේකා මහත්මයා ඒ කාලයේ කළා නම් ඒකත් වැරදියි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතකොට ජනාධිපති අපේක්ෂක.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් තමුන්නාන්සේලා ඔය කථාව කිව්වාට වැඩක් නැහැ නේ. මොකටද මිනී මරමර ඉන්න හමුදාපති කෙනෙක් තියා ගත්තේ? ඒ කාලයේ ඒවා කළාම කිසි ප්‍රශ්නයක් නැහැ. එදාත් අපි කථා කළා. මාධ්‍යවේදීන් ඝාතනය කළා. සරත් ෆොන්සේකාගේ කණ්ඩායම නොවෙයි, කාගේ කණ්ඩායම වුණත් අපට ප්‍රශ්නයක් නැහැ. එදා කළා නම් වැරද්ද එදාත් වැරදියි; අදත් වැරදියි.

දැන් යුද්ධය ඉවරයි. අද මොකක්ද වෙලා තිබෙන්නේ? හරි නම් මිනිසුන්ට නිදහසේ ලියන්න තිබෙන අයිතිවාසිකම අද තිබෙන්නට ඕනෑ. දැන් මේක කිව්වාම අපේ ආරක්ෂක ප්‍රකාශකතුමා, කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා කියයි, "ජාත්‍යන්තර වශයෙන් තිබෙනවා මහා දැවැන්ත ජාලයක්. ඒ ජාත්‍යන්තර ජාලයේ කොටින්ගේ වුවමනා එපාකම් ඉෂ්ට කිරීම සඳහා -"

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මගේ ස්වභාවය ඊට වඩා වෙනස්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එදා අපේ අගමැතිතුමා කිව්වේ, කොටි සංවිධානයේ දැවැන්ත ජාත්‍යන්තර ජාලයක් තිබෙනවා කියලා. ඉතින් ඒ ජාලය අපි ඔක්කොම එකතු වෙලා විනාශ කරමු. මොකද, ලංකාවේ කොටි ඒජන්තයන් ටික ළඟ තබා ගෙන, කේපීව ළඟ තබා ගෙන කියනවා නම්, "ජාත්‍යන්තර කොටි ජාලය තව තිබෙනවා" කියලා, ඒ වාගේ කථාවක් මට නම් හිතා ගන්න බැහැ. මොකද, ජාත්‍යන්තර කොටි ජාලයේ ප්‍රධානියා අද ඉන්නේ ආණ්ඩුව ඇතුළේ. එතකොට ජාත්‍යන්තර කොටි ජාලයේ ප්‍රධානියාව ආණ්ඩුව ඇතුළේ තබා ගෙන, ආණ්ඩුව කියනවා නම් ජාත්‍යන්තර කොටි ජාලයක් ආපහු තිබෙනවාය කියලා මා හිතන්නේ ඒක සත්‍ය කාරණයක්. හැබැයි අවශ්‍ය නම් මර්දනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ටික ඔහු ලවාම කරන්න පුළුවන්. අපි ඒ සඳහා සූදානම්. අපි කියන්නේ ජාත්‍යන්තර කොටි ජාලය අපි බිඳින්න ඕනෑ. හැබැයි බිඳින්න පුළුවන් වෙන්නේ ලංකාව ඇතුළේ ඉන්න මේ රටේ හොරකම් ගැන, මේ රටේ ඇමතිවරුන්ගේ හොරකම් ගැන, මේ රටේ හමුදාව ඇතුළේ සිද්ධ වන යම් යම් කාරණා පිළිබඳව, ඔවුන් අතර ඇති වන කාරණා පිළිබඳව වාර්තා කරන මාධ්‍යවේදීන් ඝාතනය කරලා, මරලා දමලා නොවෙයි. ඔවුන්ට නඩු පවරන්න ඕනෑ. ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති ඇමතිතුමා විධියට ඔබතුමා කරන ක්‍රියාකාරකම් පිළිබඳව අපි බොහොම ගෞරව කරනවා. ඉතිහාසයේ මාධ්‍ය ඇමතිවරු ගණනාවක් ඉඳලා තිබෙනවා. මාධ්‍යවලට ඇති වෙලා තිබෙන තර්ජන, ගර්ජන පිළිබඳව පාර්ලිමේන්තුවේ දී මා ඇති වෙන්න කථා කරලා තිබෙනවා. හැම මාධ්‍ය ඇමතිවරයෙක්ම කිව්වේ, "දැන් කිසි ප්‍රශ්නයක් නැහැ, මා යටතේ මේවා ඔක්කොටම විරුද්ධව කථා කරන්න මා සූදානම්" කියලා. හැබැයි වෙච්ච, කෙරිච්ච දෙයක් සොයා ගන්න නැතුව ගියා. අවසාන වශයෙන් ඒ මාධ්‍ය ඇමතිවරු තමන්ගේ තනතුරු අත හැර දමා යන කොට, මාධ්‍යවේදීන් ඝාතනය කිරීම් සම්බන්ධව, ඔවුන්ගේ අතුරුදහන් වීම් සම්බන්ධව, ඔවුන්ට සිද්ධ වුණ ක්‍රියාකාරකම් ගැන කිසිම තීන්දුවක් අරගෙන තිබුණේ නැහැ. අපේ මාධ්‍යවේදීන් අඩුම තරමේ එල්ටීටීඊ කියලා හංවඩු ගැහිච්ච, එල්ටීටීඊයට කත් ඇද්ද මාධ්‍යවේදීන් කියලා තමුන්නාන්සේලා හංවඩු ගහලා තිබෙන අය පැත්තකින් තියලා කරුණාකරලා සාධාරණ විධියට මේ යුද්ධයේ තිබිච්ච තොරතුරු හරියට ඉදිරිපත් කරපු මිනිස්සු, නැත්නම් සම බරව ඉදිරිපත් කරපු මාධ්‍යවේදීන් ඝාතනය වුණා නම් ඒ අයගෙන් හෝ පටන් ගෙන කරුණාකරලා මේ අයට වුණු දේ පිළිබඳව සොයලා බලන්න, අතුරුදහන් වීම් සම්බන්ධයෙන් සොයලා බලන්න පටන් ගන්නය කියලා මා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා. අමාරුයි තමයි. මේ මාධ්‍යවේදීන්ගේ ඝාතනය වීම් සම්බන්ධව, ලසන්ත වික්‍රමතුංග මැතිතුමාගේ ඉඳලා ඒ ඝාතනය වීම් සම්බන්ධයෙන් කෙරිච්ච පරීක්ෂණවලට අද සිද්ධ වුණු දේ මොකක්ද කියලා මා අහනවා. දැන් බලන්න, ඒ ඝාතනයන්වලට සිද්ධ වුණු දේවල් සොයා ගෙන සොයා ගෙන ගිහිල්ලා එක තැනකින් නතර වෙනවා. මම කියන්නේ ඒකයි. අඩුම තරමේ මේ ඝාතන තුන හතර පිළිබඳව හරි කරුණාකරලා සොයලා වැරදිකාරයෝ අත් අඩංගුවට අරගෙන ඉදිරිපත් කළොත්, අනාගතයේ ඔබතුමා මරණ මංචකයේ හරි ඉඳ ගෙන ගෞරවයෙන් ඔබතුමාට කියන්න පුළුවන්, "අනේ දෙයියනේ, මගේ ඇමති කාලයේ මම සාධාරණව මේ රටේ මාධ්‍යයට ලියන්න, කියන්න අයිතිය ඇති කරලා දුන්නා, ඝාතනය කරපු මාධ්‍යවේදීන්ට සාධාරණය ඉෂ්ට කරන්න මා කටයුතු කළා"ය කියලා.

ප්‍රගීත් එක්නැලිගොඩ, ලංකා ඊ-නිවුස් ආයතනයේ වැඩ කළේ. මා ඒකයි මේ කථා කරගෙන යන්නේ. අපි මේවා ගැන ඇති වෙන්න කථා කරලා කියලා තිබෙනවා. ආණ්ඩුව බලා ගෙන ඉන්න කොට, ආරක්ෂක පද්ධති ක්‍රියාත්මක වන කොට නැත්නම් අධි ආරක්ෂක කලාප ඇතුළේ තිබෙන කොට, "ඉරුදින" පත්‍රයට, "ලීඩර්" පත්‍රයට ඒ පුවත් පත් ආයතනවලට පහර දුන්නා. "සිරස" ආයතනයට පහර දුන්නා. කොළඹ නගරයේ අධි ආරක්ෂිත කලාපය ඇතුළේ තිබෙන එකට ඇවිල්ලා ගල් ගහලා ගියා. ඊ ළඟට "සියත" ආයතනයට, - [බාධා කිරීමක්] අනේ, නැහැ. ඔබතුමා ඉන්න කෝ. [බාධා කිරීමක්] කාටද? [බාධා කිරීමක්] ඔබතුමා හිටියේ නැහැ නේ. [බාධා කිරීමක්] ඉඳ ගන්න, ඉඳ ගන්න. [බාධා කිරීමක්]

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එක්ක කථා කරලා වැඩක් නැහැ. අනේ, ඔබතුමා ඉන්න. [බාධා කිරීමක්] අනේ, මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කෑ ගහන්නේ නැතුව ඉන්නවාද? "සියත" ආයතනයට පහර දුන්නා. [බාධා කිරීමක්] මම ඒකේ ඉතිහාසය කියලා තමයි පටන් ගන්නේ මහත්තයෝ. කරුණාකරලා පොඩ්ඩක් ඉඳ ගෙන ඉන්න. "සියත" ආයතනයට පහර දුන්නා. එතැනින් පස්සේ "ලංකා ඊ-නිවුස්" ආයතනයට පහර දුන්නා. "ලංකා ඊ-නිවුස්" ආයතනය ගිනි බත් කළා. හැබැයි ඔබතුමා දන්නවා, සඳරුවන් සේනාධීර මැතිතුමා අද ලංකාවේ නැහැ. අද එතුමා ඉන්නේ පිට රට. ප්‍රගීත් එක්නැලිගොඩ මහත්මයා අතුරුදහන් වෙලා. අද ඔහුගේ භාර්යාව ඔහුව සොය සොයා යනවා, කොහේද මේ ප්‍රගීත් එක්නැලිගොඩ මහත්මයා ඉන්නේ කියලා. මම කියන්නේ මේ අය යම් කිසි වැරැද්දක් කරලා තිබෙනවා නම් පුවත් පත් පැමිණිලි කොමිෂන් සභාව තිබෙනවා, ඒකට ඉදිරිපත් කරන්න තමුන්නාන්සේට පුළුවන්. මේ රටේ මාධ්‍යවේදින්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ස්ථාපිත කරනවාය කියලා කියපු ආණ්ඩුව තමයි, පුවත් පත් මණ්ඩලය හරහා අද අලුත් ක්‍රමවේදයකින් අපේ පුවත් පත් කලාවේදින්ව මර්දනය කරන්න හදන්නේ. මම ඒකයි කියන්නේ. යුද්ධ කාලයේ උස්සා ගෙන ගියා. 2005, 2006 කාලවල මාධ්‍යවේදින් අරගෙන ගිහින් අතුරුදහන් කෙරුවා. ඊ ළඟට ඔවුන්ව මරලා දැම්මා; ඔවුන්ගේ ආයතනවලට පහර දුන්නා. අද අලුත් වටයකින් තමයි මාධ්‍යවේදින්ව විවිධ අඩන්තේට්ටම්වලට ලක් කරන්නේ. බෙනට් රූපසිංහ මහත්මයාව අරගෙන ගියා. එතුමා අරගෙන ගිහින් දවස් හය හතක් හිරේ හිටියා. එතුමාට දැන් අවුරුදු 68ක් වෙනවා. වයසක මනුස්සයෙක්. ඔහු ලියපු කියපු, කරපු දෙයක් නැහැ. භූතයා කියලා එක් කෙනකුට කථා කෙරුවා කියලා භූතයා ගිහින් සුසාට කථා කළාය කියලා දැන් භූතයාව එළියට දමලා -වැරැදිකාරයා එළියට දමලා- භූතයා රැක ගන්න බෙනට් රූපසිංහව ඇතුළට දමන ආණ්ඩුවක් මේක. මම ඊයේත් කිව්වා ඕක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක කරලා ඉවර වෙලා එළියට ආපු වෙලාවේ මේ කියන ආයතනය ඉදිරිපිට අලවලා ගිහින් තිබෙන කොළ කැල්ලේ සඳහන් දේ මම දැන් ඔබතුමාට කියවනවා. බලන්න, ඒකේ කියලා තිබෙන දේ. එහි මෙසේ සඳහන් වනවා:

"ශුද්ධ වූ අරගලය ඉදිරියට ගෙන යමු.

දසදහසක් දේශ ප්‍රේමින්ගේ පූජාවෙන් දිනා ගනු ලැබූ මාතෘ භූමියේ විජයග්‍රහණය විජාතික බලවේගවල හා NGO කොටි ඒජන්තලාගේ වුවමනාව මත පාවා දෙමින් සිටින ලංකා ඊ-නිව්ස් සිංහල කොටි මවූ බිමේ දේශ ප්‍රේමින් තුළ වෛරය හා කෝපය වපුරවයි.

මේ දේශ ද්‍රෝහීන් වෙනුවෙන් දිගින් දිගටම පෙනී සිටිමින් ආධාර අනුබල ලබා දෙමින් ඔවුන් ආරක්ෂා කරන නීතිඥයන්ට ඔවුන්ට රැකවරණ ලබා දී නැවත පෝෂණය කරන NGO ඒජන්තලාවත් විනාශ කිරීමේ ශුද්ධ වූ වගකීම අප වෙත ඇත.

මේ සිංහල කොටින් දේශයේ කොහේ සිටියත් විනාශ කර දැමීමට අප සූදානම්ය.

ශුද්ධ වූ අරගලය ඉදිරියට ගෙන යමු."

මේ ඔවුන්ගේ කාර්යාලය ඉදිරියේ ඊයේ රාත්‍රියේ අලවලා ගිහින් තිබෙන කොළ කැල්ල. [බාධා කිරීමක්] නැහැ, අනේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්න කැමැතියි - [බාධා කිරීමක්] විහිළුවට ගන්න එපා. කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමනි, විහිළු කරන්න හදන්න එපා. ඒක හොඳ නැහැ. මම කියන්නේ මේකේ - [බාධා කිරීමක්]

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல )
(The Hon. Keheliya Rambukwella )
ගරු මන්ත්‍රීතුමා, -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ ගලවා ගත්ත එකේ -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ ගලවා ගත්ත එකේ photocopy එකක් අරගෙනයි මම මේ ඔබතුමාට පෙන්වන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාත් දන්නවා - [බාධා කිරීමක්]

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon.H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, there is a point of Order being raised.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
Sir, he cannot read that letter. We must know the author of it.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේකට විරුද්ධ වුණා නම් මම සූදානම්. මොකද, ඔබතුමා ස්ථාවර නියෝග හොඳට කියවලා තිබෙන කෙනෙක්. [බාධා කිරීමක්]

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
මේකේ කර්තෘ කවුද කියලා කියන්නේ නැතිව ඔබතුමාට කථා කරන්න බැහැ. මේකේ කර්තෘ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. එතුමාට පාර්ලිමේන්තුවට ඕනෑ ඕනෑ කඩදාසි ගේන්න බැහැ. එතුමා මේකේ කර්තෘද, නැද්ද කියලා දැන ගන්න අපට අයිතියක් තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
1994 - [බාධා කිරීමක්] ඔබතුමා ඔය ස්ථාවර නියෝග කියවනවා මම අහගෙන හිටියා. ඔබතුමා ඒවා කියවලායි ආවේ. [බාධා කිරීම්]

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මෙලොව හසරක් දන්නේ නැහැ. මෙතැන නිකම් නැඟිටලා කෑ ගහනවා. ඒ නිසා මම කියන්න කැමැතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් අවසන් කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Lanka-e-News ආයතනයේ බෙනට් රූපසිංහ මැතිතුමාව නැවත තව දින 14කට හිර කරන්න ඊයේ පොලීසිය විසින් තවත් නියෝගයක් අරගෙන ආවා. හැබැයි නීතිඥ මහත්වරු මැදිහත් වෙලා උසාවියට කථා කරලා කරුණු දැක්වූවාට පස්සේ තමයි නිදහස ලබා දුන්නේ. මම ඒකයි කියන්නේ. එතුමා නිදහස් කරලාත් ඉවර වෙන්න දෙන්නේ නැහැ. එදා රාත්‍රිය වන කොට මේක ගහලා. මම අහනවා, මේ අය කවුද කියලා. ශුද්ධ වූ අරගලය ඉදිරියට ගෙන යන්න අයිතිය තිබෙන කට්ටිය කවුද කියලා මම අහන්න කැමැතියි. දැන් යුද්ධය අවසානයි. හරිද? මේ රටේ තව දුරටත් මාධ්‍ය මර්දනය කරන්න උත්සාහ කරන්නේ මේ විධියට නම් මම කියනවා කරුණාකරලා මේක කරන්න ඉඩ දෙන්න එපාය කියලා. මම ඔබතුමාට ගෞරවයෙන් කියනවා කරුණාකරලා තවදුරටත් මේ භූමිය මේ රටේ මාධ්‍යවේදීන්ට නිදහසේ -නිවහල්ව- තමන්ගේ රාජකාරිය කර ගෙන යන්න ඉඩ තිබෙන භූමියක් බවට පත් කරන්නය කියලා. මේ ශුද්ධ වූ භූමිය තිබෙන්නේ ඒකටයි. විශේෂයෙන් අපේ මාධ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා වැඩ කොටසක් කරන්න හදන අමාත්‍යවරයෙක්. එතුමන්ලා දැන් අර මෙතැන ඉඳලා ගිය

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කරන කට්ටිය නොවෙයි. මෙතුමන්ලා බුද්ධියක් තිබෙන, මොළයක් තිබෙන වැඩක් කරන්න පුළුවන් අය. ඒ නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මේ මාධ්‍යවේදීන්ට ඇති වෙලා තිබෙන තර්ජනය තව දුරටත් ඉස්සරහට ගෙන යන්න ඉඩ තියන්න එපා, පුළුවන් තරම් ඉක්මනින් ඒක නවත්වන්නය කියලා. මොකද, අද මාධ්‍යවේදීන්ට ලියන්න කියන්න අයිතිය තිබුණාට ලියලා කියලා ගෙදර ගිහින් බුදියා ගන්න අයිතියක් නැහැ. ඔවුන්ව මරා දමන, අතුරුදහන් කරන, අත් අඩංගුවට අරගෙන බොරු චෝදනා දමලා ඉදිරිපත් කරන තැනකට අද ගෙනැල්ලා තිබෙනවා. මම ගෞරවයෙන් ඔබතුමාට කියනවා කරුණාකරලා Lanka-e-News ආයතනයටත් ගිනි තියපු ඇත්ත අය කවුද කියලා හොයන්නය කියලා. භූතයාද, සූසාද, සූසාගේ බාප්පාගේ පුතාද කියකියා එක එක නම් දමලා ඒ මිනිස්සු අත් අඩංගුවට ගන්න එක නොවෙයි කරන්න තිබෙන්නේ. කරන්න තිබෙන්නේ මේකේ නිවැරැදි මහ මොළකාරයා කවුද කියලා හොයන එකයි. අන්න ඒ මහ මොළකාරයා අත් අඩංගුවට ගන්න, ඒ සඳහා ක්‍රියා කරන්න කියලා ආදරයෙන් සහ ගෞරවයෙන් අපේ ඇමතිතුමාගෙන් ඉල්ලනවා. විශේෂයෙන් මේ මාධ්‍යවේදීන්ට එල්ල වෙලා තිබෙන තර්ජන තවදුරටත් ඒ විධියටම තිබෙනවා. මේ කොළෙන් පස්සේ බෙනට් රූපසිංහ මහත්මයාට ඇති වෙලා තිබෙන අර්බුදය, තර්ජනය තවදුරටත් ඒ විධියටම තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඔවුන්ව බේරා ගන්න කටයුතු කළ නීතිඥ මහත්වරුන්ට මේ තර්ජනය ඒ විධියටම තිබෙනවා. මාධ්‍යවේදීන්ට එහා ගිහිල්ලා නීතිඥයන්ට මේ තර්ජනය තිබෙන තත්ත්වයක් තමයි අද ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා මම අපේ මාධ්‍ය ඇමතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා, කරුණාකරලා මේ සම්බන්ධව පියවර ගන්න කියා. ඉතිහාසයේ සිදු වුණ අතුරුදන් වීම්, මරා දැමීම්වලට ලක් වුණ මාධ්‍යවේදීන් සහ පහරදීම්වලට ලක් වුණ මාධ්‍යවේදීන් සම්බන්ධව ගත්ත ක්‍රියා මාර්ගය කරුණාකර මේ සභාවට දැනුම් දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මී ළඟට ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ගෙන එන ලද යෝජනාව ස්ථිර කරනවා ඇති.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ගෙන එන ලද යෝජනාව ස්ථිර කරමින් යම් අදහසක් කියන්නට මම කැමැතියි. විශේෂයෙන් අපි දන්නවා පසු ගිය කාලයක් පුරා වුණු සිදු වීමෙන් සිදු වීම දිහා බලන විට අපේ රටේ මාධ්‍යවලට යම් යම් තර්ජන එල්ල වෙලා තිබෙනවාය කියලා. ඒ තර්ජන එල්ල වන විට ඒ තර්ජනවල ඇඟිල්ල ආණ්ඩුව පැත්තට දික් වෙනවා. ප්‍රහාරයක් සිදු වුණත්, ගිනි තැබීමක් සිදු වුණත්, පුද්ගල පැහැර ගැනීමකදී, අත් අඩංගුවට ගැනීමකදී, ලිවීමට කරන බාධා කිරීම්වලදී සහ වාර්තා කරන්න ගියාම සිදු වන බාධා කිරීම්වලදී වුණත් ඒ ඇඟිල්ල දික් වෙනවා. ඒ ඇඟිල්ල දික් වීමෙන්ම අපි කියන්නේ නැහැ ආණ්ඩුව වැරදිකාරයා හෝ නිවැරදිකාරයා කියලා. නමුත් ආණ්ඩුවට වග කීමක් තිබෙනවා තමන්ට දික් වෙන ඇඟිල්ල, තමන් වෙත එල්ල වෙන චෝදනාව නිවැරදි නම් ඒක පිළිගන්න; වැරදි නම් ඒක ප්‍රතික්ෂේප කරන්න; ඔප්පු කරන්න. මෙතැන තිබෙන බරපතළම ප්‍රශ්නය තමයි මේ මෑත ඉතිහාසය පුරා මේ චෝදනා එල්ල වන විට ඒ ආණ්ඩුව වගකීම බාර ගන්න හෝ ප්‍රතික්ෂේප කරන කාරණාවට වඩා මඟ හරින එකයි කරන්නේ කියන එක. විශේෂයෙන්ම ගරු මාධ්‍ය ඇමතිතුමා දන්නවා. ආණ්ඩුවට ඉදිරිපත් වුණ චෝදනාවලින් මේ ආණ්ඩුවට පුළුවන් වුණාද, එක කාරණාවක් ගැන "නැහැ, මේක අපට අදාළ නැහැ" කියලා නීතිය යොදවලා පොලීසිය යොදවලා "මෙන්න වැරදිකාරයා" කියලා ඔප්පු කරන්න. එක කාරණාවක් ඔප්පු කරලා නැහැ. ඒක තමයි බරපතළ ප්‍රශ්නය. ඒ නිසාම තමයි ආණ්ඩුව මේවාට වග කියන්න ඕනෑ කියලා අපි කියන්නේ.

උදාහරණයක් ගනිමු. ජාතික රූපවාහිනියට පහර දුන්නා. මුළු ලංකාවම ඒක දැක්කා. අවසානයේ ඒ පහර දීමට ආපු ඇමතිවරයා බේරා ගන්න යන්න සිදු වුණේ තවත් ඇමතිවරුන්ට. එවකට සිටි ජනමාධ්‍ය ඇමතිතුමා කිව්වා, "මේ පිළිබඳව පූර්ණ පරීක්ෂණයක් පවත්වනවා" කියලා. මට මතකයි එවකට සිටියේ ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා. "මේ පිළිබඳව පූර්ණ පරීක්ෂණයක් පවත්වා තීරණයක් ගන්නවා, වැරදිකාරයෝ, නිවැරදිකාරයෝ සොයා තරාතිරම බලන්නේ නැතිව දඬුවම් දෙනවා" කියා කිව්වා. දුන්න දඬුවමක් තිබෙනවාද? අවසානයට සිදු වුණේ කුමක්ද? මාධ්‍යවේදීන් පිරිසකට ජාතික රූපවාහිනියෙන් එළියට යන්න සිදු වීම පමණයි.

ඊ ළඟට "සිරස" ආයතනයට පහර දුන්නා. එක වෙලාවක ගිනි තිබ්බා. "සිරස" මාධ්‍ය ආයතනයට මහ රෑ ඇවිල්ලා ගිනි තිබ්බා. ඒක කළුවරේ සිදු වුණ දෙයක් කියලා වහන්න පුළුවන්. හැබැයි මහ දවාලේ ඇවිත් බේබෑක් ප්ලේස් එකේ තිබෙන "සිරස" මාධ්‍ය ආයතනය ගිනි තිබ්බා; ගල් ගැහුවා. ඒ වෙලාවේ ඒ චෝදනාවට ලක් වුණ අයව ඡායාරූපවලින් ඔප්පු කළා. ඒ වෙලාවේ ගත්ත ඡායාරූපවලින්. පසුව ඒ අය පෑලියගොඩ, කැලණිය ප්‍රාදේශීය සභා මැතිවරණයේදී තරග කළා. හැබැයි ආණ්ඩුවට පුළුවන් වුණේ නැහැ ආණ්ඩුවේ නීතිය ක්‍රියාත්මක කරලා -පොලීසියෙන් ප්‍රශ්න

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

කරලා හෝ නඩු අහලා හෝ පැමිණිලි ලියලා හෝ- ක්‍රියා මාර්ගයක් ගන්න. අපි දන්නවා සාමාන්‍යයෙන් පොල් ගසකින් පොල් ගෙඩි 10ක් කැඩුවොත් ඒ කෙනාට ගන්න ක්‍රියාමාර්ග තිබෙනවාය කියලා. හැබැයි මේකට ක්‍රියා මාර්ගයක් ගත්තේ නැහැ.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, there is a point of Order being raised.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ කථාවේදීත්, ඒ වාගේම ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ කරුණු පැහැදිලි කිරීමේදීත් සඳහන් කළ Lanka-e-News ආයතනය ඇතුළු ඒ සියල්ල මේ වන විට අධිකරණයේ පරීක්ෂණයට භාජනය වෙමින් උසාවි ක්‍රියා මාර්ගවල තිබෙන දේවල්. ඒ නිසා ඒවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියා අපි ඉල්ලා සිටිනවා. අධිකරණ ක්‍රියා මාර්ගවල තිබෙන දේවල් තමයි පුනපුනා කියන්නේ. මේ වන කොට රජය ඒවාට ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අධිකරණය ඉදිරියේ තිබෙන දේවල් පිළිබඳව සඳහන් නොකර සිටීම හොඳයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක ඔබතුමා තීරණය කරන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එවැනි දෙයක් සිද්ධ වෙලා තිබෙනවා නම් ඒවා අස් කරනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ යෝජනාවත් වාරණයට ලක් වුණා නේ. කථා කිරීමේ නිදහස අගය කරන, ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන මේ ආණ්ඩුව අඩුම තරමේ යෝජනාව ඉදිරිපත් කරන්න තිබෙන අයිතියත් ප්‍රතික්ෂේප කරනවා නම්, ඒක වාරණයට ලක් කරනවා නම් ඒක මාධ්‍ය නිදහසට වඩා භයානකයි. මන්ත්‍රීවරයකුට කථා කරන්න තිබෙන අයිතිය, දෙයක් කියන්න තිබෙන අයිතිය නේ මේ වාරණයට ලක් වෙන්නේ. ඒක ඔබතුමා තීරණය කරන්න. මූලාසනය තීරණය කරන්න. ඒක මට කිසි ප්‍රශ්නයක් නැහැ. ඒකත් අවසානයේදි මේ ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවාදය තමයි පෙන්වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல )
(The Hon. Keheliya Rambukwella )
මන්ත්‍රීතුමනි, වාරණයක් ගැන නොවෙයි කථා කළේ. වාරණය කියන වචනයත් ඔබතුමා පාවිච්චි කළා. මගේ මිත්‍ර දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් පාවිච්චි කළා. වාරණය නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. පාර්ලිමේන්තුවේ Standing Ordersවල තිබෙන නීතිරීති සම්බන්ධව කථා කිරීමයි. ඒ නීතිරීතිවලට අදාළව කථා කිරීමයි අප සැම කෙනෙකුගේම වගකීම. ඒ වගකීම පැහැර හරින කොට අපට කරුණු ඉදිරිපත් කරන්න වනවා. නොදැනුවත්ව හෝ දැනුවත්ව හෝ පාර්ලිමේන්තුවේදී ඒ විධියට ස්ථාවර නියෝග කඩ කිරීම සුදුසු දෙයක් නොවෙයි. ඒ නිසා එය පෙන්වා දීම මේ සභාවේ මන්ත්‍රීවරුන්ගේ වග කීමක් සහ යුතුකමක් වනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! ගරු ඇමතිතුමනි, ස්ථාවර නියෝගවලට පටහැනිව යම් කිසි දෙයක් පවසනවා නම් ඒවා ඉවත් කරනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරු කථාවේදී කියන්න.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මේවා මේ රජය විසින් ගෙන යන අලුත් වැඩ පිළිවෙළවල්ය කියන එකත් මා හිතන්නේ වැරදියි. එතකොට සභාව නොමඟ යැවීමක් වනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පිළිතුරු කථාවේදී කියන්න දෙයක් ඉතුරු වන්නේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
There is an explanation. ඔබතුමාට ඒක පිළිගන්න පුළුවන්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔහොම ගියොත් මේ පාර්ලිමේන්තුවේදී මාධ්‍ය ගැන කථා කරන්න වන්නේත් තිත්, තිත්, තිත් නැවතත් වචන දෙක තුනක් කියලා තිත්, තිත් හැටියට තමයි. මාධ්‍යවලට නොනිල වාරණයක් දමලා, සමහර විද්‍යුත් නාළිකාවලින් ප්‍රවෘත්ති දමන්නේ තිත්, තිත්, තිත් හැටියටයි. එහෙම බැහැ. [බාධා කිරීමක්] ඔබතුමන්ලා ඒක කපන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] ඒක අයිතිය. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද ජීවත් වන ලෝකය තාක්ෂණයත් සමඟ ජීවත් වනවා නම්, ජනමාධ්‍යත් සමඟ ජීවත් වනවා නම්, මේ තාක්ෂණයට, විද්‍යාවට මාධ්‍යවලින් ඉදිරියට යන්න එදාට වඩා අද විවෘත නම්, ඒ විවෘතභාවය ආණ්ඩුව පිළිගන්නවා නම් ඇයි භය වන්නේ? ඒක තමයි තිබෙන ප්‍රශ්නය

වන්නේ. ඔබතුමන්ලාට පුළුවන්, මෙන්න මේ ආයතනයට පහර දී තිබෙන්නේ මෙන්න මේ අහවල්ලු, ඒක අපේ ප්‍රශ්නයක් නොවෙයි කියලා කියන්න. ඔබතුමන්ලා එහෙම ඔප්පු කරපු දෙයක් නැහැ නේ. මේ පාර්ලිමේන්තුවට ගෙනල්ලා කවදා හෝ කියලා තිබෙනවාද "සිරස" මාධ්‍ය ආයතනයට ගල් ගැහුවේ, පහර දුන්නේ මෙන්න මේ අය කියා? ඒක පාර්ලිමේන්තුවේ කියන්න ඕනෑ නැහැ, රටේ නීතිය ක්‍රියාත්මක කර තිබෙනවාද? "ලංකා" පුවත් පතේ ප්‍රධාන කර්තෘ චන්දන සිරිමල්වත්ත මහතා අවස්ථා ගණනාවකදී CID එකට ගෙන ගියා. ගෙන ගිහින් එතුමාගෙන් ප්‍රශ්න කළා. එතුමාව රඳවා ගත්තා. පසුව එතුමා නිදොස් කොට නිදහස් කළා. එතැන තිබෙන අයිතිය මොකක්ද?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඒක නීතිපති දෙපාර්තමේන්තුවෙන් කරන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අපි දන්නවා. ඒක නීතිපති දෙපාර්තමේන්තුවෙන් කරන්නේ. ගෙනි යනවා, භය කරනවා, ඊට පසුව තමයි අනෙක් ඉන්න කෙනාට ඉන්න හම්බ වන්නේ නැත්තේ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මෙතැනට ආපු කාරණය කියන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමන්ලා කියනවා නම් ලංකාව ආසියාවේ ආශ්චර්ය කරන්න යනවා, ලංකාව ආර්ථික මධ්‍යස්ථානය කරන්න යනවා, ලංකාව සංචාරකයන්ගේ පුරවරය කරන්න යනවා, ලංකාව ලෝකයේ හොඳම තැන කරන්න යනවා කියා ඒකේ එකක් තමයි මාධ්‍ය නිදහස කියන්නේ, කථා කිරීමේ නිදහස කියන්නේ. ඇත්තටම කලින් ගන්න ඕනෑ යෝජනාවක් තිබෙනවා පෞද්ගලික මන්ත්‍රී යෝජනා අතරේ. අංක 50 හැටියට න්‍යාය පත්‍රයේ තිබෙනවා, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාගේ යෝජනාවක්. මා ගරු කරනවා. ඒකේ මාධ්‍ය ගැන කියලා තිබෙනවා. එම යෝජනාවේ මෙහෙම සඳහන් වනවා:

> "... තාක්ෂණය දියුණු වෙමින් පවතින ලෝකයක සත්‍ය සැඟවීමට හෝ වසන් කිරීමට අවස්ථාවක් නොමැති හෙයින් ද, ප්‍රජාතාන්ත්‍රික රටක සියලු පුරවැසියන්ට නිදහස් මාධ්‍ය තුළින් දැනුම හා අවබෝධය ලබා ගැනීමේ අවකාශය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

කරනවා නම් අන්න වැඩ. ඇත්ත දේ ඒකයි. ඔබතුමන්ලා හිතනවාද වෙබ් අඩවියක් -website එකක්- වාරණයට ලක් කරන්න පුළුවන් කියා. එහෙම කරන්න බැහැ. "විකිලීක්ස්" වෙබ් අඩවියේ අයිතිකරුවා ලංකාවේ හිටියා නම් ඔහුගේ අළුත් හොයා ගන්න ලැබෙන්නේ නැහැ. ඒ මනුෂ්‍යයා ගිහිල්ලා. "විකිලීක්ස්" වෙබ් අඩවියෙන් ඇමෙරිකාව ගැන -

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු මන්ත්‍රීතුමනි, මතක තියා ගන්න. "විකිලීක්ස්" වෙබ් අඩවියේ පුද්ගලයා උසාවියට ගෙනියලා රිමාන්ඩ් භාරයට පත් කළා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මා කියන්නේ ලංකාවේ හිටියා නම් ඇති වන තත්ත්වය ගැනයි. එයා ලංකාවේ කෙනෙක් වුණා නම් -

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
එයා අරගෙන ගිහින් හිර ගෙදර දැම්මා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
"විකිලීක්ස්" වෙබ් අඩවියේ අයිතිකරුවා ලංකාවේ කෙනෙක් වුණා නම් මේ ආණ්ඩුව යටතේ හිටියා නම් අළුත් නැහැ. ඒකයි මා කියන්නේ. මේ ක්‍රමය හොඳ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි මේ පාර්ලිමේන්තුවේදී මාධ්‍ය නිදහස ගැන අවස්ථා කීයකදී කථා කර තිබෙනවාද? සිද්ධියෙන් සිද්ධියට කථා කර තිබෙනවා. පුද්ගලයෙකුට ගහන කොට, ආයතනයකට ගහන කොට, ගිනි තියන කොට කථා කරනවා. නමුත් වැඩක් නැහැ. ඔබතුමන්ලාට චෝදනාවලින් නිදහස් වීමට සරල ක්‍රමයයි තිබෙන්නේ. ආණ්ඩුවට මේක චෝදනාවක් නොවෙයි නම් මෙවායින් නිදහස් වීමට ආණ්ඩුවට බැරි ඇයි? ආණ්ඩුවට ලෝකයේ හොඳම හමුදාව ඉන්නවා. ලෝකයේ හොඳම පොලිසිය තිබෙනවා. ලෝකයේ හොඳම බුද්ධි අංශය තිබෙනවා. කොටි පරදවපු බුද්ධි අංශයයි ඉන්නේ. ඉතින් ඒ අය ලවා හොයලා, "මේකට ආණ්ඩුව වග කියන්න ඕනෑ නැහැ, මේකට කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා වග කියන්න ඕනෑ නැහැ, මේකට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා වග කියන්න ඕනෑ නැහැ, මේකට වග කියන්න ඕනෑ අන්න අහවලා" කියලා පැය 24න් හෙළිදරව් කරන්න පුළුවන්. ඇයි බැරි ඒක කරන්න? අප කියන්නේ ඒකයි. සිද්ධියෙන් සිද්ධිය වහන්න එපා. මොකද, මාධ්‍ය ලෝකයේ වහන එක තරම් ප්‍රසිද්ධියක් වෙන නැහැ. "හොඳ සද්දය නිස්සද්දය" කියනවා නේ. ඒක තමයි ඇත්ත දේ. වහලා නිශ්ශබ්ද කරනවා නම් ඒක තමයි ලොකුම සද්දය. ඉතිහාසයේ කොතැනකවත් ජූලියස් සීසර්ලාගේ පරපුරේ ඉඳලා සිටි මාධ්‍යවේදීන් ඝාතනය කරලා, මාධ්‍යවේදීන් මර්දනය කරලා, මාධ්‍ය ආයතන සීල් තියලා, මාධ්‍ය ආයතන ගිනි තියලා ජයග්‍රහණය කරපු ආණ්ඩුවක් නැහැ. එහෙම පවතින ආණ්ඩුවක් නැහැ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ජයග්‍රහණය කරපු පක්ෂයකුත් නැහැ. තේවිස් ගුරුගේ -

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක නිසා අප කියන්නේ මේ වැරදි ප්‍රතිපත්තිය -

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
තේවිස් ගුරුගේ, ප්‍රේම කීර්ති ද අල්විස් එහෙම තමයි මරලා තිබෙන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මේ, කෑ ගහනවා එක පැත්තක. දැන් නැඟිටලා ඇවිල්ලා. පාර්ලිමේන්තු ආවේ දැන්. දැන් නැඟිටලා ඇවිල්ලා.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

එහෙම ජයග්‍රහණ ලබන්න බැහැ. ඔබතුමන්ලා බලාපොරොත්තු වෙනවා නම් යම් කිසි අරමුණකට මේ රට ගෙන යන්න ඒ අරමුණේ අංක එකේ කාරණයක් තමයි තාක්ෂණය පිළිගන්නා, විද්‍යාව පිළිගන්නා වහන්න බැරි සත්‍යය එළිදරවු කරන්න අවස්ථාව දෙන එක. ඒ අවස්ථාව සඳහා යම් එක සාධාරණ පියවරක් හරි තියන්න කියලා ගරු ඇමතිතුමා හැටියට ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ගරු කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමනි. ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඒ සඳහා ධෛර්යය, ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, නැවතත් මේ යෝජනාව ස්ථිර කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. Thilanga Sumathipala.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
Hon. Presiding Member, thank you for giving me this opportunity. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරපු ජනතා විමුක්ති පෙරමුණේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ කථාවට පසුව වචන ස්වල්පයක් කථා කළ යුතුය කියලායි මා පැහැදිලිව සිතන්නේ. මාධ්‍ය නිදහස ගැන දිගින් දිගටම තමුන්නාන්සේලා කියනවා. එය අද ඊයේ මේ රටේ පැන නැඟිච්ච දෙයක් නොවෙයි. මා පුවත් පතකට සම්බන්ධ කෙනකු නිසා, පුවත් පතක් ආරම්භ කරපු කෙනකු නිසා, ජාතික පුවත් පතක හිමිකරුවකු හැටියට මේ රටේ ජීවත් වෙච්ච නිසා මට පෞද්ගලික අත් දැකීම් රාශියක් තිබෙනවා. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ යුගයේ ඉඳන් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ යුගය ආදි යුග ගැන බැලුවාම අප විශාල කාල පරිච්ඡේදයක් ගත කරලායි ඇවිත් තිබෙන්නේ. මම කනගාටු වෙනවා generalize කරලා සාමාන්‍යයෙන් ප්‍රකාශන කිරීම ගැන. යම් යම් අවස්ථාවල පුවත් පත්වල, රූපවාහිනී ආයතනවල, එහෙම නැත්නම් ගුවන් විදුලි ආයතනවල අයට යම් යම් තර්ජන සහ පහර දීම් සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම පසු ගිය අවුරුදු පහ ගත්තොත් යුද්ධයේ උච්ච අවස්ථාවට එන කොට අප දැකපු විශේෂ දෙයක් තමයි "ලංකාදීප", "ලක්බිම", "දිවයින", "දිනමිණ" කියන සිංහල පුවත් පත්වලට විරුද්ධව කිසිම පැමිණිල්ලක් නොතිබීම. මම එය බොහොම වග කීමෙන් කියනවා. ඒ වාගේමයි රූපවාහිනී ආයතනත්. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ දයාබර සහෝදරයාගේ TNL ආයතනය තිබුණා. ඒ වාගේම ගුවන් විදුලි ආයතන රාශියක් තිබුණා. ඒ නිසා මේ හැම ප්‍රශ්නයක්ම ආණ්ඩුවේ account එකට දාලා කථා කරන්න එපා. යම් යම් ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. නමුත් අන්තිම අවුරුදු පහේ ආපු ගොඩක් ප්‍රශ්න දිහා බැලුවොත් අප ඒවා දැක්කේ උතුරුකරයේ තිබෙන ද්‍රවිඩ පුවත් පත් අතර, ඒ ඒ අයගේ ඇති වෙච්ච මතවාදය සහ දේශපාලන වාතාවරණයත් එක්ක නැඟී ආපු ප්‍රශ්න හැටියටයි. තමුන්නාන්සේලා සාධාරණව කරුණු ඉදිරිපත් කරනවා නම්, සාධාරණව ඉදිරිපත් කරන ඒ කරුණුවල පසු බිමක් තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා ඒවා සොයා බලන්න වග කීමක් ඇති රජයක් හැටියට ගරු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා ප්‍රමුඛ අපි සියලු දෙනාත් කැමැතියි. මොකද, මේ රජය දර්ශනයක් ඇතිව, වැඩ පිළිවෙළක් ඇතිව, ඉලක්කයක් ඇතිව පැහැදිලි ගමනක් යන රජයක්. ඒ නිසා අපිත් කැමැති නැහැ මාධ්‍ය මර්දනයක් එනවාට. මොකද, මාධ්‍යයෙන් සම්පූර්ණ සහයෝගය මේ රජයට දීලායි තිබෙන්නේ. අපට පෙනෙන්නේ නැහැ කිසිම මාධ්‍යක් මේ රජයට විරුද්ධ වෙලා තිබෙන බවක්. අප එහෙම කියන්නේ ඇයි? මාධ්‍ය විශාල වශයෙන් මේ රජයට විරුද්ධ වෙලා නැති නිසයි. අප මේ ළඟදී -සති ගණනකට ඉස්සර වෙලා- අවසන් කරපු මැතිවරණ දිහා බැලුවත්, ජනාධිපතිවරණය දිහා බැලුවත්, මහ මැතිවරණය දිහා බැලුවත්, පළාත් සභා මැතිවරණය දිහා බැලුවත් මාධ්‍යවලින් විශාල වශයෙන් මෙහෙයුමක් කරලා රජය අපහසුතාවට පත් කරන්න කටයුතු කර නැහැ කියා පෙනෙනවා. රජයට විරුද්ධව මතවාදයක් ආවා කියලා ඒ අය මර්දනය කරන්න ක්‍රියාත්මක වෙලා නැහැ කියා පෙනෙනවා. මා දකින දෙයක් තමයි යම් යම් මාධ්‍යවේදීන් නීතිය තමන්ගේ අතට අර ගෙන, බලය තමන්ගේ අතට අර ගෙන ක්‍රියාත්මක වීම නිසා ඒ අයගේ අනෙකුත් ප්‍රශ්න මත යම් යම් ප්‍රශ්න ඇති වෙලා තිබෙනවාය කියන එක. ඒ නිසා බොහොම වග කීමෙන් කටයුතු කරන ලෙස අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

මේ ගැන වචන ස්වල්පයක් කථා කළ යුතුය කියලා මම හිතුවා. මොකද, මාධ්‍ය නිදහස, කථා කිරීමේ නිදහස, තමන්ගේ අදහස් ඉදිරිපත් කිරීමේ නිදහස වෙනුවෙන් මම පැහැදිලිවම නියෝජනය කරන නිසා. "ලංකාදීප" පුවත් පතේ අධ්‍යක්ෂතුමකු හැටියට කටයුතු කරන ගරු රුවන් විජයවර්ධන මැතිතුමා මේ සභාවේ ඉන්නවා. ඒ ආයතනයේ සම්පූර්ණ අවුරුදු විස්සක කාලය ගත්තාම පසු ගිය අවුරුදු පහ තුළ "ලංකාදීප" පුවත් පතේ වර්ධනය පස් ගුණයකින් වැඩි වෙලා තිබෙනවා; ආදායම වැඩි වෙලා තිබෙනවා; අලුත් පුවත් පත් ආරම්භ කරලා තිබෙනවා. පුවත් පත් ආයතනයක් හැටියට, පැහැදිලිවම රජයට ප්‍රතිවිරුද්ධ මතයක් දරන පුවත් පතක් හැටියට එහෙම වර්ධනයක් සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම අන්තර්ජාලය හරහා -internet හරහා- විශාල අසාධාරණයක් අපේ ජනතාවට, නායකත්වයට, රජයට සිදු වනවා. ඒ ගැන අපි විශේෂයෙන් බලන්න ඕනෑ. වෙනත් රටවලින් පිටපත් අර ගෙන අසත්‍ය ප්‍රචාර කරනවා. අන්තර්ජාලයට ග්‍රහණය කර ගෙන මේ රජයට පක්ෂ, විපක්ෂ සියලු දෙනාගේ නොයෙකුත් දෙවල්, අසත්‍ය චෝදනා ලෝකයට ඉදිරිපත් කරනවා. ඒ නිසා ඒ වෙබ් අඩවි පාලනය කරන අය, එහෙම නැත්නම් ඒවා පිටිපස්සේ ඉන්න අය අවබෝධ කර ගත යුතු එක දෙයක් තමයි බහුතර ඡන්දයෙන් ප්‍රජාතන්ත්‍රවාදීව රජයක් තේරී පත් වුණාම, ඒ තේරී පත් වුණු රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ඒ රජයේ නිලධාරින් බැඳී සිටින බව. ඒක වරදක් නොවෙයි. එය ක්‍රියාත්මක කිරීම සඳහා අසත්‍ය කියන කොට, ඒවා නොමඟ යවන කොට මාධ්‍යකරුවන්ගේ තිබෙන වගකීම දේශපාලනඥයන්ට වඩා වැඩියි.

තමුන්නාන්සේලාගේ මේ යෝජනාවේදී අපි ඉල්ලා සිටින්නේ, to be specific කියන එකයි. හරියටම ප්‍රශ්නය ප්‍රශ්නයක් හැටියට ඉදිරිපත් කරලා, පොදුවේ රජයට ඇඟිල්ල දිගු කරන්නේ නැතිව කරුණු පැහැදිලි කරලා යම් කිසි අසාධාරණයක්, අයුක්තියක් සිද්ධ වෙලා තිබෙනවා නම් ඒවා ඉදිරිපත් කරන ලෙසයි. ඒ වෙනුවෙන් අපි පක්ෂ භේදයකින් තොරව පෙනී සිටිනවාය කියමින්, මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මී ළඟට ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාධ්‍යවේදීන් මර්දනයට ලක් වනවාය, මාධ්‍යවේදීන් අතුරුදහන් වීම සම්බන්ධයෙන් රජය වග කියන්නට ඕනෑය කියමින් මාධ්‍යවේදීන් පැත්තෙන් ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ ගෙනා මේ යෝජනාව සම්බන්ධයෙන් කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වනවා.

ඒ මන්ත්‍රීතුමා මුළු කථාවම කළේ රජයට ඇඟිල්ල දිගු කරලායි. ඒ වාගේම එහෙම වුණා නම් ඒවා ගැන සොයන්න කියලාත් ඒ මන්ත්‍රීතුමා කිව්වා. ඒක ඇත්ත. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අතීතය ගැන යම් කිසි ආවර්ජනයක යෙදෙන්නට ඕනෑ. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා -මගේ මිත්‍රයා- මාත් එක්ක රූපවාහිනී සාකච්ඡාවලටත් යනවා. තේවිස් ගුරුගේ මැතිතුමාව ඝාතනය කරපු එක ගැන තමුන්නාන්සේලා කවදාවත් මේ පාර්ලිමේන්තුවේදීවත්, ඉන් පිටතදීවත් අද වන තෙක් කියලා නැහැ. 1988-89 කාලය තමුන්නාන්සේගේ කුඩා කාලය වන්න ඇති. අඩුම ගණනේ අපේ පක්ෂයෙන් නැත්නම්, අපේ පක්ෂයේ සන්නද්ධ කණ්ඩායමෙන් මේ දේ කළාය, ඒ ගැන අපි ජාතියෙන් සමාව අයදිනවාය කියලා ප්‍රකාශයක් අද වන තෙක් කරලා නැහැ. ප්‍රේමකීර්ති ද අල්විස් මැතිතුමා අවුරුදු ගණනාවක් තිස්සේ මේ රටේ මිනිස්සු ආදරය කරපු චරිතයක්; ජනමාධ්‍යවේදියෙක්. හැබැයි කවදාවත් ඇවිල්ලා කිව්වේ නැහැ, "අපි ඒ ඝාතනය ගැන දුක් වනවාය, එහෙම නැත්නම් ජාතියෙන් සමාව අයදිනවා"ය කියලා. විජය කුමාරණතුංග මැතිතුමා මාධ්‍යට සම්බන්ධ කෙනෙක්; කලාකාරයෙක්; මේ රටේ මිනිස්සු ආදරය කරපු චරිතයක්. හැබැයි ඒ ඝාතන තමුන්නාන්සේලා කළා. ඒවා තමුන්නාන්සේලා කළාය කියන එක මේ රටේ හිටපු ඇහැ පෙනෙන, කන ඇහෙන මිනිස්සු දන්නවා. ඒ අපේ තරුණ කාලය. 1988-89 කාලය කියන්නේ අපේ හොඳම තරුණ කාලය. විශ්වවිද්‍යාලවල, පාසල්වල උසස් පෙළ පන්තිවල ඉගෙන ගන්නා කාලය. ඒ කාලයේ මේ රටේ හිටපු අය ඒ ගැන දන්නවා. හැබැයි, සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමන්ලාට
(13th Start) පක්ෂයක් හැටියට ඔතැනට එන්න බැරි වෙලා තිබෙන ප්‍රධාන හේතුව තමයි ඒ අතීතාවර්ජනයේ යෙදිලා, තමුන්නාන්සේලාගෙන් වෙච්ච ඒ වැරදිවලට තමුන්නාන්සේලා ජාතියෙන් තවමත් සමාව අයදින්නේ නැතිකම.

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ ඒ කාලයේ අපේ පැත්තේ හිටියේ. හැබැයි තමුන්නාන්සේටත් මතක ඇති, එක්සත් ජාතික පක්ෂ පාලන සමය පැවැති අවුරුදු දහහතක කාලය පුරාවටම දැවැන්ත මාධ්‍ය මර්දනයක් තිබුණු බව. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් වාගේ මේ රටේ නාට්‍ය කලාවේ පුරෝගාමී අයට -නාට්‍ය කලාවේ පියා කියලා කියන්නේ-

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මාධ්‍යට සම්බන්ධ නැහැ.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
ඒ අය මාධ්‍යවේදීන් නොවෙයි කියලා කියන්නේ කොහොමද? මාධ්‍යට සම්බන්ධයි. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කියනවා, මාධ්‍යට සම්බන්ධ නැහැයි කියලා. තමුන්නාන්සේට ඒක තේරෙන්නේ නැද්ද? මාධ්‍යට සම්බන්ධයි. මේ රටේ නාට්‍ය කලාවේ පියා කියලායි එතුමාට කියන්නේ. එතුමාට පහර දුන්නා; පත්තරවලට සීල් තිබ්බා. [බාධා කිරීමක්] දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට ඒවා කියන්න බැහැ. මොකද, අපේ පැත්තේ ඉඳලා තමුන්නාන්සේත් ඒවා විවේචනය කරපු කෙනෙක් නිසා. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා පුද්ගලානුබද්ධයි. මොන ආණ්ඩුවකින් හෝ මේවා කරනවා නම් මේවා සම්පූර්ණයෙන් මෙච්චල් කරන්න ඕනෑ; මේවා නැති වන්න ඕනෑ.

හැබැයි අපි එකක් කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ පැවැති යුද්ධයත් එක්කලා සමහර මාධ්‍යවේදීන් ක්‍රියා කළ ආකාරය ගැන මම හිතන්නේ කිසිම කෙනකුගේ පැහැදීමක් නැහැ කියලායි. ඒ අය ජීවිතෙන් වන්දි ගෙවන්න ඕනෑ කියලා අපි කියන්නේ නැහැ. හැබැයි අපි එකක් කියනවා. සමහර මාධ්‍යවේදීන් තමන්ගේ පැන එහෙම නැත්නම් තමන් භාවිත කරන මාධ්‍ය පාවිච්චි කොට යුද්ධය පිළිබඳව සම්පූර්ණ බොරු තොරතුරු ගෙනැල්ලා ලෝකය ඉදිරියේ තබලා, ජාත්‍යන්තරව මේ රට අපකීර්තියට පත් කළා. දහස් ගණනක් සොල්දාදුවෝ, එහෙමත් නැත්නම් සිංහල, දෙමළ දෙපැත්තේම මිනිසුන් අවුරුදු ගණනාවක් තිස්සේ මේ මිලේච්ඡ යුද්ධයක් එක්කලා ජීවිතවලින්, ලේවලින්, කඳුළුවලින්, දහදියවලින් වන්දි ගෙවපු ඒ යුගය අවසන් කරන්න ගත් මෙහෙයුමේදී ඒ කරපු කර්තව්‍යයට සම්පූර්ණයෙන් විරුද්ධව වැඩ කළ මාධ්‍යවේදීන් රාශියක් ඉන්නවා. ජාත්‍යන්තරය ඉදිරියට ගිහිල්ලා අදටත් මේවා ගැන කරුණු කියනවා. අද තමුන්නාන්සේලා ඒ ගොල්ලන්ව පිට රට යවලා. තමුන්නාන්සේලා ඔය අතුරුදහන් වෙලා කියලා කියන අයගෙන් භාගයක් දැන් ඉන්නේ පිට රටවල. තමුන්නාන්සේලා විසිනුයි ඒ අයව පිට රට යවලා, සුඛෝපභෝගී ජීවිත ගත කරන්නට ඉඩ පහසුකම් සලස්වලා දීලා තිබෙන්නේ. තමුන්නාන්සේලා එම්බසිවලට ගිහිල්ලා කථා කරලා, වීසා අරන් දීලා, ජාත්‍යන්තරයට කරුණු කියන, ජාත්‍යන්තරය ඉදිරියේ මේ රටේ තිබෙන ස්වරූපය සම්පූර්ණයෙන් විනාශ කරන විධියේ වැඩ පිළිවෙළවල යෙදුණු මාධ්‍යවේදීන්ව පිට රටවලට යවලා අද ආරක්ෂා කරනවා. ඒ අයට තමයි තමුන්නාන්සේලා අතුරුදහන් වෙලායි කියලා කියන්නේ. හැබැයි අතිගරු ජනාධිපතිතුමා බලයට පත් වෙච්ච දවසේ සිට හැම දාමත් මාධ්‍යවේදීන් එක්කලා සිටියා. එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට හිටපු කාලයේත්, එතුමා අමාත්‍ය ධුර දරපු කාලයේත්, එතුමා ජනාධිපති පුටුවට ඇවිල්ලා එතැන ඉඳලාත් කවුරුවත් කවදාවත් නොකළ විධියට මාධ්‍යවේදීන් එක්ක ඉතාමත් සුහදව කටයුතු කරනවා. සාමාන්‍යයෙන් මාසයකට සැරයක් හෝ දෙසැරයක් මාධ්‍යවේදීන්ව, පුවත් පත් කතුවරුන්ව ගෙන්වලා, කථා කරලා රටේ ප්‍රතිරූපය පිළිබඳව ජාත්‍යන්තරයට ඇත්ත කථාව කියන්න කියන කාරණාව කියනවා. එහෙම ප්‍රකාශ කරලා ඉතාම හොඳ සුහදත්වයක් ඇති කර ගෙන මේ වැඩ පිළිවෙළ ගෙනි යනවා. තමුන්නාන්සේලාටවත්, අපටවත් අදටවත් කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමාට චෝදනා කරන්න බැහැ. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමන්ලාගේ ආණ්ඩු කාලයේත් මාධ්‍ය ඇමතිවරු සිටියා. ඒ අය ගැන කථා කරන්න දෙයක් නැහැ. හැබැයි අපි සන්තෝෂ වනවා, කිසිම චෝදනාවක් නැති කෙනකුට, මාධ්‍යත් සමඟින් ඉතාම සුහදව කටයුතු කරපු කෙනකුට මේ අමාත්‍යාංශය භාර දීලා මේ කටයුත්ත ක්‍රමවත් වැඩ පිළිවෙළක ගෙන යන එක ගැන. අපේ රටේ මාධ්‍යවේදීන් කථා කරන්නේ ඕවා නොවෙයි. ඔවුන්ට යම් යම් ප්‍රශ්න තිබෙනවා. අපේ රටේ මාධ්‍යවේදීන් හා පිට රටවල ඉන්න මාධ්‍යවේදීන් සංසන්දනයට ගත්තාම ඒ අයගේ පහසුකම් සම්බන්ධයෙන් ලොකු පරස්පරතා තිබෙනවා. අපි ඒවා ගැන කථා කරමු; ඒ පහසුකම් සලස්වලා දෙමු. නිදහසේ මාධ්‍ය පාවිච්චි කරන්නට වාගේම ඒ අයට අවශ්‍ය කරන සියලුම පහසුකම් ටික දෙමු. දීලා, ඒ අයව නියම මාධ්‍යවේදීන් බවට පත් කර ගන්නා වැඩ පිළිවෙළකට යමු.

මාධ්‍යවේදීන්ගේ පැත්තෙනුත් ලොකු යුතුකමක් තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ යුතුකම තමයි, තමන්ගේ අතට පැන හම්බ වුණා කියලා, තමන්ගේ අතට කැමරාව හම්බ වුණා කියලා, තමන්ගේ ජාතියට, තමන් උපන් රටට, තමන් උපන් දේශයට විරුද්ධව දේශ ද්‍රෝහී වැඩ කරන යම් කිසි පිරිසක් ඉන්නවා නම් ඒ අයත් එක්කලා එකතු නොවී තමන්ගේ රටට ආදරය කරලා ඒ මාධ්‍ය හරියට හැසිරවීම. නිදහස් මාධ්‍ය කියන දෙය වැරදි විධියට පාවිච්චි කරන්නේ නැතුව හරි විධියට පාවිච්චි කරලා කටයුතු කිරීම තමයි ඒ අයගේ යුතුකම. විශේෂයෙන්ම තමුන්නාන්සේ කියනවා වාගේ ඉදිරි කාලයේදී මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් මේ රජයෙන් හෝ යම් කිසි වැරැද්දක් වෙනවා නම් ඒ වෙනුවෙන් අපි පෙනී සිටින බව කියමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදයට සහභාගි වන්න ලැබීම පිළිබඳව මම ඉතාම සන්තෝෂ වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා පුදුම කථාවක් කිව්වා. එතුමා කියනවා, එක්සත් ජාතික පක්ෂය පසු ගිය කාලයේ කියපුවා ගැන කථා කරන්න එපා කියලා. දැන් ඒවා කියන්න එපා, මේ කාලයේ තිබෙන ඒවා කථා කරන්න කියලා කියනවා. මම එතුමාගෙන් අහන්න කැමැතියි, එතුමා කොයි පක්ෂයේද, කොයි පැත්තේද කියලා. එතුමාට අද ඒක අමතක වෙලා. ඒ වාගේම අපේ - [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා වැරැදි විධියට තේරුම් අරගෙන තිබෙන්නේ. මම කියපු දේ ඔබතුමා අහගෙන හිටියේ නැහැ. මම කිව්වේ ඉතිහාසයේ එක්සත් ජාතික පක්ෂයෙන් කරලා තිබෙන වැරැදි ගැන. මම ඒවා හරි කියලා කියන්නේ නැහැ. ඒවා වැරදියි කියලා පිළිගන්නවා කියන එක තමයි මම කිව්වේ. ඒක අවබෝධ කර ගන්න.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
නැහැ. තමුන්නාන්සේ දැන් එහෙම කිව්වාට, අතීතය දිහා බලා තමයි වර්තමානය හා අනාගතය ගැන අපට තීන්දු ගන්න වෙන්නේ.

දැන් ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා කථා කළා. ජනතා විමුක්ති පෙරමුණේ නඩු කථා කරපු එකම නීතිඥයා වූ ලියනාරච්චි මහත්මයාව ගහලා මරලා දැම්මා. මේ රටේ ඒ ගැන කථා කරන්න කෙනෙක් හිටියේ නැහැ. යූනුස්ලාට පිහියෙන් ඇන්නා. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රට පාරේ ඇද ඇද ගැහුවා. ඒ යුගයේ ඒවා කථා කරන්න කෙනෙක් හිටියේ නැහැ. මේ පුවත් පත් මාධ්‍යවේදීන්ට කරන හිරිහැර ගැන කථා කරන්න කෙනෙක් හිටියේ නැහැ. කිසිම පූජනීය පක්ෂයක් හිටියේ නැහැ. බුරුතු පිටින් හන්දි ගානේ වෙඩි තියලා මරලා දමන කොට ඒ ගැන කථා කරන්න කෙනෙක් හිටියේ නැහැ. මාධ්‍ය රැස්වීමක් තිබුණා නම් දම්වැල්, චේන්වලින් ගහන්නේ. මැරයෝ පැන පැන ගැහුවා. මේවා ගැන කවුරුත් කථා කළේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද තත්ත්වය බලන්න. අද පෙළපාළි යන්න පුළුවන්, හර්තාල් කරන්න පුළුවන්; කෑ ගහන්න පුළුවන්; පිකටිං කරන්න පුළුවන්. අද මොනවාද මාධ්‍යවේදීන්ට අඩු? අද මොනවාද ඔවුන්ට කරන්න බැරි? අද මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය යටතේ මාධ්‍යවේදීන්ට සියලු නිදහස ලබා දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියලු දෙනා සමඟ වාගේම මාධ්‍යත් සමඟ සුහදව කටයුතු කරන මේ වාගේ නායකයෙක් මම දැකලා නැහැ. මේක තමයි ඇත්ත තත්ත්වය. අද අපේ රට මෙවැනි තත්ත්වයකට පත් වෙලා. ඉතාම හොඳ නායකයෙක් යටතේ මේ නිදහස භුක්ති විඳින කාලයක මෙවැනි යෝජනා ඉදිරිපත් කිරීම එක පැත්තකින් බරපතළ පාපයක්. අද ඉදිරිපත් කරපු කරුණු අතර වූ සමහර ගිනි තැබීම්, සමහර කටයුතු පිළිබඳව කථා කළොත් කවුද ඒවා කරලා තිබෙන්නේ? රජයෙන්ද කරලා තිබෙන්නේ? රජයේ පාක්ෂිකයෝද කරලා තිබෙන්නේ? නැහැ. අද ඒ කරුණු අධිකරණයේ තිබෙනවා. තමුන්නාන්සේ කියනවා කථා කරන්න දෙයක් නැහැ කියලා. කථා කරද්දී සදාචාරාත්මකව කථා කරන්න ඕනෑ. අද රටේ නීති තිබෙනවා; රීති තිබෙනවා. ඒ රීති අනුව කථා කරන්න ඕනෑ. අධිකරණයේ නඩුවක් තියෙද්දී ඒ පිළිබඳව කථා කරන්න බැහැ. ඒ කැලෑ නීතිය තුළ කථා කරන්න අයිතියක් මේ සභාවේ නැහැ. මේ සභාවේ කථා කරන්න අයිතිය තිබෙන්නේ යුක්ති ගරුකව හා සදාචාර සම්පන්නවයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය තමයි අද පුවත් පත් නිදහස ගැන, මාධ්‍ය නිදහස ගැන කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන පොඩ්ඩක් කියන්නයි මම කථා කළේ. ඒ සඳහා කෙටි කාලයක් හරි මට ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මී ළඟට, ගරු කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல - வெகுசன ஊடக, தகவல் அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Mass Media and Information)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද යෝජනාවේ පළමුවැනි කරුණ වන්නේ, "නිදහස් මාධ්‍යවේදීන්ට පසු ගිය කාල වකවානුවේදී දැවැන්ත හිරිහැර කිරීම්, අතුරුදන්වීම් සහ ජීවිතවලින් වන්දි ගෙවීමට පවා සිදු වූ අතර, එම සිද්ධීන් පිළිබඳව මේ වනතුරුත් කිසිදු පියවරක් ගෙන නොමැත." යන්නයි.

දෙවැනි කරුණ වන්නේ, " එබැවින් මේ සියලු කරුණු සලකා බලා මාධ්‍යවේදීන්ට දඬුවම් පමුණුවන පුවත් පත් පැමිණිලි කොමිසම අහෝසි කර නිවැරැදි මාධ්‍ය භාවිතයක් වෙනුවෙන් හැම මාධ්‍යවේදියෙකුටම සාධාරණයක් ඉටු වන සේ...." යන්නයි.

මාගේ හිතවත් ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කොයි ආකාරයෙන් මේ, - [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පුවත් පත් පැමිණිලි කොමිසම නොවෙයි.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
නැහැ, මේ මට ලැබිලා තිබෙන යෝජනාවේ තිබෙන්නේ ඒකයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක වැරැදියි.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
වැරැදි නම්, පළමුවෙන්ම මේ යෝජනාව අහෝසි කරන්න වෙනවා නේ. ඒ ගැන කථා කරපු එකත් අපරාදේ. මේ මට ලබා දීලා තිබෙන එක. පළමුවෙන්ම මූලාසනයෙන් ඒ ගැන තීන්දුවක් ගන්න වෙනවා. මන්ත්‍රීතුමා, මේ මට පාර්ලිමේන්තුවෙන් ලැබුණු එක.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක මම දන්නේ නැහැ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මේ මට පාර්ලිමේන්තුවෙන් ලැබුණු එක. එහෙම නැතිව මට ඔබතුමා දෙන එක ගන්න බැහැ.

"එබැවින් මේ සියලු කරුණු සලකා බලා මාධ්‍යවේදින්ට දඬුවම් පමුණුවන පුවත් පත් පැමිණිලි කොමිසම අහෝසි කර......" [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක වැරැදියි.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
වැරදි නම් ඒක නිවැරදි කරන්න ඕනෑ මම නොවෙයි නේ. [බාධා කිරීම්] ඒක වෙන්න පුළුවන්. නමුත් මට මේ - [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පළමුවෙනි පරිච්ඡේදය කපලා ආපසු - [බාධා කිරීම්]

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඒක වෙන්නට පුළුවන්. [බාධා කිරීම්] නමුත් මට අනවශ්‍ය දේවල් වැඩක් නැහැ. මෙන්න මේකේ බොහොම පැහැදිලිව ඒ විධියට තිබෙනවා. මට දීලා තිබෙන යෝජනාවේ. මේ යෝජනාව අනුවයි මට කථා කරන්නට සිද්ධ වන්නේ. ඒකේ වෙනසක් තිබෙනවා නම් ඔබතුමා නැවත වරක් යෝජනාව ගේන්න. [බාධා කිරීම්] මා දන්නවා, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා පුංචි අපහසුතාවකට පත් වන බව මේ යෝජනාවේදී. ඒ ගැන මා අවංකව කනගාටු වනවා. නමුත් ඔබතුමා පැහැදිලිව දන්නවා, මේ මණ්ඩලය ඇති කරන්නය කියලා කරුණු ඉදිරිපත් කරමින් 2002.10.16 වන දින ඔබතුමාගේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා කැබිනට් මණ්ඩලයට මෙන්න මෙහෙම යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙන බව. "ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් ශක්තිමත් කිරීමට හැකි වන සාධකයක් වශයෙන් නිදහස් මාධ්‍ය පරිසරයක් ඇති කිරීමට රජයට ඇති වගකීම වැඩිදියුණු කිරීමට දැනට ක්‍රියාත්මක වන 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල පනත ප්‍රධාන බාධකයක් ලෙස පෙනී ගොස් ඇති බැවින් එය ඉවත් කිරීම අවශ්‍ය කරුණක් වේ. එසේම එම පනත ඉවත් කිරීමෙන් දැනට පවත්නා පුවත් පත් මණ්ඩලය වෙනුවට බොහෝ ජනමාධ්‍යවේදීන්ගේ ප්‍රධාන ඉල්ලීමක් වන විවිධ වෘත්තීය මාධ්‍ය ආයතන නියෝජනය කරන පුවත් පත් පැමිණිලි කොමිසමක්, සභාවක් ඇති කිරීමට අවස්ථාව සලසනු වස් " යනුවෙන්. [බාධා කිරීම්] ඒක කැබිනට් එකට දාලා, කැබිනට් එකෙන් අනුමත වෙලා තිබෙනවා. [බාධා කිරීම්] නැහැ. නැහැ. පොඩ්ඩක් ඉන්නකෝ. [බාධා කිරීම්] ඊට පස්සේ කථා කරන්නකෝ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Let the Hon. Minister continue.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Let me continue. එතකොට ගරු මූලාසනයේ - [බාධා කිරීම්] ඒක නිවැරදි කරන්න, - [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! In the original Motion - [*Interruption.*] Order, please! පුවත් පත් පැමිණිලි කොමිසම කියලායි ඔබතුමාගේ මුල්-, [බාධා කිරීම්] So, let him explain. [බාධා කිරීම්] All right. It says Press Council of Sri Lanka. Hon. Minister, you may continue.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2008.12.03 වන දා පාර්ලිමේන්තුවේ දී පැවැති පුවත් පත් මණ්ඩලය සම්බන්ධව පාර්ලිමේන්තු රාජ්‍ය ව්‍යවසාය කාරක සභා රැස්වීමේදී එකී වාර්තාවේ අංක 5 යටතේ පුවත් පත් මණ්ඩලය යළි සක්‍රිය කිරීමට තීරණය කර ඇති අතර, එම තීරණය ගනු ලැබූ කමිටුවේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාද සාමාජිකත්වය දරා ඇති බව පෙනේ. [බාධා කිරීම්] හරි. ඔබතුමා දැන් ඒ ස්ථාවරය වෙනස් කිරීම සම්බන්ධවයි මා කියන්නේ. [බාධා කිරීම්] පැහැදිලිව මේකේ සාමාජිකයන් වශයෙන් ඉඳලා තිබෙන්නේ, ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න ඇමතිතුමා, ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා, ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා, ගරු හුසේන් බයිලා මැතිතුමා, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. එතුමන්ලා තමයි මේකට එකඟතාව පළ කරලා මේක ඇති කර තිබෙන්නේ. සමහර විට එතුමාට මේ මොහොතේ -වර්තමානයේ- ඒක ගැළපෙන්නේ නැත කියා හිතෙන්න ඇති. එම නිසා එය ඉවත් කර ගන්නට අදහසක් - [බාධා කිරීම්] නැහැ. නැහැ. සම්පූර්ණ වැරදියි. මේ පාර්ලිමේන්තුවේ කාරක සභාවක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, do you give him way?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
No, I am running out of time, Hon. Presiding Member.- [*Interruption.*]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් මේ මම කිව්ව නිසාද පුවත් පත් මණ්ඩලය ආපහු පණ ගන්වලා තිබෙන්නේ? මම කිව්ව නිසාද පුවත් පත් මණ්ඩලය පණ ගන්වලා තිබෙන්නේ?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

නැහැ, නැහැ. ඔබතුමා කමිටුවේ සාමාජිකයෙකු හැටියට සිටි බව පමණයි මම කිව්වේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමාට ඒක පැහැදිලි කරන්න ඉඩ දෙන්න.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ගරු මන්ත්‍රීතුමා සාමාජිකයකු කියන එක පමණයි මම කිව්වේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා වුණා. දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් වුණා. දැන් මෙතැනදී පැහැදිලිව පෙනෙන එක කරුණක් තමයි අපේ ගරු මන්ත්‍රීවරුන් විශාල දායකත්වයක් මේ යෝජනාව වෙනුවෙන් ලබා දුන්නු බව. යුද කාලය පසු කරමින් අපි දැන් ඇවිල්ලා තිබෙන්නේ. ඒ යුද කාලය තුළ මේ රටේ ජාතික පුවත් පත් කියන ජාතික මාධ්‍ය ආයතනය ඉතාමත්ම වග කීමෙන් හැසිරුණු බව අපි දන්නවා. හැබැයි එයින් පරිබාහිරව නොයෙකුත් අවස්ථාවලදී, මාධ්‍ය ආයතන කියන සමහර අය නිසා මේ රටේ ජනතා වෛරයට ලක් වුණු එකත් සත්‍යයක්. ඒ ගැන රහසක් නැහැ. ඒකට හේතු පාදක වුණු කරුණු කාරණා ගණනාවක් තිබෙනවා. මට ඒවා එකින් එක කියන්න පුළුවන්. මොකද, ඒ කාලයේ මම ජාතික ආරක්ෂක මාධ්‍ය ප්‍රකාශක හැටියට කටයුතු කරපු නිසා බොහොම පැහැදිලිව මට ඒ ගැන කරුණු ඉදිරිපත් කරන්නට පුළුවන්.

අද මගේ මිත්‍ර දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී දිගින් දිගටම කථා කළේ Lanka-e-News එක ගැන. මම එක ප්‍රශ්නයක් අහන්න කැමැතියි. මේ රටේ මාධ්‍යවේදීන් ඉන්නවා, මාධ්‍ය ආයතන තිබෙනවා. පෘථග්ජන මිනිසුන් හැටියට අපි සියලු දෙනාම අතින් වරදක් වෙන්න පුළුවන්. හැබැයි ඒ සිදු වූ වරද නිවැරදි කර ගන්නට කවදාකවත් ඉදිරිපත් නොවුණු කොටසක් මේ රටේ ඉන්නවා. ඔවුන් බෝධි සත්ත්වයන් නොවෙයි. ඔවුන්ගේ අතින් වැරදි වෙන්න පුළුවන්. හැබැයි ඔවුන් කවදාකවත් ඒ වැරැද්ද, වැරැද්දක් හැටියට පිළිගන්නේ නැහැ. යම් අවස්ථාවලදී කෙනෙකුගේ පෞද්ගලික ජීවිතය පවා විවේචනයට ලක් කරමින් යම් යම් අයගේ පවුල් කඩාකප්පල් වන තත්ත්වයට, දරුවන්ට පාසල් යන්නට බැරි වන තත්ත්වයට මාධ්‍ය හැසිරුණු වෙලාවන් තිබෙනවා. ඒ වාගේම මාධ්‍ය වග කීමක් ඇතිව කටයුතු කරපු අවස්ථාවන් තිබෙනවා. ඒ ගැන හොඳට දන්නා, ඒ පරතරය ගැන හොඳට දන්නා මහ ජන නියෝජිතයන් මේ රටේ ඉන්නවා. එදා යුද්ධය පැවැති අවස්ථාවේදී රටට වින කරන්නට ඩොලර් සිය ගණන් අරගෙන INGOකාරයන්ගේ සාක්කුවට වැටිච්ච අය ගැන අපි විටින් විට මේ රටේ ජනතාවට පැහැදිලිව පෙන්වා දී තිබෙනවා. ඉතින් ඒකෙත් කණ්ඩායම් ගණනාවක් ඉන්නවා. ඉතාම මධ්‍යස්ථව වැඩ කරන, රටක් ගැන හිතලා කටයුතු කරන, ලෝකයේ මාධ්‍ය සදාචාරයට ගරු කරන කණ්ඩායම් මේ රටේ ඉන්නවා. එයින් පරිබාහිරව කටයුතු කරපු අය ගැන අප වාගේම මේ විපක්ෂයේ යෝජනා ඉදිරිපත් කරන ගරු මන්ත්‍රීවරුනුත් නොදන්නවා නොවෙයි. අද බෙනට් රූපසිංහ ගැන කථා කළා. එක පත්තකින් කියනවා, රටේ නීතිය ක්‍රියාත්මක කරන්නය කියලා. එතුමාට විරුද්ධව පැමිණිල්ලක් ලැබිලා තිබෙනවා. ඒ පැමිණිල්ලට කරුණු කාරණා සියල්ලම ගොනු වෙලා තිබෙනවා. ඒ කරුණු ගොනු වී තිබෙන තත්ත්වයන් අනුව ඔහුව අත් අඩංගුවට ගන්න සිද්ධ වෙනවා. ඔහුට නිදහසට කරුණු කාරණා ඉදිරිපත් කරන්න උසාවියේදී අවස්ථාව තිබෙනවා. ඒ අවස්ථාව අනුව ඔහුට ඇප නියම වෙනවා. මේ ක්‍රියාවලිය, අපේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා උසාවියේ තිබෙන තීන්දු තීරණ ගැන කථා කරන්න බැහැ කියලා. මම උසාවියේ තිබෙන තීන්දු තීරණ ගැන නොවෙයි කථා කළේ. ඒකට ගරු කරන අතර ඒ ක්‍රියාවලියේදී ඇති වෙච්ච පසු බිම මම තේරුම් කරලා දුන්නේ. ගරු මන්ත්‍රීවරුනි, එදා යුද්ධය පාවා දෙන්නට කටයුතු කරපු යම් යම් කණ්ඩායම්, යම් යම් දේශපාලන පක්ෂ ඔවුන්ගේ අන්ත පරාජය තුළ අද කිඹුල් කඳුළු හෙළීම ගැන මම කනගාටු වෙනවා. එදා යුද්ධය ජයග්‍රහණය කරන්න බැහැ, මහා බොරු යුද්ධයකට, රට අවාසනාවන්ත තත්ත්වයකට පටලැව්වාය කියපු උදවිය යුද්ධය අවසාන වන කොට, ත්‍රස්තවාදය අවසාන වන කොට ඉවසා ගන්න බැරි තත්ත්වයකට පත් වුණා. එසේ කරලා අතිගරු ජනාධිපතිතුමා ගෙන ගිය වැඩ පිළිවෙළ පැත්තක තියලා රණ විරුවන්ට ශුභාශිංසනය කරන්නට පටන් ගත්තා, "මේ වැඩ පිළිවෙළ ගෙන ගිය රණ විරුවන්ට දීර්ඝායු වේවා!" කියලා. ඒ රණ විරුවන්ව නොමරා මරාපු, ඝාතනය කරපු යම් ආයතන තිබුණේ නැද්ද කියලා මම ඒ ගරු මන්ත්‍රීතුමාගෙන් අහන්න කැමැතියි. එවැනි ප්‍රශ්නවලට මුහුණ දෙන්න වන කොට, ඔවුන් ගැන කථා කරන කොට අද ඒ කිඹුල් කඳුළු හෙළන්නේ එදා යුද්ධය පරාජය කරන්නට කැස කවන කොට ඔවුන්ට උල් පන්දම් දීලා කොටි වෙනුවෙන් පෙනී හිටපු කණ්ඩායම්. අද බහුතරයක් ඒ ආකාරයෙන් ක්‍රියාත්මක වෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ගැන මම අවංකවම කනගාටු වෙනවා. මේ මාතෘ භූමියට ආදරය කරන, මේ මාතෘ භූමියේ අයිතිවාසිකම් තිබෙන එක්කෝටි අනූපන්ලක්ෂයක් ජනතාව තහවුරු කරයි එදා වෙච්ච සිදු වීම්. යම් යම් පුවත් පත්වල පළ කරලා තිබුණා මට මතකයි. Countdown එකක් පවා කළා. "කොටි ඉන්නේ 5,000යි. හමුදාව කියනවා, මේ වන කොට 1,000ක් මැරුවා" කියලා පළ කරනවා. ඊට පසුව දා පළ කරනවා, "අද 200ක් මැරුවා" කියලා. ඊ ළඟට යුද්ධය අවසාන වෙන්න මාස තුනකට ඉස්සර වෙලා කියනවා, "කොටින් සියල්ල අවසානයි. එහෙම නම් කාගෙත් එක්කද යුද්ධ කරන්නේ?" කියලා. ඒ ගෙනිච්ච සියලුම වැඩ පිළිවෙළවල් කඩාකප්පල් කරන්න ගත හැකි ක්‍රියාමාර්ග සියල්ල එදා අර ගත්තු උදවිය තමයි අද මේ තත්ත්වයෙන් කථා කරන්නේ. මම එක මොහොතකටවත් කියන්නේ නැහැ, ජනතාවගේ මාධ්‍ය නිදහස - මේ රටේ තොරතුරු දැන ගැනීමේ නිදහස- නැති කළ යුතුයි කියලා. හැබැයි උදාහරණයක් මම කියන්නම්. එදා පුවත් පතේ මුල් ශීර්ෂ පාඨයක් හැටියට දමනවා "නාමල් රාජපක්ෂ ඇස්ටන් මාර්ටින් රථයක් මිලියන 60ක් ගෙවා ගෙනෙයි" කියලා. එතුමා අද මන්ත්‍රීවරයෙක්. මේක ගැන කථා කරලා මාස තුනකට විතර පස්සේ කියනවා "නැහැ, නැහැ. තවත් නාමල් කෙනෙක් ඒක ගෙනැල්ලා තිබෙන්නේ" කියලා. හැබැයි රටේ ජනතාවට මොකක්ද යන්නේ? එහෙම නම් වග කීමෙන් වාර්තා කිරීම එතැන දැක්කාද? සති අන්තයේ පුවත් පත් තිබෙනවා. මම ඔබතුමාට කියනවා, මේ සති අන්තයේ පුවත් පත් ටික ගන්න කියලා. ජාතික පුවත් පත් කියන පුවත් පත් 10ක් 12ක් තිබෙනවා. ඒ පුවත් පත් ගත්තොත් රජයේ පුවත් පත් හැටියට තිබෙන "දිනමිණ", "සිළුමිණ", "සන්ඩේ ඔබ්සර්වර්" එකයි, ද්‍රවිඩ පත්තරයයි හැර අනික් පුවත් පත් යොදවන්නේ ජනාධිපතිතුමා පමණක් නොවෙයි, දේශපාලනය ගැන ඔහුගේ පවුලේ ගැව්ච්ච මුළු සංහතියටම ප්‍රහාරයන් එල්ල කරමින් ඇමතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ සංහතියටමත් ප්‍රහාරයන් එල්ල කරන්නටයි. ඒ පිටුවේම කොනක තිබෙනවා, "මේ රටේ මාධ්‍ය නිදහස නොමැත" කියලා. ඒ පුවත් පතේම තමයි ඉතුරු ටිකත් ඇතුළට දාලා තියෙන්නේ. ඉතින් මෙවැනි විකෘති වෙච්ච තත්ත්වයක් මේ රටේ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපට අවශ්‍ය වනවා මේ තත්ත්වය නිවැරදි කරන්නට. හැබැයි මේ තත්ත්වය නිවැරදි කරන්න නම් අපි ඔක්කොම පිළිගත යුතු එක සාධකයක් තිබෙනවා. අපි සියලු දෙනාම බෝධි සත්ත්වයන් නොවෙයි. පුවත් පතක නිවේදනයක් වැරදි විධියට කෙරෙනවා නම් ඒ වැරැද්ද එක්කෝ නිවැරදි විය යුතුයි; එහෙම නැත්නම් එයට දඬුවම් ලැබිය යුතුයි. එයට ආයතනයක් තියෙන්නට ඕනෑ. ඒ ආයතනය ශක්තිමත් කරන්න ගියාම කියනවා රජය මාධ්‍ය මර්දනය කරන්න

හඳුනවාය කියලා. එහෙම නම් මොකක්ද විකල්පය? මම විපක්ෂයෙන් අහනවා, ඒ විකල්පය අපට කියන්න කියලා. ඒ විකල්පය අපි සලකලා බලන්නම්. එවැනි තත්ත්වයක් අපට අමතක කරන්නට බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ පුරවැසියන්ගේ අයිතිවාසිකම් රැක ගන්නට අපට වග කීමක් තිබෙනවා. ඒ වගකීම ක්‍රියාත්මක කරන්න ආයතනයක් තිබිය යුතුයි. ඒ ආයතනය ක්‍රියාත්මක වන කොට ඒ ආයතනයට මාධ්‍ය මර්දනය කියලා කියනවා නම් මම හිතන්නේ ඒක ඉතාමත්ම අසාධාරණයි. මම දන්නවා, පෙළක් වෙලාවට දේශපාලනයට සම්බන්ධ, එහෙම නැත්නම් දේශපාලනයට සම්බන්ධ නැති අයගේ වත ගොත පුවත් පත්වල ලියන්නේ නැවත වරක් ඒ දරුවන්ටවත් පාසල්වලට යන්න බැරි වෙන්නයි. ඒ දරුවෝ පාසල්වලට යන්න ප්‍රතික්ෂේප කරනවා. හැබැයි ඊට මාස දෙකකට පස්සේ පුංචි කැල්ලක් දමනවා නිවැරදි කිරීමක් මේ ආකාරයෙන් සිදු වෙනවාය කියලා. ඒ වන කොට සම්පූර්ණයෙන්ම වෙන්න ඕනෑ සියලු කරුණු එහෙම නැත්නම් අගතීන් සියල්ල වෙලා ඉවරයි. ඒ නිසා ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් පළමුවෙන්ම නිවැරදි කිරීමක් කරනවා නම් හොඳයි. මට ලැබී තිබෙන දේ මේකයි. කනගාටු වෙනවා -

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)
එතුමා අත්සන් කරලා තිබෙන්නේ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
එතුමා අත්සන් කරපු යෝජනාව තමයි අපට එවලා තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම බොහොම පැහැදිලිව පෙන්වා දුන්නා. එය මම අත්සන් කළ එක නොවෙයි.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
එහෙම නම් කවුද අත්සන් කරලා තියෙන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වැරදි වැටහීමක් තිබෙන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අපි අවසන් කරමු. වෙලාව හරි. ආපසු යන්නේ නැතිව ඒ පැහැදිලි කිරීම අවසන් කරමු.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ මේ මන්ත්‍රීවරුන් ලබා දීපු දායකත්වයට මම ස්තුතිවන්ත වනවා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මම හිතන්නේ කියන්න උත්සාහ කළේ එක දෙයක්. නමුත් ඒ වෙනුවෙන් ප්‍රතිඋත්තර ලබා දීපු අපේ ගරු මන්ත්‍රීවරුන් කරුණු කාරණා ගණනාවක් එතුමාගේ අවධානයට ලක් කළාය කියා මම හිතනවා. ගරු මන්ත්‍රීතුමා ඒ ගැන කල්පනා කරලා බලන්න. මොකද හේතුව මාධ්‍ය නිදහස කියන එක ඔබතුමාට, මට පමණක් නොවෙයි, මේ රටේ සෑම කෙනෙකුම බුක්ති විඳිය යුතු දෙයක්. හැබැයි එය නිසියාකාරව කළ යුතුයි. ඒක එක ආකාරයකට, එක කණ්ඩායමකට හැසිරෙන විධියට කරන්නට බැහැ. තමන්ට අවාසි වන කොට; දේශපාලන වශයෙන් කඩා ගෙන වැටෙන කොට; දේශපාලන වශයෙන් බංකොලොත් වන කොට ඒකට ගන්න ආයුධයක් හැටියට පාවිච්චි කරන්න උත්සාහ කරන්න එපා. මොකද එවැනි තත්ත්වයක් ඇති වුවොත් එය දැලි පිහිය වාගේ එසේ නැත්නම් "බ්ලේඩ්" එක වාගේ දෙපැත්තට කැපෙන්නට පුළුවන්. ඒ නිසා මම නැවත වරක් ඉල්ලීමක් කරනවා. මාධ්‍ය ගැන අපේ වග කීමක් තිබෙනවා. මාධ්‍ය වග කීමේදී මාධ්‍යකරුවන්ගේ වගකීම ගැනත් අපි යම් කිසි තැනකට මේ රට ගෙනෙන්න ඕනෑ. සාධාරණයක් ඉෂ්ට වන්නට ඕනෑ නම්, යුතුකම් ඉෂ්ට වන්නට ඕනෑ නම් ඒ දෙපැත්තම එක ආකාරයෙන් ක්‍රියාත්මක වන්න ඕනෑ. එක පැත්තකට යන්න බැහැ. මාධ්‍යයට දෙන නිදහස කියලා "වල් බූරු නිදහස" කියන වචනය කනගාටුවෙන් හෝ මට පාවිච්චි කරන්න සිද්ධ වනවා. එවැනි වල් බූරු නිදහසක් ලබා දෙන්නට බැහැ. මොකද, මාධ්‍ය කියන්නේ මේ රටේ ජනතාවගේ ජීවිතත් එක්ක ගැට ගැහුණු දෙයක්. එම නිසා කිහිප දෙනෙක්, ඒ කිහිප දෙනා බෝධි සත්ත්වයන් නොවෙයි. ඔවුන් අතරෙන් වරදක් වනවාය කියලා කවදාවත් පිළිගත් අවස්ථාවක් තිබෙනවා නම් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ යෝජනාවට, ඔබතුමා කියන දේවල්වලට මා එකඟ වනවා. කිසිම දවසක ඔවුන්ට කොන්දක් තිබුණේ නැහැ, ඔවුන් කරපු දේ, කියපු දේ වැරදියි කියලා ඇවිල්ලා කියන්න. හැබැයි මුළු සමාජයටම කොහෙන් හෝ කොනක පුංචි notice එකක් දමනවා, ඒ මුළු පවුලම, ඒ දරුවන්ම විනාශ කරලා ඉවර වෙලා, එහෙම නැත්නම් ඒ ආයතන විනාශ කරලා. මහා විකෘති වෙච්ච තෘප්තියක් ලබන මාධ්‍යවේදීනුත් මේ රටේ ඉන්නවාය කියන එක මතක තබා ගන්න ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා අර කියන කොට ඒ අය බේරුවා. එක අවස්ථාවකදී යුද්ධය වෙනුවෙන් කථා කරපු අය ගැන නොවෙයි කථා කරන්නේ. අද ඔබතුමා කථා කළේ යුද්ධය වෙනුවෙන් තුප්පහි විධියට, නින්දිත විධියට, අශික්ෂිත විධියට මුළු රටක්ම පාවා දෙන විධියට කථා කරපු අය ගැනයි. ඒ ගැන මා කනගාටු වනවා. එම නිසා - [බාධා කිරීමක්] නැහැ. මට නම් කරන්න බැහැ. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. දැන් අවසන් කරන වේලාවයි. [බාධා කිරීම්] ගරු ඇමතිතුමා, පැටලෙන්න එපා. ඔබතුමාගේ කථාව අවසන් කරන්න. [බාධා කිරීම්]

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
එහෙම නම් හොඳයි. එල්ටීටීඊ සංවිධානයට කිසිම සහයෝගයක් දුන්නේ නැහැ, ලංකා ඊ-නිවුස් ආයතනය.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
වෙලාව ගෙවී ගෙන යනවා.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ජගත් පුෂ්පකුමාර ඇමතිතුමා, මොකක්ද, point of Order එක?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
කිසිම සහයෝගයක් දුන්නේ නැහැ, එල්ටීටීඊ සංවිධානයට. මා ඒ ගැන ආඩම්බර වනවා.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා - [බාධා කිරීම්] දැන් ලොකු ළමයෙක්. එම නිසා බොහොම වග කීමෙන් කටයුතු කරන එක හොඳයි. අර කණ්ඩායමක් අනාථ කළා. එතුමා කණ්ඩායමක් අනාථ කළා. එතුමා විපක්ෂයේ නියෝජ්‍ය ප්‍රධාන සංවිධායක; ලොකු ළමයෙක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමාගේ කථාව අවසානද?

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
සජිත් ප්‍රේමදාස මැතිතුමාව අනාථ කළා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.14ට, අද දින සභා සම්මතිය අනුව 2011 අප්‍රේල් 27 වන බදාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப 6.14 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க 2011 ஏப்பிரல் 27, புதன்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 6.14 p.m. until 1.00 p.m. on Wednesday, 27th April, 2011, pursuant to the Resolution of Parliament of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.